

# සන්න සහිත

# ශබ්ධසාරාත්ථ ජාලිනිය



# THE
# SABDASARARTHAJALINI.
## (PALI GRAMMAR)

BY

THE VENERABLE NAGITA MAHA THERA.

———x———

TRANSLATED INTO SINHALESE AND EDITED

BY

THE Rev. DEDIGAMUWE SEELAKKHANDHA

OF

NAWAGAMU VIHARA.


PUBLISHED BY

ROBERT BATUVANTUDAVE.

PRINTED AT THE "LANKABHINAWAVISSRUTA" PRESS.

COLOMBO.

A. B, 2444.

1900.

THIS WORK

IS RESPECTFULLY DEDICATED

TO

**THE VEN: H. SRI SUMANGALA**

TRIPITAKA WAGISWARACHARYA CHIEF NAYAKA

STHAVIRA

PRINCIPAL OF VIDYODAYA PARIVENA

BY

**THE AUTHOR.**

---

කොළඹ

මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපති

**හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය**

ගාලුබටහිර පලාත් සහිත ශ්‍රීපාදස්ථානයෙහි

ප්‍රධාන නායක ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ

විසින්

**සමාදරයෙන් පිළිගන්නාලදී.**

# ශුද්ධිපත්‍රය.

———:x:———

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 7 | දසං | දස |
| 4 | 3 | අමක්ඛුඛිජ්ජාති | අමක්ඛිජ්ජාති |
| 4 | 20 | වක්ඛති | වක්ඛසි |
| 6 | 5 | විපල්ලාශ | විපල්ලාස |
| 7 | 13 | බ්‍යඤ්ජබ්‍යකොච | බ්‍යඤ්ජකොච |
| 7 | 14 | විකෘතිභෙදයෙන් | ක්‍රියාභෙදයෙන් |
| 8 | 1 | විධා | වෙධා |
| 8 | 7 | කුතතාපචරාති * | කුශෙනපචරාති |
| 10 | 4 | මජෙඣා | මජ්ඣා |
| 11 | 23 | මධ්‍යපෙයාලයෙහි | මධ්‍යපෙයාලයෙහිම |
| 11 | 24 | තං තං පෙයාලං අපි, ඒ ඒ පෙයාලම; දිස්වා එව, දූකම; | තං තං, එය එය; දිස්වා එව, දූකම; පෙයාලං අපි, මධ්‍ය පෙයාලම්ද; |
| 12 | 2 | ධනුද්ධරෙරා * | ධනුධරෙරා |
| 13 | 9 | යෙභුය්‍යාසතතාකො * | යෙභුය්‍යාසනතාකා |
| 16 | 19 | පුතතා | පුත්තා |
| 16 | 25 | පිතරොයි | පිතරො |
| 16 | 26 | විරූපෙකශෙෂයයි | විරූපෙකශෙෂයයි |
| 17 | 2 | මාසකුටිලා | මාසාකුටිලා |
| 17 | 5 | පදීප | පදීපො |
| 24 | 2 | එකතනයො | එකඝතතයො |
| 24 | 22 | සියවසඟයෙහි | සියවසයෙහි |
| 25 | 6 | සකිලෙසෙ | සංකිලෙසෙ |
| 27 | 32 | මුදුශබ්දාදිය | මුදු යනාදිය |
| 30 | 6 | ලබහති * | ලභති |
| 32 | 1 | යථා මුනීනංච | මුනීනංච |
| 33 | 3 | අපරිච්ඡෙදරහෙ | අපරිච්ඡෙදරහෙ |
| 34 | 4 | සදිසප්පානපෙක්ඛනො * | සදිසප්පානපෙක්ඛකො |
| 38 | 17 | ශාරිපුතත | ශාරිපුත්‍ර |
| 41 | 16 | සර්වඥ නුවනින් | නුවනැත්තා විසින් |
| 43 | 5 | ජලං | ජල |
| 46 | 1 | කොධකෙ * | කොධනෙ |
| 48 | 27 | සිද්ධනතවාදී | සිඩනතවාදී |
| 53 | 4 | සවප්පාවතතනො * | සවප්පවත්තිනො |
| 54 | 17 | විපරීතාපමාවද | විපරීතොපමාවද |
| 55 | 8 | බාලා | බාලෙ |
| 57 | 3 | කිංච | කිංචා |
| 57 | 4 | ලොලයතො * | දෙලායතො |
| 58 | 6 | සමුගතස්සාපි * | සමුග්ගතස්සාපි |
| 58 | 10 | රවිවභාති | රවිවාභාති |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 58 | 32 | තිට්ඨා | තිට්ඨෙ |
| 59 | 6 | පාණමිව | පාණ ඉව |
| 59 | 7 | දෙවරාජ * | දෙවරාජො |
| 59 | 22 | පාණං ඉව, ප්‍රාණියමෙන් | පාණ ඉව, ප්‍රාණියන්මෙන් |
| 61 | 22 | කිහු | කියත් |
| 64 | 5 | යොගස්ස | යොගිස්ස |
| 67 | 20 | වඵෙ | වෙ අඵෙ |
| 68 | 1 | සමූහ | සමූහො |
| 72 | 6 | විවජ්ජිතා * | පිවජ්ජිතා |
| 73 | 20 | ගුණ | ගුණං |
| 76 | 24 | සපශි | සපශී |
| 77 | 11 | කරණදිය | කාරණාදිය |
| 78 | 10 | වීඩා | වෙඩා |
| 79 | 25 | සුනෙතඞි | සුයොතඞි |
| 82 | 15 | සූත්‍රයෙන් | සූත්‍රයෙන්වූකලී |
| 82 | 27 | යථාභාවී | යථාභාවි |
| ,, | ,, | යථාභාවි | යථාභාවී |
| 83 | 22 | පරිභාස | පරිභාසා |
| 90 | 15 | ඇත්තිසයිද | ඇත්තාශුයයිද |
| 92 | 31 | කෙරේද නිපදවාද | කෙරේනුයි නිපදවානුයි |
| 93 | 23 | කරැණුලැබේ | කරණුලැබේ |
| 94 | 13 | සෙසං | තෙසං |
| 95 | 24 | කාරකනම්ද | කාරකනම්වේද |
| ,, | 25 | කාරකනම්දැයි | කාරකයවේද යන මේ ප්‍රශනයෙහිලා |
| ,, | 31 | කාරකනම්දැයි | කාරකනම්වේද යනමේ ප්‍රශනයෙහිලා |
| 96 | 16 | නං දබිං, ඒ ද්‍රව්‍යය | නං දබිං අපි, ඒ ද්‍රව්‍යයද |
| 97 | 26 | කියත්තේය | කියනු ලබත්තේය |
| 97 | 31 | නනතානනං | සනනතානනං |
| 98 | 10 | එහෙයිත් | එහෙයිති |
| 103 | 18 | විසෙසනතා | විසෙසනක |
| 105 | 1 | එකභවී | එකභාවී |
| 105 | 25 | ගවයින් | ගවයෝ |
| 111 | 1 | දකාරාගම | දකාරාගමං |
| 112 | 4 | හෙනති | හොනති |
| ,, | 5 | තරතාදි | ඌරතාදී |
| ,, | 25 | සුතෙනසුසු | සුතෙනසූ |
| 118 | 29 | වත් ·නීය | වත්නීය |

* මේ ලකුණෙන් යුත් තැන් සනනයෙහිද මෙහි ශුද්ධකර තිබෙන පරිද්දෙන් ගතයුතු.

සද්දත්ථභෙදචින්තානාමා'යංගන්ථො.

වස්සබගගාඛ්‍ය ගාමෙ අභිනවාරාම මජ්ඣාවසතා
සදෙස දෙසන්තර සුධීජන සම්භාවිතෙන
**පවර නෙරුත්තිකාචරිය මහාවිභාවි රාජගුරුනා**
**සුභූති නායකත්ථෙරමහාසාමිපාදෙන.**
සමාදරපුරස්සරෙන
සම්පටිච්ඡිතො.

# Preface.

THIS work was composed by the Venerable Nagita a Buddhist Monk who lived about seven centuries ago at Wijayapura, in Tambarata (a Province in Burma,) It is not possible to locate with accuracy the exact period at which this author flourished, as the materials in our hands are very meagre. We are therefore obliged to leave the matter undecided here. But the work is highly appreciated by every Mágadhi Grammarian. I have paraphrasəd the work into Sinhalese with a view to facilitate the Study of Mágadhi language. There may be errors and over-sights in this attempt of mine, which I hope will in no way diminish the utility of the work. In conclusion I have to acknowledge with thanks the valuable assistance rendered to me by the very Rev: H. Dewa-mitta the vice Principal of Vidyodaya Parivena, and Second High Priest of the Western Province.

*D. Seelakkhandha.*

# විඥාපනය.

ශබ්දසාරාර්ථජාලිනීනම්වූ මෙම විශිෂ්ටමාගධව්‍යාකරණග්‍රන්ථය තම්බරට විජයපුරවිසූ නාගිතනම් * මහාස්වාමිපාදයන් විසින් රචනාකරණලද්දේය. මෙය නානාවිධවිශිෂ්ටව්‍යාකරණ ලක්ෂණයන්ගෙන් හොබවා ශබ්දශාස්ත්‍රානුකූලපටිපාටියෙන් ප්‍රමාණොල්ලඞ්ඝනය නොකොට විවජ්ජනයන්ගේ චිත්තාකර්ෂණවනපරිද්දෙන් සඞ්ක්ෂෙපකටයුතු තැන් සඞ්ක්ෂෙපකිරීමෙන්ද විස්තරකටයුතු තැන් විස්තරකිරීමෙන්ද රචනාකරතිබෙනබව පෙණේ. එබැවින් මේ ග්‍රන්ථකර්තෘවූ ස්වාමිපාදයන්වහන්සේ ශබ්දශාස්ත්‍රාදිය මොනවට හදාළ පඬිතුමෙකුබව ශඞ්කාරහිතව පෙණේ.

මේප්‍රකරණය වනාහි ශබ්දසාරප්‍රකීර්ණක අර්ථසාරප්‍රකීර්ණක යන කාණ්ඩද්වයකින්ද සඤ්ඤාමකාරකාදි කාණ්ඩසත්තකින්ද සමන්විතයි. මෙහි ඉතිශබ්ද එව ශබ්දාදීන්ගේ විශෙෂවිභාගද උපචාරනයාදි නානාවිධ ශාස්ත්‍රනයද සඤ්ඤානාම කාරක සමාස තද්ධිත ආඛ්‍යාතකිතක යන්ගේ විශෙෂවිභාග හා තත්සම්බන්ධ උගතයුතු විශිෂ්ටොපදෙශ රාශියක්ද යථානුරූපවශයෙන් දක්වනලදී. එහෙයින්ම ස්‍යාමබ්‍රහ්ම ලංකාදි නොයෙක් රටවාසී මාගධීවෛයාකරණ පඬිතයන්විසින් මේ ග්‍රන්ථය සමාදරයෙන් පරිශීලනයකරණබවත් මාගධීනිරුක්තිප්‍රකරණ විෂයෙහි ගරුබුහුමන් පෙරටුව පිළිගෙණ තිබෙනබවත් සුබොධිකා ටීකා දියෙන්ද පෙණේ. මාගධීපණ්ඩිතයන් විසින් ඉතා උසස්කොට සලකන යථොක්ත සුබොධිකා ටීකාවෙහි මේ ග්‍රන්ථයෙන් පාඨනිදර්ශන කරණලද්දේය. එසේහෙයින් මේ පොත අනුවගොස් ආධුනිකයන් විසින් මාගධව්‍යාකරණ ඉගෙණ ගතයුතුබැව් කියනු කිම, එබැවින් මේ පොතේ උත්තමතාව දැක්වීමට වාක්‍යරාශියක් ලියයුතු නොවේ. මේ සම්බන්ධ සියල්ල ප්‍රාඥයන්ට අවබොධවේමැයි.

මෙසේ මාගධීවෛයාකරණ පණ්ඩිතයන් විසින් ඉතාගරුකොට සලකන මෙමග්‍රන්ථය අව්‍යක්තලෙඛකයන්ගෙන් ජනිත දොෂරාශිය නිසාත් සිංහල අකුරෙන් ලියනලද පොත් ඉතා සුලභනොවන නිසාත් ආධුනිකයන්ට මෙයින් ගතයුතු ප්‍රයොජන නිරායාසයෙන් ගත නොහැකිලෙස මේතාක් පැවැත්තේයි. මෙසේ පවත්නා අතර මෙය සකස්කොටඅර්ථවර්ණනාවක් ලියා ආධුනිකයන්ගේ ප්‍රයොජනය සඳහා සුලභකරවීම සත්කෘත්‍යයෙකැයි සලකා, ගණේගොඩැල්ලේ විහාරාධිවාසී මුල්ලේරියාවේ ගුණරතන ස්ථවිරස්වාමිපාදයන් වහන්සේගෙන්ද විද්‍යොදය පිරිවෙණේ උපප්‍රධානාචාර්ය්‍ය ධුරන්ධර හෙයියන් තුඩුවේ දෙවමිත්තනායකාභිධාන බටහිර පලාතේ විනීය නායකස්ථවිර

* කණ්ටකඛිල නාගිත ස්ථවිරයෝයයිද කියත්.

ස්වාමිපාදයන්වහන්සේගෙන් හා විද්‍යෝදයපරිවෙණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන **ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය** ගාලුබටහිර පලාත්සහිත ශ්‍රීපාදස්ථානයෙහි ප්‍රධාන නායක ස්ථවිරස්වාමිපාදයන් වහන්සේගෙනුත් ශාස්ත්‍රාගමෝද්ග්‍රහණයකලාවූද නවගමුවේ විහාරාධිවාසී **කමුවාවල සුමනතිස්ස** ස්ථවිරස්වාමිපාදයන් වහන්සේගේ අනවැසි ශිෂ්‍යවූද දූඹිගමුවේ සීලක්ඛන්ධ නමැති මාවිසින් මෙය සකස්කොට සිංහලාර්ථවර්ණනාව ලියා. යථොක්ත විහාර නායකස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගෙන් ලබනලද ආධාර ඇතුව ශුද්ධකොට යථොක්ත ප්‍රධාන නායකස්ථවිර ස්වාමිපාදයානන්වහන්සේට ඔප්පු කරණලදින් එම නායක ස්වාමිපාදයානන් වහන්සේ විසින් සමාදරයෙන් පිළිගන්නාලදී.

මෙම අර්ථව්‍යාඛ්‍යානය කරණ අපි සදොස්ව පෙණුනුගාථා ශුද්ධ කොටලීමු. එසේම ඡන්දෝලක්ෂණවිරහිතගාථාවන්ගෙන් සමහරක් අර්ථාවිරෝධලෙස ඡන්දෝලක්ෂණානුගතකොට සෑදුවෙමු. ආධුනිකයන්ට දුර්බෝධ්‍යයි හැඟුන ඇතම් ගාථාවන්ට භාවාර්ථයක්ද ලීවෙමු.

මෙහි ගාථාසඞ්ඛ්‍යාව අධිගාථාසොළසක් සහිත පන්සිය එකුන් විස්සක්බැව් "පඤ්චසතං දසචෙව" යනාදි අවසානගාථාවෙන් පෙණේ. නුමුත් බොහෝ උත්සාහයෙන් පොත්හතරක් සොයා බැලූනුමුත් අපට ලැබුනේ ගාථා පන්සියසොළසකි. එබැවින් මෙහි ගාථාත්‍රයක ඌනත්වයක් පෙණේ. එය අතින් අතට ලිවීමෙන් කාලාන්තරයකදී අභාවයට ගියේදෝහෝයි සිතමු.

තවද අපේ මේ කෘත්‍යයේදී සාරමඤ්ජූසානම් ටීකාව ඉවහල්වූබව සතුටින් මතක්කරම්හ.

ලෝකධර්මයට අවිරුද්ධ පරිද්දෙන් මෙහි අපේ ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිත මන්දෝපක්ලේශස්ථාන ඇතිවියනොහැකි නොවෙයි, එබඳු තන්හි පණ්ඩිතයෝ සමාධිය භජනය කෙරෙත්වා.

මේවගට,

දූඹිගමුවේ සීලක්ඛන්ධ භික්ෂු

*D. Seelakkhandha.*

සන්න සහිත

# ශබ්දසාරත්ථ ජාලිනිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1. නමස්සිත්වාන සම්බුද්ධං සද්දසාරත්ථපාරගුං
ධම්මං සාරත්ථසම්භූතං ගණඤ්ච වියධාරණං.

2. පුබ්බාචරියසීහානං මතං නිස්සාය සාධුකං
වක්ඛාමි සද්දසාරත්ථජාලිනිං මතිවඩ්ඪනිං.

---

විවිධනයසමන්විතවූ විචිත්‍රාචාර්‍ය්‍ය සමයානුගත පරමවිචිත්‍රගම්භීරඥානාවගාහනයට සමර්ථවූ මේ ප්‍රකරණය කරණු කැමති ආචාර්‍ය්‍ය නාගිතස්ථවිරයෝ පළමු කොට රත්නත්‍රයප්‍රණාමය කරන්නාහු "නමස්සිත්වාන" යනාදිවූ මේ ප්‍රථමගාථාව උපන්‍යාස කළහ.

තන්ත්‍රාර්ථජිඥාසාභිලාෂී විඥයන් විසින් පළමු කොට සංඥා නිමිත්ත කර්තෘ පරිමාණ ප්‍රයොජනය යන මේ පඤ්ච පදාර්ථය දක්වියයුතු; එහි සංඥා වක්තෘ ශ්‍රොතෘ ලොකයාගේ සෞකර්‍ය්‍ය සඳහා කියයුතු, නිමිත්ත ද විඥජනසම්භාවනාව ග්‍රන්ථොත්පත්තිනිමිත්තපරිඥානමූලකව වන්නෙන් තදුත්පත්තිය සඳහා කියයුතු, ග්‍රන්ථකර්තෘ ද පුද්ගලප්‍රමාණිලොකයාහට ග්‍රන්ථවිෂයෙහි ගෞරවය පුද්ගලාධාරකව වන්නෙන් තදුත්පත්තිය සඳහා කියයුතු, පරිමාණ ද ප්‍රතිපාද්‍යප්‍රොත්සාහය සඳහා කියයුතු, ප්‍රයොජන ද තත්ප්‍රයොජනාපෙක්ෂකව පවත්නා ජනයන්ගේ ප්‍රවෘත්තිය සඳහා කියයුතු, මේ යථොක්තප්‍රකාරයෙන් සප්‍රයොජනවූ සංඥාදිපඤ්චකය දක්වන්නට පුරාතන ව්‍යාඛ්‍යානකාරාචාර්‍ය්‍යයෝද කීහු—"සංඥාං නිමිත්තං කර්තාරම්පරිමාණම්ප්‍රයොජනං ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණාම'පි බ්‍රූයාද්විචක්ෂණඃ" යි.

එහි සාමාන්‍යසංඥාය විශෙෂසංඥායයි සංඥා ද්විවිධ වේ ශබ්දසාර අර්ථසාරය හෙවත් මාගධීශබ්දශාස්ත්‍රය සාමාන්‍යසංඥාය 'සද්දසාරත්ථජාලිනී' යනු විශෙෂසංඥායි—ඒ "සද්දසාරත්ථජාලිනිං" යන්නෙන් දක්වනලදී; අනතර් නිමිත්තය බාහ්‍යනිමිත්තයයි නිමිත්ත ද්විවිධ වේ—"පුබ්බාචරියසීහානං මතං නිස්සාය සාධුකං වක්ඛාමි සද්දසාරත්ථජාලිනිං මතිවඩ්ඪනිං" යි ප්‍රතිඥාකරණ

යට මූලකාරණවූ කරුණාව අභ්‍යන්තරනිමිත්තනම, සත්පුරුෂවූ ශ්‍රොතෘජන යතම බාහ්‍යනිමිත්ත නම් වේ; කර්තෘහු තඹරට විජයපුරවිසූ විදිතධර්මවිනය ශබ්දශාස්ත්‍රඇති නාගිතස්ථවිරයෝය; පරිච්ඡෙදපරිමාණය ග්‍රන්ථපරිමාණයයි පරිමාණ ද්විවිධ වේ, ශබ්දසාරප්‍රකීර්ණකකාණ්ඩය අර්ථසාරප්‍රකීර්ණකකාණ්ඩය සන්ධිකාණ්ඩය නාමකාණ්ඩය කාරකකාණ්ඩය සමාසකාණ්ඩය තද්ධිතකාණ්ඩය ආඛ්‍යාතකාණ්ඩය කිතකකාණ්ඩය යනු පරිච්ඡෙදපරිමාණයයි "පඤ්චසතං දසං චෙව නව ගාථා පකාසිතා අඩ්ඪගාථා සොළසාති, වෙදිතබ්බා සුධීමතා." යි–කීබැවින් ගාථාවශයෙන් පන්සිය එකුන්විස්සක් හා අඩගාථාසොළොසක් දවේ. මේ ග්‍රන්ථපරිමාණයයි; මුඛ්‍යප්‍රයොජනය අනුෂඞ්ගිකප්‍රයොජනයයි ප්‍රයොජනය ද්විවිධ වේ–එහි මුඛ්‍යප්‍රයොජන නම් විචිත්‍රප්‍රකරණකරණයෙහි ශක්තිය අභිමතාර්ථප්‍රතිපාදනයෙහි ප්‍රසක්ත්‍යාගමානුගතකෞශල්‍යය යනමේ ආදියයි, නොහොත් ධර්මවිනයදෙක්හි කුලපුත්‍රයන් හික්මවීමද පරිවාසමානත්තාදිවිනයකර්මයෙහි තදනුරූපකර්මවාක්‍ය යොදා තත්තත්කර්මනිස්තරණ සාමර්ථ්‍යයද මුඛ්‍යප්‍රයොජනයි; අනුෂඞ්ගිකප්‍රයොජන නම්–ශබ්දලක්ෂණාවබොධයෙන් පදාවබොධයද පදාවබොධයෙන් පාල්‍යර්ථවිජානනයද තද්විජානනයෙන් සදුපායමනස්කාරයෙන් පිළිපැදීමද තත්ප්‍රතිපත්තියෙන් ක්ලෙශසංසාරයෙන් මුක්තියද යනමේයි.

යථොක්ත සංඥාදිපඤ්චපදාර්ථයද රත්නත්‍රයප්‍රණාම පූර්ව කොට දක්වනු කැමතිව මේ 'ශබ්දසාරාර්ථජාලිනී' නම් ප්‍රකරණයෙහි ප්‍රථම කොට "නමස්සිත්වාන සම්බුද්ධං" යනාදි ගාථාමය ආරම්භ කළෝ–මෙහි සමුදායාර්ථය අවයවාර්ථයයි අර්ථදෙකෙක් වේ, සමුදායාර්ථ නම් ඉෂ්ටදෙවතා නමස්කාරය හා සංඥාද්‍යර්ථපඤ්චකයයි, ඒ අර්ථපඤ්චකය ප්‍රථමයෙන් නිර්දිෂ්ටයි, අවයවාර්ථද ව්‍යුත්පත්ත්‍යර්ථය පදාර්ථයයි ද්විප්‍රකාර වේ, එහි ව්‍යුත්පත්ත්‍යර්ථ නම් "නමස්සිත්වාන" යනාදි තත් තත්පදයන්ගේ ව්‍යුත්පත්තිනිමිත්තාර්ථයි "නමස්සිත්වාන" යන තන්හි 'නමස්ස නමස්සනෙ' යන ධාතුයි කෘදන්තයෙන් නිෂ්පන්න පූර්වක්‍රියාවාචී නිපාතයි. නමස්සිත්වා නමස්සිත්වාන, "සම්බුද්ධං" යන තන්හි–සංපූර්වවූ 'බුධාවගමනජාගරණවිකසනයෙසු' යන ධාතුයි, කර්තෘසාධනයෙහි නිෂ්පන්න කෘදන්තයෙන් කර්මකාරකයි, සං සයමෙව අබුජ්ඣීති සයමෙව පබුජ්ඣීති සයමෙව විකසිතොති වා සම්බුද්ධො–තං සම්බුද්ධං, "සද්දසාරත්ථපාරගුං" යන තන්හි 'සද්ද සොසනෙ' යන ධාතුය 'සර ගතිම්හි' යන ධාතුය 'අර ගතිම්හි' යන ධාතුය පාරශබ්ද පූර්වවූ 'ගමු ගතිම්හි' යන ධාතුය කෘදන්තයෙන් කර්මධාරය සමාසය තත්පුරුෂ සමාසයයි; සද්දීයති උච්චාරියතීති සද්දො, සරති ගච්ඡති එතෙනාති සාරො, අරීයති ඤායතීති අත්ථො, සාරො ච සො අත්ථො චාති සාරත්ථො, සද්දානං සාරත්ථො සද්දසාරත්ථො; මෙහි අර්ථශබ්දය හා යුක්තවූ සාර ශබ්දය අභෙදොපචාරයෙන් "සද්ද" ශබ්දය හා යොදනබව දතයුතු, මේ

ප්‍රයොගයද "තස්මා ලොභං ච දොසං ච මොහජංචාපි විද්දසු" යනාදී බුද්ධ දෙසිතපාලිය මෙනි–මේ පාලියෙහි 'මොහජ' ශබ්දයෙහි මෙන් "ලොභ දොස" ශබ්දමය හා 'ජ' ශබ්ද යොගය වනබව දතයුතු; නොහොත් සුප්‍රයුක්ත ශබ්දයෙන් සාරාර්ථප්‍රතීතිය වේ දුෂ්ප්‍රයුක්ත ශබ්දයෙන් නිස්සාරාර්ථප්‍රතීතිය වේ එහෙයින් සාරාර්ථනිර්දේශ සඳහා කියන ශබ්දය සාරශබ්දයක්ම වන බැවින් ඒ අධ්‍යාහාර වේ එහෙයින් අත්ථශබ්දයා හා යුක්තවූ සාරශබ්දය "සද්ද" ශබ්දයෙහි අධ්‍යාහාරව යෙදෙන පරිද්දෙන් දක්වනලද්දයි සිතිය යුතු; පාරමගමීති පාරගූ, සද්දසාරත්ථානං පාරගූ සද්දසාරත්ථපාරගූ, තං සද්දසාරත්ථපාරගුං–මෙය ටීකාකාරයන් විසින් මෙසේ වර්ණනාකරණලදී, "තත්ථ සද්දතී සොතවිඤ්ඤෙය්‍යභාවං ගච්ඡති උච්චාරීයතීති වා සද්දො, උතුජො චිත්තජොච සද්දො, තත්ථ පච්ඡිමො ඉධාධිප්පෙතො, සො ච මුනින්දමුඛම්බුජසම්භූතො උපාදායරූපසඞ්ඛාතො සද්දො, සරති ගච්ඡති පයොජනං එතෙනාති සද්දො, සාරෙති උපලබ්භතීති වා, සාරො, මණිසාරදාරුසාරාදයො සද්දෙසු සාරො වියාති සද්දසාරො, සද්දානං සාරොතිපි සද්දසාරො, එවං හි සති සාරසද්දො උත්තමපරියායො යථා සාරපුරිසොති, අසති භවතීති අත්ථො, අරීයති ඤායතීති අත්ථො වා, අත්ථානං වා සාරොති අත්ථසාරො, සද්දසාරො ච අත්ථසාරො ච සද්දසාරත්ථා, එකදෙසසරූපෙකසෙසොයං යථා කායවචීවිඤ්ඤත්තීති (එවමාදි)" මෙහි "සද්දසාරත්ථ" ශබ්දය කායවචීවිඤ්ඤත්ති ශබ්දය මෙන් එකදෙසසරූපෙකසෙසයයි කියනලදී.

"ධම්මං" යන තන්හි 'ධර ධාරණෙ' යන ධාතුය කර්තෘසාධනයෙහි නිෂ්පන්න කෘදන්තයෙන් කර්මකාරකයි–ධාරෙතීති ධම්මො, තං ධම්මං; "සාරත්ථසම්භූතං" යන තන්හි 'සර ගතිම්හි' යන ධාතුය 'අර ගතිම්හි' යන ධාතුය සංපූර්වවූ 'භූ සත්තායං' යන ධාතුය කෘදන්තයෙන් කර්මධාරය සමාස හා තත්පුරුෂසමාසයි කර්මයෙහි විතීයායි–සම්භවීති සම්භූතො, සාරො ච සො අත්ථො චාති සාරත්ථො, සාරත්ථෙන සම්භූතො සාරත්ථසම්භූතො, තං සාරත්ථසම්භූතං; "ගණං" යන තන්හි 'ගණ සඞ්ඛ්‍යානෙ' යන ධාතුය කර්මසාධනයෙහි නිෂ්පන්න කෘදන්තයෙන් කර්මයෙහි විතියායි–ගණීයතෙති ගණො, අරියසඞ්ඝො; 'ච' යනු සමුච්චයාර්ථයෙහි නිපාතයි; "මයධාරණං" යන තන්හි 'ධර ධාරණෙ' යන ධාතුය කෘදන්තයෙන් තද්ධිත හා තත්පුරුෂ සමාසයි කර්මයෙහි විතීයායි විජානං සමූහො මයං, මයං ධාරෙතීති මයධාරණං–කාන්තාරි යුප්පච්චයො.

"පුබ්බාචරියසීහානං" යන තන්හි 'පුබ්බ නිවාසෙ' යන ධාතුය ආ පූර්වවූ චර ගතිම්හි, යන ධාතුය 'හිංස හිංසායං' යන ධාතුය කෘදන්තයෙන් තත්පුරුෂ සමාසය හා කර්මධාරය සමාසයි සම්බන්ධයෙහි ෂෂ්ඨීයි–අපුබ්බීති පුබ්බො, ආචරීයතෙති ආදරෙන චරිතබ්බොති ආචාරයති උපනීයති අජ්ඣාපයති සිස්සමිතිවා ආචරියො, පුබ්බෙ භවා ආචරියා පුබ්බාචරියා, හිංසතීති සීහො, සීහා

ඉව සීහා පුබ්බාචරිය එව සීහා පුබ්බාචරියසීහා, තෙසං පුබ්බාචරියසීහානං; "මතං" යනතන්හි 'මන ඤාණෙ' යන ධාතුය කර්මසාධනයෙහි නිෂ්පන්න කෘදන්තයෙන් කර්මයෙහි වීත්යාසි—අමඤ්ඤිත්ථාති මතො, තං මතං, "නිස්සාය" යනතන්හි නිපූර්වවූ සිසෙවනෙ යනධාතුය පූර්වක්‍රියාවාචී කෘදන්තනිපාතයි; "සාධුකං" යන තන්හි 'සාධ සංසිද්ධියං' යන ධාතුය ක්‍රියාවිශෙෂණත්වයෙන් කෘදන්තයෙන් වීත්යාසි—සාධයතීති සාධු සාධු එව සාධුකං, "වක්ඛාමි" යන තන්හි වච වියත්තියං වාචායං, යන ධාතුය භවිෂ්‍යත්‍ය විභක්තියෙන් කර්තෘසාධනයෙහි නිෂ්පන්න පරස්මෛපදයෙන් උත්තමපුරුෂෛකවචනයි; "සද්දසාරත්ථජාලිනිං" යන තන්හි 'ජල සංවරණවඤ්චාදසාතෙසු' යන ධාතුය කෘදන්තයෙන් හා තද්ධිතයෙන් තත්පුරුෂ සමාසය හා කර්මධාරය සමාසයි, ජල යන්ති ජාලං තමෙත්ථ අත්ථීති ජාලී, ජාලී එව ජාලිනී, සද්දසාරත්ථා එව ජාලිනී සද්දසාරත්ථජාලිනී, සද්දසාරත්ථා එව ජාලා වියාති වා සද්දසාරත්ථජාලිනී, තං සද්දසාරත්ථජාලිනිං, "මතිවඩ්ඪනිං" යන තන්හි 'මන ඤාණෙ' යන ධාතුය 'වඩ්ඪ වඩ්ඪනෙ' යන ධාතුය කෘදන්තයෙන් තත්පුරුෂසමාසයි—මතිං වඩ්ඪතීති මතිවඩ්ඪනී, තං මතිවඩ්ඪනිං.

## දූන් පදාර්ථ කියනු ලැබේ.

සබුද්ධං ධම්මඤ්ච ගණඤ්ච නමස්සිත්වාන මතං නිස්සාය සද්දසාරත්ථජාලිනිං වක්ඛාමි යනු මෙහි වාක්‍යයොජනායි.

කිදිසං සබුද්ධං ධම්මඤ්ච ගණඤ්ච නමස්සිත්වාන කෙසං මතං නිස්සාය කිං සාධුකං සද්දසාරත්ථජාලිනිං කථං වක්ඛති? යන මේ ප්‍රශ්නයෙහි "සද්දසාරත්ථ පාරගුං" යනාදි කීහු.

1, 2. සද්දසාරත්ථපාරගුං, ශබ්දයන් සම්බන්ධිසාරාර්ථයන්ගේ පාරප්‍රාප්තවූ හෙවත් ශබ්දසාර අර්ථසාරනැමැති සමුද්‍රයෙහි පරතෙරට ගියාවූ නොහොත් උත්තමවූ ශබ්දාර්ථ දෙදෙනාගේ කොටිප්‍රාප්තවූ; (ශබ්දසාර අර්ථසාර දෙදෙනාගේ පරතෙරට ගියහෙයින් "සද්දසාරත්ථපාරගූ" නම්වූයයි සේයි) සබුද්ධං ච, සම්‍යක්සම්බුද්ධයන් වහන්සේද; සාරත්ථසම්භූතං, සාරාර්ථයෙන් හෙවත් ප්‍රතිවෙධධර්මයෙන් හටගත්තාවූ හෙවත් සාරාර්ථ ව පහළවූ; ධම්මංච, (සපර්‍යාප්තික නවලොකොත්තර) ධර්මයද; වයධාරණං, (ශබ්දසාර අර්ථසාර) දෙක දරන්නාවූ; ගණංච, ආර්‍ය්‍යසඞ්ඝයාද; නමස්සිත්වාන (භක්ති ශ්‍රද්ධාදීන්ගෙන්) වැඳ; පුබ්බාචරියසීහානං (ගම්භීරඥානාදි ගුණයන් කරණකොටගෙණ පරවාදීන් විසින් කම්පා කොට ලියනොහැකිහෙයින්) සිංහසමාන පූර්වාචාර්‍ය්‍යයන්ගේ නොහොත් ශ්‍රෙෂ්ඨවූ පූර්වාචාර්‍ය්‍යයන්ගේ; මතං, මතය; නිස්සාය, ඇසුරු කොටගෙණ; මතිවඩ්ඪනිං, ප්‍රඥාවර්ධනය කරන්නාවූ; සද්දසාරත්ථජාලිනිං, ශබ්දසාරාර්ථජාලිනී නම් ප්‍රකරණයක්; සාධුකං, මනාකොට; වක්ඛාමි, කියන්නෙමි; (මෙහි ශබ්දසාරය පර්‍ය්‍යාප්තිධර්මයයිද අර්ථසාරය ප්‍රතිවෙධධර්මයයිද කියනලදී.)

මෙහි පූර්වගාථායෙන් ඉෂ්ටදෙවතා නමස්කාර සංඛ්‍යාතය ඒ පූජ්‍යපූජා විශේෂා දක කුශලචේතනායෙන් විධ්වස්තාශේෂක්ලේශයන් ඇති චිත්තසන්තානයෙහි භවාන්තරයෙහිදු කරණලද අන්තරායකර ධර්මයන් ප්‍රත්‍යය වෛකල්‍යකරණයෙන් ප්‍රතිබාහනය කොට තද්හේතුකවූ භයාද්‍යන්තරායනිවර්තනයෙන් සප්‍රාරබ්ධශාස්ත්‍රය නිර්විඝ්නයෙන් පරිසමාප්තියට පැමිණෙන පිණිසයි.

මෙහි පූජ්‍යයෝ නම් බුද්ධාදි රත්නත්‍රයයි, ඒ රත්නත්‍රයට පූජා නම් ආමිෂ ප්‍රතිපත්තිවශයෙන් ද්විප්‍රකාර වේ; එහි පුෂ්පගන්ධාදීන්ද චතුර්විධප්‍රත්‍යයෙන්ද බුද්ධාදීන්ට කරණ සත්කාර ආමිෂපූජා නම් වේ; අභිවාදන ශරණගමනාදි ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රතිපත්තිපූජා නම් වේ; මෙහි ප්‍රතිපත්ත්‍යෙකදේශවූ පූජ්‍යනාමෝ ස්තුතිප්‍රණාමවශයෙන් ද්විප්‍රකාර වේ; එහි ස්තුති භගවත්හට හේතුඵලසත්වෝපකාරවශයෙන් ත්‍රිවිධාකාරයෙන් කරණලදි, එහි හේතු සම්පත්තිනම් මහාකරුණාසමායෝගය බෝධිසම්භාරසම්භරණයි, ඵලසම්පත්ති නම් ඥාන ප්‍රහාණ ආනුභාව රූපකායසම්පද්වශයෙන් චතුර්විධ වේ, එහි සර්වඥතාඥානයට පිහිටවූ මාර්ගඥානයද එම මුල් කොටඇති චතුර්වෛශාරද්‍යාදි ඥානයෝද ඥානසම්පත් නම් වේ, සවාසනාසකලක්ලේශයන්ගේ අත්‍යන්තානුත්පාදස්වරූපබවට පැමිණීම ප්‍රහාණසම්පත් නම් වේ; කැමති කැමති වස්තූන් ඉපදවීමෙහි ඉසුරුබව ආනුභාව සම්පත් නම් වේ, සකල ලෝක නයන රසායනවූ ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජනයෙන් සමලඞ්කෘතවූ ආත්මභාවය තෙමේ රූපකාය සම්පත් නම් වේ, සත්වෝපකාර සම්පත් නම් ආශය ප්‍රයෝගවශයෙන් ද්විවිධ වේ,—එහි දෙවදත්තාදි නිත්‍යවිරෝධීසත්වයන් කෙරෙහිදු නිත්‍යයෙන් හිතාධ්‍යාශය ඇතිබවද නොමුහුකල ඉඳුරන් ඇති භද්‍රජිත්ස්ථවිරාදීන්ගේ ඉන්ද්‍රියපරිපාකකාලාගමයද ආශය නම් වේ, මෙයින් පිටත් සෙසු සත්වයන්ට ලාභසත්කාරාදියෙහි නිරපේක්ෂ සිත්ඇති බුදුන්ගේ යානත්‍රය මුඛයෙන් සර්වදුඃඛනෛර්යානිකධර්මදේශනාව ප්‍රයෝග නම් වේ; මේ සකල සම්පත් සර්වශාස්ත්‍රඥ කවිවරයන් විසින් ග්‍රන්ථනිර්මාණයෙහි දක්ෂාභිෂෙක ඇති ග්‍රන්ථකාරාචාර්යවරයන් විසින් කිසිතැනෙක තදනුරූපවිශේෂණ ප්‍රකටකිරීමෙන් විස්තරවශයෙන්ද කිසිතැනෙක සංග්‍රහමුඛයෙන් සංක්ෂේපයෙන්ද නිර්දිෂ්ටයි, මෙහි මේ ආචාර්යයන් විසින් "සම්බුද්ධං සද්දසාරත්ථපාරගුං" යන පදවයෙන් සංගෘහිත කොට සර්වසම්පත් නිර්දිෂ්ටයි' යම්සේ සම්බුද්ධපදාර්ථයෙහි ම යථෝක්ත සර්වසම්පද් අනූනව ලැබේද එසේ හෙයින් සම්බුද්ධපදාර්ථය මුඛ්‍ය කොට "සම්බුද්ධං සද්දසාරත්ථපාරගුං" යන්නෙන් යථෝක්ත සර්වසම්පද් සම්පූර්ණයෙන් නිර්දිෂ්ටකලබව සිතියයුතු, එහෙයින් ආගමයුක්තියෙන් හා තත් තන්නිර්දේශානුසාරයෙන්ද විස්තරවශයෙන් තත්පරිඥානය කටයුතු.

මෙතෙකින් ශබ්දචාරය නොඉක්මවා ප්‍රණාමසහිත පූර්වපඤ්චකය දක්වා දැන් තමන් විසින් ප්‍රතිඥාතශාස්ත්‍රය දක්වනු සඳහා "කෙවලං" යනාදිය ආරබ්ධයි.

3. කෙවලං ඉතිසද්දෙනාමිස්සො අත්ථපදත්ථකො
ඉතිසද්දෙන චෙ යුත්තො හවෙ සද්දපදත්ථකො.

4. පුරිසිත්ථිචිත්තසද්දා පුරිසාදි දබ්බවාචකා
පුරිසො'ත්‍යාදි වුත්තෙ තු සද්දොයෙව පදත්ථකො.

---

3–ඉති සද්දෙන, (අර්ථවිපර්‍ය්‍යාශ කරන්නාවූ) ඉති ශබ්දයා හා; අමිස්සො, සම්මිශ්‍රනුවූ; (සම්බන්ධනැති) කෙවලං, හුදෙක්; (අතිශයිනි) අත්ථපදත්ථකො, (පදාර්ථාවබොධයඇති ශබ්දප්‍රයොගයක් වේද එය) අර්ථපදාර්ථකනම්; චෙ, ඉදින්; ඉතිසද්දෙන, අර්ථවිපර්‍ය්‍යාශකරණ ඉතිශබ්දයා හා; යුත්තො, යෙදුනාවූ යම් ශබ්දයක්; හවෙ, වීනම්; සද්දපදත්ථකො, ඒ ශබ්දපදාර්ථක නම්.

පදාර්ථාවබොධය කරන්නාවූ ශබ්දප්‍රයොගය කෙවලවූ අර්ථපදාර්ථකනම්. එය අර්ථවිපර්‍ය්‍යාශ කරන්නාවූ ඉතිශබ්දයා හා අමිශ්‍රයි. යම් ශබ්දප්‍රයොගයක් යථොක්ත ඉතිශබ්දය හා යුක්තවේ නම් ඒ ශබ්දපදාර්ථකනම්, ඉතිශබ්දය විපර්‍ය්‍යාශනිදර්ශනහෙත්වාදි අනෙකාර්ථයෙහි වැටේ.

එහෙයින් කියනලදී.

"ඉතිරර්ථවිපර්‍ය්‍යාශෙ දෘෂ්ටෙ හෙත්විදම'ර්ථයොඃ
ආද්‍යර්ථෙ ච ප්‍රකාරාර්ථෙ තථාවච්ඡෙදනෙ'පිච" යි.

## දැන් ඔවුන්ට උදාහරණ දක්වත්.

4. පුරිසිත්ථිචිත්තසද්දා–පුරිස, පුරිසශබ්දය; ඉත්ථි, ඉත්ථිශබ්දය; චිත්තසද්දා, චිත්තශබ්දය යන මොහු; (පදාර්ථවිපර්‍ය්‍යාශ කරණ ඉතිශබ්දයහා මිශ්‍රනුවූවෝ) පුරිසාදිදබ්බවාචකා, පුරුෂාදි ද්‍රව්‍යවාචකයහ; පුරිසො ඉති ආදිවුත්තෙතු, පුරිසො ඉති යනාදි වශයෙන් කීකල්හි; සද්දො එව, ශබ්දයම; පදත්ථකො, පදාර්ථ ඇත්තේත්ය හෙවත් ශබ්දපදාර්ථක නම් වේ, (පුරිසිත්ථි චිත්තශබ්ද යෝ වූකලී පදාර්ථවිපර්‍ය්‍යාශයෙහි වැටෙන ඉතිශබ්දයා හා සම්මිශ්‍රයක්නැති කල්හි පුරුෂාදි ද්‍රව්‍යවාචකයහ. 'පුරිසො ගච්ඡති ඉත්ථි ගච්ඡති චිත්තං පස්සති යනාදිය මෙනි, 'පුරිසොති' යි කීකල්හි වනාහි ශබ්දපදාර්ථයම කියනලද්දේ වේ, 'පුරිසොති සත්තුනිදස්සනමෙතං, යනාදිය මෙනි.

යටකී පරිද්දෙන් පදාර්ථ විපර්‍ය්‍යාශ ආද්‍යර්ථ ප්‍රකාර අවධාරණ හෙතු නිදර්ශන පරිසමාප්ත්‍යාදි අනෙකාර්ථයෙහි වැටෙන ඉති ශබ්දය විපර්‍ය්‍යාශාර්ථයෙහි වැටෙනකල ශබ්දපදාර්ථකයි හේ නිපාතයක් මෙන් දක්කයුතු ඇයිද නෙරුත්තිකාදීන් හා යුක්තවූයේ අර්ථපදාර්ථකයයිද ආචාර්‍ය්‍ය ධර්මපාල මහාස්වාමි පාදයන් විසින් කියනලදී.

5. වාචකො ලක්ඛණිකො ච ඛ්‍යඤ්ජකො'ති තිධා මතො
සද්දො ඛ්‍යාපාරභෙදෙන සද්දසත්ථඤ්ඤූහි සරූපතො.

6. මුඛ්‍යොව වාචකො නාම උපචාරො ලක්ඛණිකො
සපිච්ඡිතත්ථො ඛ්‍යඤ්ජකො වාච්චලක්ඛියබ්‍යඞ්ගත්ථො.

7. ගඞ්ගායෙත්ථ පවාහො'ති වාච්චත්ථො'ති උදීරිතො
ගඞ්ගාතටං රූපතො ලක්ඛ්‍යා ආසිංසො බ්‍යඞ්ගියො මතො.

---

"යො පදත්ථවිපල්ලාසභූතත්ථෙනෙතිනා සහ
යුජ්ජතෙ සො ච නිපාතො'ව සො'ව සද්දපදත්ථකො
යො භෙදවත්ථාදිනා යුජ්ජතෙ සො'ව අත්ථපදත්ථකො
කෙවලො ඉති සො මෙධා සද්දෙ භෙදවත්ථබොධකො" යි.

මෙසේ මහත්වූ විෂය ඇති සර්වව්‍යාපකශබ්දලක්ෂණය දක්වා දැන් අන්‍යවූ ශබ්දලක්ෂණයක් දක්වනු පිණිස 'වාචකො' යනාදිය ආරබ්ධයි.

5. වාචකො, වාචකයද; ලක්ඛණිකො ච, ලාක්ෂණිකයද; ඛ්‍යඤ්ජකො ච ඉති, ව්‍යඤ්ජකයදැයි; ඛ්‍යාපාරභෙදෙන, ව්‍යාපෘතිභේදයෙන් සාමර්ථ්‍යවිශෙෂයෙන්; සරූපතො, ස්වරූපවශයෙන්; සද්දො, ශබ්දයතෙම; තිධා, තුන්පරිද්දෙකින්; සද්දසත්ථඤ්ඤූහි, ශබ්දශාස්ත්‍රඥයන් විසින්; මතො, දන්නාලද්දේය.

6. මුඛ්‍යො එව, ප්‍රධානාර්ථය කියනශබ්දයම; වාචකො නාම, වාචක නම් වේ; උපචාරො, උපචාරවිවාචකවූයේ; ලක්ඛණිකො, ලාක්ෂණිකනම්; සපිච්ඡිතත්ථො, සාපෙක්ෂිතාර්ථඇත්තේ හෙවත් ප්‍රාර්ථිතවූ පරිදිඅර්ථ ඇත්තේ; ඛ්‍යඤ්ජකො, ව්‍යඤ්ජක නම් වේ; වාච්චලක්ඛියබ්‍යඞ්ගත්ථො—වාච්ච, යථොක්තවාචකයාගේ අර්ථය ශබ්දයෙන් දතයුතු පදාර්ථයයි; ලක්ඛිය, ලාක්ෂණිකයාගේ අර්ථය, උපචාරයෙන් දතයුතු අර්ථයයි; බ්‍යඞ්ගත්ථො, ව්‍යඤ්ජකයාගේ අර්ථය ආශිංසනයෙන් දතයුතු අර්ථයයි යනා භෙදයෙන් අර්ථයද ත්‍රිවිධ වේ.

මේ ගාථාව වෘත්තිභඞ්ග යි එසේහෙයින් මෙපරිද්දෙන් යෙදියයුතු.

"මුඛ්‍යො'ව වාචකො නාම ලක්ඛණිකො'පචාරකො
ඛ්‍යඤ්ජකො ච සපිච්ඡත්ථො වාච්චබ්‍යඞ්ගකලක්ඛියා"

**"ගඞ්ගායං" යනාදීන් උදාහරණ දක්වත්.**

7. ගඞ්ගායං ඉති එත්ථ, ගඞ්ගායං යන මේ ප්‍රයොගයෙහි; පවාහො, ජලප්‍රවාහය තෙම; වාච්චත්ථො ඉති, වාච්‍යාර්ථයයි; උදීරිතො, කියනලදී; ගඞ්ගාතටං, ගඞ්ගාභාවය; රූපතො, සමීපයෙහි හැසිරෙණහෙයින්, (සමීපයෙහි පවත්නාහෙයිනි) ලක්ඛ්‍යා, ලක්ෂ්‍යාර්ථ නම; ආසිංසො, (මේ පෙදෙස ගඟ වේවයි යන) පැතීම; බ්‍යඞ්ගියො, ව්‍යඞ්ගාර්ථයයි; (ව්‍යඞ්ගො එව බ්‍යඞ්ගියො) මතො, දන්නාලද්දේය.

8. මුඛ්‍යාමුඛ්‍යවසෙනෙව සද්දො ද්විධා පකාසිතො
තත්‍ථ මුඛ්‍යො සභාවො තු ඉතරො වඤ්චකො මතො.

9. මුඛ්‍යො එකවිධො තත්‍ථ අමුඛ්‍යො දසධා මතො
හෙතු ඵලො සද්දිසො ච ඨානං ඨානී ගුණෝ'පිච.

10. එකදෙසො සමීපො ච තබ්ධම්මො භෙදකො'පිච
ගුළො සෙම්හො සෙම්හගුළො සීහො'යං මාණවො'පිච
මඤ්චා කොසන්ති කුන්තාපචරා'ති ච යථාක්කමං.

11. නීලො පටො සමුද්දො ච ගඞ්ගා සසවිසානකං
සනිදස්සනධම්මා'ති ඉදං තෙසං නිදස්සනං.

---

මෙසේ සර්වව්‍යාපක ශබ්දලක්‍ෂණයක් දක්වා දැන් තුන්වෙනිවූ ශබ්දලක්‍ෂණයක් දක්වනු සඳහා "මුඛ්‍යාමුඛ්‍යවසෙන" යනාදිය ආරබ්ධයි

8. සද්දො, (සියලුම) ශබ්දයතෙම; මුඛ්‍යාමුඛ්‍යවසෙන එව, ප්‍රධාන අප්‍රධානවශයෙන්ම; ද්විධා, දෙපරිද්දෙකින්; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය; (ප්‍රකාශ කටයුතුයි) තත්‍ථ, ඔවුන් අතුරෙන්; සභාවො තු, ස්වභාව වාචක ශබ්දය වනාහි; මුඛ්‍යො, මුඛ්‍ය නම් වේ; ඉතරො, අනික, (අමුඛ්‍යය) වඤ්චකො, වඤ්චකයයි; මතො, දන්නාලද්දේය.

තත් ප්‍රභෙද දක්වනු පිණිස "මුඛ්‍යො" යනාදිය ආරබ්ධයි.

9. තත්‍ථ, ඔවුන්අතුරෙන්; මුඛ්‍යො, ප්‍රධානවූ ශබ්දයතෙම; එකවිධො, එකවිධ වේ; අමුඛ්‍යො, අප්‍රධානවූ ශබ්දයතෙම; දසධා, දශප්‍රකාරයකින්; මතො, දන්නාලද්දේය; (ඔහු කවරහුදයත්) හෙතු, හෙතූපචාරයද; ඵලො, ඵලොපචාරයද; සද්දිසො ච, සදෘශොපචාරයද; ඨානං, ස්ථානොපචාරයද; ඨානී, ස්ථාන්‍යුපචාරයද; ගුණෝ අපිච, ගුණොපචාරයද;—10—එකදෙසො, එකදෙශොපචාරයද; සමීපො ච, සමීපොපචාරයද; තබ්ධම්මො, තබ්ධම්මොපචාරයද; අභෙදකො අපිච, අභෙදොපචාරයද; (යන මොහුයි)—(අතත් ස්වභාවෙ තත්ස්වභාවාරොපණමුපචාරඃ, ඒ ස්වභාව නැති දෙයෙහි ඒ ස්වභාවය පැමිණවීම උපචාරනම්, ඒ හෙතුවාදි දශොපචාරයයි) ඊට උදාහරණ දක්වන්නෝ "ගුළො සෙම්හො" යනාදිය කීහ;—ගුළො සෙම්හො, ගුළො සෙම්හො යනුද; සෙම්හගුළො, සෙම්හගුළො යනුද; සීහොයං මාණවො අපිච, සීහොයං මාණවො යනුද; මඤ්චා කොසන්ති, මඤ්චා කොසන්ති යනුද; කුන්තාපචර ඉතිච, කුන්තාපචර යනුද;—11—නීලො පටො, නීලො පටො යනුද; සමුද්දෙ ච, සමුද්දෙ යනුද; ගඞ්ගා, ගඞ්ගා යනුද; සසවිසානකං, සසවිසානකං; යනුද; සනිදස්සනධම්මා ඉති, සනිදස්සනධම්මා යනුද; තෙසං, ඔවුන්ට; යථාක්කමං, පිළිවෙළින්; ඉදං නිදස්සනං, මේ නිදර්ශනයි.

ඒ දශොපචාරොදාහරණ අතුරෙන් "ගුළො සෙම්හො" යනු හෙතූපචාරයට උදාහරණයි. 'ගුළො' යන හෙතුව 'සෙම්හො' යන ඵලයෙහි පවත්නාහෙයින් ශ්ලෙෂ්මයට කරුණුවූ ගුඩය 'ගුළො සෙම්හො' යි ආරොපණය කෙරෙයි–'සෙම්හො ගුළො' යනු ඵලොපචාරයයි. මෙහි ශ්ලෙෂ්මය ඵලයයි ඒ ශ්ලෙෂ්මසඞ්ඛ්‍යාත ඵලය ගුඩ සඞ්ඛ්‍යාත හෙතුයෙහි ආරොපණය කෙරෙයි–'සීහොයං මාණවො', යන්නෙන් මාණවකයා ආකාරාදීන් කරණකොට ගෙණ සිංහයාට සමානත්වයෙහි පවත්නා බැවින් මේ මාණවකයා සිංහයායයි කියනු ලැබේ, මේ සදෘශොපචාරයයි. 'මඤ්චා කොසන්ති, යන්නෙන් ස්ථානවාචකවූ මඤ්චශබ්දයෙන් මඤ්චස්ථපුරුෂයෝ ගන්නාලැබෙත්නුයි ස්ථානොපචාරනම්–'කුන්තාපචර' යනු ස්ථාන්‍යුපචාරයයි 'කුන්තයන් පහකරව යි' කීකල්හි එහි පවත්නා යෂ්ට්‍යාදීහු ද උපචාරවශයෙන් ගන්නාලැබෙත්–'නීලො පටො, යනතන්හි නීලගුණය සම්බන්ධ නාමය ඒ ගුණවත් වස්ත්‍රයෙහි උපචාරවශයෙන් ගන්නාලැබේ. මේ ගුණොපචාරයයි–'සමුද්දො දිට්ඨො' යි කීකල චක්ෂුර්විෂයවූ එකදෙශමාත්‍රයක් කරණකොටගෙණ සකල සමුද්‍රය උපචාරවශයෙන් ගන්නාලදින් මේ එකදෙශොපචාරනම්–'ගඞ්ගායං ඝොසො' යි කීකල ගඞ්ගාසමීපයෙහි ගොපලුගම පවත්නාබව කියනලදින් සමීපොපචාරනම්–'සසවිසාණකං' යන්නෙන් සිව්පාවුන්ට බෙහෙවින් අංඇති බැවින් ඔවුන්ගේ ස්වභාවය සසකයා කෙරෙහි ආරොපණය කොට ඔහුට අං නැතත් තද්ධර්මවශයෙන් 'සසවිසාණකං, යි කියනලද්දේ තද්ධර්මොපචාරනම්–'සනිදස්සනධම්මා, යනතන්හි නිදර්ශනනම් වර්ණායතනයයි, ඒනිදර්ශන සහිතව පවත්නා ධර්මයන් අභෙදොපචාරයෙන් ගන්නාලදින් අභෙදොපචාරනම්–මෙසේ මෙහි උපචාරදශයක් කියනලදහ. ඇතම් ආචාර්යකෙණෙක් තෙළසක්ද කීහු

— එහෙයින් කියනලදී.

"සාමිප්පෙනෙකදෙසෙන සහිතට්ඨානපායිකා
තබ්ධම්මභෙදගුණතො ඵලතාදත්ථසාදිසා
සම්බන්ධතො පමෙය්‍යනොපචාරා හොන්ති තෙරස,,යි

මෙකියනලදතෙළසෙන් මෙහි බාහුල්‍යොපචාර තාදර්ථ්‍යොපචාර සම්බන්ධොපචාරතුණ නොකියනලදහ, 'නාගවනං ඛදිරවනං, යනාදිය බාහුල්‍යොපචාරයටනිදර්ශනයි, 'පදීපත්ථා මල්ලිකා පදීපො, යනාදිය තාදර්ථ්‍යොපචාරයට නිදර්ශනයි, 'රාජකීයො පුරිසො රාජායං, යනු සම්බන්ධොපචාරයට නිදර්ශනයි, බෙහෙවින් නාරුක්ඇතිවනය සෙසුරුක් ඇතත් නාගවෘක්ෂයන්ගේ බාහුල්‍යය ගෙණ 'නාගවන, යයි කියනුලැබේ, 'ඛදිරවනං, යනුද මෙසේමැයි, ප්‍රදීපය පිණිස යොදනලද කබල ප්‍රදීපයයි කියනුලැබේ; රජ්ජු සම්බන්ධ පුරුෂයාම රජයයි කියනුලැබේ.

12 අවයවෙ පවත්තො යො වොහාරො සමූහෙ කතො
තං යථා චෙ සමං චුණ්ණං සමත්ථිධවයවං මතං.

13. ආද්‍යන්තමත්තං දස්සෙත්වා මජ්ඣෙ පන අදීපනං
මජ්ඣෙ පෙය්‍යාලකං නාම ඉතො සෙසෙස්වයං නයො.

14. ආද්‍යන්තමජ්ඣපෙය්‍යාලං සබ්බපෙය්‍යාලකං තථා
පෙය්‍යාලන්තු චතුබ්බිධං තං විඤ්ඤූහි පකාසිතං.

---

දැන් අතිකුදු උපචාරනයක් දක්වත්.

12. අවයවෙ, අවයවයෙහි; පවත්තො, පැවත්තාවූ; යො වොහාරො, යම් ව්‍යවහාරයක් ඇත්තේද; (ඒ ව්‍යවහාරයතෙම) සමූහෙ, සමූහයෙහිද; කතො, කරණලද්දේය; (කවුරුතුයයි ජේයි) තංයථා චෙ, ඒකෙසේදයත්, සමං චුණ්ණං, සමං චුණ්ණං කියා වේ; ඉධ, මේඋදාහරණයෙහි; සමං ඉති; සමං යනපදය; අවයවං, අවයවයයි; මතං, දන්නාලදී; (දතයුතුයයි ජේයි)

චුණ්ණං, යනු සමූහයයි මෙහි ‘සමං, යන අවයවව්‍යවහාරය ‘චුණ්ණං, යන සමූහයෙහි උපචාරවශයෙන් පවත්නෙයි අවයවොපචාරයයි කියන ලදී.

මෙතෙකින් තුන්වෙනි උපචාරනය දක්වා දැන් පෙය්‍යාලනය දක්වනු සඳහා ‘ආද්‍යන්තමත්තං, යනාදි කියා.

13. ආද්‍යන්තමත්තං, ආදිඅන්තදෙකපමණක්; දස්සෙත්වා, දක්වා; මජ්ඣෙ පන, මධ්‍යයෙහි වනාහි; අදීපනං, නොදැක්වීම හෙවත් ප්‍රකාශනොකිරීම; මජ්ඣෙ, මධ්‍යයෙහි; පෙය්‍යාලකං නාම, පෙය්‍යාලකනම් වේ; (මධ්‍යපෙය්‍යාලකයයි) ඉතො, මෙයින්; සෙසෙසු, සෙසු ආදිඅන්තසර්වපෙය්‍යාලයෙහිදු; අයං නයො, මෙමක්‍රමය (දැක්කයුතු)යි;–එහි විභාග දක්වන්නෝ, ආද්‍යන්තමජ්ඣ, යනාදිය කියත්.

14. තං පෙය්‍යාලන්තු, ඒපෙය්‍යාලය වනාහි; ආද්‍යන්තමජ්ඣපෙය්‍යාලං, ආදියෙහි පෙය්‍යාලය අන්තයෙහි පෙය්‍යාලය මධ්‍යයෙහි පෙය්‍යාලය; තථා, එසේම; සබ්බපෙය්‍යාලකං, සර්වපෙය්‍යාලකයයි; චතුබ්බිධං, සිව්වැදෑරුම්ය යි විඤ්ඤූහි, ප්‍රාඥයන් විසින්, පකාසිතං, ප්‍රකාශකරණලදී.

එහි ආදිපෙය්‍යාලය නම් පූර්වපදය ප්‍රකාශ නොකරණ තැනි ‘දසෙත්‍ත භූත රූපං, යනාදිය මෙනි, අන්තපෙය්‍යාලය නම් අවශානපදය නොදැක්වීමයි, “සම්මාසම්බුද්ධං,, යනාදිය මෙනි, මධ්‍යයෙහි පෙය්‍යාලය නම් මධ්‍යපදය නොදැක්වීමයි, “පධානං පදහිත්වාන න සංසෙස්සාම සම්මුඛා ඉමං” යනාදිය මෙනි–සර්වපෙය්‍යාලය නම් පළමුවෙනි ගය කියා දෙවෙනි තුන්වෙනි ගයෙහි ආද්‍යවසානමධ්‍යපද ප්‍රකාශ නොකිරීමයි– “භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා, සබ්බබුද්ධානුභාවෙන සදා සුඛී භවන්තු තෙ,, සිද, ල–සබ්බධම්මානුභාවෙන සබ්බසඞ්ඝානුභාවෙන සදා සුඛී භවන්තුතෙ, යි

15. පාතුං අලන්ති පෙය්‍යාලං විත්ථාරෙතුං අලං'ථවා
පෙය්‍යාලස්ස වචනත්ථො වෙදිතබ්බො විභාවිනා.

16. තෙසු මජ්ඣිමගි පෙය්‍යාලෙ සොවා ලොවා ඨපීයතෙ
තං තං දිස්වා'ව විඤ්ඤෙය්‍යං පෙය්‍යාලම්පි සුධීමතා.

17 අයොගා අඤ්ඤයොගා ච අච්චන්තයොගතො තිධා
එවසද්දො භවතීති වත්තුං ජිඥති කාමතො.

---

යනමෙහි "භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා" යි යනපද 'ධම්මස ඞ්ඝ' යන පදයත් හාද කියයුතුයි. එහෙයින් 'සබ්බධම්මානුභාවෙන, සබ්බ සඞ්ඝානුභාවෙන' යි කියනලදින් සබ්බපෙය්‍යාලයයි කියනුලැබේ, ආදිපදයන් නොකියනලදින් ආදිපෙය්‍යාල නොවේදයත්, එය අර්ථවශයෙන් සම්බන්ධ නැතිබැවින් නොවේ, කුමක්හෙයින් අර්ථකථාවෙන් උදාහරණ නොකරණලදද? අන්‍යයන්ගේ ගම්භීරඥානයෙන් දැනගන්නාපිණිස පළමුවෙනි ගාථාවට ලක්ෂණවූවචනයෙන් ප්‍රකටවනබැවිනි.

මෙතෙකින් ලක්ෂණත් ස්වරූපත් දක්වා දැන් වචනාර්ථය දක්වනුපිණිස පාතුං අලන්ති, යනාදිය කියත්.

15. පාතුං, (ආද්‍යන්ත දෙකම දක්වා විස්තරකටයුතු අර්ථැතිපාඨය) පාලන ය කරන්නට, අලං ඉති, පොහොසත්නුයි, අථවා, නොහොත්; විත්ථාරෙතුං, (සංක්ෂිප්තපාඨය) විස්තාර කරන්නාට; අලං ඉති, පොහොසත්නුයි; පෙය්‍යා ලං; පෙය්‍යාල නමැයි; පෙය්‍යාලස්ස, පෙය්‍යාලශබ්දයාගේ; වචනත්ථො, වච නාර්ථය; විභාවිනා, විඥජනයා විසින්, වෙදිතබ්බො, දතයුතුයි.

මෙතෙකින් ලක්ෂණස්වරූපවචනාර්ථ දක්වා දැන් විශෙෂ සතවන ලක්ෂ ණ දක්වන්නෙනෝ, තෙසු, යනාදිය කියත්.

16 තෙසු, ඔවුන්අතුරෙන්, මජ්ඣිමගි පෙය්‍යාලෙ, මධ්‍යපෙය්‍යාලයෙහි; සො වා, සකාරය හෝ; ලො වා, ලකාරය හෝ; ඨපීයතෙ, තබනුලැබේ, තං තං පෙය්‍යාලං අපි, ඒ ඒ පෙය්‍යාලම; දිස්වා එව, දැකම; සුධීමතා, සුන්දරනුවන ඇත්තහු විසින්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

ඉක්බිති අවධාරණානය දක්වනු සඳහා 'අයොගා, යනාදිය ආරම්භකලෝ

17 අයොගා, අන්‍යකර්මයක් හා නොයෙදීම්වශයෙන්ද; අඤ්ඤයොගා ච, අන්‍ය කර්මයක් හා යෙදීම් වශයෙන්ද; අච්චන්තයොගතො, අත්‍යන්තයො ග වශයෙන්දැයියන; තිධා, තුන්ප්‍රකාරයෙන්; එවසද්දො; එවශබ්දය තෙම, භවති, වෙයි; ඉති ඒහෙයින්; කාමතො, වක්තෘහුගේ ඉච්ඡාවශයෙන්; වත්තුං, වක්නුව; ජිඥති, වෙනස් කෙරෙයි.

18. ගුණද්‍රබ්‍යක්‍රියානං වා ව්‍යවච්ඡේදවසා තිධා
තිස්සො ධනුබ්බරො එව කාළො එව ධනුබ්බරො,
අසෙව්ව කාකො සෙතො'පි ඉදං තෙසං නිදස්සනං.

19. දුවිධො වා'වධාරො සො සන්නිධාන * නිවත්තනතො
සන්නිධානං යුත්තං'ව පුරිසො වා 'තිමිතරො.

---

එවශබ්දය අයොගව්‍යවච්ඡේදකය අන්‍යයොගව්‍යවච්ඡේදකය අත්‍යන්තායොගව්‍යවච්ඡේදකයයි ත්‍රිවිධ වේ, එහි විශෙෂණයෙන් පරකොට යොදන ලද එවශබ්දය අයොගව්‍යවච්ඡේදක නම් විශෙෂ්‍යයෙන් පරකොට ප්‍රයොගකරණලද එවශබ්දය අන්‍යයොගව්‍යවච්ඡේදක නම් ක්‍රියායෙන් පරකොට ප්‍රයොගකරණලද එවශබ්දය අත්‍යන්තයොගව්‍යවච්ඡේදක නම් එහි අයොගව්‍යවච්ඡේදකය අන්‍යකර්මයක් හා යුක්ත නොවේ අන්‍යයොගව්‍යවච්ඡේදකය අන්‍යකර්මයක් හා යුක්ත වේ. අත්‍යන්තායොගව්‍යවච්ඡේදකය කෙවලයොගය වේ. එහෙයින් වක්තෘහුගේ විවක්ෂාවශයෙන් වස්තුව අවධාරණය කෙරෙයි.

එයම ව්‍යවහාරමාත්‍රයෙන් වෙන් කොට දක්වනු පිණිස 'ගුණද්‍රබ්‍යක්‍රියානං වා' යනාදිය කීවේ.

18 ගුණද්‍රබ්‍යක්‍රියානං වා, ගුණය ද්‍රව්‍යය ක්‍රියාය යනමොවුන්ගේ හෝ; ව්‍යවච්ඡේදවසා, නිර්ධාරණවශයෙන්; තිධා, තුන්ප්‍රකාරයෙකි, තිස්සො ධනුබ්බරො එව, තිස්සො ධනුබ්බරො එව යනුද; කාළො එව ධනුබ්බරො, කාළො එව ධනුබ්බරො යනුද; අසෙව්ව කාකො සෙතොපි, අසෙව්ව කාකො සෙතොපි යනුද; ඉදං, මේ; තෙසං, ඔවුන්ට; නිදස්සනං, නිදර්ශනයි.

ගුණය ද්‍රව්‍යය ක්‍රියාය යනමොවුන්ගේ නිර්ධාරණවශයෙන්ද එවශබ්දය ත්‍රිවිධයි ඊට උදාහරණ දක්වන්නෝ "තිස්සො ධනුබ්බරො එව" යනාදිය දැක්වූහු. "තිෂ්‍ය තෙමේ ධනුර්ධරයාමය" යි යන්නෙන් තිෂ්‍යයාගේ දුනු දැරීම විනා අන්‍යකර්මනිවාරණය කෙරෙයි එහෙයින් ගුණයෙන් ව්‍යවච්ඡේදය වේ. 'කාළ තෙමේම ධනුර්ධරයාය' යි යන්නෙන් ඒ දෙසෙහි අන්‍ය ද්‍රව්‍යනිවාරණය කොට හෙතෙමේ අන්‍යකර්මයොග ඇත්තේද වෙයි එහෙයින් ද්‍රව්‍යයෙන් ව්‍යවච්ඡේදයි 'ශ්වෙතකාකයෙකුදු ඇත්තේමය නැත්තේ නොවෙයි' කීමෙන් ක්‍රියායෙන් ව්‍යවච්ඡේදකය හඟවයි.

නැවතද එම විශෙෂ දක්වනු පිණිස 'දුවිධොවාවධාරො' යනාදිය කීහ.

19 අවධාරො, අවධාරණයතෙම; සන්නිධානනිවත්තනතො, සන්නිධාන නිවර්තනවශයෙන්; දුවිධො එව, දෙවැදෑරුම්ම වේ; සන්නිධානං, සන්නිධානාවධාරණය; යුත්තං එව, යුක්තං එව යනුයි; ඉතරො, අනික; (හෙවත් නිවර්තනාවධාරණය) පුරිසො එව ඉති, 'පුරිසො එව' යනුයි.

---

* "සන්නිධාන" ඇතම්.

20. උල්ලිඞ්ගවුත්තිසම්බන්ධවසෙන තිවිධො නයො
උද්ධං ලිඞ්ගෙ'තුල්ලිඞ්ගං ඉතිනා සහිතං මතං.

21. උද්දෙසං ලිඞ්ගමුල්ලිඞ්ගමිති ආචරියා පරෙ
ලක්ඛණෙ සති වුත්තීව වුත්තිනයො 'ව ගම්‍යතෙ.

22. අඤ්ඤාහරිත්වා සම්බන්ධො සම්බන්ධො'ති විධීයතෙ
උදාහරණමෙතෙසං පාකටං සබ්බසො සියා.

23. මිගපදෙ ඝිතනසන්තති තන්ත්‍රකො ච සිලෙසිකො
එකසෙසො පදීපො ච පධානො නානන්තරිකො.

24. සෙභුය්‍යාසන්නකො චෙව මහීරුහනයො'පිච
නිදස්සනොපලක්ඛණ නයභෙදාචනෙකධා.

---

දැන් අතිකුදු ශබ්දලක්ෂණයක් දක්වන්නෝ "උල්ලිඞ්ගවුත්ති" යනාදිය කියත්.

20 උල්ලිඞ්ගවුත්තිසම්බන්ධවසෙන—උල්ලිඞ්ග, උල්ලිඞ්ගය; වුත්ති, වෘත්තිය; සම්බන්ධවසෙන, සම්බන්ධය යනමොවුන්ගේ වශයෙන්; තිවිධො, තුන්වැදෑරුම්වූ; නයො, නයක්ද වේ; උද්ධං, වර්ණිතාර්ථසම්බන්ධ මතුඅර්ථය; ලිඞ්ගෙති, ප්‍රකාශ කෙරෙයි; ඉති, එහෙයින්; ඉතිනා සහිතං, ඉතිශබ්දයා හා යුක්තවූවර්ණය; උල්ලිඞ්ගං, උල්ලිඞ්ගයයි; මතං, දන්නාලදී.

21 උද්දෙසං, උද්දෙසියයුතුවූ; ලිඞ්ගං, අප්‍රකටඅවයවය; උල්ලිඞ්ගං ඉති, උල්ලිඞ්ගයයි; අපරෙ ආචරියා, අන්‍යාචාර්‍ය්‍යකෙණෙක් (කියත්;) ලක්ඛණෙ සති, සූත්‍රය ඇතිකල්හි; වුත්ති ඉව, සූත්‍රවිවරණය මෙන්; වුත්තිනයො එව, වෘත්තිනයම; ගම්‍යතෙ, හැඟේ.

22 අඤ්ඤාහරිත්වා, (අන්‍යවාක්‍යයක් හෝ පදයක් අමුතුවෙන්) ගෙණපා; සම්බන්ධො, බැඳීම; සම්බන්ධො ඉති, සම්බන්ධයයි; විධීයතෙ, කියනුලැබේ; එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණය; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; පාකටං සියා, ප්‍රකටවන්නේය; (එහෙයින් උදාහරණ නොකරමුයයි සේයි.)
තදනන්තරව මිගපදවලඤ්ජාදිනන්වැදෑරුම් නය දක්වනු පිණිස 'මිගපදෙ' යනාදිය ආරබ්ධයි.

23 මිගපදෙ, මිගපදවලඤ්ජනයද; ඝිතනසන්තති, ඝිතනසන්තතිනයද; තන්ත්‍රකො ච, තන්ත්‍රකනයද; සිලෙසිකො, සිලෙසිකනයද; එකසෙසො, එකසෙස නයද; පදීපො ච, ප්‍රදීපනයද; පධානො, ප්‍රධානනයද; නානන්තරිකො, නානන්තරිකනයද යෙවත් අව්‍යවච්ඡෙදනයද.

24 සෙභුය්‍ය, සෙභුය්‍යනයද; ආසන්නකො චෙව, ආසන්නකනයද; (සමීපනයයි) මහීරුහනයො අපිච, මහීරුහනයද; (අපිශබ්දයෙන් චන්ද්‍රකාන්ත

25. ආද්‍යන්තමෙව දීපෙත්වා මජ්ඣෙ පන අදීපනං
මිගපදවලඤ්ජෝ'ති වෙදිතබ්බො සුධීමතා.

26. එකොයෙව අනෙකත්ථං පරිදීපෙති සඤ්ඤිනියා
භින්නසඤ්ඤීති සො ඤෙය්‍යො සෙතො ධාවති තංයථා.

---

නය සූචිකාහත්ථනය දෙක කියනලදී) නිදස්සනොපලක්ඛණ, නිදර්ශන සඳ උපලක්ෂණ නයද්‍යයි කියා; නයභෙදතු, නයවිශෙෂයෝ වනාහි; අනෙකධා, අනෙකප්‍රකාරයහ.

මෙසේ ස්වරූප දක්වා දූන් ලක්ෂණ දක්වන්නාහු 'ආද්‍යන්තමෙව' යනාදී කීහු.

25 ආද්‍යන්තං එව, ආදිඅන්තදෙකපමණක්ම; දීපෙත්වා, ප්‍රකාශ කොට; මජ්ඣෙ පන, මධ්‍යයෙහි වනාහි; අදීපනං, නොදක්වීම; මිගපදවලඤ්ජෝ ඉති, මිගපදවලඤ්ජනයයයි; සුධීමතා, සුධීමත්තු විසින්; වෙදිතබ්බො, දතයුතු.

"කරුණාවිය සත්තෙසු පඤ්ඤාය යස්ස මහෙසිනො" යන්න මෙහි, එහි කරුණා ප්‍රඥාදෙක ගැණීමෙන් මධ්‍යයෙහි සියලු බුද්ධගුණයන් ගන්නාලදින් මේ මිගපදවලඤ්ජ නයයි, ඒ එසේමය, යම්සේ ගලපිට ගිය මුවාගේ පා තැබූතැන නොපෙණේද උභයපාර්ශ්වයෙහි සමීපභූමියෙහිම පෙණේද ඒ දර්ශනයෙන්ම මේ මෘගතෙමේ ගලපිට මේ මාර්ගයෙන් ගියේයයි දක්‍ෂවූ මුවැදිතෙමේ දැනගණීද එපරිද්දෙන්ම ප්‍රාඥතෙමේ " කරුණා විය සත්තෙසු" යනාදී ප්‍රයොගයන්හි ආදිඅන්තදෙක්හි ගන්නාලද ගුණයන් කරණකොට ගෙණ මධ්‍යයෙහි සංග්‍රහීතවන බුද්ධගුණයන් දැනගණීයි එහෙයින් මේ මිගපදවලඤ්ජයනය යි දතයුතු.

26 එකො එව, (එකම නයක් හෝ ශබ්දයක් හෝ) තෙමේ හුදකලාවූයේම; සඤ්ඤිනියා, සාමාන්‍යයෙන්; (පොහොසත් බැවින්) අනෙකත්ථං, නානාවිධ; පරිදීපෙති, ප්‍රකාශ කෙරේද; සො, ඒ නයතෙම; භින්නසඤ්ඤි ඉති, භින්නසඤ්ඤිනයයයි; ඤෙය්‍යො, දතයුතු; තංයථා, ඒ මෙසේයි. සෙතො, ශ්වෙත අශ්වතෙම ; ධාවති, දුවයි. (සෙතො යන්න 'සා ඉතො' යි විශ්ලෙෂ කළකල්හි–සා, සුනඛතෙම; ඉතො, මෙතැනින්; ධාවති, දුවයි, කියාවේ.)

ඒ වනාහි ගුණභින්නසඤ්ඤිය ද්‍රව්‍යභින්නසඤ්ඤියයි ද්විධයි ඔවුන්අතුරෙන් "සෙතො අස්සො සෙතො ගොණො, යනාදිය ගුණභින්නසඤ්ඤිනම 'සා (සුනඛො) ඉතො ධාවති, සා (ඉත්ථී) ඉතො ධාවති, සො (පුරිසො) ඉතො ධාවති, යනාදිප්‍රයොග ද්‍රව්‍යභින්නසඤ්ඤිනම.

එහෙයින් කියනලදී.

"සාමඤ්ඤං ගුණදබ්බම්පි භින්නසඤ්ඤීති වුච්චති
සෙතො අස්සො'ත්‍යාදි ගුණෙ සා ඉතො දබ්බසම්මතො" යි.

27. එකොයෙව ද්‍රුවෙ අත්‍ථෙ පරිදීපෙති භූතතො
තන්තානයො'ති සො ඤෙය්‍යො වස්සවාවු'ත්‍ථ රූපකං.

28. සිලෙසො වාචන-නෙකාභිධෙය්‍යෙකපදයුතං
අනෙකභෙදො සො ඤෙය්‍යො යුත්තායුත්තාදිභෙදතො.

29. අන්‍ධකාරොහරො හාරී සමාරූළ්හො මහොදයං
දීප්‍යතෙ භානුමා සො'යං භගවා බොධයං ජනෙ.

යුත්තසිලෙසො.

30. සාරදමලකාභාසො සමානිතපරිතාබයො
කුමුදකරසම්බොධො පීණෙති ජනතං ඉධී.

අයුත්ත සිලෙසො.

---

27 එකො එව, එකම ශබ්දයෙක්; ද්‍රුවෙ අත්‍ථෙ, අර්‍ථදෙකක්; භූතතො විද්‍යමානවශයෙන්; (හෝ සත්‍යවශයෙන්) පරිදීපෙති, ප්‍රකාශ කෙරේද; සො, හෙතෙම; තන්තානයො ඉති, තන්ත්‍රනයයයි; ඤෙය්‍යො, දතයුතු. එත්‍ථ, මෙහි හෙවත් මේ තන්ත්‍රනයෙහි; වස්සවාවු; වස්සවාවු යන සූත්‍රය ; රූපකං, ප්‍රකාශකයි (උදාහරණයයි සේයි).

"වස්සවාවු" යන සුතුරෙන් වසධාතුහුගේ වකාරයට උකාරාදෙශ කියන ලදී මේ එකඅර්‍ථයකි වැලිදු වසධාතු සම්බන්‍ධ වකාරයේ අකාරයට උකාරාදෙශද ප්‍රකාශිතයි මෙසේ එකම ශබ්දයෙන් අර්‍ථදෙකක් ප්‍රකාශ කෙරේ ඒ එසේමය ලොකයෙහි තන්ත්‍රය හෙවත් හූය දෙපටක් ඇත්තේම එයා පට මෙන් වේද මේනයද එසේයයි කියනලදී.

28 අනෙකඅභිධෙය්‍ය, නොයෙක් අර්‍ථ ඇති; එකපදයුතං, එකපදය කින් යුක්තවූ; වාචනං, වචනය; සිලෙසො, ශ්ලෙෂනම්; සො, ඒ ශ්ලෙෂය තෙම; යුත්තායුත්තාදිභෙදතො, යුක්තායුක්තාදිවිශෙෂයෙන්; අනෙකභෙදො, නොයෙක් ප්‍රකාර ඇත්තේයයි; වෙදිතබ්බො, දතයුතු.

29 අන්‍ධකාරඅවහරො, අවිද්‍යාන්‍ධකාරය නසන්නාවූ; හාරී, මනොඥවූ රශ්මීන්විහිදුවන්නාවූ; මහොදයං, අර්හත් මාර්ගඥාන නැමති උදයපර්වතයට, සමාරූළ්හො, නැංගාවූ; භානුමා, රශ්මිමත්වූ; සො අයං භගවා, ඒ මේ භාග්‍යවතුන් වහන්සේ; ජනෙ, (අවිද්‍යානැමති රාත්‍රියෙහි නිද්‍රාවට පැමිණියාවූ) ජනයන්; බොධයං, පුබුදුවමින්; දීප්‍යතෙ, බබලනසේක, (නොහොත්) අන්‍ධකාරොහරො, පියවිමහඅඳුරු නසන්නාවූ; හාරී, මනොඥවූ හෙවත් රශ්මිමත් වූ; මහොදයං, උදයපර්වතයට; සමාරූළ්හො, නැංගාවූ; භගවා, සෞභාග්‍යපෙතවූ; සො අයං භානුමා, ඒ මේ සූර්‍ය්‍යතෙම; ජනෙ, (නිද්‍රාගතවූ)සත්වයන්; බොධයං, පුබුදුවමින්; දීප්‍යතෙ, ප්‍රකාශ වෙයි.

යුත්තසිලෙසො, අභින්නපදාර්‍ථඇති ශ්ලෙෂයි.

30 සාරදෙ, සාරනම්වූ නිර්‍වාණය දෙන්නාවූ හෙවත් ශ්වෙත රශ්මියක් ඇත්තාවූ; අමලකාභාසො , නිර්මලවූකාන්තිඇති ; සමානිතපරිතාබයො, මනා

31. එකසෙසො තු දුවිධො පුබ්බාපරානසෙසතො
පුබ්බසෙසො තත්‍ථ පුත්‍තා ඉතරො තු ධීතාදිකා.

32. සරූපතබ්බිරූපානං වසෙනච විධා භවෙ *
සරූපො පුරිසා තත්‍ථ විරූපො තු පිතාදිකා.

---

කොට පමුණුවනලද ශෛලශෘඞ්ගයැති (හෙවත් සර්වප්‍රකාරයෙන්) කෞලශ්‍රීයත් ක්‍ෂයට පැමිණියාවූ; කුමුදාකරසම්බොධො, විකසිතවූ කුමුද වනය මනාකොට පුබුදුවන්නාවූ; සුභී, සොභනවූ ප්‍රභාඇති සර්වඥයන් වහන්සේ; ජනතං, ජනසමූහයා; පිණෙති, පිණවනසේක; නොහොත්–සාරද, සරත්කාලයෙහි; අමලකාභාසො, නිර්මලවූ රශ්මිඇති හෙවත් නිර්මලවූ රශ්මියෙන් බබලන්නාවූ; සමානිතපරික්ඛයො, කාලපක්‍ෂයෙහි මනාකොට එළවනලද පරික්‍ෂයඇති හෙවත් කාලපක්‍ෂයෙහි දවසක්පාසා පිරිහීමට පැමිණෙන්නාවූ; කුමුදාකරසම්බොධො, කුමුදවනයන් මනාකොට පුබුදුවන්නාවූ; සුභී, ශොභනවූ රශ්මිඇති චන්ද්‍රතෙම; ජනතං, ජනසමූහයා; පිණෙති, පිණවයි.

අපුත්‍ථ සිලොසො, මේ භින්නපදජ්ඣැති ශ්ලෙෂයයි.

දැන් එකසෙසනය දක්වනු පිණිස "එකසෙසො" යනාදිය ආරබ්ධයි.

31 එකසෙසො තු, එකසෙසයවූකලී; පුබ්බාපරානං, පූර්වාපරයන්ගේ; සෙසතො, ශෙෂවශයෙන්; දුවිධො, දෙවැදෑරුම් වේ; තත්‍ථ, ඔවුන්අතුරෙන්; පුබ්බසෙසො, පූර්වශෙෂයනම්; පුත්‍තා, (පුත්‍තා ච ධීතා ච යන වාක්‍යයෙහි 'ධීතා' යන අපරපදය ලොප්කොට 'පුත්‍තා' යන පූර්වපදයාගේ ශෙෂය කළහෙයින්) පුත්‍තා යනුවේ. ඉතරොතු, අනිකවනාහි; (හෙවත් අන්‍ය අපරශෙෂය වනාහි) ධීතාදිකා, ධීතායනාදීහුයි.

'ධීතරො (1) යන ප්‍රයොගයෙහි 'පුත්‍තො ච ධීතා ච' යන වාක්‍යයෙන් 'පුත්‍තො, යන්න ලොප්කොට 'ධීතරො' යි අපරපදයාගේ ශෙෂයවේ, ආදි ශබ්දයෙන් 'මාතා ච පිතා ච' පිතරො යි යනාදිප්‍රයොග ගන්නාලැබේ.

මේ කියනලද්දේ විරූපෙකශෙෂයයි. හේ මෙසේ දෙපරිද්දෙකින් දක්වා සරූපවිරූපවශයෙන් විභාග කොට දක්වනු පිණිස "සරූපතබ්බිරූපානං" යනාදිය කළිතයි.

32 සරූපතබ්බිරූපානං, සරූපෙකසෙසය විරූපෙකසෙසය යනමොවුන්ගේ; වසෙනච, වශයෙන්ද; විධාභවෙ, දෙවැදෑරුම්වේ; තත්‍ථ, ඔවුන් අතුරෙන්; පුරිසා, පුරිසා යනු; සරූපො, සරූපෙකසෙසයි; විරූපොතු, විරූපෙකශෙෂය වනාහි; පිතාදිකා, පිතා යනාදි ප්‍රයොගයෝයි.

---

* "සරූපෙකසෙසවිරූපානං වසෙනාපි ච දුවිධො"–පොත්හි.

33. සරූපො තිවිධො සද්දඅත්ථසද්දත්ථභෙදතො
තං යථා මාසකුටිලා * පුරිසා'ති යථාක්කමං.

34. එකසෙසෙ නිවයිතෙ තු සාමඤ්ඤං 'පෙක්ඛතී පරා
තෙනෙකවචනං හොති නාමරූපාදිකං යථා.

35. යථා පදීප එකත්ථ ඨිතො දීපෙති වත්ථුනි
සබ්බත්ථෙසනයො වාපි තථා වුච්චති ධීමතා.

---

පුරිසා යන තන්හි 'පුරිසො ච පුරිසො ච පුරිසා' යි සමානරූපපද ව්‍යඤ්ජනයන්ගේ එකශෙෂය කළ පරිදි දතයුතු. 'මාතා ච පිතා ච පිතරො' යි විරූපවූ පදව්‍යඤ්ජනයන්ගේ එකශෙෂය කළ පරිදි දතයුතු.

33 සරූපො, සරූපෙකශෙෂය; සද්දඅත්ථසද්දත්ථභෙදතො—සද්ද, ශබ්දය; අත්ථ, අර්ථය; සද්දත්ථභෙදතො, ශබ්දාර්ථය යනමොවුන්ගේ භෙද යෙන්; තිවිධො, ත්‍රිවිධයි; තංයථා, ඒ මෙසේයි; මාසා, මාසා යනුද; කුටිලා, කුටිලා යනුද; පුරිසා ඉති, පුරිසා යනුද; යථාක්කමං, පිළිවෙළින් (උදාහර ණයි.)

මාසා යනු ශබ්දස්වරූපෙකශෙෂයි 'මාසො ච මාසො ච' යන වාක්‍ය යෙහි එකක් ලොප් කොට එකක් ශෙෂකළකල්හි 'මාසා' කියා වේ මෙහි මාසා යන්නෙන් අපරාහනවිශෙෂයක්වූ මෑද වන්‍දයාගේ පරිභොගයෙන් පිරිසිඳෙනකාලවිශෙෂයක්වූ මාසයෝද කියනලදහ–'වංකො ච කුටිලො ච, යනවාක්‍යයෙහි අර්ථවශයෙන් 'කුටිලා, යි එකශෙෂ කරණලදී–'පුරිසො ච පුරිසො ච' යනවාක්‍යයෙහි ශබ්දාර්ථයන්ගේ ස්වරූපවශයෙන් 'පුරිසා, යි එක ශෙෂ කරණලදී.

34. එකසෙසෙ, එකශෙෂය; නිවයිතෙ තු, නිමුනුකල්හි; පරා, පසුව; සාම ඤ්ඤං, සාමාන්‍යය හෙවත් ජාතිය; අපෙක්ඛති, අපෙක්‍ෂා කෙරෙයි; තෙන, ඒජාත්‍යපෙක්‍ෂාවෙන්; එකවචනං හොති, එකවචන (ද) වෙයි; නාමරූපාදිකං යථා, නාමරූප යනාදිය මෙනි–'නාමං ච රූපං ච' යනවාක්‍යයෙහි සමාහාර වත්වවශයෙන් එකවචනාන්තව 'නාමරූපං' යි කියනලදී.

ඉක්බිති ප්‍රදීපනය දක්වනුපිණිස 'යථා පදීපො' යනාදිය ආරබ්ධයි.

35. එකත්ථ, එක්පෙදෙසක; ඨිතො, සිටියාවූ; පදීපො, ප්‍රදීපය; යථා, යම් සේ; වත්ථූනි, වස්තූන්; දීපෙති, ප්‍රකාශ කෙරේද; තථා, එපරිද්දෙන්; ධීමතා, සුධීමත්හු විසින්; සබ්බත්ථ, සෑමතන්හි; එසො නයො අපි, මේනය ද; වුච්චති, කියනුලැබේ.

---

* මාසා–සමඝර.

36. තව ආදිමජ්ඣඅන්තවසෙන තිවිධං මතං
අකාසි අප්පනො අත්ථං පරත්ථම්පිච සො ජිනො.

37. සාධූනං දස්සනං හොති අමතස්සෙව කෙවලං
අසාධූනන්තු දස්සනං විසස්සෙව තවං * මුනි.

38. අතිඉට්ඨං අතිසොභං මුනිවදනං ච පුණ්ණමං
පස්සන්තානන්තු සත්තානං මුඛං සබ්බත්ථ භාසකං.

39. පධානො නාම පධානෙ ගහිතෙ අප්පධානකං
ගහිතං තං යථා රාජා ආගතෙත්ථ නිදස්සනං.

---

මෙසේ ලක්ෂණ දක්වා දැන් විභාග දක්වනු පිණිස 'තවආදි' යනාදිය කියත්.

36. තව, හෙද, ආදිමජ්ඣඅන්තවසෙන, ආදිදීපක මධ්‍යදීපක අන්තදීපක වශයෙන්; තිවිධං, තෙවැදෑරුම්යයි; මතං, දත්නාලදී; සො ජිනො, ඒ සර්වඥයන් වහන්සේ; අප්පනො, තමන්වහන්සේගේ; අත්ථං, අර්ථය; අකාසි, කළසේක; පරත්ථං අපි ච, පරාර්ථයද; අකාසි'යි යොදනු. (මෙහි පූර්වවාක්‍යයෙහි පෙණෙන ක්‍රියාපදාදිය අපරවාක්‍යයෙහිද යෙදෙනබැවින් මේආදි දීපකයි.)

37. මුනි, සර්වඥයන් වහන්ස; සාධූනං, සජ්ජනයන්ට; තව, නුඹවහන්සේගේ; දස්සනං, දර්ශනය; අමතං එව හොති, අමෘතයම වෙයි; අසාධූනන්තු, අසජ්ජනයන්ට වනාහි; තව, නුඹවහන්සේගේ; දස්සනං, දර්ශනය; විසං එව, විෂයක්ම; හොතියි, යොදනු. (මේ මධ්‍යදීපකයි, මේද යටක්ලෙස දතයුතු.)

38. අතිඉට්ඨං, අතිශයින් ඉෂ්ටවූ; අතිසොභං, අතිශයින් ශොභනවූ; මුනිවදනං, සර්වඥයන් වහන්සේගේ මුඛය; පස්සන්තානං, බලන්නාවූ; සත්තානන්තු, සත්වයන්ගේ වනාහි; මුඛං, මුඛය; සබ්බත්ථ, සැමතන්හි; භාසකං, සතුටුකරන්නේය; පුණ්ණමං ච, පූර්ණචන්ද්‍රයාද; පසන්තානං, යනාදිය යොදනු. (මේ අන්ත්‍යදීපිකයි.)

ඉක්බිති ප්‍රධාන නය දක්නුවෝ 'පධානො' යනාදිය කීහු.

39. පධානො නාම, ප්‍රධානනය නම්; පධානෙ, ප්‍රධානයා; ගහිතෙ, ගත් කල්හි; අප්පධානකං, අප්‍රධානයා; ගහිතං, ගන්නාලද්දේය; තංයථා, මේමෙසේයි; එත්ථ, මෙහි; රාජා ආගතො, රජ ආගතො යන්න; නිදස්සනං, නිදර්ශනයි.

මෙහි 'රජා ආගතො'යි කීකල්හි ප්‍රධානවූ රජහුගේ ඊම කීමෙන් අප්‍රධානවූ අමාත්‍යාදීන්ගේ ඊම ද කියනලද්දේය.

තදනන්තරව 'විනා' යනාදීන් අතිකුදු නයක් දක්වත්.

---

* තවං–තමහට.

40. විනා යෙන න හොතීයං තංනානන්තරිකං * මතං
සතන්තිකස්ස සටාගර ඉදමෙත්ථ නිදස්සනං.

41. යෙභුය්‍යො නාම අප්පකා අගණෙත්වා 'ව භාසිතං
අම්බවනං නාගවනං ඉදමෙත්ථ නිදස්සනං.

42. තබ්බහුලං නාම තස්මිං බාහුල්ලා † චරණං මතං
වනෙ චරණම්පාදි දස්සෙතබ්බං සුධීමතා.

---

40. යෙන, සටාදියම්වස්තුවකින්; විනා, වෙන්ව; යං, (ඝටාදි) යම්වස්තු වක්; න හොති, නොවේ ද හෙවත් නොසිටී ද; තං, එය; නානන්තරිකං, නානන්තරීකනයයයි; මතං, දන්නාලදී; සතන්තිකස්ස, හිතෙලින් ප්‍රයොජනඇත් තාහට; සටං ආගර, සටය ගෙණඑව (සියන) ඉදං, මේවාක්‍යය; එත්ථ, මේ නයෙහි, නිදස්සනං, නිදර්ශනයි.

තදනන්තරව 'යෙභුය්‍යො නාම, යනාදීන් යෙභුය්‍යනය දක්වූහ.

41. යෙභුය්‍යො නාම, යෙභුය්‍ය නයනම්; අප්පකං, ස්වල්පයක්; අගණෙත්වා එව, නොගෙණම; (බොහොමයක්ම ගෙණ) භාසිතං, කියනලදී; අම්බව නං, අම්බවනං යනුද; නාගවනං, නාගවනං යනුද; එත්ථ, මෙහි; ඉදං නිදස්ස නං, මේනිදර්ශනයි.

බෙහෙවින් විද්‍යමානවූ ආම්‍රවෘක්ෂාපෙක්ෂාවෙන් 'අම්බවනං, යි ව්‍යවහාර යයි, හුදෙක් අම්‍රවෘක්ෂ පමණක් නොව අවශෙෂවූ ජම්බුවෘක්ෂාදීහු ද ඇතත් ආම්‍රවෘක්ෂයන්ගේ බාහුල්‍යයෙන් තව්‍යවහාරය දතයුතු. 'නාගවනං' යනාදි ය ද මෙසේමැයි.

ඉක්බිති තබ්බහුල නයදක්වන්නෝ 'තබ්බහුලං' යනාදී ආරම්භකළෝ.

42. තබ්බහුලං නාම, තබ්බහුල නයනම්; තස්මිං; ඒ දෙශයෙහි; බාහුල්ලා, බාහුල්‍යයෙන්; චරණං, හැසිරීමයයි; මතං, දන්නාලදී. වනෙ චරණං ඉති ආදි, වනචරණං යනාදී ප්‍රයොග; සුධීමතා, පැනැත්තහු විසින්; දස්සෙත බ්බං, (තත්සාධකවශයෙන්) දක්වියයුතු.

මේ තද්බහුල නය මූලටීකායෙහි අවිද්‍යමානවූවත් යෙභුය්‍යසහචරණ යෙන් මෙහි කියනලදැයි දතයුතු, 'තස්මිං බහුලං ආචිණ්ණං තබ්බහුලං' යනු ටීකාහෙයින් ඒ දෙශයෙහි හැසිරීම බෙහෙවින් ආචීර්ණවශයෙන් පවත්නේ තබ්බහුල නම්, වනයෙහි හැසිරීම ආචීර්ණකොට ඇත්තේ නගරයෙහි හැසි රෙතත් ඒ වනචර නාමය ලබන්නාක්මෙනි, ආදිශබ්දයෙන් චුල්ලකුමාරි චාරිකාදීන් ගැණේ.

ඉක්බිති ආසන්න නය දක්වනු වස් 'ආසන්නං නාම, යනාදි කීවෝ.

---

* නානන්තරිකං—සෑම.

† බාහුල්ලෙන—සමහර.

43. ආසන්නං නාම දූරට්ඨං වජ්ජෙත්වා භාසිතං මතං
කාකෙ වාරය මච්ඡම්හා ඉදං තෙසං නිදස්සනං.

44. මහීරුහො තරු වුත්තො තස්මිං අසති නො භවෙ
ඡායා පකති ලොකම්හි විභත්තිම්හාසති නයො.

45. අසති චන්දකන්තම්හි නොපයාති තතො භවං
තථෙව පච්චයෙ ලුත්තෙ අත්ථො විජ්ජති තස්ස'පි
සූරියකන්තනයො එවං වෙදිතබ්බො විභාවිනා,

---

43. ආසන්නං නාම, ආසන්න නයනම්; දූරට්ඨං, දුරසිටි අතිකක්; වජ්ජෙත්වා, හැර; භාසිතං, කියනලද වස්තුව; මතං, දන්නාලදී; මච්ඡම්හා, මත්ස්‍යයෙන්; කාකෙ, කාකයන්; වාරය, වළකව; ඉදං, මෙය; තෙසං, ඔවුන්ට; නිදස්සනං, නිදර්ශනයි.

ආසන්න නයනම් දූරස්ථදෙය හැර සමීපස්ථදෙය ගෙණ කියනලද වස්තු වයි. ඊට උදාහරණ දක්වන්නෝ 'කාකෙ වාරය මච්ඡම්හා' යි කීහු. මෙයින් කුමක් දක්වත්දයත්? මසුන් භක්ෂණය කරණ සමීපයෙහි සිටි කාකයන් ගේ නිවාරණය කීමෙන්ම දුරසිටි උකුසුආදිපක්ෂීන්ගේ ද සුණඛාදීන්ගේ ද නිවාරණය එයින්ම කියනලදුයි දක්වත්.

මෙතෙකින් ආසන්නනය දක්වා තදනන්තරව මහීරුහනය දක්වනු සඳහා 'මහීරුහො, යනාදිය ආරබ්ධයි.

44. මහීරුහො, මහීරුහයයි; තරු, වෘක්ෂය; වුත්තො, කියනලදී; (නොහොත්) මහීරුහො, මහීරුහයයිද; තරු, තරුයයිද; වුත්තො, කියනලදී; තස්මිං අසති, එය අවිද්‍යමානකල්හි; ලොකම්හි, ලොකයෙහි; ඡායා, වෘක්ෂච්ඡායා තොමෝ; නො භවෙ, නොවෙයි.; පකති, ස්වරාන්තප්‍රකෘතිය; විභත්තිම්හි, විභක්තිය; අසති, අවිද්‍යමානකල්හි; නො භවෙ, නොවේ (ලොප් නොවේය යනුයි;) නයො, (මේ ප්‍රකෘති) නය වේ.

මෙහි වනාහි මහීරුහ තරුශබ්දයන් කරණ කොටගෙණ කියනලද වෘක්ෂය විද්‍යමානකල්හි තච්ඡායාව වේද එය අවිද්‍යමානකල්හි තච්ඡායාව නො වේද එපරිද්දෙන්ම ප්‍රකෘතිස්වරාන්තය විභක්තිඇතිකල්හි ලොප් වෙයි නැති කල්හි ප්‍රකෘතියම වේයයි දතයුතු, මේ වනාහි මහීරුහ නයයි.

ඉක්බිති චන්ද්‍රකාන්තසූර්‍ය්‍යකාන්තනය මය දක්වන්නෝ 'අසති චන්දකන්තම්හි' යනාදිය කථනය කළෝ.

45. චන්දකන්තම්හි, චන්ද්‍රකාන්තපාෂාණය; (සඳකැන්මිණ) අසති, අවිද්‍යමානකල්හි; තතො භවං, එයින් උපන්නාවූ ජලය; න උපයාති, විනාසයට නො පැමිණේද; තථා එව, එපරිද්දෙන්ම; පච්චයෙ ලුත්තෙ, ප්‍රත්‍යයා ලොප් කළකල්හි; තස්ස, ඒ ප්‍රත්‍යයසම්බන්ධවූ; අත්ථො, අර්ථය; විජ්ජති, ලැබෙයි;

46. එකදෙසග්ගහණෙන සබ්බස්ස ගහණම්පන
නිදස්සනන්ති දට්ඨබ්බා ගොත්‍රභූතෙත්ථ ඤාපකං.

47. එකග්ගහණමත්තෙන යථිච්ඡිතස්ස ගාහණං
උපලක්ඛණං විඤ්ඤෙය්‍යං ලද්ධාතපත්ත නිදස්සනං.

---

සුරියකන්තන්තො අපි, සූය්‍ර්‍යකාන්තනය ද; විභාවිනා, පැනැත්තහු විසින්; එවං, මෙසේ; වෙදිතබ්බො, දතයුතු.

මෙහි වනාහි සඳකැත්මිණි ලොකයෙහි විද්‍යමානයි එය සඳරැස්හි තුබූකල්හි එයින් ජලය නික්මෙයි ඒ ජලය වනාහි සඳකැත්මිණි නැතිකල්හිදු විනා සයට නොයෙයි එපරිද්දෙන්ම ප්‍රත්‍යය ලොප්කල කල්හිදු ඒ ප්‍රත්‍යයාර්ථය නො නැසී පවතීයයි දක්කයුතු, මේ චන්ද්‍රකාන්තනයයි, සූය්‍ර්‍යකාන්තනය ද මෙම චන්ද්‍රකාන්තනය මෙන්ම දතයුතු, මේ වනාහි වෙනසයි, සඳකැත්මිණි සඳරැසෙහි තුබූකල්හි දිය උපදියි, හිරුකැත්මිණි හිරුරැසෙහි තුබූකල්හි ගිනි උපදිය යනු වෙනසයි–"චන්දො'ව කන්තො මනාපො අස්මිං අසෑවා අත්ථීති චන්දකන්තො–සුරියො'ව කන්තො මනාපො අස්මිං අස්සවා අත්ථීති සුරියකන්තො' යනු ටීකායි.

මීට අනතුරුව 'එකදෙසග්ගහණෙන' යනාදීන් නිදර්ශනනය දක්වූහ.

46. එකදෙසග්ගහණෙන, එකදෙසයක්හුගේ ගැණීමඇතිකල්හි ;(සප්තම්‍යර්ථයෙහි කරණවචනයි) සබ්බස්ස, සියල්ලගේ; ගහණං පන, ග්‍රහණය වනාහි; නිදස්සනං ඉති, නිදර්ශනනයයයි; දට්ඨබ්බං, දක්කයුතු; එත්ථ, මෙහිලා; ආගොත්‍රභූ ඉති, ගොත්‍රභූඥානය දක්වාය යනු; ඤාපකං, තදර්ථද්‍යොතකොදාහරණයි.

මෙහි 'දට්ඨබ්බා ගොත්‍රභූ' යන්න අර්ථවශයෙන් 'ආගොත්‍රභූ' යි පදච්ඡෙද කටයුතු, කුමක්හෙයින්දයත් ? මෙහි ගොත්‍රභූ ශබ්දයම අර්ථවශයෙන් නොගැණේ. සලිදු 'ගොත්‍රභූ' ඥානයෙන් නිම්ලවූ ඵලසමාපත්ත්‍යන්ට පූර්වව පවත්නා පරිකර්මයෝ ද ගන්නාලදහ එහෙයිනි.

'එකග්ගහණමත්තෙන, යනාදීන් උපලක්ෂණනය දක්වූහ.

47. එක, එකක්හුගේ; ගහණමත්තෙන, ගැණීම්පමණින්; යථිච්ඡිතස්ස, ඉච්ඡිතානුරූපයාගේ; ගහණං, ගැණීම; උපලක්ඛණං, උපලක්ෂණනයයි; විඤ්ඤෙය්‍යං, දතයුතු; ලද්ධාතපත්තො, ලබනලද ශ්වෙතච්ඡත්‍ර ඇත්තේය; (යනු) නිදස්සනං, (ඊට) නිදර්ශනයි.

ලබනලද ශ්වෙතච්ඡත්‍ර ඇත්තේය යන්නෙන් හුදෙක් ශ්වෙතච්ඡත්‍රය පමණක් ලද්දේ නොවෙයි, සලිදු වල්විදුනාය නළල්පටය කඩුවය ශ්වෙතච්ඡත්‍රය රන්මිරිවැඩිසඟලය යනමේ පඤ්චරාජකකුදභාණ්ඩම ලබනලද්දේයයි කියනලදී.

"යථාසඞ්ඛ්‍යං සීහගතිකමණ්ඩූකප්ලුතනයො තථා
නදීසොතනයො චාපි නාවාසකටනයො තථා.

ආවත්තො රුක්ඛසකුනො යථාලාභනයො'පිච
කාකොලොකනයො චාපි අවුත්තසිද්ධිනයො තථා.

ඉච්චෙවමනතු නයභෙදෙ 'නෙකසද්දෙන ගය්හතෙ
අඤ්ඤෙ'පි භෙදෙ ජානෙය්‍ය පණ්ඩිතො සද්දකොසලො."

මේ ග්‍රන්ථයෙහි නොකියනලද මෙකීනයවිශෙෂයෝ ටීකාවෙහි කියන ලදහ. මොවුහු මාතෘකායෙහි කියනලද අනෙකශබ්දයෙන් ගන්නාලදහයි දතයුතු.

මෙහි අර්ථ මෙසේ දතයුතු.

යථාසඞ්ඛ්‍යං, යථාක්‍රමනය ද; සීහගතික, සීහගතිකනය ද හෙවත් සිංහාව ලොකනනය ද; තථා, එසේම; මණ්ඩූකප්ලුතනයො, මණ්ඩූකප්ලුතනය ද; නදී සොතනයො ච අපි, නදීශ්‍රොතනය ද; තථා, එසේම; නාවාසකටනයො, නාව සකටනය ද; ආවත්තො, ආවර්තනය ද; රුක්ඛසකුනො, රුක්ඛසකුන නය ද; යථාලාභනයො අපි ච, යථාලාභනය ද; කාකොලොකනයො ච අපි, කාකාවලොකනය ද; තථා, එසේම; අවුත්තසිද්ධිනයො, අවුත්තසිද්ධිනය ද; ඉති, මෙසේ; එවං නයභෙදෙ තු, මේනයභෙදය වනාහි; අනෙකසද්දෙන, (උද්දේශයෙහි කියනලද) අනෙකශබ්දයෙන්; ගය්හතෙ, ගනුලැබේ; සද්දකුසලො, ශබ්දයන් දැනීමෙහි නිපුණවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අඤ්ඤෙ භෙදෙ අපි, සෙසුභෙදයන් ද; ජානෙය්‍ය, දන්නේය. ('සද්දකුස ලො' යි කියයුතුතන්හි උකාරයට ඔකාරාදෙශය ඡන්දස්හානි වළකනුපිණිස යයි දතයුතු.)

එහි යථාක්‍රමයෙන් යථාර්හ යථානුරූප යථානුසම්භවනයද සංග්‍රහකරණ ලද්දෑහ.

සිංහාවලොක නයනම් සිංහතෙමේ රන්ගිරිලෙනෙන් නික්මී සතරදිශාව බලා යේද එමෙන්ම පූර්වාපරයන් අවලොකනය කොට යොදනලද වාක්‍යය සිංහාවලොකනය නම්, ඒවනාහි 'ජිනවචනයුත්තං හි, අබ්භන්තසාගරමජ්ඣ තති තරඞ්ගං, යනාදී ප්‍රයොගයන්හි ලැබේ' කෙසේදයත් අජ්ඣත්තිවිභක්ති ග්‍රහණයෙන් පූර්වාපරයන් ගන්නාලදබැවිනි, මණ්ඩූකප්ලුත නයනම් එකක් හෝ දෙකක් හෝ ඉක්මවා පවත්නා සූත්‍රයයි, නදීශ්‍රොතනයනම් නදීශ්‍රො තය මෙන් කිසිවක් නොයික්මවා පවත්නාසූත්‍රයයි, නාවාසකට නයනම් එකම රූපයක් බොහෝ සූත්‍රයන්හා එකතුකොට තමතමන්ගේ ස්ථාන යෙහි නිපදවීමයි, ආවර්ත නයනම් පරිවර්තනනයයි, 'අක්ඛරාපාදයො එකච ත්තාළීසං, යන්සූත්‍රයෙහි 'අක්ඛරා' යනපදය වනාහි ස්වරාදිනාමයන්හිදු

48. නයා එකත්තනානත්තඅබ්‍යාපාරධම්මතා වසා
චතුබ්බිධං පවුච්චන්ති කවිඤ්ඤෙන සුධීමතා.

---

පරිවර්තිතයවේ, 'නදියං * උදකෙ වට්ටන්ති' කියාද ඇතැම්කෙණෙක් මීට නිදර්ශන දක්වත්, 'වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා' යනසූත්‍රයෙහි 'වග්ගෙ' යනපදය වනාහි 'ඝොසාඝොසා' කියාද 'තතියපඨමා' කියාද කියනලදී, ඇතැම් කෙණෙක් වනාහි තත්‍ත්‍රනය හා සමානයයි කියත්, රුක්ඛසකුන නයනම් 'අග්ගිං' යන ප්‍රයොගයෙහි 'අමෙමා නිග්ගහීතං ඣල පෙහි' යනසූත්‍රයෙන් 'අං' වචනයට නිග්ගහීතාදෙශ කොට තමන්ගේ නිශ්‍රය විනාශකල ඣකාරයට පැමිණෙයි, යම්සේ ලිහිනිතෙමේ වෘක්ෂයෙහි යමක් නිසා වසා ද ඒ ගොචරය නටකල්හි අන්තැනකට යේද එමෙන්ම නිග්ගහීතයද ස්වරයනිසා සිටියි ස්වරය නටකල්හි අන්තැනකට යනසුලුවූයේ නොසිටියි, යථාලාභ නයනම් 'සක්බරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි, යනාදියෙහි සක්ඛරකඨලයන්ගේ චරණයොගයෙන් මත්ස්‍යසමූහාපෙක්ෂායෙන් චරණ ක්‍රියාව හා යෙදීමයි, කාකොලොකනය නම් 'රඤ්ඤො පහිතො දූතො' යනප්‍රයොගයෙහි 'රඤ්ඤො' යන මේපදය 'පහිතො' යන පදයට කර්තෘ වේ, 'දූතො' යනපදයට සම්බන්ධවනහෙයිනි, ඒ එසේමය කාකයා වනාහි එකඇසකින් බලන්නේ එකඇසකින් නොදකීද වමැසින් බලන්නේ දකුණැසින් නොදකීද දකුණැසින් බලන්නේ වමැසින් නොදකීද මේනයද එමෙනි.

එහෙයින් කීහ පුරාතනයෝ.

'යථා හි කාකො එකෙන චක්ඛුනා පස්සති සදා
තථෙවායං නයො තෙන කාකොලොකො'ති වුච්චති' යි.

අවුත්‍යසිද්ධි නයනම් 'පස්සෙය්‍යං තං වස්සසතං අරොගං' යන ප්‍රයොගයෙහි 'වස්සසතං අරොගං පස්සෙය්‍යං' යි කීකල්හිම නොකියනලද ආයුෂයාගේ ප්‍රාර්ථනාවම සිඬයි පච්චාසත්තිනයද මෙහිම සඞ්ගෘහීතයි, ඒ වනාහි යථාක්‍රමය මුදා ආසන්නය ගෙණ කියනුලැබේ, ඒ මෙසේයි 'තතො සස්ස ස්සාය' යනසූත්‍රයෙහි 'තතො තා එතා ඉමාතො' යි වෘත්ති කීහ.

මෙසේ නොයෙක් සඞ්කීර්ණ නය දක්වා අන්‍යවූ නය චතුෂ්කයක් දක්වනු සඳහා 'නයා එකත්තනානත්ත' යනාදිය ආරබධයි.

48. එකත්තනානත්තඅබ්‍යාපාරධම්මතාවසා—එකත්ත, එකත්තය; නානත්ත, නානත්තය; අබ්‍යාපාර, අබ්‍යාපාරය; ධම්මතාවසා, ධර්මතාය යනමේ නය යන්ගේ වශයෙන්; නයා, නයයෝ; සුධීමතා, ප්‍රඥාවත්වූ; කවිඤ්ඤෙන, කවීන්ද්‍රයා විසින්; චතුබ්බිධං, සිව්වැදෑරුම්යයි; පවුච්චන්ති, කියනුලැබෙත්.

---

* නදියං උදකාවට්ටන්ති—ඇතම්.

49. හෙතුඵලසම්බන්ධෙන සන්තානානුපච්ඡෙදතො
පවත්තො එකත්තනයො කවිඤ්ඤෙන පකාසිතො.

50. පච්චයෙහි සකීයෙහි * නානාධම්මානුපජ්ජනං
නයො නානත්තනාමො සො'ව † වෙදිතබ්බො විභාවිනා.

51. තදුප්පන්නාන ධම්මානං අවසවත්තිතා පන
බ්‍යාපාරරහිතත්තා සා අබ්‍යාරො'ති වුච්චති.

52. තං තං ඨානානුරූපෙන තං තං ඵලොපපජ්ජනං
ධම්මතා ඉති විඤ්ඤෙය්‍යං නයලක්ඛණවිඤ්ඤුනා.

53. නන්ද්‍යාවත්තතිපුක්ඛලා සීහවික්කීළිත'ංකුසා
දිසාලොචනයො චෙව නයො පඤ්චවිධො මතො.

---

49. හෙතුඵලසම්බන්ධෙන, හෙතුඵලදෙදෙනාගේ සම්බන්ධයෙන් ද; සන්තානානුපච්ඡෙදතො, සන්තතියෙහි අනුපච්ඡෙදවශයෙන් ද; පවත්තො, පැවති ධර්‍මසමූහය; එකත්තනයො, එකත්තනයයයි; කවිඤ්ඤෙන, කවීන්ද්‍රයා විසින්; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය. (ඒ එසේමය එකාකාරයෙකින් පැවති බැවින් සියලු ධර්‍මයෝම හෙතුඵල අසම්බන්ධ නම් වෙති.)

50. සකීයෙහි පච්චයෙහි, තමතමන්ගේ ප්‍රත්‍යයෙන්; නානාධම්මානුපජ්ජනං, නානාවූ ධර්‍මයන්ගේ ඉපදීමක් හෝ පැවැත්මක් වේ ද; සො එව, හෙතෙමේම; නානත්තකො නයො ඉති, නානත්තනයයයි; විභාවිනා, පණ්ඩිතයා විසින්; වෙදිතබ්බො, දතයුත්තේය. (ඒ එසේමය, සියලු ධර්‍මයෝ ප්‍රත්‍යයවශයෙන් හෙදවනලද්දාහුය.)

51. තදුප්පන්නානං ධම්මානං, ඒ ස්වකීය ස්වකීය ප්‍රත්‍යයෙන් උපන් ධර්‍මයන්ගේ; අවසවත්තිතා පන, සියවසහයෙහි නොපවත්නාබව වනාහි; බ්‍යාපරරහිතත්තා, ක්‍රියාරහිතබැවින්; සා, ඕතොමෝ; අබ්‍යාපාරනයො ඉති, අබ්‍යාපාරනයයයි; වුච්චති, කියනුලැබේ.

52. තං තං ඨානානුරූපෙන, තත්තත්කාරණානුරූපවශයෙන්; (ඒ ඒ කාරණයන්ට සුදුසුවශයෙනි) තංතංඵලොපපජ්ජනං, තත්තවිපාකොත්පත්තිය; (ඒ ඒ විපාකයන්ගේ පැවැත්ම) ධම්මතා ඉති, ධර්‍මතානයයයි; නයලක්ඛණවිඤ්ඤුනා, නයලක්ෂණ දන්නහු විසින්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

'ඉක්බිති නන්ද්‍යාවත්තතිපුක්ඛලා' යනාදීන් අතිකුදු නයපඤ්චකයක් කීහ.

53. නන්ද්‍යාවත්තතිපුක්ඛලා, නන්ද්‍යාවර්තනය තිපුක්ඛලනයදෙක ද; සීහවික්කීළිතඅංකුසා, සිංහවික්‍රීඩිතනය අංකුසනයදෙක ද; දිසාලොචනනයො ච,

---

* සක සක පච්චයෙහි–පොත්හි.

† සොව නානත්තනයොති–පොත්හි.

54. නන්දියා විය ආවත්තා ආවත්තා එත්ථ තිට්ඨති
තස්මා සො නන්දියාවත්තො නයො හොති සභාවතො.

55. නදියාවත්තෙ පවිට්ඨා දාරුක්ඛන්ධො'ව සො නයො
නන්දිනාමාය තණ්හාය නන්දියා පමුදස්ස වා
ආවත්තා එත්ථ අත්ථීති තෙනෙදමිති වුච්චති.

56. ලොභාදීහි සංකිලෙසෙ වොදානෙ ඉතරාදිහි
තිපූවිය බලතීති සො'ව තිපුක්ඛලො මතො'ති.

---

දිසාවලොචනනයද්දැයි කියා; පඤ්චවිධො, පස්වැදෑරුම්වූ; නයො, නයද; මතො, දන්නාලදී.

මෙහි ඡන්දානුරක්ෂණය පිණිස 'දිසාලොචනනයො' යි කියයුතුතන්හි නකාරයක්හුගේ ලොපයෙන් 'දිසාලොචනයො' යි කියනලදී.
මෙසේ මාතෘකාව දක්වා දැන් වචනාර්ථය දක්වනු පිණිස 'නන්දියා' යනාදිය කීහ.

54. නන්දියා, නදීගුගේ; ආවත්තා විය, සලාවැටුම්මෙන්; එත්ථ, මේනයෙහි; ආවත්තා, ආවර්තයතෙම; තිට්ඨන්ති, සිටියි; තස්මා, එහෙයින්; සභාවතො, ස්වභාවවශයෙන්; සො නයො, ඒනයතෙම; නන්දියාවත්තො හොති, නන්ද්‍යාවර්ත නම් වේ.

55. වා, නොහොත්; නදියාවත්තෙ, නද්‍යාවර්තයෙහි; පවිට්ඨා, වැදෙනලද; දාරුක්ඛන්ධො ඉව, දාවකඳක් මෙන්; සො නයො, ඒනයක් වේද; (හෙතෙමේ ද නන්දියාවර්තනම්) නන්දිනාමාය, නන්දිනම්වූ; තණ්හාය (වා,) තෘෂ්ණාවගේ හෝ; නන්දියා, නන්දියායි සේයි; පමුදස්ස (වා), ප්‍රමොදයාගේ හෝ; ආවත්තා, ආවර්තය හෙවත් කරකැවීම; එත්ථ, මෙහි; අත්ථි ඉති, ඇත්තේනුයි; තෙන, එහෙයින්; ඉදං, මේනය; ඉති වුච්චති, මෙසේ කියනුලැබේ;–(නොහොත් නන්දියාවර්තනම්වූ මත්ස්‍යයුගලයාගේ ආවර්තය මෙන් හෙවත් කරකැවීම මෙන් ආවර්තය මෙහි ඇත්තේනුයි ද නන්දියාවර්තනම්.)

56. ලොභාදීහි, ලොභාදීන් කරණකොටගෙණ; සංකිලෙසෙ, සංක්ලෙශපක්ෂයෙහි ද; ඉතරාදීහි, අලොභාදීන් කරණකොටගෙණ; වොදානෙ, ව්‍යවදානපක්ෂයෙහි ද; තිපු විය, ඊයම් මෙන්; බලති ඉති, අශුද්ධශුද්ධ වශයෙන් කැපිවේනුයි; සො එව, හෙතෙමේම; තිපුක්ඛලො, තිපුක්ඛලනයයයි; මතො, දන්නාලදී.

සංක්ලෙශපක්ෂයෙහි ලොභද්වෙෂමොහාදීන් කරණකොටගෙණ ද ව්‍යවදානපක්ෂයෙහි අලොභ අද්වෙෂ අමොහාදීන් කරණකොටගෙණ ද ඊයම් මෙන් කැපිවනහෙයින් තිපුක්ඛලනයයයි දන්නාලදී.

57. අසන්තාසාදිභාවෙන භගවා සීහො'ති වුච්චති *
තස්සෙව කීළනභූතා දෙසනා සීහවික්කීළිතා.

58. විපල්ලාසපටිපක්ඛපරිදීපනතො පන
සීහස්ස විය කීළිතං එතං අත්ථී'පි මතො.

59. අඞ්කුසො විය යො හොති සො අඞ්කුසනයො මතො
දිසාභාවෙන කුසලාදිධම්මානම්පි දස්සනං †
දිසාලොචනසංඛාතො නයො හොති යථාක්කමං.

60. අන්වත්ථං'ච සමානම්පි රුළ්හං ගොමහිසාදිකං
ගතිභුසයනාදීනං අඤ්ඤෙසු'පි පවත්තිතො.

---

57. අසන්තාසාදිභාවෙන, අනුත්‍රාසාදිභාවයෙන්; (තැතිනොගැණීමාදි බැවිනි) භගවා, භාග්‍යවතුන් වහන්සේ; සීහොඉති, සිංහයයි; වුච්චති, කියනු ලැබේ. තස්ස එව, ඒ භගවත්හුගේම; කීළනභූතා, ක්‍රීඩාවවැනිවූ; දෙසනා, ධර්මදෙශනාතොමෝ; සීහවික්කීළිතා, සිංහවික්‍රීඩනයයි දන්නාලදී.

58. විපල්ලාසපටිපක්ඛපරිදීපනතො.—විපල්ලාසපටිපක්ඛ, විපර්‍යාසබවට විපක්ෂභාවයෙන්; පරිදීපනතො, ප්‍රකාශකරණහෙයින්; සීහස්ස, සිංහයාගේ; කීළිතං විය, ක්‍රීඩාව මෙන්; එතං, මේනයෙහි; අත්ථීඉතිපි, ඇත්තේනුයිද; මතො, (සීහවික්‍රීඩිතයයි) දන්නාලදී.

59. අඞ්කුසො විය, අකුස්ස මෙන්; යො, යම්නයක්; හොති, වේද; සො, හෙතෙම; අඞ්කුසනයො, අඞ්කුසනයයයි; මතො, දන්නාලදී; කුසලාදිධම්මානං අපි, කුශලාදිධර්මයන්ගේ ද; දිසාභාවෙන, දිසාභාවයෙන්; දස්සනං, බැලීම; දිසාලොචනසඞ්ඛාතො, දිසාලොචනනයයි කියනලද; නයො, නයය; යථාක්කමං හොති, පිළිවෙළින් වේ.

මෙතෙකින් නයනවකයක් දක්වා දැන් රූඪ්‍යාදිනය දක්වනු සඳහා 'අන්වත්ථං' ගනාදිය ආරබ්ධයි.

60. අන්වත්ථං එව සමානං අපි, අන්වර්ථවූමද; ගොමහිසාදිකං, ගොමහිසාදි නාමය; රූළ්හං, රූඪනාම; (කුමක්හෙයින්දයත්) ගතිභුසයනාදීනං, ගතිභුසයනාදි ක්‍රියාවන්; අඤ්ඤෙසු අපි, සෙසු සත්වයන්කෙරෙහිදු; පවත්තිතො, ප්‍රවෘත්තහෙයිනි

මෙහි වනාහි 'ගච්ඡතීති ගො' යිද 'මහියං සෙතීති මහිසො' යිද යන වචනාර්ථය සඳහා කියනලදී, එහි වනාහි ගමන භූමිසයන ක්‍රියාද උත්පත්ති නිමිත්තයයි; 'ගො මහිසො' යන නාමලාභයට නිමිත්තභාවයෙන් ප්‍රවෘත්තිනිමිත්තවූ ජාත්‍යාදිපක්ෂවශය මේ ආචාර්‍ය්‍යතෙමේම මතුකියන්නේය.

---

* "සීහො වුච්චති භගවා"—පොත්හි.

† "ධම්මානම්පි ආලොචනං" පොත්හි.

61. තත්‍ථ රුළ්හං ද්විධා හොති පසිද්ධමුපචාරතො
පසිද්ධො මයූරෙච්චාදි සත්තාදිකො තු මිතරො.

62. සනිමිත්තානිමිත්තානං වසෙනාපි ද්විධා මතො
ගමනසමයෙ පුබ්බං සයනාදීසු මිතරං.

63. ක්‍රියාවිසෙසනං නාම දුවිධං සමුදීරිතං
බහිද්ධාලපනං සබ්බං අබහිද්ධා මුදූදිකං.

---

එහෙයින් කියනලදී.

" ක්‍රියාපච්චුප්පත්තිනිමිත්තං වෙදිතබ්බං විනාවිනා
ජාත්‍යාදිපඤ්චවිධන්ති පවත්තිනිමිත්තන්ති වා " ති.

මෙසේ සියලුම සත්ත්වයන්ට තත්තන්නිමිත්තයොගය ඇතිකල්හිදු ඒනාමය නොලැබෙයි කුමක්හෙයින්ද ඒ ගොමහිසාදීන් කෙරෙහිම රූඪබැවිනි එහෙයින් අනවපීනාමයයිද රූඪනාමයයිද කියනු ලැබේ.

දැන් රූඪශබ්දයාගේ දෙපරිද්දෙකින් ප්‍රවෘත්තිය දක්වනු පිණිස 'තත්‍ථ' යනාදිය ආරබ්ධයි.

61. තත්‍ථ, ඒරූඪානවපීදෙකඅතුරෙන්; පසිද්ධමුපචාරතො, ප්‍රසිද්ධරූඪය උපචාරරූඪය යන මොවුන්ගේ වශයෙන්; රුළ්හං, රූඪනාමය, ද්විධා හොති, දෙපරිද්දෙකින් වේ; මයූරො ඉති ආදි, ('මහියං රවතීති මයූරො' යනු නිර්වචනහෙයින්) මයූරො යනාදිය; පසිද්ධො, ප්‍රසිද්ධරූඪයි; (පසිද්ධශබ්දයාගේ පකාරයොගයෙන් රූඪාපීය දන්නාලදී.) සත්තාදිකො තු, සත්තශබ්දාදිය වනාහි; ඉතරො, අනික් උපචාරරූඪයයි කියනලදී-(ආදිශබ්දයෙන් පඞ්කජ විපාකශබ්දාදිය ගණිත්-රූපාදිසු සජ්ජන්තීති සත්තා).

62. සනිමිත්තානිමිත්තානං, නිමිත්තසහිතය නිමිත්තරහිතය යනමොවුන් ගේ; වසෙන අපි, වශයෙන් ද; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, (රූඪශබ්දය) දන්නාලදී; ගමනසමයෙ, ගමනක්‍රියාකාලයෙහි; පුබ්බං, (ගො යනනාමය) පළමුකොට (කියනලද නිමිත්තසහිත) යි; සයනාදීසු, සයනසමයාදියෙහි; ඉතරං, අනිකයි නොහොත් නිමිත්තරහිතයි (මහිසශබ්දාදියෙහිදු මෙසේම දතයුතු.)

මෙසේ රූඪානවපීනය දෙක දක්වා දැන් ක්‍රියාවිශෙෂණනය දක්වන්නෝ 'ක්‍රියාවිසෙසනං' යනාදිය කියත්.

63. ක්‍රියාවිසෙසනං නාම, ක්‍රියාවිශෙෂණය නම්; දුවිධං (බහිද්ධාබහිද්ධ වශයෙන්) දෙපරිද්දෙකින්; සමුදීරිතං, කියනලදී; සබ්බං ආලපනං, සියලු ආමන්ත්‍රණය; බහිද්ධා (ක්‍රියාවෙන් බාහ්‍යවූ බැවින්) බහිද්ධානම්; මුදූදිකං, මුදු ශබ්දාදිය; අබහිද්ධා, අබාහ්‍යනම්;

64. අබ්භිඩා විධා හොති පඨමාදුතියාවසා
සකම්මකාය දුතියා අකම්මා පඨමා මතා.

65. ක්‍රියානං සමුදයෙන යදා කත්තාභිධීයතෙ
තදාව පඨමා හොති දුතියා තු ඉතො පරා.

66. ක්‍රියාවිසෙසනං යාව තං සබ්බං හි නපුංසකෙ
සියා ච එකවචනං යථා භික්ඛු සුඛං සිතා.

67. විසෙසසම්බභිඩා'ච ඉතරෙ නොපලබ්භති
තස්මා තත්‍ථ විසෙසස්සානුබරෙය්‍ය සුබුද්ධිමා.

---

එහෙයින් කියනලදී.

"ක්‍රියාවිසෙසො දුවිධො බාහ්‍යාභ්‍යන්තරභෙදතො
බාහිරාලපනං සබ්බං මුදුදබ්භන්තරං මතං" යි.

64. අබ්භිඩා, අභ්‍යන්තරවූ ක්‍රියාවිශෙෂණය; පඨමාදුතියාවසා, ප්‍රථමා (විභක්තිප්‍රත්‍යය) ද්විතීයා (විභක්තිප්‍රත්‍යය යනමොවුන්ගේ) වශයෙන්; විධා හොති, දෙපරිද්දෙකින් වේ; සකම්මකාය, සකර්මකක්‍රියාව හා; දුතියා, ද්විතීයා විභක්තිය; මතා, දන්නාලදී; අකම්මාය, අකර්මකක්‍රියාව හා; පඨමා, ප්‍රථමා විභක්තිය; මතා, දන්නාලදී. ('අකම්මාය, යනතන්හි ඡන්දානුරක්‍ෂණය පිණිස යකාරලොපි, ආචාර්‍ය්‍ය පාණිනීමතානුගතවශයෙන් 'මුදුං පච්චති සුඛං සෙති, යි උදාහරණ දක්වත්.)

65. ක්‍රියානං සමුදයෙන, ක්‍රියාසමුදයෙන් හෙවත් ක්‍රියාසමූහයෙන්; යදා, යම්කලෙක; කත්තා, කර්තෘ තෙමේ; අභිධීයතෙ, කියනුලැබේද; තදා එව, එකල්හිම; පඨමා හොති, ප්‍රථමාවිභක්ති වේ; දුතියා තු, ද්විතීයාව වනාහි; ඉතො, මේකර්තෘවාචකපදයාකෙරෙන්; පරා, අන්‍යවූ කර්මවාචකපදයාකෙරෙන් වෙයි.

(මේ ක්‍රියාවිශෙෂණයෙහි ක්‍රියා විභක්තිභෙදයයි ලිඞ්ගවචනභෙදය වනාහි.)

66. යාව, යම්පමණ; ක්‍රියාවිසෙසනං, ක්‍රියාවිශෙෂණයක් ඇද්ද; තං සබ්බං හි, ඒසියල්ලම; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහිය; එකවචනං ච සියා, එකවචනම වන්නේය; යථා, ඒමෙසේයි; භික්ඛු, භික්‍ෂුහු; සුඛං, සුවසේ; සිතා, සිටියාහුය.

විශෙෂණයනම් විශෙෂ්‍යයට අයිතිව පවත්නේය එහෙයින් සැමතන්හි විශෙෂ්‍යය උඩරණය කරන්නේයයි ආශඞ්කානිවාරණය පිණිස 'විසෙස්සං' යනාදිය ආරබ්ධයි.

67 විසෙස්සං, විශෙෂ්‍යය; අබ්භිඩා එව, අභ්‍යන්තරයෙන්ම (ලැබෙයි) ඉතරෙ, බාහ්‍යයෙන්, න උපලබ්භති, නොලැබෙයි; තස්මා, එහෙයින්; තත්‍ථ, ඒ බහිඩාලපනයෙහි; විසෙසසාව, විශෙෂ්‍යයද; සුබුද්ධිමා, ශොභනබුද්ධි ඇත්තේ, අනුබරෙය්‍ය, උඩරණය නොකරන්නේය.

68. අසම්භාරසභාවත්තා කත්තුනො න ච කාරකං
භවෙ තෙනෙව විඤ්ඤූහි තතියන්තම්පි ඉච්ඡිතං.

69. ඡට්ඨන්තමපරෙ ආහු විසෙසනසභාවතො
එකාහෙනෙව පායාසි සීසස්සුක්ඛිපනස්සච.

70. පඨමා දුතියා තතියා තාව ක්‍රියාවිසෙසකා
කෙචි වදන්ති තං ගිරං පණ්ඩිතෙහි විචාරියං.

---

මෙහිදු විශෙෂණොදාහරණය මෙසේ දතයුතුයි, 'මුදුං පචති' යනප්‍රයොගයෙහි 'මුදුපචනං පචන්ති' මෘදුවූ පිසීම පිසනුලැබෙයි යන අර්ථයි. සෙස්සෙහිදු මෙසේම දතයුතු, 'මුදුපචනං කරොති'යි කියාද ඇතම්කෙණෙක් උදාහරණ කෙරෙත්, කිම? ක්‍රියාවිශෙෂණය කාරකද අකාරකදැයි ආශඞ්කානිවාරණය පිණිස 'අසම්භාර සභාවත්තා' යනාදිය කීහ.

68. කත්තුනො, කර්තෘහුගේ; අසම්භාරසභාවත්තා, අසම්භාරස්වභාවය ඇතිබැවින්; කාරකං ච, කාරකයද; න භවෙ, නොවන්නේය; තෙන එව, එහෙයින්ම; විඤ්ඤූහි, නුවනැත්තන් විසින්; තතියන්තං අපි, තෘතීයාන්තයද; ඉච්ඡිතං, කැමතිවනලදී.

69. අපරෙ, අන්‍යාචාර්‍ය්‍යකෙණෙක්; විසෙසනසභාවතො, විශෙෂණස්වභාවයෙන්; ඡට්ඨන්තං, ෂෂ්ඨ්‍යන්තය; ආහු, කියත්; එකාහෙන එව, එකදවසින්ම; පායාසි; ගියේය (සිද); සීසස්ස, ශීර්ෂයාගේ; උක්ඛිපනං ඉති ච, ඔසවීම හෝ සෙලවීමයයි ද වේ.

මෙසේ සකවාදය දක්වා ඉක්බිති පරවාදය දක්වනු සඳහා 'පඨමාදුතියා' යනාදි කථනය කළෝ.

70. පඨමාදුතියාතතියා තාව, ප්‍රථමා ද්විතීයා තෘතීයා විභක්තිත්‍රය වනාහි; ක්‍රියාවිසෙසකා, ක්‍රියාව වෙනස්කරන්නාහුයයි; කෙචි, ඇතම්කෙණෙක්; වදන්ති, කියත්; තං ගිරං, ඒ වචනය; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විචාරියං, විචාරණය කටයුතු.

එහි වනාහි එවශබ්දයෙන් ෂෂ්ඨීවිභක්තිය නවත්වයි ඔවුන්ගේවූකලී මේ අදහසයි ෂෂ්ඨීවිභක්තිය තමා ක්‍රියායොගාභාවයෙන් ක්‍රියාවිශෙෂණය අයුතුයි එහෙයින් ප්‍රථමාදි විභක්තිත්‍රයම යෙදෙයි යනුයි.

මේ ආචාර්‍ය්‍යයාගේ මතය වනාහි ක්‍රියායොගය නොවීනම් "පාදස්සුක්ඛිපනං, සීසස්සුක්ඛිපනං, භමුකස්ස චලනං, අක්ඛිස්ස නිජ්ඣානං, චක්ඛුස්ස උම්මීලනං, යනාදි ප්‍රයොගයන්හි ක්‍රියායොගය කෙපරිද්දෙකින් වේදැයි යනුයි. එහෙයින් 'විචාරියං'යි කියනලදී, ෂෂ්ඨීවිභක්තියගේ ක්‍රියායොගාභාවයෙන් කාරකය නොවේයයි කියනලද්දේ නොවේද, සැබව, ඒ වනාහි කර්තෘස්ථ කර්මස්ථ ක්‍රියා සඳහා කියනලද්දේය මේ භාවසාධනක්‍රියාව වනාහි භාව

71. ක්‍රියාවිසෙසනං සද්දෙ වුත්තං ධාතුවිසෙසනං
භාවනපුංසකන්ත්වෙව සාසනෙ සමුදීරිතං.

72. ලිඞ්ගවිභත්තිවචනකාලානඤ්ච පවුච්චති
වසෙන විපල්ලාසො පුරිසක්ඛරානං ඡබ්බිධො.

73. තත්ථ ලිඞ්ගවිපල්ලාසෙ හීනමුක්කට්ඨමජ්ඣිමෙ
කුලානි අවිවජ්ජෙන්තො එවං ලබ්භති යාපනං
සිප්පුත්තානි චවහයෙ වෙදිතබ්බා විභාවිනා.

---

සාධනයාගේ කර්තෘකර්මවාචකත්වය නැතිබැවින් දෙකින්ම විනිර්මුක්තයයි වාචකයවී නම් 'දෙවදත්තෙන පච්චතෙ' යන ප්‍රයොගයෙහි 'දෙවදත්තො' කියාද වන්නේය 'පාදසුඛප්පතං' යන ප්‍රයොගයෙහිද 'පාදං' කිය වන්නේය.

මෙසේ වාදමයක් දක්වා තදනන්තරව ශාස්ත්‍රමයක් දක්වන්නෝ 'ක්‍රියා විසෙසනං' යනාදිය උපන්‍යාස කළෝ.

71. සද්දෙ, (ශබ්ද) ශාස්ත්‍රයෙහි; ක්‍රියාවිසෙසනං, ක්‍රියාවිශෙෂණය; ධාතුවිසෙසනං, ධාතුවිශෙෂණයයි; වුත්තං, කියනලදී; සාසනෙ, ශාසන ප්‍රකරණයෙහි (නොහොත්) ශාසනයට හිතවූප්‍රකරණයෙහි; භාවනපුංසකං ඉති එව, (ක්‍රියාවිශෙෂණය) භාවනපුංසකයයිම; සමුදීරිතං කියනලදී. (භාවස්ස දීපකං නපුංසකං, භාවෙන උපලක්ඛිතං වා නපුංසකං භාවනපුංසකං යනුටීකායි.)

මෙසේ ක්‍රියා විශෙෂණවය දක්වා දැන් විපය්‍යාසනය දක්වනු වස් 'ලිඞ්ග' යනාදිය ආරබ්ධයි.

72. ලිඞ්ගවිභත්තිවචනකාලානඤ්ච—ලිඞ්ග, ලිඞ්ගය; විභත්ති, විභක්තිය; වචන, වචනය; කාලානං ච, කාලය යන මොවුන්ගේද; පුරිස, පුරුෂය; අක්ඛරානං ච, අක්ෂරය යන මොවුන්ගේද; වසෙන, වශයෙන්; විපල්ලාසො, විපය්‍යාසය තෙම; ඡබ්බිධො, සවැදෑරුම්යයි; පවුච්චති, කියනුලැබේ.

ඉක්බිති 'තත්ථ' යනාදීන් ඊට උදාහරණ කළෝ.

73. තත්ථ, ඔවුන් අතුරෙන්; ලිඞ්ගවිපල්ලාසෙ, ලිඞ්ගවිපය්‍යාසයෙහි; හීනඋක්කට්ඨමජ්ඣිමෙ, හීනොත්කෘෂ්ටමධ්‍යමයන; කුලානි, කුලයන්; අවිවජ්ජෙන්තො, පහනොකරණ (භික්ෂු) තෙමේ; එවං, මෙසේ; යාපනං, යැපීම (නොහොත් දිවියැපීමට පමණවූ භික්ෂාව); ලබ්භති, ලබයි; සිප්පුත්තානි ච, සිප්පුත්‍රයන්ද; අවහයෙ, කැඳවන්නේය; (යනමේ උදාහරණ) විභාවිනා, පණ්ඩිතයාවිසින්; වෙදිතබ්බං, දතයුතු.

74. විභත්තියා විපල්ලාසෙ හොති ඉදමපි සීලස්මිං
වචනස්ස විපල්ලාසෙ නජ්ජො'නුපරියායති.

75. කාලස්සච විපල්ලාසෙ ජබ්බස්සානි යපෙස්සති
පුරිසස්ස විපල්ලාසෙ පුත්තං ලභෙථ කිඤ්චි මෙ.

76. අක්ඛරස්ස විපල්ලාසෙ සුගන්ධෙ සුගතො මතො
සංකාරස්ස මත්කාරො ච එකෙ ආචරියා බ්‍රවුං.

77. චත්ථවාක්‍යෙ චසද්දෙන නීතො ධම්මො පතියතෙ
දබ්බගුණක්‍රියා වාපි චත්ථවාක්‍යානුසාරිනා.

---

74. විභත්තියා, විභක්තීහුගේ; විපල්ලාසෙ, විපර්‍ය්‍යාසයෙහි; (ඉදමපිසීලස්මිං හොති යනු උදාහරණයි) ඉදං අපි, මෙයද; සීලස්මිං හොති, සීලයවේ; (ඉදමපිස්ස හොති සීලස්මිං යනු සම්පූර්ණපාඨයි) වචනස්ස, වචනයාගේ; විපල්ලාසෙ, විපර්‍ය්‍යාසයෙහි; (නජ්ජොනුපරියායති, යනු උදාහරණයි) නජ්ජො, නදිය; අනුපරියායති, අනුපරිවර්තනය වෙයි; (ගලායෙයි හෝයි)—මෙහි 'නදී, යන එකවචනය වචනවිපර්‍ය්‍යාසයෙන් 'නජ්ජො' යි බහුවචනවූබව පෙණේ.

75. කාලස්ස, කාලයාගේ; විපල්ලාසෙ, විපර්‍ය්‍යාසයෙහි; ජබ්බස්සාති යාපෙස්සති, ජබ්බස්සානි යාපෙස්සති යනුවේ; ('යාපෙති' යි කියයුතුතන්හි 'යාපෙස්සති' යනු කාලවිපර්‍ය්‍යාසයයි හෙවත් ක්‍රියාවිපර්‍ය්‍යාසයයි) පුරිසස්ස, පුරුෂයාගේ; විපල්ලාසෙ, විපර්‍ය්‍යාසයෙහි; පුත්තං ලභෙථ කිඤ්චි මෙ, පුත්තං ලභෙථ කිඤ්චි මෙ යනුයි. ('ලභෙම' යනතන්හි 'ලභෙථ' යනු පුරුෂ විපර්‍ය්‍යාසයි.)

76. අක්ඛරස්ස, අක්ෂරයාගේ; විපල්ලාසෙ, විපර්‍ය්‍යාසයෙහි; සුගන්ධෙ, සුගන්ධ යන්න; සුගතො, සුගතොයයි; මතො, දන්නාලද්දේය; සංකාරස්ස, සංකාරස්ථානයෙහි; මත්කාරො, මත්කාරය (වේයයි); එකෙ ආචරියා, ඇතම් ආචාර්‍ය්‍යකෙණෙක්; බ්‍රවුං, කීහු—ඒ මෙසේයි. 'බලාකයොනිම්හි න විජ්ජති පුමා සදා' යන පාලියෙහි 'බලාකයොනියං' යන 'යං, කාරස්ථානයෙහි 'ම්හි' කාරය දක්කයුතු.

ඉක්බිති 'චත්ථවාක්‍යෙ' යනාදීන් සමුච්චය ලක්ෂණ දක්වූහ.

77. චත්ථවාක්‍යෙ, චාර්ථ (සමාසයට යොග්‍ය) වාක්‍යයෙහි; චසද්දෙන, චශබ්දයෙන්; නීතො, පමුණුවනලද; ධම්මො, ගුණය; පතියතෙ, හැඟෙයි; චත්ථවාක්‍යානුසාරිනා, චාර්ථවාක්‍යානුසාරයෙන්; දබ්බගුණක්‍රියා වා අපි, ද්‍රව්‍ය ගුණක්‍රියාවෝ හෝ (පමුණුවනලද්දාහුය.)

78. යථා මුනීනං ච විජානං ච ගාවො අත්ථි ඝරෙ ඝරෙ
යතීනං ච විජානං ච සීලං ගච්ඡන්ති යති විජො.

79. සමුච්චයෙ කතෙ ද්වින්නං බහුන්නං වා පතීයතෙ
වච්‍යඞ්ගානුගතා සඞ්ඛ්‍යා වාක්‍යෙ ඡන්දානුසාරිනා.

80. සත්ථා ච සාරිපුත්තො ච ධම්මං දෙසෙති කෙවලං
ථෙරො ච දහරො චෙව පිණ්ඩචාරං චරන්ති ච.

81. ගහපති ච විජො චෙව සධා සධො'ති වා පන
එලො අමෙබා අඑලො ච තෙ සත්ථාරො උභො මම.

---

78. යථා, ඒ මෙසේයි; මුනීනං ච විජානං ච ගාවො අත්ථි ඝරෙ ඝරෙ, මුනීනං ච විජානං ච ගාවො අත්ථි ඝරෙ ඝරෙ යනුයි; (මේ ද්‍රව්‍ය සමුච්චයයි) යතීනං ච, යතීන්ගේද; විජානං ච, බ්‍රාහ්මණයන්ගේ ද; සීලං, සීලය; (අත්ථි, ඇත්තේය;) (මේ ගුණසමුච්චයයි) යති විජො ගච්ඡන්ති, 'යති ච විජො ච ගච්ඡන්ති' යි යෙදියයුතු. (මෙහි චශබ්දය ගම්‍යමානාර්ථ ඇත්තෙන් හෝ ඡන්දානුරක්ෂණවශයෙන් හෝ ලොප්කරණලදැයි දතයුතු (මේ ක්‍රියා සමුච්චයයි.)

තදනන්තරව 'සමුච්චයෙ' යනාදීන් සමූහාවයවයන්ගේ ප්‍රධානත්වය කීහු.

79. ද්වින්නං වා, දෙදෙනෙකුන්ගේ හෝ; බහූනං වා, බොහෝදෙනෙකුන්ගේ හෝ, සමුච්චයෙ කතෙ, පිඬුකිරීම කළකල්හි; වච්‍යඞ්ගානුගතා සඞ්ඛ්‍යා, වච්‍යානුගතවූද අඞ්ගානුගතවූද සඞ්ඛ්‍යාතොමෝ; වාක්‍යෙ, වාක්‍යයෙහි; ඡන්දානුසාරිනා, ඡන්දය අනුවයාමෙන්; පතීයතෙ, හැඟේ.

80. සත්ථා ච සාරිපුත්තො ච කෙවලං ධම්මං දෙසෙති (ඉතිච), සත්ථා ච සාරිපුත්තො ච කෙවලං ධම්මං දෙසෙති යනුද; ථෙරො ච දහරො චෙව පිණ්ඩචාරං චරන්ති ඉති ච, ථෙරො ච දහරො චෙව පිණ්ඩචාරං චරන්ති යනුද (උදාහරණයි;–'සත්ථා ච–පෙ–දෙසෙති.' යන වච්‍යානුගතසඞ්ඛ්‍යාවෙහි ඉදින් 'දෙසෙන්ති' යි බහුවචනය යෙද්ද එකල්හි අවයව ප්‍රධානහෙයින් අඞ්ගානුගතසඞ්ඛ්‍යාවද වේ. 'ථෙරො ච–පෙ–චරන්ති' යනු අඞ්ගානුගතසඞ්ඛ්‍යායි. මෙහි 'චරති' යි යෙදූකල වච්‍යානුගතසඞ්ඛ්‍යාව ද වන්නීය.

81. ගහපතිච විජො චෙව සධා (ඉති වා පන), ගහපති ච—පෙ— සධො, (කියා හෝ); ගහපතිච විජො චෙව සධා ඉති වා පන, ගහපති ච–පෙ–සධා කියා හෝ වේ–(මේ යථාක්‍රමයෙන් වච්‍යානුගත අඞ්ගානුගතසඞ්ඛ්‍යාවන්ට උදාහරණයි) එලො අමෙබා අඑලො ච තෙ සත්ථාරො උභො මම, අමෙබා එලො ච (කියාද) අමෙබා අඑලො ච (කියාද) තෙ උභො මම සත්ථාරො (හොන්ති කියාද යෙදියයුතු–මේද අඞ්ගානුගතසඞ්ඛ්‍යායි.)

82. අහං ච භරියා ච මනුස්සලොකෙ උභො මයං දම්පතී අහුම්හා,

83. අබහුත්තෙ සතියෙව අත්තනී ච ගරූසු ච
අපරිච්ඡෙදදරතෙ ඡෙදෙ ඉච්චාදීසු බහු භවෙ.

84. මයං ගච්ඡාම වක්ඛාම තුම්හෙ ගච්ඡථ වක්ඛථ
අප්පච්චයා අසඞ්ඛතා ධම්මාත්‍යාදිසු දිස්සති.

85. බහුත්තෙව සමානෙපි එකස්ස වචනම්භවෙ
මහාජනො බහුජනො සන්නිපතීති ආදිසු.

86. කත්තූනං කම්මකත්තූනං ක්‍රියන්තරමපෙක්ඛා යො
සස්සරූපටෙඨා සුබොධා සො ලිඞ්ගත්ථො'ති පවුච්චති.

---

82. (මෙද වචනානුගත අභිධානානුගතසඞ්ඛ්‍යාභෙදකට උදාහරණයි) 'මනුස්සලොකෙ අහංච දම්පතී අහොසිං, භරියාච දම්පතිනී අහොසි' යි වචනානුගත සඞ්ඛ්‍යාවශයෙන්ද 'අහං ච භරියා ච මයං උභො දම්පතී අහුම්හා'යි අභිධානානුගත සඞ්ඛ්‍යාවශයෙන්ද යෙදියයුතු.

ඉක්බිති තදන්‍ය ලක්ෂණයක් දක්වන්නෝ 'අබහුත්තෙ' යනාදිය කීහ.

83. අබහුත්තෙ, අල්පාර්ථයෙහි; සතියෙව, ඇතිකල්හිම; අත්තනි ච, තමන් (සඳහා පවත්නාව්‍යවහාරය) කෙරෙහිද; ගරූසු ච. ආචාර්‍ය්‍යොපාධ්‍යායාදීන් (සඳහා පවත්නා ව්‍යවහාරය) කෙරෙහිද; අපරිච්ඡෙදදරතෙ, අපරිච්ඡෙදනවිෂයෙහිද; ඡෙදෙ, පරිච්ඡෙදනවිෂයෙහිද; ඉති, යන; ආදීසු; මේ ආදියෙහි; බහු භවෙ, බහුවචනය වන්නේය.

84. මයං ගච්ඡාම මයං වක්ඛාම කියාද, තුම්හෙ ගච්ඡථ තුම්හෙ වක්ඛථ කියාද, අප්පච්චයා ධම්මා අසඞ්ඛතා ධම්මා කියාද. යොජනාකටයුතු—මයං, අපි; ගච්ඡාම, යමු; මයං, අපි; වක්ඛාම, කියන්නමු; තුම්හෙ, තෙපි; ගච්ඡථ, යන්නහු; තුම්හෙ, තෙපි; වක්ඛථ, කියන්නහු; අප්පච්චයා, ප්‍රත්‍යයරහිතවූ; ධම්මා, ධර්මයෝය; අසංඛතා, අසංස්කෘතවූ; ධම්මා, ධර්මයෝය; ඉති ආදිසු, යනාදියෙහි; දිස්සති, දක්නාලැබෙ.

මෙතෙකින් එකවචනස්ථානයෙහි බහුවචන දක්වා තදනන්තරව බහුවචනස්ථානයෙහි එකවචන දක්වත්.

85. බහුත්තෙ එව, බහුභාවයම; සමානෙ අපි, ඇතිකල්හිදු; එකස්ස වචනං, එකවචනය; භවෙ, වන්නේය; මහාජනො බහුජනො සන්නිපති ඉති, මහාජනො සන්නිපති බහුජනො සන්නිපතියන; ආදිසු, මේ ආදියෙහි වේ (ආදිශබ්දයෙන් 'අපරිමිතජනො' යනාදිය ගැණේ) මෙතෙකින් වචනභෙද දක්වා දැන් ලිඞ්ගාර්ථය දක්වත්.

86. කත්තූනං, කර්තෘකාරකයන්ගේ ද; කම්මකත්තූනං, කර්මකාරකයන්ගේ ද; ක්‍රියන්තරං, ක්‍රියාභෙදයට; අපෙක්ඛා; නොපෑමිණියාවූ; යො;

87. තථාගතො ජිනො සත්ථා ලොකජෙට්ඨො නරාසභො
මුනින්දො භගවා නාථො ගොතමො සක්‍යපුඞ්ගවො.

88. පටිසෙධො ද්විධා වුත්තො පසජ්ජපරියුදාසතො
නිසෙධෙතබ්බපධාන සදිසත්ථානපෙක්ඛතො.
පසජ්ජපටිසෙධො'ති වෙදිතබ්බො සුධීමතා.

89. පරිතුලිතමත්ථම්පි උපගන්ත්වා නිසෙධනං
පරියුදාසො'ති සො ඤෙය්‍යො පණ්ඩිතෙන නිසෙධනො.

90. අස්සද්ධාලවණභොජී ඉදං පුබ්බනිදස්සනං
අසූරියං පස්සං මුඛං ඉදං පච්ඡිමදීපකං.

---

සම්බන්ධයෙක්; සසරූපට්ඨො, තමන්ගේ ස්වරූපයෙහි සිටියේද; සුද්ධො, (කම්මාදිකාරකයන් හා) මිශ්‍රනුවූයේද; සො, ඒ ශබ්දයතෙම; ලිඞ්ගත්ථො ඉති, ලිඞ්ගාර්ථයයි; පවුච්චති, කියනුලැබේ.

87. තථාගතො, තථාගතො යනුද; ජිනො, ජිනොයනුද; සත්ථා, සත්ථා යනුද; ලොකජෙට්ඨො, ලොකජෙට්ඨො යනුද; නරාසභො, නරාසභො යනුද; මුනින්දො, මුනින්දො යනුද; භගවා, භගවා යනුද; නාථො, නාථො යනුද; ගොතමො, ගොතමො යනුද ; සක්‍යපුඞ්ගවො, සක්‍යපුඞ්ගවො යනුද; ලිඞ්ගාර්ථයට උදාහරණයි.

ලිඞ්ගාර්ථයට අනතුරුව ප්‍රතිෂේධය දක්වනු පිණිස 'පටිසෙධො' යනාදිය කථනය කළේ.

88. පටිසෙධො, ප්‍රතිෂේධයතෙම; පසජ්ජපරියුදාසතො; ප්‍රසහ්‍යප්‍රතිෂේධය පර්‍ය්‍යුදාසප්‍රතිෂේධය යන මොවුන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින්; වුත්තො, කියනලදී; නිසෙධෙතබ්බං, ප්‍රතිෂේධකටයුතුවූ වස්තුවට; පධාන, පැමිණි; සදිසත්ථ, සදෘශාර්ථය, හෙවත් සදිසතා, තත් සදෘශභාව; අනපෙක්ඛතො, නොබලන්නේද; පසජ්ජපටිසෙධො ඉති, (එය) ප්‍රසහ්‍යප්‍රතිෂේධයයි; සුධීමතා, ප්‍රාඥයාවිසින්; වෙදිතබ්බො, දතයුතු.

89. පරිතුලිතං; හාත්පසින් තුලනාකටයුතුවූ; අත්ථං අපි, ශබ්දාර්ථයද; උපගන්ත්වා, සංග්‍රහ කොට; නිසෙධනං, යම්ප්‍රතිෂේධයෙක් ඇද්ද; සො නිසෙධනො, ඒ ප්‍රතිෂේධයතෙම. පණ්ඩිතෙන, පණ්ඩිතයා විසින්; පරියුදාසො ඉති, පර්‍ය්‍යුදාසයයි; ඤෙය්‍යො, දතයුතු. ප්‍රසහ්‍යප්‍රතිෂේධයනම් සර්වප්‍රකාරයෙන් ප්‍රතිෂේධ කිරීමයි පර්‍ය්‍යුදාසප්‍රතිෂේධය නම් එක් අර්ථයෙක් හැර අනික් අර්ථයෙක් කීමයි.

90. අස්සද්ධාලවණභොජී, අස්සද්ධභොජී අලවණභොජී යන; ඉදං, මේ උදාහරණවය; පුබ්බ, පූර්වයට හෙවත් පූර්වවූප්‍රසහ්‍යප්‍රතිෂේධයට; නිදස්සනං, උදාහරණයයි; අසූරියං පස්සං මුඛං, අසූරියං පස්සං මුඛං යන; ඉදං, මේ උදාහරණය; පච්ඡිමදීපකං, පශ්චිමාර්ථයවූ පර්‍ය්‍යුදාසලක්ෂණය හඟවයි.

91. නෙය්‍යත්ථො ච නීතත්ථො ච සද්දෙ, ද්විධා පකාසිතො
සද්දන්තරෙන ඤාපෙතො නෙය්‍යත්ථො'ති පවුච්චති
සයමෙව ගමිතත්ථො නීතත්ථො'ති තථා මතො.

92. පිතා'ති වුත්තෙ සාගුත්තං පාතො ඤාපෙති සද්දතො
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං.

93. අත්ථා පකරණා ලිඞ්ගා ඔචිත්‍යා * කාලදෙසතො
සද්දත්ථා විභජීයන්ති න සද්දායෙව කෙවලා.

---

'අස්සද්ධභොජී, යනු මතකබත් අනුභවනොකරන්නාය 'අලවණභොජී' යනු ලුණුරස අනුභව නොකරන්නාය–'අස්සද්ධභොජී ච අලවණභොජී ච අස්සද්ධාලවණභොජී, කියා මේ එකදෙශසරූපෛකශෙෂවත්වසමාසයයි 'අසූරියං පස්සං මුඛං, යන ප්‍රයොගයෙහි ගුප්තස්ථානයෙහි වසන රාජස්ත්‍රිය සූර්‍ය්‍යයා නො දක්නාහෙයින් සූර්‍ය්‍යයා නොදක්නා මුඛයයි ව්‍යවහෘතයි.

ඉක්බිති 'නෙය්‍යත්ථො' යනාදීන් තදන්‍යලක්ෂණයක් දක්වූහු.

91. නෙය්‍යත්ථො, නෙයාර්ථශබ්දය ද හෙවත් පැමිණවියයුතුඅර්ථඇතිශබ්ද සද; නීතත්ථො ච, නීතාර්ථශබ්දය ද හෙවත් පමුණුවනලදඅර්ථඇතිශබ්දය දැයි කියා; සද්දෙ, ශබ්දයතෙම; ද්විධා, දෙපරිද්දෙකින්; පකාසිතො, ප්‍රකාශකරණලදී; සද්දන්තරෙන, අන්‍යශබ්දයෙකින්; ඤාපෙතො, හඟවනලද්දේ; නෙය්‍යත්ථො ඉති, නෙයාර්ථයයි; පවුච්චති, කියනුලැබේ; සයං එව, තමා විසින්ම; ගමිතත්ථො, හඟවනලද අර්ථඇත්තේ; නීතත්ථො ඉති, නීතාර්ථයයි; තථා, එපරිද්දෙන්; මතො, දන්නාලදී.

ඔවුන්ට උදාහරණ නම්.

92. පාතො, උදෑසන; පිතා, ඉති, පානයකරණලදැයි; වුත්තෙ, කීකල්හි; සාගුත්තං, හුළුකැනය (යන අර්ථය;) සද්දතො, අන්‍ය ශබ්දයෙකින්; ඤාපෙති, හඟවයි; (මේ නෙයාර්ථයයි–) චිත්තස්ස, චිත්තයාගේ; දමථො, නිපොපිකිරීම හෙවත් දමනය; සාධු, මැනවි; දන්තං, දමනයකරණලද; චිත්තං, සිත; සුඛාවහං, සැප එලවන්නේය; (මේ නීතාර්ථයයි)–'චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං, යනාදී ගාථාවෙහි 'චිත්ත' ශබ්දය විචිත්‍රාදී අර්ථඇතත් මෙතන්හි දමථදන්ත ශබ්දයන්ගේ ප්‍රයොගයෙන් විඥානාර්ථය දතයුතු.

93. අත්ථා, අර්ථවශයෙන්ද; පකරණා, ප්‍රකරණවශයෙන්ද හෙවත් උපකරණවශයෙන්ද; ලිඞ්ගා, ලිඞ්ගවශයෙන්ද; ඔචිත්‍යා, සුදුසුබවය යන මෙයින්ද; කාලදෙසතො, කාලවශයෙන් හා දෙශවශයෙන්ද; සද්දත්ථා, ශබ්දාර්ථයෝ; විභජීයන්ති, විභාගකරණු ලැබෙත්; කෙවලා, හුදුවූ; සද්දා එව, ශබ්දයෙන්ම; න, විභාගකරණු නොලැබෙත්.

---

* පොත්හි–ඔජත්‍යා.

94. සීහො ගායති නඞ්ගුට්ඨං සීහො චාලෙති පාඨකො
සීහොව මාණිකොවා සීහො අත්ථතො ඤායතෙ බුධො.

95. දූතසාලයකෙ ඨත්වා සඞ්ගාමෙ ච යථාක්කමං
අසෙස ආගතාසිති වුත්තෙන දලිද්දො සො'ති ඤායතෙ.

96. සුවණ්ණා උරගං ගණ්හ සුවණ්ණං හාති පබ්බතෙ
ලිඞ්ගතො පක්ඛිරාජඤ්ඤං වෙදිතබ්බං විභාවිනා.

97. ඔචිත්‍යං ලොකතො ඤෙය්‍යං පුබ්බාපරාවිරොධිතං
අනත්තතො විඤ්ඤාණසන්තානතා පරං සන්තති සො මුනි.

---

94. සීහො, සිංහතෙම; ගායති, ගායනාකෙරේයි; සීහො, සිංහතෙම; නඞ්ගුට්ඨං, නඟුට; චාලෙති, සොලවයි (ගහ); පාඨකෙ, පාලියෙහි; සීහොව ප්‍රකෘති සිංහතෙමේ ද; මාණිකොවා සීහො, පුරුෂ සිංහතෙමේ ද; බුධො, ප්‍රාඥයා විසින්; අත්ථතො, අර්ථවශයෙන්; ඤායතෙ, දන්නාලැබේ. (මෙහි 'බුධො' යනු තෘතීයෙහි ප්‍රථමායි.)

95. දූතසාලයකෙ, දූතසාලාවෙහිද; සඞ්ගාමෙ ච, යුඞභූමියෙහි ද; ඨත්වා, සිට; අසෙස, අසෙයත්; ආගතාසි ඉති, ගෙණ එව යි; වුත්තෙන, කීකල්හි; යථාක්කමං, පිළිවෙළින්; දළිද්දො, දරිද්‍රයා ද; අසෙසා ඉති, අසුද්ධයි; ඤායතෙ, දන්නාලැබේ යෙවත් හැතේ;–(තත්‍ර සං ඛතං එතස්සා'ති අසෙසා දලිද්දො' අසි ඛ්‍යං අසති හණතීති ආසු සීඝං ගච්ඡතීති වා අසෙසා, තුරගො, යනු ටීකායි.)

96. සුවණ්ණා උරගං ගණ්හ සුවණ්ණං හාති පබ්බතෙ, සුවණ්ණා පෙ—පබ්බතෙ යන ප්‍රයොගයෙහි, ලිඞ්ගතො, ලිඞ්ගවශයෙන්; පක්ඛිරාජඤ්ඤං, පක්ෂිරාජාදෙවගීය; විභාවිනා, ප්‍රාඥයා විසින්; වෙදිතබ්බං, දතයුතු.

සුවණ්ණා, ගුරුළුතෙම; උරගං, නාගයා; ගණ්හ, ගණියි; (මෙහි සුවණ්ණ ශබ්දය පුල්ලිඞ්ගයි) පබ්බතෙ, පර්වතයෙහි, සුවණ්ණං, රත්රන්; හාති, බබලයි, (මෙහි සුවණ්ණ ශබ්දය නපුංසකලිඞ්ගයි–එහෙයින් පුල්ලිඞ්ග සුවණ්ණ ශබ්දය ගරුඩ පර්යායයි හ පුංසකලිඞ්ගිකය සුවණ්ණ ශබ්දය සුවර්ණ පර්යාය යයි දතයුතු.

97. පුබ්බාපරාවිරොධිතං, පූර්වාපරයන්ට අවිරුඞබවවූ; ඔචිත්‍යං, සුදුසුබව; ලොකතො, ලොකව්‍යවහාරයෙන්; ඤෙය්‍යං, දතයුතු; සො මුනි, ඒ සර්වඥයන් වහන්සේ; අනත්තතො, තමන් වහන්සේගෙ; චිත්තසන්තානතා, චිත්තය සන්තුෂ් බැවින්; පරං, (දෙව්මිනිසුන් සහිතවූ) අන්‍යජනයා; සන්තෙති, සන්හිඳුවයි හෙවත් සිවයි

98. තයො භික්ඛූ සන්නිපාතා සායං පීතාති භාසිතෙ
න සාමා ඉති විඤ්ඤෙය්‍යා ඤායති යාමකාලිකාති.

99. උදකෙ රොහිතා සන්ති ථලෙ සන්ති ච රොහිතා
ඉති පාඨෙ පුබ්බෙ මච්ඡා පරෙතු මිගරොහිතා.

100. සංයොගා විප්පයොගා ච සාහචරියා විරොධතො
සද්දන්තරවසෙනාපි සද්දො විසෙසවාචකො.

101. සවච්ඡං ධෙනුමානෙහි * වුත්තෙ ගාවී න වලවා
අවච්ඡං ධෙනුමානෙහි වුත්තෙ වලවාති ඤායති.

---

98. තයො භික්ඛූ, භික්ෂූහු තුන්දෙනෙක්; සන්නිපාතා: රැස්වූවාහු; සායං, සවස්වේලෙහි; පීතා ඉති, පානය කළෝයයි; භාසිතෙ, කීකල්හි; සාමා ඉති, මදිරාවයයි; න විඤ්ඤෙය්‍යා, නොදතයුත්තේය; යාමකාලිකා ඉති, (මධුමුද්දිකාදි) යාමකාලික (පැන්)යයි; ඤායති, දන්නාලැබේ.

99. උදකෙ, ජලයෙහි; රොහිතා, රොහිතයෝ; සන්ති, සෙත්; ථලෙ, ගොඩ; රොහිතා, රොහිතයෝ; සන්ති ච, සෙත්; ඉති පාඨෙ, යන මේ පාඨයෙහි; පුබ්බෙ, පූර්වවාක්‍යයෙහි; මච්ඡා, මත්ස්‍යයෝ කියනලද්දුහ; පරෙතු; පරභාගයෙහි වනාහි; මිගරොහිතා, මෘගවිශෙෂයක්වූ රොහිතයෝ; කියන ලද්දුහ.

100. සංයොගා, සංයොගවශයෙන් ද හෙවත් එක්කොට කීමෙන්ද; විප්පයොගා ච, විප්‍රයොගවශයෙන් ද හෙවත් වෙන්කොට කීමෙන්ද; සාහචරියා, සහචරණයෙන් ද හෙවත් එක්වපැවැත්මෙන්ද; විරොධතො, විරුද්ධවශයෙන් ද; සද්දන්තරවසෙන අපි, අන්‍යශබ්දයක් හා යෙදීම්වශයෙන් ද; සද්දො, ශබ්දය තෙම; විසෙසවාචකො, විශෙෂාර්ථය කියන්නේය.

101. සවච්ඡං, වත්සාසහිතවූ; ධෙනුං, ධෙනුව; ආනෙහි, ගෙණඑව (යි) වුත්තෙ, කීකල්හි; ගාවී, ගාවිය (හැගේ;) වලවා, වෙළඹ; න, නොහැගේ; අවච්ඡං, වත්සාරහිතවූ; ධෙනුං, ධෙනුව; ආනෙහි, ගෙණඑව (යි;) වුත්තෙ කීකල්හි; වලවා ඉති, වෙළඹයයි; ඤායති, හැගේ.

මේ "අවච්ඡං ධෙනුමානෙහි වුත්තෙ වලවාති ඤායති" යන්න සුබොධ නොවේ, කුමක්හෙයින්දයත්? මෙහි වත්සාගේ විප්‍රයොගයෙන් ගාවියම හැඟෙන බැවින් හා මෙයින් වෙළඹ හැඟීමට තිබෙන යුක්තිය අප්‍රකට බැවිනුත්ය මිට ටීකාකාරයන් විසින් "නනු ච ගාවිපි වඤ්ඣා වා පුත්තමරණාදිසු කාලෙසු පුත්තවිරහා වා සියාති සච්චං අවච්ඡසද්දස්ස රුළ්හිසද්දත්තා එකන්තා වළවාගතා ච" යන්නෙන් කියනලද අදහසද අප්‍රකටයි මේ සංයොග විප්‍ර

---

* "සවච්ඡං ධෙනු පානෙහි" යනපාඨයෙක් ටීකාවෙහි පෙනේ.

102. සාරිපුත්තමොග්ගල්ලානා වුත්තා තු අග්ගසාවකා
න ගන්ථකො විඤ්ඤෙය්‍යො සභාවරියෙන විඤ්ඤුනා.

103. කුසලාකුසලං පාඨෙ කුසල'න්ති ඉට්ඨඵලදං
න ඡෙකාදිති විඤ්ඤෙය්‍යා විරොධෙන සුධීමතා.

104. රමණීයා වත හොන්ති දෙසිතාරත්ති ආදිසු
දෙසාපගමභාවො'පි රමණීයෙන ඤායතෙ.

---

යොගවශයෙන් අර්ථප්‍රවිභාගයට නිදර්ශන දක්වන ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය තොටගමුවේ ශ්‍රීරාහුලාභිධාන සඞ්ඝරාජමහාස්ථවිරපාදයන් විසින් මෙසේ දක්වනලදී—"තත්‍ථ සංයොගතො සද්දත්‍ථප්පවිභාගො, යථා සකිසොරා ධෙනු දියතූති වුත්තෙ අස්සපොතකවාචිකිසොරසද්දසංයොගතො වලවා එව පතීයතෙ න ගාවී, විප්පයොගතො අකිසොරා ධෙනු දියතූති වුත්තෙ තප්පටිසෙධා වලවා එව පතීයතෙ නගාවී" යන්නෙනත් මේ අර්ථය සුබොධයි කාරණානුරූපයි, ඒ ග්‍රන්ථකර්තෘන් විසින් කියනලද්දේ වච්ඡශබ්දය අශ්වපොතක පර්‍ය්‍යායනොවනබව සලකාගෙණයි ඊට ටීකාකාරයන් විසින් කියනලද අදහස යහපත්ව නොයෙදේ.

102. සාරිපුත්තමොග්ගල්ලානා, සාරිපුත්‍රමොග්ගල්ලානයයි, වුත්තා තු, කීකල්හි වනායි; සභාවරියෙන, සාභාවර්‍ය්‍යයෙන්; අග්ගසාවකො, ශාරිපුත්ත ශබ්දයෙන් අග්‍රශ්‍රාවකවූ දම්සෙනෙවිශාරිපුත්‍රස්ථවිර තෙමේම (හැඟේ;) ගන්ථකො, ගන්ථකශාරිපුත්‍ර ස්ථවිරතෙමේ; න, නොහැඟේයයි; විඤ්ඤුනා, නුවනැත්තහු විසින්; විඤ්ඤෙය්‍යො, දතයුතු.

103. කුසලාකුසලං පාඨෙ, කුසලාකුසලං (යන) පාඨයෙහි; විරොධෙන, විරුද්ධවශයෙන්; කුසලං ඉති, කුසලං යන්නෙන්; සුධීමතා, සුධීමත්හු විසින් ඉට්ඨඵලදං, ඉෂ්ටවිපාකය දෙන කුසලය දතයුතු; ඡෙකාදී, ඡෙකාදීහු; න විඤ්ඤෙය්‍යා ඉති, නොදතයුත්තාහුයි.

104. රමණීයා වත හොන්තා දෙසිතා රත්තිආදිසු, රමණීයා වත හොන්තා දෙසිතාරත්ති යනාදී පාළියෙහි; දෙසාපගමභාවො අපි, දෙසයන්ගේ පහවීම්බවද; රමණීයෙන, රමණීයශබ්දයෙන්; ඤායතෙ, හැඟේ.

හොන්ති, භවත්නි; දෙසිතාරත්ති, දෙෂයන්ගෙන් පහවූරාත්‍රී තොමෝ; වත, එකාන්තයෙන්; රමණීයා, සිත්කළුයි; (දෙසිතාරත්ති, යන්නෙහි දෙෂාපගමය රමණීයශබ්දයෙන් දතයුතු.)

මෙසේ සර්වව්‍යාපකශබ්දලක්ෂණය දක්වා දැන් අනික් ශබ්දලක්ෂණයක් දක්වන්නෝ "මාතත්‍ථා" යනාදිය කීහු.

105. මානන්තා ච වත්තමානානාගතෙසු පවත්තරෙ
අන්තො කත්තරි මානො තු භාවෙ කම්මනි කත්තරි.

106. භුඤ්ජන්තො භාසති වාචං ගච්ඡන්තො පාපුණිස්සති
මීයමානං පාණකෙන මීයමානො'ති සො ජනො.

107. ගච්ඡමානො'න්තනො ගෙහං වුය්හමානො නස්සිස්සති
කෙචි තු පච්චුප්පන්නාව තෙහි වුත්තං විචාරිතං.

108. නිච්චප්පවත්තිසාමීපෙ පවත්තූපරතෙ තථා
පවත්තාවිරතෙ චෙව වත්තමානො චතුබ්බිධො.

---

105 මානන්තා ච, මානය අන්තයන ප්‍රත්‍යයෝද; වත්තමානානාගතෙසු, වර්තමානකාලඅනාගතකාල දෙක්හි හෙවත් වර්තමානක්‍රියාඅනාගතක්‍රියා දෙක්හි; පවත්තරෙ, පවතිත්; අන්තො, අන්තප්‍රත්‍යයතෙම; කත්තරි, කර්තෘකාරකයෙහි වන්නේය; මානො තු, මානප්‍රත්‍යය වනාහි; භාවෙ. භාව සාධනයෙහි ද; කම්මනි, කර්මසාධනයෙහි ද; කත්තරි, කර්තෘසාධනයෙහි ද වන්නේය.

හේ මෙසේයි.

106. භුඤ්ජන්තො, අනුභවකරමින්; වාචං, වචනය; භාසති, කියයි; ගච්ඡන්තො, යෙමින්; පාපුණිස්සති, (අවශ්‍යයෙන්) පැමිණෙන්නේය; පාණකෙන, සත්වයා විසින් හෙවත් ජනයා විසින්; මීයමානං, ප්‍රමාණකට සුතුවූ වෑතුවයි; සො ජනො, ඒජනතෙම; මීයමානො ඉති, ප්‍රමාණකරමින් යේයයි–(මීයමානො සො ජනො ගච්ඡති, යි සම්බන්ධකටයුතු මේ වර්තමානයයි.)

107. අන්තනො ගෙහං, සියගෙට; ගච්ඡමානො, යන්නාවූ ජනතෙමේ; (පාපුණිස්සති,යි සම්බන්ධකටයුතු) වුය්හමානො ගෙණියනුලබන්නාවූ වෘක්ෂය තෙම; නස්සිස්සති, නැසෙන්නේය; (වුය්හමානො රුක්ඛො නස්සිස්සති, යි සම්බන්ධකටයුතු) කෙචි තු, විශෙෂ නොදත් ඇතැම් කෙණෙක් වනාහි; පච්චුප්පන්නා එව, ප්‍රත්‍යුත්පන්නයෝම යයි කියත්); තෙහි; ඔවුන් විසින්; වුත්තං, කියනලද්ද; විචාරිතං; විචාරණය කටයුතු.

මෙසේ මානඅන්තප්‍රත්‍යයලක්ෂණ දක්වා තදනන්තරව වර්තමානලක්ෂණ දක්වන්නෝ 'නිච්චප්පවත්ති' යනාදිය කීහු.

108. නිච්චප්පවත්ති, හැමකල්හි පැවැත්ම ද; සාමීපෙ, සමීපයෙහිවූයේද; පවත්තූපරතෙ, පවත්නාදෙයින් වැළකීම ද; තථා, එසේම; පවත්තාවිරතෙ ච එව, පවත්නාදෙයකඩනොවී පැවැත්මද්දයි කියා; වත්තමානො, වර්තමානය; චතුබ්බිධො, චතුර්විධයී.

109. කුමාරකා කීළන්තීධ ආගච්ඡාමි කදාගතො
ත්වං ච ඊහි ච ගච්ඡාහි ගමිස්සසි කදා'ති ච.

110. න ඛාදන්ති අයං මංසං ඉහ තිට්ඨන්ති නින්නගා
පබ්බතාපි ච තිට්ඨන්ති ඉදං තෙසං නිදස්සනං.

111. ගඞ්ගා ච තංසමීපො ච ඝොසො ගඞ්ගාවනාගතං
තීතඤ්ච වත්තමානං තංසමීපත්තා පතීයතෙ.

112. ලිඞ්ගෙකසෙසත්තං නාභාසෙ අනෙමිත්තකභාවතො
විභත්‍යෙකසෙසත්තං කළුනාගවුත්‍යාථාවරා.

---

109. ඉධ, මෙහි; කුමාරකා, කුමාරකයෝ; කීළන්ති, ක්‍රීඩාකෙරෙත්; ආගච්ඡාමි, මම එමි; ත්වං, තෝ; කදා, කවරකලෙක්හි; ආගතො අසි, ආයෙහිද; ත්වං, තෝ; ගච්ඡාහි, යව; කදා, කවරකලෙක්හි; ගමිස්සසි ඉති ච, යෙහිද.

110 අයං, මේජනයා; මංසං න ඛාදති, මස් නොකයි, නින්නගා, ක්‍ෂුද්‍රන දීහු; ඉහ, මෙහි; තිට්ඨන්ති, සිටිත්; පබ්බතා අපි ච, පර්වතයෝද; (ඉහ, මේ දෙශයෙහි; තිට්ඨන්ති (පිහිටා) සිටිත්; තෙසං, ඒසතරට; ඉදං නිදස්සනං, මේ උදාහරණයි.

ප්‍රතිලොමක්‍රමයෙන් උදාහරණදතයුතු.

'නින්නගා තිට්ඨන්ති පබ්බතා තිට්ඨන්ති, යන ප්‍රයොගයන්හි ක්‍ෂුද්‍රනදී පර්වතයන්ගේ සිටීම නිත්‍යප්‍රවෘත්ත හෙයින් වර්තමානයෙන් කියනලදී. මේ නිත්‍යප්‍රවෘත්තයට උදාහරණයි.—"අහං ආගච්ඡාමි, ත්වං කදා ආගතොසි, ත්වං ගච්ඡාහි, ත්වං කදා ගමිස්සසි" යනමේ ප්‍රයොගයන්හි වර්තමානසමීපයෙහි ක්‍රියා පවත්නාහෙයින් භූතසාමීප්‍යභවිෂ්‍යත්සාමීප්‍යදෙක්හි පවත්නා ක්‍රියා වර්තමානයට සමීපබැවින් වර්තමානයෙහි සංග්‍රහීතයි, ඒ සංග්‍රහීතලක්‍ෂණ දක්වන්නෝ "ගඞ්ගා ච" යනාදිය කියත්.

111 ගඞ්ගාව, (ජලප්‍රවාහලක්‍ෂණවූ) ගඞ්ගාව ද; තං සමීපො, ඊටසමීප වූ; ඝොසො ච, ගොපල්ලගම ද; ගඞ්ගා ඉව, ගඞ්ගා යන ව්‍යවහාරය මෙන්; අනාගතං, අනාගතක්‍රියාවද; අතීතඤ්ච, අතීතක්‍රියාව ද; වත්තමානං, වර්තමානක්‍රියාව ද; තං සමීපත්තා, ඒ වර්තමානයට සමීපවූබැවින්: පතීයතෙ, (වර්තමානයයි) හැඟේ;.

"අයං ජනො මංසං නඛාදති" යන ප්‍රයොගයෙහි පැවති මාංසභොජනයෙන් වැළකීම කියනහෙයින් ප්‍රවෘත්තොපරතනම් "ඉධ කුමාරකා කීළන්ති" යන ප්‍රයොගයෙහි තත්කාලයෙහි ක්‍රීඩාව නැතත් පූර්වක්‍රීඩාවෙහි බුද්ධිය ගෙණ වර්තමාන ව්‍යවහාරය කියනලදී, මේ ප්‍රවෘත්තාවිරතනම්.

112. ලිඞ්ග, ලිඞ්ගයෙහි හෝ අවිභක්තිකයෙහි; එකසෙසත්තං, එකසෙස බව; අනෙමිත්තකභාවතො, නෛමිත්තකභාවය නොවනහෙයින් හෙවත්

113. සරූපසමුදයෙකසෙසත්තං පඤ්චිකාබ්‍රවුං
ඉච්චෙවං තිවිධා කප්පා දට්ඨබ්බා සාරබුද්ධිනා.

114. එකකාරකතඤ්චෙව අවුද්ධිංච නිදස්සිතුං
බ්‍යාසත්ථං ච විභත්‍යන්තං වසද්දො ච කරීයතෙ.

115. චතුසාධාරණො ගොව දීපො’ව සනිදස්සනො
විභත්‍යාපියා තථෙකාය නෙකා සඞ්ඛ්‍යා පතීයතෙ.

---

අනිච්ඡිතදර්ශිතය හෙතුකොටගෙණ; න්‍යාසෙ, න්‍යාසප්‍රකරණයෙහි; (සරූපානමෙකසෙසොත්වසකිං‘යි කියනලදී) විභත්‍යන්තෙ, විභක්ත්‍යන්තයෙහි හෙවත් සවිභක්තිකයෙහි; කච්චායනවුත්තිථාවරා, කාත්‍යායනවෘත්තියෙහි ස්ථාවර ආචාර්ය්‍යවරයෝ; එකසෙසත්තං, එකසෙස බව (කියනලදී.)

113. සරූපසමුදය, සමානරූපවූ පදව්‍යඤ්ජන සමූහයෙහි; එකසෙසත්තං, එකසෙසබව; පඤ්චිකා (මොග්ගල්ලායන) පඤ්චිකාචාර්ය්‍යයෝ; අබ්‍රවුං, කීහු–(ඇතම් කෙණෙක් කාලාප පඤ්චිකාචාර්ය්‍යයෝයයි කියත්) ඉති එවං, මේ උක්තප්‍රකාරයෙන්; තිවිධා කප්පා, ත්‍රිවිධ විකල්පයෝ; සාරබුද්ධිනා, ස්ථිර බුද්ධිඇත්තහු විසින්; දට්ඨබ්බා, දක්කයුත්තාහුය (හෙවත්); සාරබුද්ධිනා, ස්ථිරවූ නුවනින්; දට්ඨබ්බා, දක්කයුත්තාහුය.

114. එකකාරකතං ච එව, එකකාරකබව හෙවත් එකපදබවද; අවුද්ධිං ච, වෘද්ධිරහිතබව ද; බ්‍යාසත්ථං ච, කැමතිපරිද්දෙන් ව්‍යාපනවූඅර්ථය ද; නිදස්සිතුං, දක්වනු පිණිස හෙවත් ප්‍රකාශ කරණු පිණිස; විභත්‍යන්තං, විභක්ත්‍යන්තය ද; වසද්දො ච, වශබ්දය ද; කරීයතෙ, කරණුලැබේ.

මේ ආචාර්ය්‍යතෙම පුරිමාචාර්ය්‍යලබ්ධ්‍යනුරූපවූ ශබ්දලක්ෂණය සාදන්නේ මෙසේ කියයි, ලිඞ්ගයෙහිම එකසෙසය වීනම් කුමක් සඳහා විභක්ති හා වශබ්දයත් යොදනුලැබේදයත් ඒ ප්‍රයෝජනය දක්වනු සඳහා මේ ගාථාව කියනලදී.

“බොහෝ අර්ථඇති බැවින් ඒ ප්‍රකාශකරණු පිණිස බොහෝ විභක්තීහු යොදනලද්දාහු වියයුතුදයත්” යන චොදනාව මෙතෙහි කොට “චතුසාධාරණ” යනාදිය කියත්.

115. චතුසාධාරණ ගො ඉව, සතරදෙනෙකුන්ට සාධාරණවූ දෙනක් මෙන්ද; සනිදස්සනො, (නිල්ඇපැහැය) ප්‍රකාශ කරන්නාවූ; දීපො ඉව, ප්‍රදීපයක් මෙන්ද; එකාය විභත්‍යාපියා, එකවිභක්තියකින්; තථා, එසේම; නෙකා සංඛ්‍යා, නොයෙක්සඞ්ඛ්‍යාව, පතීයතෙ, අවගමනය කරණුලැබේ;.

මේඑකසෙසය වනාහි කවරනාමපදයෙක් භජනය කෙරේද යන චොදනාවට පරිහාර දක්වන්නාහු “කෙචි” යනාදිය කීහු.

116. කෙචි අප්පච්චයන්තා තං සුද්ධනාමපදන්ති ච
අපරේ පරිකප්පෙන පච්චයෙ විගතෙපි ච.

117. තද්ධිතන්ති ච එකච්චෙ මඤ්ඤෙව සො සභාවතො
තං ලක්ඛණස්ස තං නාමෙනෙකසෙසොති ලක්ඛයෙ.

118. එකසෙසපකප්පෙන පුරෙත්ථිති කිතෙන වා
පුරිසා'ති පුරට්ඨානෙ සෙත්තිතූපපදෙන වා.

119. මාතරො පිතරො සාරිපුත්තා පුත්තා'ති ආදිසු
එකසෙසො විරූපානං වුත්තො යොගවිභාගතො.

120. වජ්ජනිවාරකො එකසෙසො'ති ඤායතො මතො
වජ්ජවිසයපුබ්බො'පි න වණ්ණකාසවා භවෙ.

---

116. කෙචි, (විචිත්‍රග්‍රන්ථකාරකාදී) කිසිආචාර්‍ය්‍යකෙණෙක්; අප්පච්චයත්තා, ප්‍රත්‍යයරහිතබැවින්; තං, ඒ එකසෙසය; සුද්ධනාමපදං ඉති ච, කෙවලවූනාම පදයයිද කියත්; අපරෙ, (භාසාකාරාදී) අන්‍යාචාර්‍ය්‍යකෙණෙක්; පරිකප්පෙන, පරිකල්පවශයෙන්; පච්චයෙ විගතෙ අපි ච, ප්‍රත්‍යයරහිතකල්හිද කියත්.

117. එකච්චෙ, (තවත්) ඇතම්ආචාර්‍ය්‍යකෙණෙක්; තද්ධිතං ඉතිච, තද්ධිත යයිද කියත්; සො, ඒ එකසෙසය; සභාවතො, ශබ්දස්වභාවවශයෙන්; මඤ්ඤෙ එව, වන්වසමාසවයයි කියතුලැබේ; තං ලක්ඛණස්ස, ඒ ඒ ලක්ෂණ යාගේ; තංනාමෙන, ඒ ඒ නාමයෙන්; එකසෙසො ඉති, එකසෙසයයි; ලක්ඛයෙ, දක්නේය;.

"පුරිසා" යයි බහුවචවිවක්ෂාව ඇතිකල්හි එකශෙෂය කිත්‍යයෙන් වේයයි යන ආශංකානිවාරණය පිණිස "එකසෙසපකප්පෙන" යනාදිය කියත්.

118. එකසෙසපකප්පෙන, එකසෙසනය සිතීමෙන් හෝ; පුරෙත්ථි ඉති, පුරෙත්ථි යන, කිතෙන වා, කෘදන්තවාක්‍යයෙන් හෝ, පුරට්ඨානෙ සෙත්ති ඉති, පුරට්ඨානෙ සෙත්ති යන; උපපදෙන වා, උපපදසමාසයෙන් හෝ; පුරිසා ඉති, පුරිසා යන පදසිද්ධිය දතයුතු.

ඉක්බිති විරූපෛකශෙෂයට නිදර්‍ශන කළෝ.

119. මාතරො, (මාතා ච පිතා ච) මාතරොය; පිතරො, (මාතා ච පිතා ච) පිතරොය; සාරිපුත්තා, (සාරිපුත්තො ච මොග්ගල්ලානො ච) සාරිපුත්තාය; පුත්තා ඉති, (පුත්තො ච ධීතා ච) පුත්තාය යන; ආදිසු, මේආදී ප්‍රයොග යෙහි; යොගවිභාගතො, "සරූපානමෙකසෙසස්වසකිං" යනසූත්‍රය 'එක සෙසෙස්වසකිං" යි විභාගකිරීමෙන්; විරූපානං, අසමානරූපයන්ගේ; එක සෙසො, එකසෙසයතෙම; වුත්තො, කියනලදී.

120. එකසෙසො, එකසෙසයතෙම, වජ්ජනිවාරකො ඉති, වන්වය ප්‍රති ෂෙධකොට ඇත්තේය යන; ඤායතො, න්‍යායහෙයින්; මතො, දන්නාලද;

121. භුසොරිතෙ'පි නෙකත්ථං විච්ඡාවචනමීරිතං
ආමෙණ්ඩිතං පනෙකත්ථං මත්තික්ඛත්තුමුදීරිතං.

122. භින්නවත්ථූනි දබ්බෙන ගුණෙන ච ක්‍රියාය වා
බ්‍යාපිතුං වත්තුනො ඉච්ඡා විච්ඡාචෙව පතීයතෙ.

123. ගාමෙගාමෙ ජලං කුම්භං ගාමො ගාමො රමණීයො
ගාමො ගාමො'ව ගම්‍යතෙ යථාසංඛ්‍යං නිදස්සනා.

124. ජලදබ්බාදිනා බ්‍යාපිතුමිච්ඡාවචනම්පන
දබ්බිච්ඡා ගුණවිච්ඡා ක්‍රියාවිච්ඡා වචනං මතං

125. කෙචි පන බහුත්තම්පි දබ්බාදිනමෙකක්ඛණෙ
බ්‍යාපිතු මිච්ඡාවචනං දබ්බිච්ඡාවචනමාහු ච.

---

වඥ්ජිසයපුබ්බො අපි, වඥ්ජනිකරණපූර්වකොටඇත්තේ ද; වසෙඥකාසවා, වත්වයට අවකාසඇත්තේ; න භවෙ, නොවන්නේය;.

විප්සාවචන දක්වනු පිණිස "භුසො" යනාදිය කියත්.

121. භුසො, බොහෝසෙයින්; (දෙවරෙක්යයිසේයි) ඊරිතෙ අපි, කිකල් හිදු; නෙකත්ථං, නොයෙක්අර්ථඇතිවචනය; විච්ඡාවචනං, විප්සාවචනයයි; ඊරිතං, කියනලදී; ආමෙණ්ඩිතං පන, ආම්‍රෙණ්ඩිතය වනාහි; එකත්ථං, එකාර්ථඇතිවචනයෙක්; මත්තික්ඛත්තුං, දෙතුන්වරෙක්; උදීරිතං, කියන ලද්දේයි.

දූන් ප්‍රභෙද හා උදාහරණ දක්වත්.

122. දබ්බෙන, ද්‍රව්‍යයෙන් හෝ; ගුණෙන ච, ගුණයෙන් හෝ; ක්‍රියාය වා, ක්‍රියාවෙන් හෝ; භින්නවත්ථූනි, බෙන් වෙන්වස්තූන්; බ්‍යාපිතුං, සම්බන්ධ කරන්නට; වත්තුනො, වක්තෘහුගේ; ඉච්ඡා, කැමැත්ත; විච්ඡා ඉති එව, විප්සාවමයයි; පතීයතෙ, හැගේ හෙවත් දන්නාලැබේ.

123. ගාමෙ ගාමෙ ජලං කුම්භං, ගාමෙ ගාමෙ ජල කුම්භං යනුද; ගාමො ගාමො රමණීයො, ගාමො ගාමො රමණීයො යනුද; ගාමො ගාමොව ගම්‍යතෙ, ගාමො ගාමොව ගම්‍යතෙ යනුද; යථාසංඛ්‍යං, පිළිවෙළින්; නිදස්සනා, උදාහරණයි.

124. ජලදබ්බාදිනා, ජලද්‍රව්‍යාදිය හා; බ්‍යාපිතුං, සම්බන්ධකරන්නට; ඉච්ඡාවචනං පන, කැමතිවූ වචනය වනාහි; දබ්බවිච්ඡා, ද්‍රව්‍යවිප්සා යයිද; ගුණවිච්ඡා, ගුණවිප්සා යයිද; ක්‍රියාවිච්ඡාවචනං, ක්‍රියාවිප්සාවචන යදුයි කියා; මතං, දන්නාලදී.

125. කෙචි පන, ඇතම් ආචාර්‍ය්‍ය කෙනෙක් වනාහි; බහුත්තං අපි, බොහෝවූද; දබ්බාදිනං, ද්‍රව්‍යාදීන්ගේ හෙවත් ද්‍රව්‍යගුණක්‍රියාවන්ගේ; එකක්ඛ

126. ගාමෝ ගාමෝ රමණීයෝ යාති යාති ජ පදනි
රෝදමානා රෝදමානා භුඤ්ජති තත්‍රෙකෙකං තිධාමතං.

127. ගාමෙ ගාමෙ සතං හත්ථී ගාමො ගාමො මනොරමා
රුක්ඛං රුක්ඛං ඡින්දතාදි දබ්බගුණක්‍රියාබ්‍යාපනං—දබ්බවිච්ඡාවචනං.

128. සුරතනං සුරතනං වණ්ණං සුරතනං රජිතබ්බං
පුට්ඨා පුට්ඨා බ්‍යාකාසීති දබ්බගුණක්‍රියාබ්‍යාපනං—ගුණවිච්ඡාවචනං.

129. ධාවමානා ධාවමානා ඔහිසී පච්ඡා පච්ඡා භුඤ්ජති
භුත්වා භුත්වා පුනට්ඨාසි දබ්බගුණ ක්‍රියාබ්‍යාපනං—ක්‍රියාවිච්ඡා වචනං.

130. ගුණදබ්බක්‍රියායොගා ගුණදබ්බක්‍රියාහි වා
බ්‍යාපිතුං වත්තුනො ඉච්ඡා විච්ඡා ඉච්චෙව භාසිතා.

---

ණේ, එකුවට; බ්‍යාපිතුං, සම්බන්ධකරන්නට; ඉච්ඡාවචනං, ඊප්සාවචනය; දබ්බවිච්ඡාවචනං ඉති ච, ද්‍රව්‍යවීප්සාවචනයයිද කියත්.

126. ගාමෝ ගාමෝ රමණීයෝ, ගාමෝ ගාමෝ රමණීයෝය; රෝදමානා රෝදමානා භුඤ්ජති; රෝදමානා රෝදමානා භුඤ්ජතිය; (යනාදී වශයෙන්) යාතියානි, යම්යම්; ජපදනි, පදසයෙක්වෙත්ද; (එසේ ගත්කල) තත්‍ර, ඒ ත්‍රිවිධවීප්සාවන් අතුරෙන්; එකෙකං, එක එක වීප්සාව; තිධාමතං ත්‍රිවිධයයි දන්නාලද.

127. ගාමෙ ගාමෙ සතං හත්ථී ගාමො ගාමො මනොරමා රුක්ඛං රුක්ඛං ඡින්දති ආදී, ගාමෙ ගාමෙ සතං හත්ථී—පෙ—රුක්ඛං රුක්ඛං ඡින්දති යනමේ ආදී (ද්‍රව්‍යවාචකශබ්දය)න්ගේ; දබ්බගුණක්‍රියාබ්‍යාපනං, ද්‍රව්‍යගුණක්‍රියාවන් හා සම්බන්ධ කිරීම; දබ්බවිච්ඡාවචනං, ද්‍රව්‍යවීප්සාවචනයයි.

128. සුරතනං සුරතනං වණ්ණං සුරතනං රජිතබ්බං පුට්ඨා පුට්ඨා බ්‍යාකාසි ඉති ආදී, සුරතනං සුරතනං වණ්ණං—පෙ—පුට්ඨා පුට්ඨා බ්‍යාකාසි යනමේ ආදී ගුණශබ්දයන්; දබ්බගුණක්‍රියාබ්‍යාපනං, ද්‍රව්‍යය ගුණය ක්‍රියාය යනමොවුන් හා සම්බන්ධකිරීම; ගුණවිච්ඡාවචනං, ගුණවීප්සාවචනයයි.

129. ධාවමානා ධාවමානා ඔහිසී, ධාවමානා ධාවමානා ඔහිසි කියාද; පච්ඡා පච්ඡා භුඤ්ජති, පච්ඡා පච්ඡා භුඤ්ජති කියාද; භුත්වා භුත්වා පුනට්ඨාසි, භුත්වා භුත්වා පුනට්ඨාසි කියාද ක්‍රියාවන්ගේ; දබ්බගුණක්‍රියාබ්‍යාපනං, ද්‍රව්‍යයගුණයක්‍රියාය යන මොවුන් හා සම්බන්ධකිරීම; ක්‍රියාවිච්ඡාවචනං, ක්‍රියාවීප්සාවචනයයි.

දැන් ව්‍යාප්තිලක්ෂණය දක්වත්.

130. ගුණදබ්බක්‍රියායොගා, ගුණද්‍රව්‍යක්‍රියාවන්ගේ යොගයෙන් හෝ; ගුණදබ්බක්‍රියාහි වා, ගුණද්‍රව්‍යක්‍රියාවන් හා සමග හෝ; බ්‍යාපිතුං, සම්බන්ධ කරන්නට; වත්තුනො, වක්තෘහුගේ; ඉච්ඡා, කැමැත්ත; විච්ඡා ඉති එව; වීප්සාවමයයි; භාසිතා, කියනලදී.

131. විච්ඡාවචනස්සෙව සමාස සම්බන්ධිනියා–
පෙක්ඛත්තා එකසෙසවච ද්විරුච්චාරණත්ථතා. *

132. සම්බන්ධිනියමතොනෙන සමාසාදිකතෙ පන
තස්සාපි සමසාදිතා ඤායතෙ මෙකපාදතො.

133. යථා හි සොසො ච අඤ්ඤො තදඤ්ඤොති හි ලක්ඛිතො
පඤ්චපඤ්චවිභාගෙහි පඤ්ච පඤ්ච (ච) සොති ච.

134. භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතුහලච්ඡරෙ
හාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො.

---

දැන් වීප්සාශබ්දයාගේ සමාසස්වභාවය හා එකපදබව දක්වත්.

131. විච්ඡාවචනස්ස, වීප්සාවචනයාගේ (සමාසා දිබවෙක් නැත්තේමය එසේදවුවත් බහුගේ) සමාසසම්බන්ධිනියඅපෙක්ඛත්තා, සමාසස්වභාවයෙන් සම්බන්ධකටයුතුබව අපෙක්ෂාකොටඇතිබැවින්ද; එකස්ස එව ච, එකම ශබ්දයාගේ; ද්විරුච්චාරණත්ථතා, දෙවරක් උච්චාරණයඅපිකොටඇති බැවින්ද; අපි එව, (සමාසස්වභාවය) ඇත්තේමය.

132. සම්බන්ධිනියමතොනෙන, (ඒවීප්සාවගේ) සම්බන්ධිනියමයෙන්; සමාසාදිකතෙ පන, සමාසාදියකළකල්හි වනාහි; තස්සා අපි, ඒ වීප්සා වගේද: එකපදතො, එකපදඇතිබැවින්; සමාසාදිතා, සමාසාදිබව; ඤායතෙ, හැඟේ;.

133. යථාහි, යම්සේ වනාහි; සො සො අඤ්ඤො, සො සො අඤ්ඤො යන වීප්සාව; තදඤ්ඤො ඉතිහි තදඤ්ඤොයිද (සමාසවශයෙන්) ලක්ඛිතො, දක්නා ලදී; පඤ්චපඤ්චවිභාගෙහි, පඤ්ච පඤ්චවිභාගෙහි යන්න; පඤ්ච පඤ්චසො ඉති ච, පඤ්ච පඤ්චසොයිද; (තද්ධිතයෙන්ද දක්නාලදී)

තදනන්තරව ආමේ‍රඩිතලක්ෂණ දක්වත්.

134. භයෙ, බියෙහිද හෙවත් භයෙක් පැමිණිකල්හිද; කොධෙ, ක්‍රොධයෙහිද; පසංසායං, පැසසීමෙහිද; තුරිතෙ, යුහුසුලුවීමෙහිද; කොතුහලෙ, කොතුහලකම්යෙහිද; අච්ඡරෙ, පුදුමයෙහිද; හාසෙ, තුෂ්ටියෙහිද; සොකෙ, ශොකයෙහිද; පසාදෙච, ප්‍රසාදයෙහිද; බුධො, නුවණැත්තේ; ආමෙණ්ඩිතං කරෙ, ආමේ‍රඩිත කරන්නේය හෙවත් දෙවරක් වචනය කියන්නේය;

---

* “විච්ඡාවචනං තස්සෙව සමාස සම්බන්ධිනියා
පෙක්ඛත්තා එකසෙසාව ච ද්විරුච්චාරණත්තතා” ඇතම්.

135. චොරෝ චොරෝ භයෙ තත්‍ථ පොඨ පොඨාදි කොධකෙ
සාධු සාධු පසංසායං ගච්ඡ ගච්ඡාහි තුරිතෙ.

136. කොතූහලා ගච්ඡා ගච්ඡ බුද්ධො බුද්ධොති අච්ඡරෙ
හාසාභික්කමා භික්කම සොකෙක පුත්ත පුත්තකා.

137. අහො සුඛං අහො සුඛං'ත්‍යාදිපසාදකං මතං
චසද්දෙන පාපො පාපො'භිරූපාභිරූපො මතො.

138. වණ්ණාගාමො වණ්ණවිපරියයොච මෙවාපරෙව ණ්ණවිකාරනාසා
ධාතුස්ස අත්‍ථාතිසයෙන යොගො තදුච්චතෙ පඤ්චවිධං නිරුත්තං.

---

135. තත්‍ථ, ඔවුන් අතුරෙන්; චොරෝ චොරෝ, චොරෝ චොරෝ යනු හෙවත් සොරෙක්ය සොරෙක්යකියා; භයෙ, භයක්පැමිණීකල්හි;(දෙවරක්කියයි) පොඨ පොඨාදි, පොඨ පොඨ යනාදිය හෙවත් මරව මරව යනාදිය කොධකෙ, ක්‍රොධයෙහිය; සාධු සාධු, සාධු සාධු යනු හෙවත් යහපත යහපත යනු; පසංසායං, පැසසීමෙහිය; ගච්ඡ, ගච්ඡාහි; ගච්ඡ ගච්ඡාහි යනු හෙවත් යව යව යනු; තුරිතෙ, සුහුසුලුවීමෙහිය.

136. කොතූහලෙ, කෞතුහලකම්යෙහි; ආගච්ඡ ආගච්ඡ, ආගච්ඡ ආගච්ඡ යනුයි හෙවත් එව එව යනුයි; බුද්ධො බුද්ධොති, බුද්ධො බුද්ධො යනු; අච්ඡරෙ, පුදුමයෙහිය; හාසෙ, තුෂ්ටියෙහි; අභික්කම අභික්කම, අභික්කම අභික්කම යනුයි හෙවත් මොබ එව මොබ එව යනුයි; සොකෙ, සොකයෙහි; එක පුත්තක එකපුත්තකා, එක පුත්තක එක පුත්තකායනුයි හෙවත් (මගේ ප්‍රියවූ එකම) පුත්‍රය එකම පුත්‍රය යනුයි.

137. අහො සුඛං අහො සුඛං ඉති ආදි, අහො සුඛං අහො සුඛං යනාදිය හෙවත් අහෝ සැපය අහෝ සැපය යනාදිය; පසාදකං, ප්‍රසාදයයි; මතං, දන්නාලදී; චසද්දෙන, චශබ්දයෙන්; පාපො පාපො, ලාමකය ලාමකය යනුද; අභිරූපො අභිරූපො, අභිරූපො අභිරූපො යනුද; මතො, දන්නාලදී.

දූත් නිරුක්තිනය දක්වත්.

138. වණ්ණාගාමො, අක්‍ෂරයක්හුගේ ආගමවනබවද; වණ්ණවිපරියයොච, වර්ණයාගේ ස්ථාන ව්‍යත්‍යයද හෙවත් වර්ණය උඩුයටිවනබවද; වණ්ණවිකාරනාසා—වර්ණයාගේ හෝ වර්ණයන්ගේ; විකාර, විරූපාන්තර ප්‍රාප්තිය; නාසා, නැසීමය හෙවත් ලොප්වනබවය යන; අපරෙ චෙව, අනික් දෙකද; අත්‍ථාතිසයෙන, අර්ථවිශෙෂයෙක් හා; ධාතුස්ස, ධාතුහුගේ; යොගො, යෙදීමද; තං පඤ්චවිධං, ඒ පඤ්චප්‍රකාරයතෙම; නිරුත්තං, අර්ථකථන වාක්‍ය පූර්වකවූ උච්චාරණයයි; උච්චතෙ, කියනුලැබේ.

139. තත්‍ථ වණ්ණාගමො නාම අසන්තුප්පත්ති වුච්චති
නක්ඛත්තරාජාරිව තාරකානං අජ්ජතග්ගෙති වා යථා.

140. වණ්ණානං ඨිතට්ඨානතො අඤ්ඤත්‍ථ තු පවත්තනං
වණ්ණවිපරියයො නාම හිංසති සීහො'ති ආදිසු.

141. එකස්ස වයරූපත්තං මෙහාවො'ති උදීරිතො
දිප්පතෙ භානුමාසො'යං චන්දිමාපි විජම්භතෙ.

142. යථාවිධිතු වණ්ණස්ස අඤ්ඤවණ්ණවිකාරතා
වණ්ණවිකාරො'ති ඤෙය්‍යා යථා නියඤ්චිතාදිසු.

143. වණ්ණලොපො වණ්ණනාසො මෙඝනස්ස බස්ස මාලා
මෙබලා මහියං රවයිති මයූරො'තිසයො මතො.

---

139. තත්‍ථ, ඔවුන් අතුරෙන්; වණ්ණාගමො නාම, වර්ණාගමය නම්; අසන්තුප්පත්ති, අවිද්‍යමානවර්ණයක්හුගේ උත්පත්තිය; වුච්චති, කියනුලැබේ; යථා, ඒ මෙසේයි; නක්ඛත්තරාජාරිව. නක්ඛත්තරාජා ඉව යනතන්හි නක්ඛත්තරාජාරිව යනුද; අජ්ජතග්ගෙ ඉති වා, අජ්ජ අග්ගෙ යන තන්හි අජ්ජතග්ගෙ යනුද මෙනි. *

140. හිංසති සීහො ඉති ආදිසු, හිංසතීති සීහො යනාදී ප්‍රයොගයන්හි; වණ්ණානං, වර්ණයන්ගේ; ඨිතට්ඨානතො, සිටියාවූ ස්ථාන ප්‍රදෙශයෙන්; අඤ්ඤත්‍ථ තු, අන්තැනක වනාහි; (උඩ හෝ යට හෝයි)-පවත්තනං, පැවතීම; වණ්ණවිපරියයොනාම, වර්ණව්‍යත්‍යයනම් වේ හෙවත් වර්ණවිපර්‍ය්‍යාස නම් වේ.

'හිංසතීති සීහො, යන ප්‍රයොගයෙහි හකාරස්ථානයෙහි සකාරය ද සකාරස්ථානයෙහි හකාරය ද ඊකාරය ද කියනලදී.

141. එකස්ස, එකවර්ණයක්හුගේ; වයරූපත්තං, රූපදෙකෙක්වනබව; මෙහාවො ඉති, මේධාවීයයි; උදීරිතො, කියනලදී; (දිප්පතෙ යනු ඊට උදාහරණයි) භානුමා, සූර්‍ය්‍යතෙම; දිප්පතෙ, බබලයි; සො අයං චන්දිමා අපි, ඒ මේ චන්ද්‍රතෙමේද; විජම්භතෙ, විශෙෂයෙන් ප්‍රකාශ වෙයි.

142. යථාවිධිතු, විධිවූ පරිද්දෙන් (සිටියාවූ); වණ්ණස්ස, අක්‍ෂරයාගේ; අඤ්ඤවණ්ණවිකාරතා, අන්‍යවූ වර්ණයෙකින් වෙනස්වනබව; වණ්ණවිකාරො ඉති, වර්ණවිකාරයයි; විඤ්ඤෙය්‍යා, දතයුතු; නියකො ඉති ආදිසු යථා, 'නියකො' යනාදියෙහි මෙනි;—(නියතො යන තන්හි ප්‍රකෘති රූපවූ තකාර යට කකාරය විකාරවශයෙන් ආදෙශව නියකො යනුවෙ, ආදි ශබ්දයෙන් සුගතො යනාදි ප්‍රයොග ගතයුතු.)

143. වණ්ණලොපො, අක්‍ෂරයන්ගේ ලොපය; වණ්ණනාසො, වර්ණනාසය නම් වේ; මෙඝනස්ස බස්ස මාලා මෙබලා මහියං රවයීති මයූරො ඉති,

---

* තාරකානං, තාරකාවන්ට; නක්ඛත්තරාජා ඉව, චන්ද්‍රයාමෙනි; අජ්ජඅග්ගෙ අද පටන් මත්තෙහි.

144. ලෙසමත්තමුප්පාදය යං වා තං වා පරම්පරා
චොදකො පන චොදෙති සොහි සබ්බං න පස්සති.

145. සචෙ පස්සති සො සබ්බං පරිහාරො න සම්භවෙ
තස්මා සො චොදකො සත්ථෙ පරිසොධෙති සබ්බථා.

146. පුබ්බාපරං විචාරෙත්වා නිස්සාය සුවිනිච්ඡිතං
අත්ථං වණ්ණෙන්ති සිද්ධන්තවාදී තු භූතනිස්සිතං.

147. පදලීලාදිනාට්ඨානෙ පයුත්තොපි පයොජයෙ
ඨානෙ ඨානෙ පයුත්තො'පි තථා ඨානෙ පයොජයෙ.

---

මෙහනස්ස බස්ස මාලා මෙබලා මහිසං රවන්ති මයූරො යන මේ ප්‍රයොග යන්හි; අතිසයො අතිශය ශයොගය; මතො, දන්නාලදී;—(මෙහ නස්ස බස්ස මාලා, යන වාක්‍යයෙහි මෙහන ශබ්දයාගේ හකාර නකාර වය ද මාලාශබ්දයාගේ මා යන්නද ලොප්කොට 'මෙබලා' යි කියනලදී, 'මහියමතිසයෙන රවන්ති මයූරො, යනුද උදහරණයි.)

ඉක්බිති චොදනානය දක්වත්

144. ලෙසමත්තං, ස්වල්පමාත්‍රයක්; උපාදය, ගෙණ; යංවා තංවා, ඒ යම කිත් හෝ; පරංපරා, පරම්පරාවෙන්; චොදකො පන, චොදකයා වනාහි; චොදෙති, චොදනාකෙරෙයි; සො හි, හෙතෙම වනාහි; සබ්බං, සියලුම අද හස; න පස්සති, නොදකියි.

145. සචෙ, ඉදින්; සබ්බං, සියල්ල; පස්සති, දකීද; පරිහාරො, පරිහා රය; න සම්භවෙ, නොලැබෙන්නේය; තස්මා, එහෙයින්; සො චොදකො, ඒචොදකතෙම; සත්ථෙ, ශාස්ත්‍රයෙහි (දොෂයන්) සබ්බථා, සර්වප්‍රකාරයෙන්; පරිසොධෙති, පිරිසිදු කෙරෙයි;.

තදනන්තරව පරිහාර දක්වත්.

146. පුබ්බාපරං, (කිසියම්ග්‍රන්ථයෙක හෝ වාක්‍යයෙක හෝ) පෙරපසු දෙය; විචාරෙත්වා, විචාරණය කොට; සුවිනිච්ඡිතං නිස්සාය, මොනවට විනිශ්චය කරණලද්ද නිසා; අත්ථං, ශබ්දාර්ථය හා අභිප්‍රායාර්ථය; වණ්ණෙන්ති, වර්ණනා කෙරෙයි; සිද්ධන්තවාදී තු, සිද්ධාන්තවාදීතෙම වනාහි; භූතනිස්සිතං, (ශාස්ත්‍ර යෙහි) භූතාර්ථයන් ඇසුරු කෙළේවේ.

ඉක්බිති අස්ථානප්‍රයොගනය ආරම්භකළෝ.

147. පදලීලාදිනා, පදයන්ගේ ලීලාදිය කරණ කොටගෙණ; අට්ඨානෙ පයුත්තොපි, අස්ථානප්‍රයොගයෙහි ද; පයොජයෙ, යොදන්නේය; පයුත්තො අපි, ප්‍රයොගකටයුතුවූ ද; ඨානෙ ඨානෙ, (ස්වකීය ස්වකීය) තන්හි ද; තථා, එසේම; ඨානෙ, (ප්‍රකෘති) ස්ථානයෙහි ද; පයොජයෙ, යොදන්නේය.

148. කත්තරි සාධනෙ 'භූතතබ්භාවෙ කරභූඅස
යොගෙ භවති සාදෙසො සරස්සීපච්චයො'පි වා.

149. අවත්ථාවතො 'වත්ථායාභූතස්සඤ්ඤාය වත්ථුනො
තායාවත්ථාය භවනං අභූතතබ්භාවං විදූ.

150. අධවලම්පි ධවලං කරොති ධවලීකතං
ධවලී කරණං හොති ධවලී භවති සදා.

151. පදවාක්‍යාවත්තිකන්තාවසෙන විග්ගහො ද්විධා
පඨමනෙත්ථ විග්ගහො පදවත්තිකමීරිතො.

---

දැන් අභූත තද්භාව නය කියත්.

148. කත්තරි සාධනෙ, කර්තෘසාධනයෙහි; කරභූඅසයොගෙ, කර කරණෙහි භූසත්තායං අසභුවි යනධාතූන්ගේ ප්‍රයොගයඇති කල්හි; අභූත තබ්භාවෙ, අභූතතද්භාවය ගම්‍යමානකල්හි; සරස්ස, (උපපදයෙහි වැටෙන අන්ත්‍ය) ස්වරයට; (සාදෙසො යනු ඊආදෙසොයි පදච්ඡෙදකටයුතු) ඊආදෙසො, ඊආදෙශය හෝ; අපි, යලිත්; ඊපච්චයො වා, ඊප්‍රත්‍යය හෝ; භවති, වෙයි; (නොහොත්) සොඊආදෙසො, සම්ඊකාරාදෙශයෙක් හෝ; සො ඊපච්චයො වා, සම්ඊප්‍රත්‍යයෙක්හෝ; භවති, වේද; (ඒ අභූතතද්භාවනම් වෙයි.)

149. අවත්ථාවතො, අවස්ථාවත්වූ; අඤ්ඤාය අවත්ථාය, අනෙක්අවස්ථාවකින්; අභූතස්ස, නොවූ; වත්ථුනො, වස්තුහුගේ; තාය අවත්ථාය, ඒ නොවූ අවස්ථාවෙන් යුක්තව; භවනං, වීම; අභූතතබ්භාවං, අභූතතද්භාවය යි; විදූ, දනිත්.

150. අධවලං අපි, ශ්වෙතවර්ණනුවූද වස්තුව; ධවලං කරොති, ශ්වෙත වර්ණ කෙරෙයි (යනඅර්ථයෙහි;) ධවලීකතං, ධවලීකෘතනම්; ධවලීකරණං; ශ්වෙතවර්ණකිරීම; හොති, වෙයි; (යනු කරධාතුවට උදාහරණයි) සදා, සෑම කල්හි; ධවලී භවති, ශ්වෙතවර්ණ වෙයි; (යනු අසභූධාතු දෙකට උදාහරණයි ටීකාවෙහි "භූධාතුයා * අභිනනත්ථත්තා න වුත්තං, ධවලී හොති ධවලී අසි ධවලී සියාති වුත්තං හොති"යි කියනලදී, "භූධාතුයා අභිනනත්ථත්තා න වුත්තං" යනු කිමෙක්දැයි විමසියයුතු.

මිට අනතුරුව තදන්‍යතයක් කථනය කළෝ.

151, පදවාක්‍යාවත්තිකන්තාවසෙන, පදවෘත්තිකාන්තය වාක්‍යාවෘත්තිකාන්තය යනමොවුන්ගේ වශයෙන්; විග්ගහො, විග්‍රහයතෙම; ද්විධා, දෙවැදෑරුම්; පඨමනෙත්ථ, ප්‍රථමාන්තයෙන්; විග්ගහො, විග්‍රහය; පදවත්තිකා, පදවෘත්තිකය අන්තකොට; ඊරිතො, කියනලදී.

---

* "අභූධාතූනං" කියාවිය යුතුයි.

152. අත්ථං අත්ථානුරූපෙන තිප්පාදෙහි යථා යථා
වාක්‍යාවත්තිකමාඛ්‍යාතං නාම විඤ්ඤූහි භාසිතං.

153. අත්තනා යුඤ්ජිතං අඤ්ඤං පදං ච අනපෙක්ඛිතං
පදමෙවාවත්තිකත්තා පදාවත්තිකමීරිතං.

154. අත්තනා යුඤ්ජිතං අඤ්ඤං පදමෙවමපෙක්ඛිතං
වාක්‍යං ආවත්තිකං කත්වා කථනත්ථු තථා මතං.

155. විසෙසනං විධා වුත්තං භින්නතුල්‍යප්පභෙදතො
භින්නෙනා තත්ථ තිධා හොති තුල්‍යෙන ඡධා'ති මීරිතො.

156. සමෙන ධාවති පොසො විසමෙනපි ධාවති
ගොත්තෙන ගොතමො නාථො වයසෙකූනතිංසකො.

---

152. අත්ථං, අර්ථය; අත්ථානුරූපෙන, අර්ථයට අනුරූපවශයෙන්; යථා යථා; යම් යම් පරිද්දෙකින්; තිප්පාදෙති, නිපදවාද; වාක්‍යාවත්තිකං නාම ආඛ්‍යාතං, වාක්‍යාවර්තිකආඛ්‍යාතනමැයි; විඤ්ඤූහි, ප්‍රාඥයන් විසින්, භාසිතං, කියනලදී.

153. අත්තනා, තමන් හා; යුඤ්ජිතං, යෙදෙනලද; අඤ්ඤං පදං, අනික්පද යක්; අනපෙක්ඛිතං, නොබැලීම; පදං එව, ස්වපදයම; ආවත්තිකත්තා, ආවර්තිකකොටඇති බැවින්; පදාවත්තිකං, පදාවර්තිකාඛ්‍යාතයයි; ඊරිතං, කිය නලදී.

154. අත්තනා, තමන්හා; යුජිතං, යෙදෙනලද; අඤ්ඤං පදං එව, අන්‍ය පදයක්ම; අපෙක්ඛිතං, අපෙක්ෂා කරන්නාවූ; වාක්‍යං, වාක්‍යය; ආවත්තිකං කත්වා, ආවර්තිකකොට; කථනත්ථු, කීමද; තථා, එපරිද්දෙන්; මතං, දන්නා ලදී.

ඉක්බිති විශෙෂණනය දක්වත්.

155. විසෙසනං, විශෙෂණය; භින්නතුල්‍යප්පභෙදතො, භින්නාධිකරණය තුල්‍යාධිකරණය යනප්‍රභෙදයෙන්; විධා, දෙපරිද්දෙකින්; වුත්තං, කියනලදී; තත්ථ, ඒ ප්‍රකාරයඅතුරෙන්; භින්නෙනා, භින්නාධිකරණවිශෙෂණයෙ: තිධා, හොති, තුන්පරිදි වේ; තුල්‍යෙන, තුල්‍යාධිකරණවිශෙෂණය; ඡධා ඉති, සපරිදියයි; ඊරිතො, කියනලදී.

156. පොසො, පුරුෂතෙම; සමෙන, සමප්‍රමාණයෙන්; ධාවති, දුවයි; විසමෙන අපි, විසමයෙන්ද; ධාවති, දුවයි; නාථො, ලොකස්වාමිවූ සර්‍වඥයන් වහන්සේ; ගොත්තෙන, ගොත්‍රයෙන්; ගොතමො, ගෞතමයි; වයසා, වය සින්; එකූනතිංසකො, එකුන්තිස්හවුරුද්දෙක්ඇත්තේය; (මේ තෘතීයා භින්නාධිකරණ විශෙෂණයයි.)

157. රාජිනො පුරිසො හොති න සෙට්ඨිබ්‍රාහ්මණාදිනං
නිසින්නො හොති ගෙහෙව න සාලාදිසු සො ජනො.

158. ආසයාසයිභාවො ච තබ්භාවො තබ්බිසෙසතා
ධම්මාධාරඵලානම්පි එකතා ච ඡධා මතා.

159. රත්තො පටො සුවො සෙතො ආසයාසයිතා මතා
බුද්ධො ජිනො කරී හත්ථී තබ්භාවොති පවුච්චති.

160. නීලො වණ්ණො අම්බ පානො ඉච්චාදෙ තබ්බිසෙසතා
අනිලස්සො නරො සීහො ඉති ධම්මෙ කතා මතා. *

161. අම්බිලො ගරුකො හොති කටුකො ලහුකො රසො
ඉච්චාධාරෙ කතා ඵතා එකාධාරං හි තං වයං.

---

157. රාජිනො, රජනුගේ; පුරිසො, පුරුෂතෙමේ; හොති, වෙයි; සෙට්ඨි බ්‍රාහ්මණාදිනං, සිටුබමුණුආදින්ගේ පුරුෂයෙක්; න, නොවෙයි; (මෙහි ෂෂ්ඨියෙන් භින්නාධිකරණයි)-සො ජනො, ඒ ජනතෙම; ගෙහෙ එව, ගෙහිම; නිසින්නො හොති, උන්නේ වෙයි; සාලාදිසු, ශාලාදියෙහි; න, නොවෙයි; (මෙහි සප්තමියෙන් භින්නාධිකරණයි.)

158. ආසයාසයීභාවො ච, ආශ්‍රයආශ්‍රයිතව්‍යභාවයද; තබ්භාවො, තද්භාවයද; තබ්බිසෙසතා, තද්විශෙෂභාවයද; ධම්මාධාරඵලානං අපි, ධර්මය ආධාරය ඵලයයනමොවුන් සම්බන්ධවූ; එකතාව ඉති, එකත්වයදැයි කියා; ඡධා, සපරිද් දෙකින්; මතා, දන්නාලදහ.

159. රත්තො, රක්තවර්ණවූ; පටො, වස්ත්‍රය; සෙතො, ශ්වෙතවූ, සුවො, කිරපක්ෂීතෙමේය; (යනු)-ආසයාසයිතා, ආශ්‍රයාශ්‍රයීභාවයයි; මතා; දන්නාලදී; (මෙහි ආශයනම් ද්‍රව්‍යයයි ආශ්‍රයිතව්‍යයනම් ගුණයයි)-බුද්ධො, බුද්ධය; ජිනො, ජිනතෙමේය; කරී, හස්තිය; හත්ථී; ඇත්ය; යනු-තබ්භාවො ඉති, තද්භාවයයි; පවුච්චති, කියනුලැබේ;—(ඔවුන්ගේ භාවයවූ පදාර්ථය තද්භාවනම් ඒ ද්‍රව්‍යවාචීන්ගේ පදාර්ථය හෝ තද්භාවනම්.)

160. නීලො, නිල්වූ; වණ්ණො, වර්ණය; අම්බපානො, අඹපැන්ය; ඉති ආදෙ, මේ ආදිප්‍රයොගයෙහි; තබ්බිසෙසතා, තද්විශෙෂණත්වය වේ; (ඒ ද්‍රව්‍යාදීන්ගේ විශෙෂණභාවය තද්විශෙෂණත්වනම්)-අනිලො, වාතය තෙම; අස්සො, අශ්වයායි; නරො, මනුෂ්‍යතෙම; සීහො, සිංහයායි; ඉති, යනමේප්‍රයෝගයෝ; ධම්මෙ, ස්වභාවයෙහි; කතා, කරණලද්දාහුයයි; මතා, දන්නාලදහ.

161. අම්බිලො, ඇඹුල්රසය; ගරුකො හොති, බරඇත්තේ වේ; ලහුකො, ලඝුවූ; රසො, රසය; කටුකො, කටුකයි; ඉති. යන මොහු; ආධා

---

* විභත්‍යපි-පොත්හි.

162. ගදූගතං සුසංයුත්තං ඔසධං දුද්දුතං විසං
එලෙකතා ඉදං වුත්තං අනාමයං නිපජ්ජතෙ,

163. යස්සෙකසංඛ්‍යාකිරියා විභත්ත්‍යාදීනං සමානතා
සමාන ලිඞ්ගතාචෙව තුල්‍යාධිකරණං මතං.

164. දළ්හියං දළ්හීකරණං ජොතකඤ්ච තිධා මතං
දළ්හියං පුබ්බවචනං දළ්හීකරණ පච්ඡිමං.

165. තිසද්දො ජොතකො වුත්තො පච්ඡිමත්ථො ච ජොතිතො
සාමඤ්ඤෙනෙව පුබ්බත්ථො වෙදිතබ්බො විභාවිනා.

166. උපමානොපමෙය්‍යානං සදිසත්තූපමා මතං
ඉවාදිසද්දා ජොතෙන්ති උපමානස්ස සාදිසං, *

---

රෙ, ආධාරයෙකි; කථිා, කරණලද්දැහුයයි; මතා, දන්නාලදහ; තං මයං, ඒ (විශෙෂණවිශෙෂ්‍ය) දෙක; එකාධාරං හි, එකක් ආධාරකොටඇත්තේ මය.

162. සුසංයුත්තං, මනාකොට යොදනලද; ඔසධං, ඖෂධ ; ගදූගතං, රොගනසයි; දුද්දුතං, නපුරුයොගයන් හා යොදනලද ඖෂධය; විසං, විෂයි; ඉදං; මේ විශෙෂණ විශෙෂ්‍යවය; එලෙකතා, එලයාගේ එකත්වයයි හෙවත් එලය හා සමානයයි; වුත්තං, කියනලදී; අනාමයං, නිරොගීභාවය; නිපජ්ජතෙ, නිපදවන්නේය.

163. යස්ස, යම්පදයක්හුගේ; එකසංඛ්‍යාකිරියාවිභත්‍යාදීනං, එකසංඛ්‍යා එක ක්‍රියා එකවිභක්ති වශයෙන් මේ සංඛ්‍යාදීන්ගේ; සමානතා, සමානබව වේද; සමානලිඞ්ගතා ච එව, සමානලිඟු ඇතිබවත් වේද; තං, ඒ පදය; තුල්‍යාධිකරණං, තුල්‍යාධිකරණයයි; මතං, දන්නාලදී,

ඉක්බිති අතිකුදු ශබ්දලක්ෂණයක් දක්වත්.

164. දළ්හියං, දෘඪකටයුත්තද; දළ්හීකරණං, දළ්හීකරණයද; ජොතකඤ්ච, බැබලුවීමදැයි කියා ; තිධා, තුන්පරිද්දෙකින්, මතං, දන්නාලදී; පුබ්බවචනං; පූර්වවචනය; දළ්හියං, දෘඪකටයුත්තයි; පච්ඡිමං, පශ්චිමවචනය; දළ්හීකරණං, දළ්හීකරණයයි.

165. සාමඤ්ඤෙන එව, ප්‍රොභොසත්භාවයෙන්ම; තිසද්දො, තිශබ්දයතෙම; ජොතකො, බබුලුවන්නේයයි; වුත්තො, කියනලදී; පච්ඡිමත්ථො ච, පශ්චිමාර්ථයද; පුබ්බත්ථො, පූර්වාර්ථය ද; ජොතිතො, ප්‍රකාශකරණලද්දේයයි; විභාවිනා, පණ්ඩිතයා විසින්; වෙදිතබ්බො, දතයුතු.

ඉක්බිති උපමානය දක්වන්තෝ “ උපමානො” යනාදිය කීහ.

166. උපමානොපමෙය්‍යානං, උපමාන උපමෙය දෙදෙනාගේ; සදිසත්තං, සමානබව; උපමා, උපමාවය යි; මතං, දන්නාලදී; ඉවාදිසද්දා, ඉවආදිශබ්ද

---

* උපමානසදිසත්තං–පොත්හි.

167. සාමඤ්ඤෙන ජොතෙය්‍ය උපමෙය්‍යස්ස සාදිසං *
උපමෙය්‍යො පධානො’ව ඉතරොත්වප්පධානකො.

168. උපමෙය්‍යං විසෙසෙත්වා උපමානො නිවත්තති
තෙන සො අප්පධානො’ව ඉතරො ස්වත්ථප්පවත්තනො.

169. සද්දක්කමොපමා චෙව අත්ථක්කමොපමා තථා
වාක්‍යත්ථක්කමවිසයා උපමා තිවිධා මතා.

170. තත්ථාදි තිවිධා හොති සමාසො පච්චයො තථා
ඉවාදිසද්දයොගො ච ඤෙය්‍යො සබ්බත්ථ විඤ්ඤූනා.

171. ‘නරසීහො මුඛචන්දො සමාසො’ති මතො බුධො
පච්චයො නාම ආයාදි වදනං පංකජායතෙ.

---

යතෙම; උපමානස්ස, උපමානයාගේ; සාදිසං, සමානබව; ජොතෙති, ප්‍රකාශ කෙරෙයි.

167. උපමෙය්‍යස්ස, උපමෙයයාගේ; සාදිසං, සමානබව; සාමඤ්ඤෙන, (ඉවාදිශබ්දගණයාගේ) පොහොසත්භාවයෙන්; ජොතෙය්‍ය, දන්නේය; උපමෙය්‍යො, උපමෙයයතෙම; පධානො එව, ප්‍රධානමය; ඉතරොතු; අනික් උපමානය වනාහි; අප්පධානකො, අප්‍රධානයි.

168. උපමානො, උපමානය තෙම; උපමෙය්‍යං, උපමෙයය; විසෙසෙත්වා, වෙසෙසා; නිවත්තති, නවතියි; තෙන, එහෙයින්; සො, ඒ උපමානයතෙම; අප්පධානො එව, අප්‍රධානමය; ඉතරො, අනික් උපමෙයය තෙම; ස්වත්ථප්පවත්තනො, ස්වකීය අර්ථයෙහිම පවත්නා බැවින් ප්‍රධානයි.

169. සද්දක්කමොපමා ච එව, ශබ්දක්‍රමොපමාවද; අත්ථක්කමොපමා, අර්ථක්‍රමොපමාවද; තථා, එසේම; වාක්‍යත්ථක්කමවිසයා, වාක්‍යාර්ථක්‍රමවිෂයද්දයි කියා; උපමා, උපමාතොමෝ; තිවිධා, තුන්පරිද්දෙකින්; මතා, දන්නාලදී.

170. තත්ථ, ඒ (තුන්වැදෑරුම්) උපමාවන් අතුරෙන්; ආදි, පළමුකොට කියනලද ශබ්දක්‍රමොපමාතොමෝ; තිවිධා හොති, තුන්පරිද්දෙකින් වේ; සමාසො, (උපමා) සමාසයද; තථා, එසේම; පච්චයො, ආයාදිප්‍රත්‍යයද; ඉවාදිසද්දයොගො ච, ඉවාදිශබ්දයන් හා යොග්‍යද්ද යි කියා; සබ්බත්ථ, හැමතන්හි; විඤ්ඤූනා, නුවනැත්තහු විසින්; ඤෙය්‍යො, දතයුතු.

171. නරසීහො, (සීහො විය සීහො, නරොච සො සීහොචාති,) නරසීහො යනුද; මුඛචන්දො, (චන්දො ඉව චන්දො, මුඛමෙව චන්දො) මුඛචන්දො යනුද; සමාසො ඉති, සමාසයයි; බුධො, ප්‍රාඥතෙම; මතො, දන්නේය; පච්චයො

---

* උපමෙය්‍ය සදිසත්තං—පොත්හි.

172. ඉවවියාදිසංයුත්තා කරුණාවියාදිකා මතා
ධම්මා ච ධම්මහීනා ච විපරීතාඤ්ඤමඤ්ඤකා.

173. අබ්භුතා ච සිලෙසා ච සන්තානා ගරහොපමා
අසාධාරණ පටිසෙධා අභූතෙකාදසා මතා.

174. විරොචි පඞ්කජංවා'ති සුන්දරං මුනිමානනං
ඉති ධම්මොපමා නාම සමාන * ගුණදස්සනා.

175. මුනිනො වදනම්භොජසදිසං ධම්මහීනකං
ගුණම්පි අගහෙත්වාන උපමාමත්තදස්සනා.

176. තවානනමිවම්භොජං සරොජමිව තෙ මුඛං
අඤ්ඤමඤ්ඤොපමා නාම අඤ්ඤමඤ්ඤූපමානතො.

---

නාම, ප්‍රත්‍යය නම්; ආයාදි, ආය ආදි ප්‍රත්‍යයයි; (ඊට උදාහරණ)-වදනං, මුඛය; පඞ්කජායතෙ, පද්මයක් මෙන් කෙරෙයි; (පඞ්කජමිව ආචරතීති පඞ්කජායතෙ-ආදි ශබ්දයෙන් "ජනනීයති පුත්තීයති" යනාදිය දතයුතු.)

172. ඉවවියාදිසංයුත්තා, ඉවවිය යනාදි උපමාවාචක ශබ්දයන් හා යුක්තවූවෝ; කරුණාවියාදිකා, කරුණා විය (සත්තෙසු) යනාදි ප්‍රයොගයෝයයි; මතා, දන්නාලදහ; ධම්මා ච, ධර්මොපමාව ද; ධම්මහීනා ච, ධර්මහීනොපමාව ද; අඤ්ඤමඤ්ඤකා, අන්‍යොන්‍යොපමාව ද; විපරීතා, විපරීතොපමාවද.

173. අබ්භුතාච, අද්භුතොපමාව ද; සිලෙසා ච, ශ්ලෙෂොපමාව ද; සන්තානො, සන්තානොපමාව ද; ගරහොපමා, නින්දොපමාවද; අසාධාරණ පටිසෙධා, අසාධාරණොපමාව ද ප්‍රතිෂෙධොපමාවද; අභූතා, අභූතොපමාවද යන මේ; එකාදස, එකොළොස; මතා, දන්නාලදහ.

174. අති සුන්දරං, අතිශයින් සුන්දරවූ; මුනිආනනං, සර්වඥමුඛය; පඞ්කජං ඉව, (අතිසුන්දර) පද්මයක් මෙන්; විරොචී, බැබළීය; සමානගුණදස්සනා, සමානගුණදර්ශනයෙන්; ඉති, මෙය; ධම්මොපමා නාම, ධර්මොපමානම් වේ;- (මෙහි ධර්මශබ්දය ගුණවාචකයි එහෙයින් උපමෙයට සමාන ගුණඇති උපමාව ධර්මොපමානම්.)

175. මුනිනො, තථාගතයන් වහන්සේගේ; වදනං, මුඛය; අම්භොජසදිසං, පද්මයක් මෙනි; ගුණං අපි, ගුණයද; අගහෙත්වාන, නොගෙණ; උපමාමත්තදස්සනා, උපමාමාත්‍රදර්ශනයෙන් මෝතොමෝ; ධම්මහීනකං, ධර්මහීනක නම්.

176. අම්භොජං, පද්මය; තව, තීගේ; ආනනං ඉව, මුහුනමෙනි; තෙ, තීගේ; මුඛං, මුඛය; සරොජං ඉව, පද්මයක් මෙනි; අඤ්ඤමඤ්ඤූපමාන

---

* සදිස-පොත්හි.

177. විපරීතොපමාතුල්‍යමානනෙනම්බුජං තව
විපරීතෙනුපමානමුපමෙය්‍යාන දස්සනා.

178. යදි භවති සරොජං ලොචනකණ්ණනාසකං
ධාරෙති මුඛසොභනතං තුය්හං සා අබ්භුතොපමා.

179. සුගන්ධිසොභාසම්බන්ධි චන්දරංසි විරොධි ච
මුඛං තවාම්බුජඤ්චෙති සා සිලෙසොපමා මතා.

150. සදි සසද්දවාචකත්තා සා සන්තානොපමා මතා
බාලාවුය්‍යානමාලායං සාලකානනසොභිනී.

181. කලඞ්කින්දු න ඉට්ඨදං පඞ්කජං තෙහි තෙ මුඛං
සදිසම්පි අධිකොසි ඉති නින්දූපමා මතා.

---

තො, අන්‍යොන්‍යයන්ට උපමාවනහෙයින්; අඤ්ඤමඤ්ඤූපමා නාම, අන්‍යොන්‍යොපමා නම් වෙ.

177. තව, නුඹවහන්සේගේ; ආනනෙන, මුඛය හා; අම්බුජං, පද්මය; තුල්‍යං, සමානයි; (පද්මය හා නුඹවහන්සේගේ මුඛය සමානයි කියා) විපරීතෙන, විපරීතයෙන්; උපමානමුපමෙය්‍යානං, උපමාන උපමෙයයන්ගේ; දස්සනා, දක්වීමෙන්; විපරීතොපමා, විපරීතොපමා නම් වන්නීය.

178. භවති, පිහිටිය; ලොචනකණ්ණනාසකං, නෙත්කන්නැහැ ඇති; සරොජං, පද්මයෙක්; යදි, ඉදින් (ඇත්තේ නම්); තං, ඒ පද්මය; තුය්හං, තීගේ; මුඛසොභං, මුඛසොභාව; ධාරෙති, දරයි; සා, ඕතොමෝ; අබ්භුතොපමා, අද්භූතොපමායි.

179. සුගන්ධි, සොභනගන්ධය ඇති; සොභාසම්බන්ධි, විලාසයෙන් හා සකල ජනයන්ගේ සම්බන්ධයෙන් යුක්තවූ නොහොත් සොභාමත් සම්බන්ධය ඇති; චන්දරංසි විරොධි, චන්ද්‍රරශ්මියට ප්‍රතිපක්ෂවූ; තව, තීගේ; මුඛච, මුඛයද; අම්බුජං ච ඉති, පද්මයදයි යන; සා, ඕතොමෝ; සිලෙසොපමා, ශ්ලෙෂොපමායයි; මතා, දන්නාලදී.

190. සදිස සද්දවාචකත්තා, ශබ්දස්වරූපවූ ශබ්දයෙන් කියනලදබැවින්; සා, ඕතොමෝ; සන්තානොපමා, සන්තානොපමායයි; මතා, දන්නාලදී; බාලා, තරුණවූ; අයං උය්‍යානමාලා, මේ උද්‍යානමාලාතොමෝ; සාලකානන සොභිනී, ශාලවෘක්ෂවනයෙන් ශොභනීය; (නොහොත්) මේ උද්‍යානමාලාතොමෝ—සාලක, කියඹු සහිතවූ; ආනනසොභිනී, මුඛයෙන් ශොභමාන වන්නාවූ; බාලා ඉව, තරුණියක්මෙන් ශොභනීය.

181. කලඞ්කින්දු, සසලපයක් ඇත්තාවූ චන්ද්‍රතෙමේද; පඞ්කජං, පද්මයද; ඉට්ඨදං න, කැමතිවකලදදෙය නොදෙන්නේය; තෙහි සදිසං අපි, ඒ ඉන්දු

182\. මුඛං දෙවමනුස්සානං අතික්කම්ම මුඛං තව
අත්තනාව සමං ජාතං ඉච්චසාධාරණොපමා.

183\. නසක්කොන්ති මුඛෙනින්දු මුනි තෙ පටිගජ්ජිතුං
ජලො ලංජොම්හි අයං පටිසෙධොපමා මතා.

184\. භෙරිං කත්වා චක්කවාලං සිනෙරු දණ්ඩනිවිහතං
තව සද්දො පභූතිති ඤෙය්‍යාභූතොපමා අයං.

185\. අත්ථක්කමූපමා නාම සද්දසාමත්ථියා ක්වචි
සමාසපච්චයෙවාදි සද්දයොගං විනානයෙ.

186\. අලිනිමානි චක්ඛූනි න සරොජං මුඛං ඉදං
සුබ්‍යත්තසදිසත්තෙන සා සරූපොපමා මතා.

---

පර්වතාදීන් හා සමානවූද; තෙ, තීගේ; මුඛං, මුහුණ; අධිකො ආසි, (කලඞ්කාභාවයෙන් හා අභිමතදෙය ප්‍රදානය කාරණයෙහිත්ද) උත්කෘෂ්ට වූයේය; ඉති, යනු; නින්දූපමා, නින්දූපමා යයි; මතා, දන්නාලදී.

182\. තව, තුඹවහන්සේගේ; මුඛං, මුඛය; දෙවමනුස්සානං, දෙව්මිනිසුන්ගේ; මුඛං, මුඛයන්; අතික්කම්ම, ඉක්මවා; අත්තනා එව සමං, තමන් හා සමානවම; ජාතං, උපන්නේය; ඉති, යනමෙය; අසාධාරණොපමා, අසාධාරණොපමානම් වේ.

183\. මුනි, සර්වඥයන්වහන්ස; තෙ, තුඹවහන්සේගේ; මුඛෙන, මුඛය හා; ජලො, ශීතවූහෝ මූර්ඛවූද; ලංජො, කලඞ්කවූද; ඉන්දු, චන්ද්‍රතෙම; පටිගජ්ජිතුං, අභිමානය කරන්නට, න සක්කොන්ති, නොහැකිවෙයි; ඉති, යන; අයං, මෝතොමෝ; පටිසෙධොපමා, ප්‍රතිෂෙධොපමායයි; මතා, දන්නාලදී.

184\. චක්කවාලං, චක්‍රවාටපර්වතය; භෙරිං කත්වා, බෙරයක්කොට; සිනෙරු දණ්ඩෙන, සිනෙරුපර්වත නැමැති දණ්ඩෙන්; ඊහතං ඉව, ගසනකලක් මෙන්; තව, තුඹවහන්සේ ගේ; සද්දො, කීර්තිය; පභූති ඉති, ප්‍රකටවේය යන; අයං, මෝතොමෝ; අභූතොපමා, අභූතොපමායයි; ඤෙය්‍යා, දතයුත්තීය.

මෙසේ ඒකාදශවිධ ශබ්දක්‍රමොපමාව දක්වා දැන් අර්ථක්‍රමොපමාව දක්වත්.

185\. අත්ථක්කමූපමා නාම, අර්ථක්‍රමොපමානම්; සද්දසාමත්ථියා, ශබ්දසාමර්ථ්‍යයෙන් හෙවත් ශබ්දයන්ගේ පොහොසත්භාවයෙන්; ක්වචි, සමහරතැනෙක; සමාසපච්චයෙවාදිසද්දයොගං, සමාසය ප්‍රත්‍යය ඉවාදිශබ්දයොගය යන සමූහය; විනා, හැර; නයෙ, දන්නේය.

186\. ඉමානි චක්ඛූනි, මේ ඇස්, න අලි, භෘඞ්ගයෝ නොවෙති; ඉදං මුඛං, මේ මුඛය; න සරොජං, පද්මය නොවෙයි; (නොහොත්) ඉමානි, මොහු;

187. මයිව මුඛසොභාසි අලමින්දු විකප්පිතා
සරොජෙ අපි සත්ථීති පරිකප්පොපමා අයං.

188. කිංව සරොජං අනෙතාලි කිං ලොලනයනං මුඛං
මම ලොලයතෙ චිත්තමිච්චයං සංසයොපමා.

189. කිඤ්චි වත්ථුං පකාසෙත්වා සධම්මස්සාභිධානතො
සමපතීතසභාවත්තා පටිවත්ථූපමා මතා.

190. ජායමානෙසු ජන්තූසු නෙකොපි ජිනසාදිසො
දුතියො නනු නත්ථෙව පාරිච්ඡත්තකපාදපො.

191. සරූපො පරිකප්පො ච සංසයො පටිවත්ථුච
ඉමා චතස්සො උපමා අබ්භුක්කමූපමා මතා.

---

චක්ඛුනි, ඇස්ය; න අලී, භෘඞ්ගයෝ නොවෙති; ඉදං, මෙය; මුඛං, මුහුනයි; න සරොජං, පද්මය නොවෙයි, සුඛ්‍යත්‍යාදිසන්‍යායෙන, අතිව්‍යාක්‍යාසාදෘශ්‍යය කරණ කොටගෙණ, සා, ඕතොමෝ; සරූපොපමා, සරූපොපමායයි; මතා, දන්නාලදී.

187. මයි එව, මාකෙරෙහි ම; මුඛසොභා, මුඛශ්‍රීතොමෝ; ආසි, විය; ඉන්දුවිකප්පිතා, චන්ද්‍රයා හා සමාන කොට වර්ණනා කිරීම; අලං, පමණි; සරොජෙ අපි, පද්මයෙහිදු; සා, ඒ ශොභාතොමෝ; අත්ථි, ඇති; ඉති, එහෙයින්; අයං, මේතොමෝ; පරිකප්පොපමා, පරිකල්පොපමායයි දන්නාලදී.

188. අනෙතා අලි, අභ්‍යන්තරයෙහි භෘඞ්ගයන් ඇති; කිං සරොජං වා, කිම පද්මයෙක් දෝ හෝ; ලොලනයනං, චපලවූනෙත්‍ර ඇති; කිං මුඛං, කිම තිගේ මුඛය දෝ හෝයි; මම, මාගේ; චිත්තං, සිත; ලොලයතෙ, භ්‍රාන්තවන්නේය; ඉති; මෙසේ කියන හොත්; අයං, මේතොමෝ; සංසයොපමා, සංශයොපමායි.

189. කිඤ්චි වත්ථුං, කිසියම් වස්තුවක්; පකාසෙත්වා, දක්වා; සධම්මස්සාභිධානතො, ඒ වස්තුව හා සමානවූ ගුණ ඇත්තක්හුගේ කථනයෙන්; සමපතීතසභාවත්තා, මනා කොට ප්‍රකටවූ සමාන භාවය ඇති බැවින්; අයං, මේතොමෝ; පටිවත්ථූපමා, ප්‍රතිවස්තූපමායයි; මතා, දන්නාලදී.

190. ජායමානෙසු, උපදින්නාවූ; ජන්තූසු, ජනයන්අතුරෙන්; ජිනසාදිසො, සර්වඥයන්වහන්සේ හා සමානවූ; එකො අපි, එකෙකුත්; න, නොවෙයි; දුතියො, දෙවෙනිවූ; පාරිච්ඡත්තකපාදපො, පාරිජාතවෘක්ෂයෙක්; නත්ථි එව නනු, නැත්තේම නොවේද.

191. සරූපො, ස්වරූපොපමාවද; පරිකප්පො ච, පරිකල්පොපමාවද; සංසයො, සංශයොපමාව ද; පටිවත්ථූපමා, ප්‍රතිවස්තූපමාවද යන; ඉමා චතස්සො උපමා, මේ උපමා සතර ද; අබ්භුක්කමූපමා, අභික්‍රමොපමායයි; මතා, දන්නාලදහ.

192. වාක්‍යත්ථෙනෙව වාක්‍යත්ථො යදිකොචුපමීයතෙ
ඉවයුත්තා වියුත්තා ච සාවාක්‍යත්ථොපමා ද්විධා.

193. ජිනො සංකෙලසතත්තානං ආවිභූතො ජනානයං
ගිම්හසන්තාපතත්තානං ගිම්හකාලම්බුදො ඉව.

194. මුනින්දානනමාභාති විලාසෙකමනොහරං
උඩ්ඩං සමුග්ගතස්සාපි කිංතෙන චන්ද විජම්භනා.

195. භින්නලිඞ්ගවචනා ච හීනාධිකොපමා තථා
අතුලත්ථුපෙක්ඛණී ච ඛණ්ඩිතා සත්තදූසනා.

196. හංසිවායං සසී යාති තිට්ඨාකාසං සරානි ව
සාව භත්තා භටොධිපෙ ඛජ්ජොතො රවිවාභති.

---

192. වාක්‍යත්ථෙන එව, වාක්‍යාර්ථයක් හා ම හෙවත් වචනප්‍රබන්ධයක් හා ම; කො අපි, කිසියම්ම; වාක්‍යත්ථො, අන්‍යවාක්‍යාර්ථයෙක්; යදි, ඉදින්; උපමීයතෙ, උපමා කරණුලැබේ ද; සා වාක්‍යත්ථොපමා, ඒ වාක්‍යාර්ථොපමාව; ඉව යුත්තා, ඉවශබ්දය හා යුක්තවීද; වියුත්තා ච, ඉවශබ්දය හා යුක්ත නො වී දැයි කියා; ද්විධා. දෙපරිද්දෙකින් දත්නාලද්දීය.

193. සංකෙලසතත්තානං, (රාගාදි) කෙලශාග්නියෙන් තප්තවූ, තැවුනාවූ; ජනානං, ජනයන්ට; අයං ජිනො, මේ සර්වඥතෙම; ගිම්හසන්තාප තත්තානං, ග්‍රීෂ්මසන්තාපයෙන් තැවුනවුන්ට; ගිම්හකාලම්බුදො ඉව. ග්‍රීෂ්මකාලයෙහි මේඝය මෙන්; ආවිභූතො, පහළවූයේය–(මේ ඉවයුක්තවාක්‍යාර්ථොපමායි.)

194. විලාසෙකමනොහරං, ලීලායෙන් අසහාය මනොඥවූ; මුනින්දානනං, මුනීන්ද්‍රයන් වහන්සේගේ මුඛය; ආභාති, බබලයි; චන්ද, චන්ද්‍රය; උඩ්ඩං, උඩට; සමුග්ගතස්ස අපි, නැංගාවූ ද; තෙ, තාගේ; විජම්භනා, විජෘම්භනයෙන්; කිං, කවරප්‍රයොජන ද; (මේ ඉව වියුක්තවාක්‍යාර්ථොපමායි.)

195. භින්නලිංගවචනා ච, භින්නවූ ලිංගය භින්නවචනය යන මොහු ද; තථා, එසේම; හීනාධිකොපමා, හීනොපමාය උත්කෘෂ්ටොපමාය යන මොහු ද; අතුලත්ථුපෙක්ඛණී ච, අසෘෂ්ටාර්ථ ඇත්තීය උපෙක්‍ෂණීය යන මොහු ද; ඛණ්ඩිතා, ඛණ්ඩිතබව ද යනමේ; සත්ත, සත; දූසනා, උපමා දූෂණයෝයි.

196. අයං සසී, මේ චන්ද්‍රතෙම; හංසී ඉව, හංසියක් මෙන්; යාති, යෙයි; (මේ භින්නලිඞ්ගිකයි); ආකාසං, ආකාශය; සරානි ඉව, තඩාගයන් මෙන්; තිට්ඨා, සිටියි; (මේ භින්නවචනයි)–අධිපෙ, ස්වාමියා කෙරෙහි; භටො, භටතෙම; සා ඉව, සුනඛයෙක්මෙන්; භත්තා, ආදරය ඇත්තේය; (මේ හීනොපමායි)–ඛජ්ජොතො, කනමැදිරිතෙම; රවි ඉව, සූර්‍ය්‍යයා මෙන්; ආභාති, බබලයි; (මේ අධිකොපමායි.)

197. සාගරො'ව බලම්බොධි සංඛුභී භෙරවාරවං
චන්දෙ කලඞ්කො භිඞ්ගො'ව පාකටො හොති සබ්බසො.

198. සොභතී කෙරවාකාරො සකලඞ්කො නිසාකරො
ඉච්චෙතා සත්ත උපමා විමනා හොන්ති පණ්ඩිතා.

199. ඉත්ථිවායං ජනො යාති වදතෙසා පුමා ඉව
පියො පාණමිවායමෙම විජ්ජාධනමිවාචිතා.

200. භවං විය මහාරාජ දෙවරාජා විරොචතෙ
ඉච්චෙතා සුමනා හොන්ති ධීරාලඞ්කාරකොවිදා

201. පක්කන්තවිසයොචෙව පසිද්ධවිසයො තථා
අනුභූතවිසයොචෙති තංසද්දො යං න පෙක්ඛතෙ.

---

197. සාගරො ඉව, සාගරය මෙන්; බලම්බොධි, බලසමුද්‍රය; භෙරවාරවං, භයානක ශබ්දයෙන්; සංඛුභී, ඇලලුනේය; (මේ අසම්භාව්‍යොපමායි)–චන්දෙ, චන්ද්‍රයාකෙරෙහි; කලඞ්කො, සසලපය; භිඞ්ගො ඉව, භෘඞ්ගයෙකු මෙන්; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; පාකටො හොති, ප්‍රකටවූයේ වේ;–(මේ උපෙක්ඛණීයොපමායි.)

198. කෙරවාකාරො, උත්පලයකටබඳු ආකාරඇති; සකලඞ්කො, කලඞ්කසහිතවූ; නිසාකරො, චන්ද්‍රතෙම; සොභතී, හොබියි; (මේ ඛණ්ඩිතොපමායි) ඉති, යන; එතා සත්තඋපමා, මේ උපමා සත; විමනා, හොන්ති, දෞර්මනස්‍යොත්පාදනය ඇත්තාහු වෙත්යයි; පණ්ඩිතා, පණ්ඩිතයෝ කියත්.

199. අයං ජනො, මේ ජනතෙම; ඉත්ථී ඉව, ස්ත්‍රියෙකු මෙන්; යාති, යෙයි; එසා, මේ ස්ත්‍රීතොමෝ; පුමා ඉව, පුරුෂයෙකු මෙන්; වදති, කියයි; අයං, මෙතෙම; පාණං ඉව, ප්‍රාණය මෙන්; මෙ, මට; පියො, ප්‍රියයි; විජ්ජා, විද්‍යාතොමෝ; ධනං ඉව, ධනය මෙන්; ආචිතා, රැස්කරණලද්දිය.

200. මහාරාජ, මහරජ; භවංවිය, පින්වත්වූ නුඹවහන්සේ මෙන්; දෙවරාජා, දිව්‍යරාජතෙම; විරොචතෙ, බබලයි; ඉති එතා, යන මේ පච උපමාවෝ; සුමනා හොන්ති, සෞමනස්‍යොත්පාදනය ඇත්තානු වෙත්යයි; අලංකාරකොවිදා, අලංකාරවිජානනයෙහි නිපුණවූ; ධීරා, ප්‍රාඥයෝ කියත්.

මෙසේ සැකෙවින් උපමා උපමෙය ලක්ෂණ දක්වා දැන් තශබ්ද ලක්ෂණය දක්වනු සඳහා "පක්කන්ත විසයො" යනාදිය කියත්.

201. පක්කන්තවිසයො ච එව, ඉකුත්වූ විෂය ඇත්තේද; තථා, එසේම; පසිද්ධවිසයො, ප්‍රකටවූ විෂය ඇත්තේ ද; අනුභූතවිසයො ච ඉති, අනුභූත විෂය ඇත්තේදැයි (යන මේ විෂය ඇතිතන්හි) තංසද්දො, ත ශබ්දය තෙම; යං, යශබ්දය; න පෙක්ඛතෙ, අපෙක්ෂා නොකෙරෙයි.

202 තස්සාපි වචනං සුත්වා භීයො චිත්තං පසාදයිං
උත්තරිඤ්චාතමධිට්ඨාසිං පූරෙතුං දසපාරමී.

203 නමාමි තස්ස බුද්ධස්ස ලොකජෙට්ඨස්ස තාදිනො
තස්සෙව ධම්මරතනං සඞ්ඝඤ්චාපි නිරඞ්ගණං.

204 අතීතං නානුසොචාමි නප්පජප්පාමිනාගතං
පච්චුප්පන්නෙන යාපෙමි තෙන වණ්ණො පසීදති.

205 යංසද්දුත්තරවාක්‍යට්ඨො පුබ්බෙ ඤාපෙ තසද්දකං
පුබ්බවාක්‍යට්ඨ යංසද්දො සාකඞ්ඛො ජනතූනතං.

206. සහසද්දප්පයොගා තු ගුණදබ්බක්‍රියානපි
සමවායෙ ච ගොතන්ති පරිදීපෙන්ති පණ්ඩිතා.

---

202 තස්ස අපි, ඒ දිවකුරු බුදුන්ගේ ද; වචනං සුත්වා, බස් අසා; භීයො, බෙහෙවින්; චිත්තං, සිත; පසාදයිං, පැහැදවීය; උත්තරිඤ්චාත, එතරවී; දස පාරමී, දසපාරමිතාවන්; පූරෙතුං, පුරනෙනම්යයි; අධිට්ඨාසිං, ඉටුයේය; (දීපඞ්කරොමහාවීරො, යන පදය අතික්‍රාන්ත වූහෙයින් මේ අතික්‍රාන්ත විෂය නමි.)

203 ලොකජෙට්ඨස්ස, ලොකජ්‍යෙෂ්ඨවූ; තාදිනො, කෙලෙසකම්පාරහිතවූ, තස්ස බුද්ධස්ස, ඒ සර්‍වඥයන් වහන්සේට; නමාමි, නමස්කාර කරමි; තස්ස එව, උන්වහන්සේගේම; ධම්මරතනං, ධර්‍මරත්නයටද; නිරඞ්ගණං, මලරහිතවූ; සඞ්ඝඤ්ච අපි, ආර්‍ය්‍යසඞ්ඝයාටද (නමස්කාර කරමි)—(මේ ප්‍රසිද්ධවිෂයයි.)

204 අතීතං, ඉකුත්ව ගියදෙයට; න අනුසොචාමි, නැවත නැවත ශොක නොකරමි; අනාගතං, අප්‍රාප්තදෙය සඳහා; නප්පජප්පාමි, බස් නොකියමි අප්‍රාප්තදෙය නොපතමියි; පච්චුප්පන්නෙන, ප්‍රත්‍යුත්පන්න දෙයින්; යාපෙමි, යපෙමි; තෙන, එයින්; වණ්ණො, (සිරුරෙහි) පැහැය; පසීදති, පහදී;– (මෙහි ශොකාදීන් තොරව සියලුම අහර මාවිසින් අනුභව කරණලදැයි කියනලදින් අධිෂ්ඨානහෙයින් අනුභූතවිෂය නම් වේ.)

මෙසේ තශබ්දයාගේ යශබ්දඅනපෙක්ෂලක්ෂණය දක්වා දැන් යශබ්ද ලක්ෂණය දක්වනු සඳහා යංසද්දො යනාදිය ආරබ්ධයි.

205. උත්තරවාක්‍යට්ඨො, පශ්චිමවාක්‍යයෙහි සිටියාවූ; යසද්දො, යශබ්දය තෙම; පුබ්බෙ, පූර්‍වවාක්‍යයෙහි; තසද්දකං, තශබ්දය; ඤාපෙ, හඟවයි; පුබ්බවාක්‍යට්ඨ, පූර්‍වවාක්‍යයෙහි සිටියාවූ; යසද්දො, යශබ්දයතෙම; සාකඞ්ඛො, ආකාංක්ෂා සහිතවම; ඌනතං, (වාක්‍යයාගේ) ඌනබව; ජනෙති, උපදවයි හෙවත් පවත්වයි.

දැන් සමවායනය දක්වන්නෝ. ‘සහසද්දප්පයොගා’ යනාදියකියත්.

206. සහසද්දප්පයොගාතු, සහශබ්දප්‍රයොග සහාපිප්‍රයොග වනාහි; ගුණ දබ්බක්‍රියානං, ගුණද්‍රව්‍යය ක්‍රියායයන මොවුන්ගේ; සමවායෙ ච, සම්බන්ධය

207. පුත්තෙන සහ ථූලො සො පුත්තෙන ධනවාඉති
පුත්තෙන සහ පාවිසි ඉදං තෙසං නිදස්සනං.

208. එකාදයොට්ඨාරසන්තා සංඛෙය්‍යෙසු තිලිඞ්ගිකා
එකෙ ඉච්චාහු සඞ්ඛ්‍යානසඞ්ඛෙය්‍යානඤ්ච වාචකා.

209. තෙනෙකවචනන්තෙකසද්දො සඞ්ඛ්‍යාය වාචකො
සමානඤ්ඤසහායත්තෙ චෙ සබ්බවචනො භවෙ.

210. තෙ බහුවචනන්තා'ව සියුං යෙ වාදිඅන්තකා
ඉදං ලක්ඛණං ඤත්වාන පයොගඤ්ච යථාරහං.

211. වග්ගමත්තාපි සඞ්ඛ්‍යානෙ සඞ්ඛෙය්‍යෙ වීසතාදයො
නවුතන්තිත්ථිලිඞ්ගෙකවචනන්තෙකරාසිතො.

---

ඇතිකල්හි ම; හොන්ති ඉති, වෙත්යයි; පණ්ඩිතා, පණ්ඩිතයෝ; පරිදීපෙන්ති, ප්‍රකාශ කෙරෙත්.

207. සො, හෙතෙම; පුත්තෙන සහ, පුත්‍රයා හා එක්ව; ථූලො, සථූලයි, පුත්තෙන සහ, පුත්‍රයා හා එක්ව; ධනවා, ධනවත්ය; පුත්තෙන සහ; පුත්‍රයා හා එක්ව, පාවිසි ඉති, වැදුනේය යන; ඉදං, මෙය; තෙසං, ඔවුන්ට; නිදස්සනං, නිදශීනයි.

ඉක්බිති 'එකාදයො' යනාදින් සඞ්ඛ්‍යානය ආරබ්ධයි.

208. එකාදයො, එකශබ්දය ආදි කොටඇති, අට්ඨාරසන්තා, අට්ඨාරස ශබ්දය අන්තකොට ඇති සඞ්ඛ්‍යාශබ්දයෝ; සඞ්ඛෙය්‍යෙසු, සඞ්ඛ්‍යායෙන් පරිච්ඡින්නද්‍රව්‍යයෙහි වැටෙත්; තිලිඞ්ගිකා, තුන්ලිඟු ඇත්තාහ; එකෙ, ඇතම් ආචාය්‍යීකෙණෙක්; සඞ්ඛ්‍යානසඞ්ඛෙය්‍යානඤ්ච, සංඛ්‍යාමාත්‍රය සංඛ්‍යාපරිච්ඡින්න ද්‍රව්‍යය යනමොවුන්ටද; වාචකා, නම්වන්නාහුයයි; ඉති ආහු, මෙසේ කිහු.

209. තෙන, එහෙයින්; එකවචනන්තො, එකවචනාන්තකොට ඇති; එකසද්දො, එකශබ්දයතෙම; සඞ්ඛ්‍යාය වාචකො, සඞ්ඛ්‍යාවට නම්වේ; චෙ, ඉදින් සමානඤ්ඤසහායත්තෙ, තුල්‍යඅන්‍යඅසහාය යනමොවුන් අර්ථකොට ඇත්තේ නම්; සබ්බවචනො භවෙ, සියලුවචන ඇත්තේ වේ.

210. වාදි, වීශබ්දය ආදිකොටඇති; අන්තකා, අඨාරසශබ්දය අන්තකොට ඇති; යෙ, යම් ශබ්දකෙනෙක්; සියුං, වන්නාහුද, තෙ, ඒසඞ්ඛ්‍යාශබ්දයෝ; බහුවචනන්තා එව, බහුවචනාන්තකොට ඇත්තාහුමය; ඉදං ලක්ඛණං, මේ ලක්ෂණය; ඤත්වාන, දැනගෙණ; පයොගං ච, ප්‍රයොගයද; යථාරහං, සුදුසු පරිද්දෙන් දත්තේය.

211. සඞ්ඛ්‍යානෙ, සංඛ්‍යාමාත්‍රයෙහි ද; සඞ්ඛෙය්‍යෙ, සංඛ්‍යායෙන් පිරිසුන් ද්‍රව්‍යයෙහි ද; වග්ගමත්තා අපි, වැටෙන්නාවූද; වීසතාදයො, වීසතිශබ්දයආදි

212. රාසිභෙදෙ කතෙ අඤ්ඤඤ්ඤයොගෙ බහුවචනකා
ජනනවුත්තියො පාසණ්ඩා ඉදමෙත්ථ නිදස්සනං.

213. එකූනසතමාදී ච ලක්ඛනන්තා'ච නපුංසකෙ
එකවචනකා හොන්ති ඉති ඤෙය්‍යා සුධීමතා.

214. කොට්‍යාදයො වීසති තු රාසිභෙදෙ කතෙ පන
සබ්බෙත්ථ බහුවාචනා හොන්තෙවා'ති විනිච්ඡයා.

215. නවනාගසහස්සානි නාගෙ නාගෙ සතං අජා
අස්සෙ අස්සෙ සතං රථා රථෙ රථෙ සතං නරා.

216. නරෙ නරෙ සතං කඤ්ඤා කඤ්ඤෙ කඤ්ඤෙ සතිත්ථියො
එසා අක්ඛොභිණී නාම මුනින්දෙන පකාසිතා.

---

කොටඇති; නවුතිඅන්තා, නවුති ශබ්දය අන්තකොට ඇත්තාහු; එකරාසිතො, එකරාශිවශයෙන්; ඉත්ථිලිඞ්ගෙකවචනන්තා, ස්ත්‍රීලිඟු එකවචනඅන්තකොට ඇත්තාහුය.

212. රාසිභෙදෙ, රාශිනානත්වය; කතෙ, කළකල්හි; අඤ්ඤඤ්ඤයොගෙ, අන්‍ය රාශියක් හා යෙදීමෙහි; බහුවචනකා, බහුවචනාන්ත ද වෙත්; ජනනවුත්තියො පාසණ්ඩා, ජනනවුත්තියො පාසණ්ඩා යන; ඉදං, මෙය; එත්ථ, මේරාශි භෙදයෙහි; නිදස්සනං, නිදර්ශනයි.

213. ලක්ඛනන්තා එව, ලක්ඛශබ්දය අන්ත කොටඇත්තාවූ; එකූනසත ආදී ච, එකූනසතශබ්දාදීහුද; නපුංසකෙ, නපුංසකලිඟුයෙහි; එකවචනකා හොන්ති ඉති, එකවචනාන්තකොටඇත්තාහු වෙතියි; සුධීමතා, සුධීමත්හු විසින්; ඤෙය්‍යා, දතයුත්තාහ.

214. කොට්‍යාදයො, කොටිශබ්දය ආදිකොටඇති; වීසති තු, ශබ්දවිස්ස වනාහි; රාසිභෙදෙ කතෙ, රාශිභෙදයකරණලද, සබ්බෙත්ථ පන, සැමතන්හිම; බහුවාචනා හොන්ති එව ඉති, බහුවචන ඇත්තාහුමවෙත්යයි; විනිච්ඡයා, විනිශ්චය කටයුත්තාහ.

215. නවනාගසහස්සානි, ඇතුන් නවදහසත්ද; නාගෙ නාගෙ, එක එක ඇතෙකු සමීපයෙහි; අජා, අශ්වයෝ; සතං, සියයක් වෙත්ද; අස්සෙ අස්සෙ, අසෙකු අසෙකු කෙරෙහි හෙවත් අසෙකු අසෙකු වෙත; සතං රථා, රථසිය යක් වෙත්ද; රථෙරථෙ, රථයක් රථයක් වෙත; සතං නරා, පුරුෂයන්සිය යක් වෙත්ද.

216. නරෙ නරෙ, පුරුෂයෙකු පුරුෂයෙකු වෙත; කඤ්ඤා, කන්‍යාවෝ; සතං, සියයක් වෙත්ද; කඤ්ඤෙ කඤ්ඤෙ, කන්‍යාවක් කන්‍යාවක් වෙත; ඉත්ථියො, ස්ත්‍රීහු; සතං, සියයක් වෙත්ද; එසා, මෙබඳුසඞ්ඛ්‍යාතොමෝ; අක්ඛොභිණීනාම, අක්ෂොභිණීනමැයි; මුනින්දෙන, මුනීන්ද්‍රයන්වහන්සේ විසින්; පකාසිතා, ප්‍රකාශකරණලද්දීය–(නිරුක්තිනයානුසාරයෙන් කඤ්ඤෙ කඤ්ඤෙයි සිඛියි,)

217. සට්ඨිවෙළුකලාපෙසු පච්චෙකං සට්ඨිවෙළුසු
ඛුලිකගතෙ තු සෙනාය යන්තියාභෙබාභිණී ච සා.

218. සතානි තීණි වස්සානි චක්කවාලාභිපූරයං
පිණ්ඩම බින්දුවස්සම අසඞ්ඛ්‍යෙයාති වුච්චති.

219. අථවාපිචත්තාළීස සතං සුඤ්ඤමපි වුච්චති
අථවා ගණනෙපථං අතීතත්තා තථා මතා.

220. ජනකො ඤාපකො සම්පාපකො හෙතව්වා තයො
බීජා පජායතඞ්කුරෝ ධූමාච අග්ගි ඤායති.

221. රථෙන නගරමපත්තො නාවාය පාර පාපුණී
මග්ගෙන පාපුණී පාරං ඉදං තෙසං නිදස්සනං.

---

සම්මතනයානුසාරයෙන් අතිකුද්‍ර ක්‍රමයක් කියත්.

217. පච්චෙකං, වෙනවෙනම; සට්ඨිවෙළුසු, හුණ්දඬු හැටහැට ඇති; සට්ඨිවෙළුකලාපෙසු, හුණ්දඬුකලප්සැටක්; (හුණ්දඬුමිටිසැටක්)–යන්තියා සෙනාය, යන්නාවූසෙනාව විසින්; ඛුලිකගතෙ තු, රජස්කලකල්හි; සා, ඕතොමෝ; අභෙබාභිණී, අක්ෂෞහිණීනම්.

218. සතානි තීණි වස්සානි, සියලුම අවුරුදුතුන්සියයක් මුළුල්ලෙහි; චක්කවාලාභිපූරයං, සක්වලපුරවමින් වසින; පිණ්ඩඤාව, බින්දුපිඩුද; වස්ස ඤාව, වැසිබිඳුද; අසඞ්ඛ්‍යෙයා ඉති, සඞ්ඛ්‍යානොකටහැකකැහුයයි; වුච්චති, කියනු ලැබේ.

ඉක්බිති අතිකුද්‍රනයක් දක්වූහ.

219. අථවා, නොහොත්; අපි, යලිදු; (අපරනයක්ද දතයුතු)–තාළීස, සතළිස්ක් අධිකකොටඇති; සතං, සියය; සුඤ්ඤං අපි, සූන්‍යයයි ද; වුච්චති, කියනුලැබේ; අථවා. නොහොත්; ගණනෙපථං. සඞ්ඛ්‍යාපථය; අතීතත්තා, ඉක්මගියබැවින්, තථා, එසේම; මතා, දන්නාලදී; (අසඞ්ඛ්‍යෙයය දන්නාලදී.)

මෙසේ සැකෙවින් ගණනනය දක්වා දූත් අතිකුද්‍රනයක් දක්වත්.

220. ජනකො, ජනකනයද; ඤාපකො, ඤාපකනයද; සම්පාපකො, සම්පා පකනය දුයි; නයතුණෙක්ද (මෙසේම) හෙතුවො තයො, හෙතුතුණෙක්ද වෙති; බීජා, බීජයෙන්; අඞ්කුරෝ, දලුව; පජායති, උපදියි; ධූමා ච, දුමින්; අග්ගි, ගින්න; ඤායති, දන්නාලැබේ.

221. රථෙන, රියෙන්; නගරං පත්තො, නුවරට පැමිණියේය; නාවාය, නැවින්; පාරං, එතරට; පාපුණී, පැමිණියේය; මග්ගෙන, (සොවාන්ආදී) මාර්ගයෙන්; පාරං, නිවණට; පාපුණී, පැමිණියේය; ඉදං, මෙය; තෙසං, ඔවුන්ට; නිදස්සනං, නිදර්ශනයි.

222. නානාපරම්පරාමෙව පච්චෙකවසතො තිධා
කුසලස්ස කතත්තා ච සම්පන්නා පච්චයස්සච
උප්පන්නං හොති විඤ්ඤාණං වෙදිතබ්බං විභාවිනා.

223. සීලතො පමුදෙ හොති පමුදා හොති සුඛිතො
සුඛිතත්තා පසම්හති කායො යොගස්ස භික්ඛුනො.

224. දානතො භොගවා හොති සීලතො හොති සුඛිතො
තස්මා දානඤ්ච සීලඤ්ච කාතබ්බං විඤ්ඤුනා සදා.

225. භාවලක්ඛණහෙත්වාදි ක්‍රියානන්තස්ස අභාවතො
තංයොගෙ තන්නිමිත්තෙ'පි කාරකන්ති න වුච්චති.

226. යම ජාතිගුණක්‍රියානාමෙහි සමුදායතො
විසුං කරණමෙකස්ස තං නිද්ධාරණමබ්‍රවුං

---

222. නානා, නානාහෙතුවශයෙන්ද; පරම්පරා ච එව, පරම්පරාහෙතුවශයෙන්ද; පච්චෙකවසතො, ප්‍රත්‍යෙකහෙතුවශයෙන්දැයි කියා; තිධා, (හෙතුහු) තුන්පරිද්දෙකින් වෙත්; කුසලස්ස, කුසලයගේ; කතත්තාව, කළබැවින්ද; පච්චයස්ස, (රූපලොකවස්තුමෙනෙහි කිරීම්සඞ්ඛ්‍යාත) ප්‍රත්‍යයගේ; සම්පන්නා, සම්පූර්ණවූ බැවින්ද; විඤ්ඤාණං, විපාකවිඥානය; උප්පන්නං හොති, උපන්නේ වේයයි; විභාවිනා, පණ්ඩිතයාවිසින්; වෙදිතබ්බං, දතයුතු.

223. සීලතො, කාමාවචරශීලයෙන්; පමුදෙ හොති, ප්‍රමොදය වෙයි; පමුදා, ප්‍රමොදයෙන්; සුඛිතො හොති, සුඛිතවෙයි; සුඛිතත්තා, සුඛිතබැවින්; යොගස්ස භික්ඛුනො, යොගාවචර භික්ෂූහුගේ; කායො, නාමකය; පස්සම්භති, සන්සිඳෙයි සිහිල්වේයයි සේයි.

224. දානතො, දානය හෙතු කොට ගෙණ; භොගවා හොති, භොගවත් වේ; සීලතො, ශීලය හෙතු කොටගෙණ; සුඛිතො හොති, සුඛිත වෙයි; තස්මා, එහෙයින්; දානඤ්ච, දානයද; සීලඤ්ච, සීලයද, විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; සදා, සැමකල්හි; කාතබ්බං, කටයුතුයි.

හෙතුහුගේ කාරක අකාරකව්‍යවස්ථානිර්දෙශකරණු පිණිස
"භාවලක්ඛණහෙත්වාදි" යනාදිය අරබ්ධයි.

225. භාවලක්ඛණහෙත්වාදි, භාවලක්ෂණහෙතු යන මේ ආදියඇති කාරකයෙක්; ක්‍රියාන්තස්ස, ක්‍රියාකාරකයාගේ හෙවත් ක්‍රියාස්වභාවයාගේ; අභාවතො, අභාවයෙන් අවිද්‍යමාන බැවින්; තංයොගෙ, ඒ ක්‍රියායොගයෙහිද; තන්නිමිත්තෙ, ඒක්‍රියාවට නිමිත්තවූදෙයෙහිද; කාරකං ඉති, කාරකයයි; න වුච්චති, කියනු නොලැබේ.

දැන් අනිකුදු ලක්ෂණයක් දක්වත්.

226. ජාතිගුණක්‍රියානාමෙහි, ජාතිය ගුණය ක්‍රියාය නාමය යනමොවුන් කරණ කොටගෙණ; සමුදායතො, සමූහයා කෙරෙන්; එකස්ස, එකක්හුගේ;

227. බාහියො සූරතමො හොති මනුස්සෙසු යථා තථා
නාරීසු දස්සනීයතමා සාමා නාරී චක්ඛුස්සා වා.

228. ධාවන්තො සීඝතමො හොති පථිකෙසු නරෙසු වෙ
අරහතඤ්ඤතරො'පි හොතානන්දො බහුස්සුතො.

229. නීහරිත්වා ධාරණතො නිද්ධාරණන්ති වුච්චති
නීහරිතබ්බභාවෙන නිද්ධාරණෙ'ව ගම්‍යතෙ.

230. නිද්ධාරණභාවො අස්ස අත්ථි නිද්ධාරණීයිති
නිද්ධාරණහෙතු කෙචි කෙහි වුත්තං විචාරිතං.

231. සාම්‍යාලපනනිද්ධාරණභාවාදිමකාරකං
ක්‍රියායොගෙ තදභාවා ඉති ලක්ඛයෙ පණ්ඩිතො.

---

විසුං කරණං, පෘථක්කරණය යන; යස්මා, යමකුත් හේද; තං, එය; නිද්ධාරණං, නිර්ධාරණයයි; අබ්‍රවුං, කීහු.

227. මනුස්සෙසු, මිනිසුන් අතුරෙන්; බාහියො, ක්ෂත්‍රියතෙම; සූරතමො හොති, අතිශයින් සූර වෙයි; යථා යථා යනු නිපාත සමුදායයි; නාරීසු, මාගමුන් අතුරෙන්; සාමා, ශ්‍යාමවර්ණවූ; නාරී, ස්ත්‍රියතොමෝ; චක්ඛුස්සා, ඇසටගිතවූ; දස්සනීයතමා, අතිශයින් දර්ශනීයයයි.

228. පථිකෙසු, ගමන්කරන්නාවූ; නරෙසු, පුරුෂයන් අතුරෙන්; ධාවන්තො, දුවන්නා; සීඝතමො හොති, අතිශයින් ශීඝ්‍රවේ; බහුස්සුතො, බහුශ්‍රැතවූ; ආනන්දො, ආනන්දස්ථවිරතෙමේ; අරහතං; අර්හතුන් අතුරෙන්; අඤ්ඤතරො, එක්තරා කෙණෙක් (යනුපඬිතානීන් උදාහරණයි).

229. නීහරිත්වා, වෙන් කොට; ධාරණතො, දරණහෙයින්; නිද්ධාරණං ඉති, නිර්ධාරණයයි; වුච්චති, (ඇතම්කෙනෙකු විසින්) කියනුලැබේ; නීහරිතබ්බභාවෙන, වෙන්කටයුත්තක්හු නැති බැවින්; නිද්ධාරණෙ එව, වෙන් කිරීමම; ගම්‍යතෙ, හැගේ.

230. නිද්ධාරණභාවො, නිර්ධාරණභාවය; අස්ස, මීට; අත්ථි, ඇත්තේවුයි; නිද්ධාරණභාවී ඉති, නිර්ධාරණභාවීයයි කියත්; කෙචි, ඇතම්කෙණෙක්; නිද්ධාරණහෙතු, නිර්ධාරණයට හෙතුවයයිද කියත්; කෙහි, ඔවුන් විසින්; වුත්තං, කියනලද්ද; විචාරිතං, විමසිය යුතු.

231. සාමි, සාමියද; ආලපන, ආමන්ත්‍රණයද; නිද්ධාරණභාවාදිං, නිර්ධාරණභාවාදියද, ක්‍රියායොගෙ තදභාවා, ක්‍රියායොගයෙහි ඔවුන්ගේ අභාවයෙන්; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අකාරකං ඉති, කාරක නො වේයයි, ලක්ඛයෙ, දක්නේය.

232. කම්මසාධනතො වත්ථු භාවසාධනතො ක්‍රියා
සාරතො'භිමුඛීකාරමත්තමෙවොපලක්ඛයෙ.

233. ආලපනපදං යත්‍ර තං ක්‍රියාය විසෙසනං
වජති * දෙවදත්තා'ති කාරකං තං න ජායතෙ.

234. සම්බන්ධො කාරකෙහඤ්ඤො ක්‍රියාකාරකපුබ්බකො
සම්බන්ධිබුද්ධිජනකො සම්බන්ධිද්වයනිස්සිතො.

235. සම්බන්ධි විය සම්බන්ධො රූපතො න කුදාචනං
දට්ඨුං සක්කා'ති විඤ්ඤූහි මඤ්ඤතෙ සො'නුමානතො.

236. රාජා දදාති ගණ්හාති පුරිසො'ති ච වත්තරි
ක්‍රියං නිස්සාය සම්බන්ධො අඤ්ඤඤ්ඤාපෙක්ඛලක්ඛණො.

---

ඉක්බිති අනිකුදු නයක් දක්වූහ

232. කම්මසාධනතො, කර්මසාධනවශයෙන්; වත්ථු, ඇමතුම්කරණ වස්තුව ද; භාවසාධනතො, භාවසාධනවශයෙන්; ක්‍රියා, ආමන්ත්‍රණක්‍රියාව ද වේයයි; සාරතො, සාරවශයෙන්; (ඇමතුම්කරණලබන්නාගේ) අභිමුඛීකාර මත්තං එව, අභිමුඛීකාරමාත්‍රයමයයි; උපලක්ඛයෙ, දන්නේය.

මෙහි වනාහි 'අභිමුඛීකාරො' යි සාමාන්‍යවශයෙන් කියන ලද්දේවී නමුත් ඇමතුම් කටයුත්තාහුගේ අභිමුඛීකාරයයි අර්ථවශයෙන් දතයුතු, එසේගත් කල උදාහරණයට ද සම වේ, අනික් පරිච්ඡෙදෙන් විභක්තිය අනිකක්ද ආල පනය අනිකක් දවේ; ආලපනපදය සම්බන්ධකාරකඅකාරකවිනිශ්චය මෙසේ කීහත්.

233, යත්‍ර, යම්බඳුවූ; ආලපනපදං, ආමන්ත්‍රණපදයක් වේ ද; තං, එය; ක්‍රියාය, ක්‍රියාවට; විසෙසනං, විශෙෂණයයි; වජති දෙවදත්ත ඉති, දෙවදත්තය (ත්වං) වජාහි කියා (ඇමතුම් කරණ සමයෙහි) තං, ඒආලපනය; කාරකං, කාරකය; න ජායතෙ, නොවන්නේය.

234. සම්බන්ධො, සම්බන්ධයතෙම; කාරකෙහි, කාරකයන්ගෙකරෙන්; අඤ්ඤො, අන්‍යවූ; ක්‍රියාකාරකපුබ්බකො, ක්‍රියාකාරකයන් ප්‍රධානකොට ඇති; සම්බන්ධිබුද්ධිජනකො, සම්බන්ධයෙහි බුද්ධිය උපදවන්නාවූ; සම්බන්ධිද්වයනිස්සිතො; සංයුක්තයන් දෙදෙනා ආශ්‍රය කොට ඇත්තේය.

235. සම්බන්ධි විය, සංයුක්තයන් දෙදෙනාමෙන්; සම්බන්ධො, සම්බන්ධයතෙම; රූපතො, ස්වරූපවශයෙන්; කුදාචනං, කිසිකලෙකත්: දට්ඨුං, දක්නට; න සක්කාති, නොහැකියි; සො, ඒසම්බන්ධයතෙම; අනුමානතො, අනුමානවශයෙන්; විඤ්ඤූහි, නුවනැත්තන් විසින්; මඤ්ඤතෙ, දන්නාලැබේ.

236. රාජා, රජතෙම; දදාති, (දියයුත්තක්) දෙයි; පුරිසො, පුරුෂතෙම; ගණ්හාති ඉති (ඒසියල්ලම) ගණීයයි; ක්‍රියං නිස්සාය, (දානගහණ) ක්‍රියා

---

* වජාහි, පොත්හි.

237. ක්‍රියාකාරකතො සෙසෙ ඡඨී ජායති සා පන
සම්බන්‍ධමපි ජොතෙති වුත්තෙන්ත සා හි පයුජ්ජතෙ.

238. ඡඨී වත්ථුද්විසම්බන්‍ධෙ භෙදකස්මා'ව ජායතෙ
ජාතාපි චෙ විසෙසනම්හා සම්බන්‍ධං න වදෙ යතො.

239. සද්දසත්තිසභාවත්තා අයං භාවො පතීයතෙ
පතීතිමනතික්කම්ම හොති සද්දප්පවත්තනං.

240. ක්‍රියාය සහ අඤ්ඤමඤ්ඤං කාරකානමපෙක්ඛතො.
ක්‍රියාකාරක සම්බන්‍ධො න ඡට්ඨිවිසයො අයං.

241. භෙදභෙදකභූතානං පුරිසානං සංකෙතනිස්සිතං
නානාපදං සමානෙති යං තං වාක්‍යන්ති වුච්චති.

---

දෙක නිසා; සම්බන්‍ධො, සම්බන්‍ධයතෙම; වත්තති, පවතියි; අඤ්ඤමඤ්ඤාපෙක්ඛලක්ඛණො, ඔවුනොවුන් අපෙක්‍ෂාකිරීම ස්වභාව කොට ඇත්තේය. (සම්බන්ධය නිසා සංයුක්තයාද සංයුක්තයා නිසා සම්බන්ධයදැයි කියනලදී.)

237. ක්‍රියාකාරකතො, ක්‍රියායෙන් හා ෂට්කාරකයන්ගෙන්ද; සෙසෙ, ශෙෂවූ අර්ථයෙහි; ඡට්ඨි ෂෂ්ඨීතොමෝ; ජායති, වෙයි; සා පන, ඒ ෂෂ්ඨිය වනාහි; සම්බන්‍ධං අපි, සම්බන්ධය ද; ජොතෙති, ප්‍රකාශ කෙරෙයි; හි, (එය මසත්‍යයද) එහෙයින්, වුත්තෙ, (සාමාන්‍යර්ථය උක්තකල්හි) කියයුතුකල්හි; සා, ඒ ෂෂ්ඨීතොමෝ; පයුජ්ජතෙ, ප්‍රයොගකරණලැබෙයි.

238. ඡඨීසම්බන්ධෙ, ෂෂ්ඨීවූ සම්බන්ධය; වත්ථු, වස්තු දෙකෙක්හි ඇති කල්හි; භෙදකස්මා එව, විශෙෂණයා කෙරෙන් ම; ඡඨී, ෂෂ්ඨී තොමෝ; ජායතෙ, වෙයි; විසෙසනම්හා, විශෙෂ්‍යයා කෙරෙන් පරව; චෙ, ඉදින්; ජාතා අපි, උපන්නාවූද (ඒ ෂෂ්ඨිය) යතො, යම්හෙයකින්; සම්බන්ධං, සම්බන්ධයක්; න වදෙ, නොකියන්නේද (එහෙයිනි.)

239. සද්දසත්තිසභාවත්තා, ශබ්දශක්තිස්වභාවය හෙයින්; අයං භාවො, මේ භාවයතෙම; පතීයතෙ, හැඟේ: පතීතිං, ප්‍රකටවූ හැඟීම; අනතික්කම්ම, නො ඉක්මවා; සද්දප්පවත්තනං, ශබ්දාර්ථදෙදෙනාගේ පැවැත්ම; හොති, වෙයි.

240. ක්‍රියාය සහ, ක්‍රියාව හා එක්ව; කාරකානං, කාරකයන්ගේ; අඤ්ඤමඤ්ඤං අපෙක්ඛතො, අන්‍යොන්‍ය අපෙක්‍ෂාව ඇතිබැවින්; අයං ක්‍රියකාරකසම්බන්ධො, මේ ක්‍රියාකාරක සම්බන්ධයතෙම; ඡට්ඨිවිසයො න, ෂෂ්ඨිය විෂයකොට ඇත්තේ නොවෙයි.

242\. ඒකවණ්ණක්ඛරං නාම අක්ඛරසමූහං පදං මතං;
වාක්‍යං තස්ස සමුදායො සත්ථන්ති තංසමූහකං.

243\. සාවකාසානවකාසෙසුනවකාසො බලී භවෙ
අන්තරඞ්ගබහිරඞ්ගෙසුන්තරඞ්ගං බලී සියා.

244\. සම්භවෙ සති බ්‍යභිචාරෙ භෙදකං සාත්ථකං භවෙ
සද්දෙ අසම්භවෙයෙව අඤ්ඤෙ වුත්තවිධී භවෙ
අඤ්ඤෙ අසම්භවෙයෙව සද්දෙ වුත්තවිධී භවෙ.

ඉති සද්දසාරත්ථජාලිනියා සද්දසාරපකිණ්ණකකණ්ඩො
පඨමො
පඨමභාණවාරො.

---

දැන් අනිකුදු නයක් දක්වත්.

241\. භෙද්‍යභෙදකතො, විශෙෂණවිශෙෂ්‍යදෙදෙනා විද්‍යමානබැවින්; පුණ්ණං, ඒදෙකින් පිරෙණලද; සංකෙතනිස්සිතං, ව්‍යවහාරය ආශ්‍රය කරණලද; යං නාමපදං, යම්බඳුවූ නාම්වැදෑරුම්පදයක්; සමානෙති, මොනවට එළවාද; තං, ඒපදසමූහය; වාක්‍යං ඉති, වාක්‍යයයි; වුච්චති, කියනුලැබේ.

242\. ඒකවණ්ණං, ඒකවර්ණයෙක්; අක්ඛරං නාම, අක්ෂරනම්; අක්ඛරසමූහො, අක්ෂරසමූහය; පදං මතං, පදයයි දන්නාලදී; තස්ස සමුදායො, ඒ පදසම්බන්ධි සමුදාය; වාක්‍යං, වාක්‍යනම්; තංසමූහකං, ඒවාක්‍යයන්ගේ සමූහයතෙම; සත්ථං ඉති, ශාස්ත්‍රයෙකැයි හෙවත් ප්‍රකරණයෙකැයි; මතං, දන්නාලදී.

243\. සාවකාසානවකාසෙසු, සාවකාශවිධිඅනවකාශවිධිගදෙදෙනා අතුරෙන්; අනවකාසො, අනවකාශයතෙම; බලී භවෙ, බලවත් වන්නේය; (සාවකාශයනම් බොහෝඅවකාශ ඇත්තේයි අනවකාශයනම් අල්පාවකාශ ඇත්තේයි) අන්තරඞ්ගබහිරඞ්ගෙසු, අන්තරඞ්ගවිධි බහිරඞ්ගවිධි දෙක අතුරෙන්; අන්තරඞ්ගං, අන්තරඞ්ගවිධිය; බලී සියා, බලවත්වන්නේය.

244\. සම්භවෙ, ග්‍රහණයට කාරණය; බ්‍යභිචාරෙ සති, ව්‍යභිචාරව ඇතිකල්හි හෙවත් විපිධව ඇතිකල්හි; භෙදකං, විශෙෂණය; සාත්ථකං භවෙ, සාර්ථකවන්නේය; සද්දෙ, ශබ්දය; අසම්භවෙ යෙව, ග්‍රහණයට කාරණය නැතිකල්හිම; අඤ්ඤෙ, අන්‍යයෙහි; වුත්තවිධි, කියනලදවිධිය; භවෙ, වන්නේය; අඤ්ඤෙ, අන්‍යය; අසම්භාවෙ එව, ග්‍රහණයට කාරණය නැතිකල්හිම; සද්දෙ, ශබ්දයෙහි; වුත්තවිධි, කියනලදවිධිය; භවෙ, වන්නේය.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනීනම් ප්‍රකරණයෙහි; සද්දසාරපකිණ්ණකකණ්ඩො, ශබ්දසාරප්‍රකීර්ණකකාණ්ඩනම්වූ; පඨමො, පළමුවන කාණ්ඩය; ඉති, මෙතෙකින් සමාප්තයි.

පඨමභාණවාරො, පළමුවන බණවරයි.

245. අත්ථො තු දුවිධො හොති අභිධානාභිධෙය්‍යතො
වචනත්ථොභිධානත්ථො පරියායත්ථිතරො භවෙ.

246. නෙය්‍යත්ථනීතත්ථවසා පුන අත්ථො ද්විධා සියුං
වචනන්තරෙන ඤෙය්‍යත්ථො නෙය්‍යත්ථො'ති පවුච්චති.

247. යථාරුතවසෙනෙව වෙදිතබ්බො තු නීතත්ථො
උදාහරණමෙතෙසං හෙට්ඨාවෙව පකාසිතං.

248. පදත්ථපදත්ථත්ථානං අත්ථත්ථානං පභෙදතො
තිවිධො'ති අත්ථො ඤෙය්‍යො අත්ථඤ්ඤූහි සරූපතො.

249. මජ්ඣිමාපටිපදා වුත්තා පදත්ථොතෙව ගම්‍යතෙ
අරියො අට්ඨඞ්ගිකො අත්ථො පදත්ථත්ථො'ති මඤ්ඤතෙ.

---

මෙතෙකින් ශබ්දසාරනය දක්වා දැන් අර්ථසාරනය දක්වනු සඳහා 'අත්ථො තු, යනාදිය ආරබ්ධයි.

245. අත්ථො තු, අර්ථය වනාහි; අභිධානාභිධෙය්‍යතො, අභිධානාර්ථ අභිධෙයාර්ථවශයෙන්; දුවිධො හොති, දෙවැදෑරුම් වේ; වචනත්ථො, (ගච්ඡතීති ගො මහියං සෙතීති මහිසො, යනාදිවූ) වචනාර්ථයතෙම; අභිධානත්ථො, අභිධානාර්ථනම්; පරියායත්ථො, පර්‍ය්‍යායාර්ථයතෙම; ඉතරො භවෙ, අභිධෙයාර්ථය නම් වන්නේය. (වචනීයාර්ථ යනුද මිට නමි.)

246. නෙය්‍යත්ථනීතත්ථවසා, නෙයාර්ථ (පැමිණවියයුතු අර්ථය) නීතාර්ථය (පමුණුවනලද අර්ථය) යනමොවුන්ගේ වශයෙන්ද; පුන, නැවත; අත්ථො, අර්ථයෝ; ද්විධා, දෙපරිද්දෙකින්: සියුං, වන්නාහුය; වචනන්තරෙන, අන්‍යවචනයෙකින්; ඤෙය්‍යත්ථො, දතයුතු අර්ථයතෙම; නෙය්‍යත්ථො ඉති, නෙයාර්ථයයි; පවුච්චති, කියනු ලැබේ.

247. නීතත්ථො තු, නීතාර්ථය වනාහි; යථාරුතවසෙන එව, ශබ්දයවූ පරිද්දෙන් ම; වෙදිතබ්බො, දතයුතු; හෙට්ඨා, යටශබ්දසාරප්‍රකීර්ණකකාණ්ඩයෙහි; එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; පකාසිතං එව, ප්‍රකාශකරණ ලද්දේමය.

248. පදත්ථපදත්ථත්ථානං, පදාර්ථය පදාර්ථයාගේ අර්ථය යන මේ දෙදෙනාගේ ද; අත්ථත්ථානං, අර්ථාර්ථයන්ගේ ද; පභෙදතො, ප්‍රභෙදයෙන්; අත්ථො, අර්ථයතෙම; තිවිධො ඉති, තුන්වැදෑරුම්යයි; අත්ථඤ්ඤූහි, අර්ථ දන්නවුන් විසින්; සරූපතො, ස්වරූපවශයෙන්; ඤෙය්‍යො, දතයුතු.

249. මජ්ඣිමාපටිපදා වුත්තා, මජ්ඣිමාපටිපදායයි කීහල්හි; පදත්ථො ඉති එව, පදාර්ථමයයි; ගම්‍යතෙ, හැඟේ; අරියො අට්ඨඞ්ගිකො, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකය යන; අත්ථො, අර්ථයතෙම; පදත්ථත්ථො ඉති, පදාර්ථයාගේ අර්ථයයි කියා; මඤ්ඤතෙ, හැඟේ.

250. සම්මාදිට්ඨාදිකො අත්ථො අත්ථෝතෙව ගම්‍යතෙ
එවමෙව අත්ථභෙදෙ අභෙදඤ්ච ජනෙය්‍ය පණ්ඩිතො.

251. පදත්ථපදත්ථත්ථානං අත්ථත්ථානං පභෙදතො
උද්දෙසනිද්දෙසපටිනිද්දෙසානං වසා තිධා.

25'. එකාභිධානො එකත්ථො එකාභිධානො නානත්ථො
නානාභිධානො නානත්ථො නානාභිධානො එකත්ථො
ඉමෙසං පන භෙදානං වසෙන චතුධා මතා.

253. ඉත්ථිපුරිසාදිකො එකා'භිධානො එකත්ථො මතො
බුද්ධො ධම්මො සඞ්ඝො එකා'භිධානො නානත්ථො මතො
කුසලං රූපචක්ඛුමා නානාභිධානො නානත්ථො.

254. සක්කො පුරින්දදො නානා'භිධානො එකත්ථො මතො
එවමෙව ච ඤාතබ්බො අත්ථභෙදො පරො පරො.

---

250. සම්මාදිට්ඨාදිකො, සම්‍යග්දෘෂ්ටිආදිකොට ඇති; අත්ථො, අර්ථයතෙම; අත්ථෝ ඉති එව, අර්ථයාගේ අර්ථයමයයි; ගම්‍යතෙ, හැඟේ; එවං එව, මෙසේම; අභෙදඤ්ච අත්ථභෙදෙ, අන්‍යවූ අර්ථවිශෙෂයන්ද; පණ්ඩිතො; පණ්ඩිත තෙම; ජනෙය්‍ය, දන්නේය.

251. පදත්ථපදත්ථත්ථානං, පදාර්ථය පදාර්ථාර්ථය යනදෙදෙනාගේ ද; අත්ථත්ථානං, අර්ථාර්ථයන්ගේද; පභෙදතො, ප්‍රභෙදවශයෙන්; උද්දෙස නිද්දෙස පටිනිද්දෙසානං වසා,—උද්දෙස, උද්දෙශය: නිද්දෙස, නිර්දේශය; පටිනිද්දෙසානං වසා, ප්‍රතිනිර්දෙශය යන මොවුන්ගේ වශයෙන්; තිධා, තුන්වැදෑරුම්වේ.

252. එකාභිධානො, එකනමක් ඇති; එකත්ථො, එකාර්ථඇත්තේයයි ද; එකාභිධානො, එකනමක් ඇති; නානත්ථො, නානාර්ථ ඇත්තේයයි ද; නානාභිධානො, නොයෙක් නම් ඇති; නානත්ථො, නානාර්ථඇත්තේයයි ද; නානාභිධානො, නොයෙක් නම් ඇති; එකත්ථො, එකාර්ථඇත්තේයයි ද යන; ඉමෙසං භෙදානං වසෙන පන, මේ භෙදයන්ගේ වශයෙන් වනාහි; චතුධා, සිව්පරිද්දෙකින්; මතා, දන්නාලද්දාහුය.

253. ඉත්ථිපුරිසාදිකො, 'ඉත්ථිපුරිස, යනාදිවූ ශබ්දය; එකාභිධානො, එකනමක් ඇති; එකත්ථො, එකාර්ථයයි; මතො, දන්නාලදී; බුද්ධො ධම්මො සඞ්ඝො, බුද්ධො ධම්මො සඞ්ඝො යනු; එකාභිධානො, එකනමක් ඇති; නානත්ථො, නානාර්ථ ඇත්තේයයි; මතො, දන්නාලදී; කුසලං, කුසලං යනුද; රූපං, රූපංනුයද; චක්ඛුමා, චක්ඛුමා යනුද; නානාභිධානො, නොයෙක් නම් ඇති; නානත්ථො, නානාර්ථ ඇත්තේයයි (දන්නාලදී.)

254. සක්කො, සක්කො යනුද; පුරින්දදො, පුරින්දදො යනුද; නානාභිධානො, නොයෙක් නම් ඇති; එකත්ථො, එකාර්ථ ඇත්තේයයි; මතො,

255. පාඨානුසාරී සම්බන්ධො සම්බන්ධො උපමාය ච
හෙතුනාපි ච සම්බන්ධො උපමාහෙතුනාපි ච
සම්බන්ධභෙදා විඤ්ඤෙය්‍යා චත්තාරො'පි විභාවිතා.

256. අබ්‍යාපිතා'ති බ්‍යාපිතං දොසං පුනරුත්ති තථා
පුබ්බාපරවිරොධත්ථං එකත්ථම්ති පඤ්චධා.

257. යමිච්ඡිතං අධිප්පායං න පූරයති යත්‍ථ තං
අබ්‍යාපිතන්ති විඤ්ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

258. අතිච්ඡිතං අධිප්පායං යත්‍ථ දිස්සති තං මතං
අතිබ්‍යාපිතදොසන්ති දොසඤ්ඤූහි සභාවතො.

---

දන්නාලදී; එවං එව ච, මේනයින්ම; පරො පරො, අන්‍යොන්‍යවූ; අත්ථභෙදෙ, අර්ථවිශෙෂය; ඤාතබ්බො, දතයුතු.

සම්බන්ධය තමාද අර්ථාපෙක්ෂාකරණ බැවින් අර්ථනයින් සංග්‍රහකරණු සඳහා පාඨ යනාදිය ආරබ්ධයි.

255. පාඨානුසාරී, විද්‍යමානපාඨය අනුව යන සුලුවූ; සම්බන්ධො, සම්බන්ධයද; උපමාය, උපමාවගේ; සම්බන්ධො ච, සම්බන්ධය ද; හෙතුනා, හෙතුව හා; සම්බන්ධො අපි ච, සම්බන්ධයද; උපමාහෙතුනා අපි ච, උපමාවගේ හෙතුව හා සම්බන්ධයදැයි කියා; විභාවිතා, පණ්ඩිතයා විසින්; සම්බන්ධභෙදා චත්තාරො අපි, සම්බන්ධභෙද සතරද; විඤ්ඤෙය්‍යා, දතයුත්තාහ.

දූන් දොෂභෙද දක්වත්.

256. අබ්‍යාපිතාතිබ්‍යාපිතා, අව්‍යාප්තිදොෂයද අතිව්‍යාප්තිදොෂයද; පුනරුත්තිදොසං, පුනරුක්තදොෂය ද; තථා, එසේම; පුබ්බාපරවිරොධත්ථං, පූර්වාපරවිරොධාර්ථදොෂය ද; එකත්ථං ඉති, එකාර්ථදොෂයදැයි කියා; පඤ්චධා, පස්පරිද්දෙකින් (දොෂභෙද) කියත්.

257. යත්‍ථ, යම් වාක්‍යයෙක්හි; යමිච්ඡිතං, අභිමතවූ; අධිප්පායං, අදහස; න පූරයති, නොපුරවා ද; තං, එය; අබ්‍යාපිතං ඉති, අව්‍යාප්තිදොෂයයි; සභාවතො, ස්වභාවවශයෙන්; දොසඤ්ඤූහි, දොෂ දන්නවුන් විසින්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

258. අතිච්ඡිතං, අභිමතනොවූ; අධිප්පායං, අදහසක්; යත්‍ථ, යම්තැනෙක; දිස්සති, පෙණේද; තං, ඒවාක්‍යය; අතිබ්‍යාපිතදොසං ඉති, අතිව්‍යාප්තිදොෂයයි; දොසඤ්ඤූහි, කාව්‍යදොෂදන්නවුන් විසින්; සභාවතො, ස්වභාව වශයෙන්; මතං, දන්නාලදී.

259. පුබ්බෙ වුත්තං අධිප්පායං පුන වුච්චති යත්ථ තං
පුනරුත්තන්ති විඤ්ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

260. යමිච්ඡිතත්ථං වත්වාන තමෙව වදතඤ්ඤථා
තං විරොධී'ති විඤ්ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

261. අත්ථතුල්‍යා දුවෙ සද්දා යත්ථ වුච්චන්ති තං මතං
එකත්ථන්ති සභාවෙන ඉමෙ දොසා විවජ්ජිතා.

262. ජාති ක්‍රියා ගුණො දබ්බං තථා නාමන්ති පඤ්චධා
සද්දස්ස අත්ථො විඤ්ඤෙය්‍යො තථා සද්දොපි පඤ්චධා.

263. භින්නෙස්වභින්නධීසද්දෙ සබලාදිසු යො භවෙ
සාව ජාතීති විඤ්ඤෙය්‍යා මාලාසුත්තං ව අන්විතං

---

259. යත්ථ, යම්වාක්‍යයෙක්හි; පුබ්බෙ, පළමුකොට; වුත්තං, කියන ලද; අධිප්පායං, අදහස; පුන, නැවත; වුච්චති, කියනු ලැබේද; තං එය; පුනරුත්ති ඉති, පුනරුක්ති දෝෂයයි; දොසඤ්ඤූහි, කාව්‍යදොෂදන්නවුන් විසින්; සභාවතො, ස්වභාවවශයෙන්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

260. යමිච්ඡිතත්ථං, අභිමතාර්ථයක්; වත්වාන, කියා; තං එව, එයම; අඤ්ඤථා, අන්පරිද්දෙකින්; වදති, කියාද; තං, එය; විරොධී ඉති, විරොධිදොෂයයි; දොසඤ්ඤූහි; කාව්‍යදොෂදන්නවුන් විසින්; සභාවතො, ස්වභාවවශයෙන්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

261 අත්ථතුල්‍යා, අර්ථයෙන් සමානවූ; දුවෙ සද්දා, ශබ්දදෙකෙක්; යත්ථ, යම් වාක්‍යයෙක්හි; වුච්චන්ති, කියනු ලැබෙත්ද; සභාවෙන, ස්වභාවයෙන්; තං, එය; එකත්ථං ඉති, එකාර්ථයයි; මතං, දන්නාලදී; ඉමෙදොසා, මේ දොෂයෝ; විවජ්ජිතා, පහ කටයුත්තාහුය.

දූන් අනිකුදු ලක්ෂණයක් දක්වත්,

262. තථා, එසේම; ජාති, ජාතිය; ක්‍රියා, ක්‍රියාවය; ගුණො, ගුණය; දබ්බං, ද්‍රව්‍යය; නාමං ඉති, නාමයදයි කියා; පඤ්චධා, පස්පරිද්දෙකින්; සද්දස්ස, ශබ්දයාගේ; අත්ථො, අර්ථයතෙම; විඤ්ඤෙය්‍යො, දතයුතු; සද්දො අපි, ශබ්දයද; තථා, එසේම; පඤ්චධා, පස්වැදෑරුම් වේ.

263 සබලාදිසු, සබලාදිවූ; භින්නෙසු, භින්නවූ අර්ථයෙහි; අභින්නධී, නොබිඳී පවත්නා බුද්ධිධ්වනිදෙකඇති; යො සද්දො, යම්ශබ්දයෙක්; භවෙ, වන්නේද; සා එව, ඕතොමෝම; ජාති ඉති, ජාතියයි; විඤ්ඤෙය්‍යා, දතයුත්තීය; අන්විතං, අනුගතවූ; මාලා සුත්තං ඉව, මල්දම මෙනි.

264. අද්දබ්බභූතං කත්තාදිකාරකෙහි ච සාධියං
පදත්ථං කත්තුකම්මට්ඨං ක්‍රියමිච්ඡන්ති තබ්බිදූ.

265. දබ්බාසයො තතො භින්නො තස්සෙව ගම්‍යහෙතුකො
විපරිවත්‍යිධම්මො ච නිගුණො ගුණමිච්ඡතො.

266. යං යං විසෙස්සතෙ කිඤ්චි තං තං දබ්බන්ති ලක්ඛිතං
ජාත්‍යාදිපි තතො දබ්බං හොතෙවාති විලක්ඛතෙ.

267. නාමරූපෙන සංයුත්තො කිඤ්චිසඤ්ඤීති ගම්‍යතෙ
නාමෙති තං යථා චිත්තො සඤ්ඤාසද්දො ච හොති තං.

268. හොන්ත්‍යස්මා සද්දඤාණානි භාවො සො සද්දවුත්තියා
නිමිත්තභූතං නාමඤ්ච ජාතිදබ්බං ගුණො ක්‍රියා.

269. චණ්ඩත්තං පුරිසත්තඤ්ච දණ්ඩිත්තං නීලත්තං තථා
පාචකත්තං යථාසඞ්ඛ්‍යං ඉදං තෙසං නිදස්සනං.

---

264. අද්දබ්බභූතං, අද්‍රව්‍යවූ; කත්තාදිකාරකෙහි, කර්ත්‍රාදිකාරකයන් විසින්; සාධියං, සිදුකටයුතුවූ; කත්තුකම්මට්ඨං, කර්තෘකර්මදෙක්හි පිහිටියාවූ; පදත්ථං, පදාර්ථය; තබ්බිදූ, ඒ දන්නෝ; ක්‍රියං, ක්‍රියාවයයි; ඉච්ඡන්ති, කැමති වෙත්.

265. දබ්බාසයො, ද්‍රව්‍යය ආශ්‍රය කොට ඇති; තතො භින්නො, එයින් වෙන්වූ; තස්ස එව, ඒ ද්‍රව්‍යයාගේම; ගම්‍යහෙතුකො, හැඟීමට හෙතුඇති; පරිවත්‍යිධම්මො, පෙරළෙනස්වභාව ඇත්තාවූ; නිගුණො, ගුණාන්තරවිරහිතවූයේ; ගුණ, ගුණයයි; ඉච්ඡතො, කැමතිවනල්දී.

266. යං යං කිඤ්චි, යම්බඳු යම්බඳුවූ කිසිපදයෙක්; විසෙස්සතෙ, විශෙෂකරණුලැබේද; තං තං, ඒ ඒ පදය; දබ්බං ඉති, ද්‍රව්‍යයයි; ලක්ඛිතං, දක්නාලදී; තතො, එහෙයින්; ජාතිආදි–අපි, ජාතිආදියද; දබ්බං හොති එව ඉති, ද්‍රව්‍යවේමයයි; විලක්ඛතෙ, දක්නාලැබේ.

267. නාමරූපෙන, නාමරූපස්වභාවයෙන්; සංයුත්තො, යෙදුනකල්හි; කිඤ්චිසඤ්ඤී, කිසි සංඥාඇතිදෙයෙක්; නාමං ඉති, නාමයයි; ගම්‍යතෙ, හැඟේ; තං යථා, ඒ මෙසේයි; චිත්තො, චිත්‍රශබ්දයතෙම; සඤ්ඤාසද්දො ච හොති, සංඥා ශබ්දයෙක්ද වෙයි.

268. අස්මා, මේ භාවයා කෙරෙන්; සද්දඤාණානි, ශබ්දබුද්ධි දෙදෙන; හොන්ති, වෙත්නුයි; භාවො, භාවනම; සො, ඒ භාවය තෙම; සද්දවුත්තියා, ශබ්දප්‍රවෘත්තියට; නිමිත්තභූතං, කරුණුවූ; නාමං, නාමය ද; ජාති, ජාතියද; දබ්බං, ද්‍රව්‍යයද; ගුණො, ගුණයද; ක්‍රියා, ක්‍රියාවද යනමේයි.

ඊට උදාහරණ දක්වත්.

269. චණ්ඩත්තං, චණ්ඩබවද; පුරිසත්තඤ්ච, පුරුෂබව ද; දණ්ඩිත්තං, දඬු ඇතිබව ද; නීලත්තං, නිල්බව ද; තථා, එසේම; පාචකත්තං, ඉව්කරුබව ද;

270. පරිසමන්තතො සෙසො පාරිසෙසො'ති සො නයො
තංයථා අයමකාරො විරුද්ධො ඉධ නිච්ඡිතො.

271. උපඤ්ඤාසො සමුච්චයො චසද්දත්ථො ද්විධා මතො
උපඤ්ඤාසො නාම වාක්‍යාරම්භො වුච්චති විඤ්ඤුනා.

272. පච්චක්ඛොකප්පනසිද්ධි අනුමානසිද්ධිවසා
අත්ථො තිධා භවතීති අත්ථඤ්ඤූහි පකාසිතො.

273. තත්ථ රූපාදිධම්මානං සභාවලක්ඛණං පන
පච්චක්ඛසිද්ධි විඤ්ඤෙය්‍යං පච්චත්තඤ්ඤෙව ජානතො.

274. සද්දාදීනමනිච්චතා දාකාරො අනුමානතො
විඤ්ඤෙය්‍යත්තා ච විඤ්ඤෙය්‍යො අනුමානො'ති විඤ්ඤුනා.

---

(යන) ඉදං, මෙය; තෙසං, ඔවුන්ට; යථාසංඛ්‍යං, පිළිවෙළින්; නිදස්සනං, නිදර්ශනයි; ඒ ජාත්‍යාදීන්ගේ ද්‍රව්‍යාපෙක්ෂාවෙහිලා 'පරිසමන්තතො' යනාදීන් අතිකුඩු නයක් දක්වුහ.

270. පරිසමන්තතො, සකලාර්ථවශයෙන්; සෙසො, ශෙෂවූයේ (යම් නයෙක්ද) සො නයො, ඒ නයතෙම; පාරිසෙසො ඉති, පාරිශෙෂ්‍යනයයයි දතයුතු; තං යථා, ඒ මෙසේයි, අයං අකාරො, මේ අකාරය තෙම; ඉධ, මේ අකුශලධර්මාධිකාරයෙහි; විරුද්ධො, විරුද්ධාර්ථඇත්තේයයි; නිච්ඡිතො, නිශ්චය කරණලදී.

ඉක්බිති 'ච' ශබ්දයාගේ ලක්ෂණ දක්වත්.

271 උපඤ්ඤාසො, උපන්‍යාසය ද; සමුච්චයො ච, සමුච්චයද්දයි කියා; චසද්දත්ථො, චශබ්දයාගේ අර්ථය; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නාලද්දේය; උපඤ්ඤාසො නාම, උපන්‍යාසය නම්; වාක්‍යාරම්භො, වාක්‍යාරම්භයයි; විඤ්ඤුනා, පැනැත්තහු විසින්; වුච්චති, කියනුලැබේ.

272. පච්චක්ඛ, ප්‍රත්‍යක්ෂසිද්ධිය ද; ඔකප්පනසිද්ධි, ඔකප්පනසිද්ධිය ද; අනුමානසිද්ධිවසා, අනුමානසිද්ධිද යන මොවුන්ගේ වශයෙන්; අත්ථො, අර්ථයතෙම; තිධා, තුන්පරිද්දෙකින්; භවති ඉති, වේයයි; අත්ථඤ්ඤූහි, අර්ථ දත්තවුන් විසින්; පකාසිතො, ප්‍රකාශකරණලදී.

273. තත්ථ, ඔවුන්අතුරෙන්; රූපාදිධම්මානං, රූපාදිධර්මයන්ගේ; සභාවලක්ඛණං පන, ස්වභාවයවූ ලක්ෂණය වනාහි; පච්චත්තං එව, තම තමන් කෙරෙහිම; ජානතො, දන්නාහෙයින්; පච්චක්ඛසිද්ධි, ප්‍රත්‍යක්ෂසිද්ධියයි; විඤ්ඤෙය්‍යං, දතයුතු.

274. සද්දාදීනං, ශබ්දාදීන්ගේ; අනිච්චතාදිආකාරො, අනිච්චතාදි ආකාරය; අනුමානතො, අනුමානවශයෙන්; විඤ්ඤෙය්‍යත්තා ච, දන්නා බැවින් ද;

275. සගගතිබ්බාණධම්මාදි ඔකප්පනසිද්ධිවහයා
පච්චත්තං බහුජනස්ස පස්සිතුං නුපලබ්භතො.

ඉති සද්දසාරත්ථජාලිනියා අත්ථසාරපකිණ්ණකකණ්ඩො.
දුතියො.

---

276. අට්ඨට්ඨානානි වණ්ණානං කණ්ඨො සිරො උරොපිච
ජිව්හාමූලඤ්ච දන්තා ච නාසිකොට්ඨො ච තාලු ච.

277. අ ආ එ ඔ කවග්ගො ච හකාරො කණ්ඨජා මතා
ටවග්ගො රළකාරා ච සත්ත සිරසි ජායරෙ.

278. ඉ ඊ ය එ චවග්ගො ච තාලුම්හි නව ජායරෙ
උ ඌ ඔ වා පවග්ගො ච නව ඔට්ඨම්හි ජායරෙ.

---

විඤ්ඤූනා, නුවණැත්තහු විසින්; අනුමානො ඉති, අනුමානයයි; විඤ්ඤෙය්‍යො, දතයුතු.

275. සගගනිබ්බාණධම්මාදී; ස්වර්ගය හා නිර්වාණධර්මාදීහු; බහුජනස්ස, බොහෝදෙනාට; පච්චත්තං, තම තමන්කෙරෙහි; පස්සිතුං, දක්නට; නුපලබ්භතො, නොලැබෙනහෙයින්; ඔකප්පනසිද්ධිවහයා, ශ්‍රද්ධාවෙන් ඇදහියයුතු සිද්ධිඇත්තෝ නම් වෙත්.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනී නම් ප්‍රකරණයෙහි; දුතියො, දෙවනවූ; අත්ථසාරපකිණ්ණකකණ්ඩො, අර්ථසාරප්‍රකීර්ණකකාණ්ඩය; ඉති, මෙසේ සමාප්තයි.

—:o:—

276. වණ්ණානං, වර්ණයන්ගේ; ඨානානි, (උත්පත්ති) ස්ථානයෝ, කණ්ඨො, ගෙල ද; සිරො, ශිරසද; උරො අපි ච, ලය ද; ජිව්හා මූලඤ්ච, දිවමුල ද; දන්තා ච, දත් ද; නාසිකා, නැහැය ද; ඔට්ඨො ච, ඔෂ්ඨය ද; තාලු ච, තල්ලදැයි කියා; අඨ, අටදෙනෙකි.

මෙසේ ස්ථානස්වරූප දක්වා ඒ ඒ ස්ථානයන්හි නිශ්‍රිතවර්ණ දක්වනු සඳහා 'අආ' යනාදිය ආරබ්ධයි.

277. අ ආ, අකාර ආකාරදෙකද; එ ඔ, එකාරඔකාරදෙකද; කවග්ගො, කවර්ගයද; හකාරො, හකාරයද යනමොහු; කණ්ඨජා, කණ්ඨයෙහි උපදනෝයයි; මතා, දන්නාලදහ; ටවග්ගො, ටවර්ගයද; රළකාරා ච, රකාර ළකාරයෝද; (යන) සත්ත, සත; සිරසි, ශීර්ෂයෙහි; ජායරෙ, උපදිත්.

278. ඉ ඊ, ඉකාරය ද ඊකාරය ද; ය, යකාරය ද; එ, එකාරයද, චවග්ගො ච, චවර්ගය ද; (යන) නව, නවය; තාලුම්හි, තල්ලෙහි; ජායරෙ, උපදිත්;

279. තවග්ගො ලසවා අට්ඨ වණ්ණා දන්තජා ජායරෙ
නාසිකා ඞඤණනමා අංවණ්ණා චාපි අනන්තිමො.

280. උරසම්භාපි හකාරො එකාරොයෙව දීපිතො
සබ්බෙ වණ්ණා ච ජිව්හට්ඨා ජිව්හාමූලෙසු ජායරෙ.

281. චතුබ්බිධන්ති කරණං ඵුට්ඨත්තං ඊසං ඵුට්ඨත්තං
සංවුතං විවටඤ්චාති කරණඤ්ඤූහි භාසිතං.

282. තංයථා පඤ්චවීසති වග්ගා ඵුට්ඨත්තමීරිතා
ඊසං ඵුට්ඨත්තං යරලවා සංවුතන්ති රස්සං මතං.

283. විවටඤ්ච යථා සබ්බෙ දීඝා දුතියා චතුත්ථාපි ච
වග්ගා තෙසං ඉමෙ භෙදා වෙදිතබ්බා විභාවිනා.

---

උ ඌ, උකාර ඌකාරදෙකද; ඔවා, ඔකාරවකාරදෙක ද; පවග්ගා ච, පවර්ගය ද; (යන) නව, (අක්ෂර) නවය; ඔට්ඨම්හි, ඔෂ්ඨයෙහි; ජායරෙ, උපදිත්.

279. තවග්ගො, තවර්ගය ද; ලසවා, ලකාරසකාරවකාරයෝ ද (යන,) වණ්ණා අට්ඨ, වර්ණයෝ අටදෙන; දන්තජා, දත්හි; ජායරෙ, උපදිත්; ඞඤණනමා, ඞඤණනම යන අක්ෂරයෝ ද; අනන්තිමො, අනන්තිමාක්ෂරයවූ; අංවණ්ණා ච; අංවර්ණයද; යනමොහු; නාසිකා, නැහැයද උත්පත්ති ස්ථානකොට ඇත්තෝය.

280. හකාරො, හකාරය ද; එකාරො එව, එකාරය ද; උරසම්භ ච අපි, ලයෙහිද උපදනේයයි; දීපිතො, දක්වනලද්දේය හෙවත් ප්‍රකාශකරණ ලද්දේය; ජිව්හට්ඨා, දිවලත්පත්තිස්ථානකොට ඇති; සබ්බෙ වණ්ණා ච, සියලුවර්ණයෝ ද; ජිව්හාමූලෙසු, දිවමුල; ජායරෙ, උපදිත්. තදනන්තරව කරණප්‍රභෙද දක්වත්

281. කරණං, කරණය තෙම; ඵුට්ඨත්තං, (සම්පූර්ණයෙන්) ස්පර්ශකරණ ලදබවය; ඊසංඵුට්ඨත්තං, මදක් ස්පර්ශ කරණලදබවය; සංවුතං, සංවෘතය හෙවත් හකුළුවා කියනලද්දය; විවටඤ්ච ඉති, විවෘතයද හෙවත් මුඛයවිවෘතකොට කියනලද්දදයි කියා; චතුබ්බිධං ඉති, සිව්වැදෑරුම්යයි; කරණඤ්ඤූහි, කරණය දන්නවුන් විසින්; භාසිතං කියනලදී; (කරණයනම් අක්ෂරොච්චාරණයට උපකාරීවන තැනි.

282. තංයථා, ඒමෙසේයි; වග්ගාපඤ්චවීසති, වර්ගාක්ෂරපස්විස්ස; ඵුට්ඨත්තං, ස්පෘෂ්ටත්වයයි; ඊරිතා, කියනලදී; යරලවා, යරලව යන අන්තඃස්ථාක්ෂරයෝ; ඊසං ඵුට්ඨත්තං ඊසත්ස්පෘෂ්ටත්වයයි; (කියනලදහ) රස්සං හ්‍රස්වස්වරය; සංවුතං ඉති, සංවෘතයයි; මතං, දන්නාලදී.

28 . සබ්බෙ දීඝා, සියලු දීර්ඝස්වරයෝ ද; දුතියා චතුත්ථා වග්ගා අපිච, දෙවන සතරවන වර්ගාක්ෂරයෝද; විවටඤ්ච, විවෘතයයි දන්නාලදහ; තෙ

284. බ්‍යඤ්ජනෙසු ච සබ්බෙසු තෙ වග්ගා පඤ්චවීසති
ඝොසවන්තෙකවීසා ච අඝොසෙකාදසා මතා.

285. යෙ ච අඩ්ඪ සරා හොන්ති තෙත්තිංසබ්‍යඤ්ජනා මතා
බ්‍යඤ්ජනානං සරානන්තු බින්දුසාධාරණං මතං.

286. ආගමො ලොපාදෙසා ච විකාරොපකතීපි ච
දීඝරස්සවසෙනාපි සන්ධි සත්තවිධා මතා.

287. තයො තයො තයො ද්වෙ ද්වෙ ද්වෙ ද්වෙ ද්වෙව යථාක්කමං
තුතවීසති විත්ථාරා විඤ්ඤෙය්‍යාතබ්බා විනිච්ඡයො.

---

සං, ඔවුන්ගේ; ඉමෙ භෙද්‍ා, මේ භෙදයෝ; විභාවිනා, පණ්ඩිතයා විසින්; වෙදිතබ්බා, දතයුත්තාහ.

මෙසේ ස්ථානකරණාදිය දක්වා වර්ගාදිප්‍රභෙද දක්වනු පිණිස

‘බ්‍යඤ්ජනෙසු’ යනාදිය ආරබ්ධයි,

284. සබ්බෙසු ව්‍යඤ්ජනෙසු ච, සියලු ව්‍යඤ්ජනයන් අතුරෙන්; තෙ වග්ගා, පඤ්චවීසති, ඒවර්ගාක්ෂර පස්විස්සද; ඝොසවන්තෙකවීසාච, ඝොෂවත් අක්ෂර එක්විස්සද; අඝොසෙකාදසා, අඝොෂාක්ෂර එකොළසද මතා, දන්නා ලද්දාහුය;

285. යෙ ච, යම්බඳුවූ; අඩ්ඪසරා හොන්ති, ස්වරඅඩෙක් වෙත්ද; තෙත්තිංසබ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනතෙතිසෙක් වෙත්ද; (ඔහු) මතා, දන්නාලදහ; බ්‍යඤ්ජනානං සරානංච, බ්‍යඤ්ජනයන්ට හා ස්වරයන්ට ද; බින්දු, බින්දුව; සාධාරණං, සාධාරණයයි; මතං, දන්නාලදී.

මෙතෙකින් සංඥාවිධි දක්වා දූන්සන්ධිවිධි දක්වන්නෝ ‘ආගමො’ යනාදිය ආරම්භකළෝ.

286. ආගමො, ආගමසන්ධියද; ලොපාදෙසා ච, ලොපසන්ධි ආදෙශසන්ධිහුද; විකාරො, විකෘති සන්ධියද; පකති අපිච, ප්‍රකෘතිසන්ධියද; දීඝරස්සවසෙන අපි, දීර්ඝසන්ධිය හ්‍රස්වසන්ධිය යන මොවුන්ගේ වශයෙන්ද; සන්ධි, සන්ධිතුමු; සත්තවිධා, සත්වැදෑරුම්යයි; මතා; දන්නාලදහ.

දූන් ඒ සන්ධිභෙද දක්වත්.

287. තයො, (ආගමසන්ධි) තුණද; තයො, (ලොපසන්ධි) තුණද; තයො, (ආදෙශසන්ධි) තුණද; ද්වෙ, (විකෘතිසන්ධි) දෙකද; ද්වෙ, (ප්‍රකෘතිසන්ධි) දෙකද; ද්වෙ, (දීර්ඝසන්ධි) දෙකද; ද්වෙව එව, (හ්‍රස්වසන්ධි) දෙකදූයි කියා; තිළිනවිසති, සතලොසෙක් වෙත්; යථාක්කමං, පිළිවෙළින්; විත්ථාරා, විස්තරහෙයින්; විනිච්ඡයො, විනිශ්චය; විඤ්ඤාතබ්බා, (මෙසේ) දතයුතු.

288. සරාගමො බ්‍යඤ්ජනො ච නිග්ගහීතාගමො තථා
'ලොපඤ්ච තත්‍රාකාරො' සුත්තෙන අකාරාගමො.

289. වසද්දෙන සත්ත සරා සෙසා ගච්ඡන්ති ආගමා
එවං සරාගමො ඤෙය්‍යො පණ්ඩිතෙන විභාවිනා.

290. "යවමද" දි සුත්තෙන අට්ඨබ්‍යඤ්ජන ආගමා
වසද්දෙන පන සෙසා චතුවීසති බ්‍යඤ්ජනා.

291. "නිග්ගහීතඤ්ච" ති සුත්තෙන නිග්ගහීතාගමො මතො
එවං නිග්ගහීතාගමො පණ්ඩිතෙන සුධීමතා.

292. සරලොපො බ්‍යඤ්ජනො ච නිග්ගහීතවසා තිධා
සරලොපො ද්විධා තත්‍ථ පුබ්බපරවසා මතො.

---

288. සරාගමො, (අෂ්ටවිධ) ස්වරයන්ගේ ආගමය ද; බ්‍යඤ්ජනො ච, (දෙතිස්) ව්‍යඤ්ජනාගමය ද; තථා, එසේම; නිග්ගහීතාගමො, නිග්ගහීතාගමයදැයි කියා ත්‍රිවිධයි; ලොපඤ්ච තත්‍රාකාරො, 'ලොපඤ්ච තත්‍රාකාරො' යන; සුත්තෙන, සූත්‍රයෙන්; අකාරාගමො, අකාරාගමය කටයුතු.

289. වසද්දෙන, වශබ්දයෙන්; සෙසා සත්ත සරා, අවශෙෂ ස්වරසත ආගමවෙති; ආගච්ඡන්ති, එත්නුයි; ආගමා, ආගම නම්හුයි; විභාවිනා, ප්‍රාඥවූ; පණ්ඩිතෙන, පණ්ඩිතයා විසින්; එවං, මෙසේ; සරාගමො, ස්වරාගමය; ඤෙය්‍යො, දතයුතු.

290. යවමදදිසුත්තෙන, 'යවමද' ආදී සූත්‍රයෙන්; බ්‍යඤ්ජනා අට්ඨ, ව්‍යඤ්ජනයෝ අටදෙන; ආගමා හොන්ති, ආගම වෙත්; වසද්දෙන පන, (එම සූත්‍රයෙහි) වශබ්දයෙන්; සෙසා, අවශෙෂවූ; චතුවීසති බ්‍යඤ්ජනා, සූවිසි ව්‍යඤ්ජනයෝ; ආගමා, ආගම වෙත්; (මේ ගාථාවෙහි 'අට්ඨ බ්‍යඤ්ජනා' යි තිබියයුතුතැන ගාථාබන්ධවශයෙන් අට්ඨබ්‍යඤ්ජන' යී කියන ලදී.)

291. නිග්ගහීතඤ්ච ඉති, 'නිග්ගහීතඤ්ච' යන; සුත්තෙන, සූත්‍රයෙන්; නිග්ගහීතාගමො, නිග්ගහීතාගමය; මතො, දන්නාලදී; සුධීමතා, සුධීමත්වූ; පණ්ඩිතෙන, පණ්ඩිතයා විසින්; නිග්ගහීතාගමො, නිග්ගහීතාගමය; එවං, මෙසේ (දතයුතු.)

ඉක්බිති ලොපත්‍රයෙහි භෙදදීය දක්වත්.

292. සරලොපො, ස්වරලොපය ද; බ්‍යඤ්ජනො ච, ව්‍යඤ්ජනලොපය ද; නිග්ගහීතවසා, නිග්ගහීතලොපය ද යන මොවුන්ගේ වශයෙන්; තිධා, තුන් පරිද්දෙකින් වේ; තත්‍ථ, ඔවුන් අතුරෙන්; සරලොපො, ස්වරලොපයතෙම; පුබ්බාපරවසා, පූර්වාපරලොපයන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නාලද්දේය.

293. "සරා සරෙ" ති සුත්තෙන පුබ්බලොපො විධීයතෙ
"වාපරො" ති සුත්තෙන පරලොපො විධීයතෙ.

294. එකවචනසද්දෙන බ්‍යඤ්ජනලොපො විධීයතෙ
එවං සරබ්‍යඤ්ජනානං ලොපං ජානෙය්‍ය පණ්ඩිතො.

295. තංයථා කස්සිදං ධම්මං චන්දෙ'ව සොභතී ජිනො
බෙලා භගවා තෙසං යථාසඞ්ඛ්‍යං නිදස්සනං.

296. "ක්වචිලොපං" 'බ්‍යඤ්ජනෙච' ඉති සුත්තෙහි ලුප්පතෙ
"නිග්ගහීතඤ්ච" තෙසාහං අරියසච්චානදස්සනං.

297. සරාදෙසො බ්‍යඤ්ජනො ච නිග්ගහීතවසා තයො
ආදෙසා හොන්ති තෙසම්පි උදාහරණං දීපයෙ.

---

293. සරා සරෙ ඉති, 'සරා සරෙ ලොපං' යන; සුත්තෙන, සූත්‍රයෙන්; පුබ්බලොපො, පූර්ව ස්වර ලොපය; විධීයතෙ, කියනුලැබේ නොහොත් කරණු ලැබේ; වාපරො ඉති, වා පරො අසරූපා යන; සුත්තෙන, සූත්‍රයෙන්; පරලොපො, පර ස්වර ලොපය; විධීයතෙ, කියනුලැබේ.

294. එකවචනසද්දෙන, (ලොපො * යන) එකවචන ශබ්දය කරණකොටගෙණ; ව්‍යඤ්ජනලොපො, ව්‍යඤ්ජනයන්ගේ ලොපය; විධීයතෙ, කියනු ලැබේ; සරව්‍යඤ්ජනානං, ස්වර ව්‍යඤ්ජනයන්ගේ; ලොපං, ලොපය; පණ්ඩිතො, පණ්ඩිතයතෙම; එවං, මෙසේ; ජානෙය්‍ය, දන්නේය.

295. තං යථා, ඒ මෙසේයි; කස්සිදං ධම්මං, (කස්ස ඉදං ධම්මං) කස්සිදං ධම්මං යනුද; චන්දෙ'ව සොභති ජිනො, (චන්දෙ, ඉව සොභති ජිනො) චන්දෙ'ව සොභති ජිනො යනුද. බෙලා, බෙලා යනුද; භගවා, (භගගවා) භගවා යනුද; තෙසං, ඔවුන්ට; යථා සඞ්ඛ්‍යං, පිළිවෙළින්; නිදස්සනං, නිදර්ශනයි.

296. ක්වචි ලොපං බ්‍යඤ්ජනෙ ච ඉති, 'ක්වචි ලොපං' බ්‍යඤ්ජනෙ ච යන; සුත්තෙහි, සූත්‍රවයෙන්; නිග්ගහීතඤ්ච, නිග්ගහීතයද; ලුප්පතෙ, ලොප්කරණු ලැබේ; තෙසාහං, (තෙසං අහං) තෙසාහං යනුද; අරිය සච්චාන දස්සනං, (අරියසච්චානං දස්සනං) අරියසච්චාන දස්සනං යනුද; (පිළිවෙළින් උදාහරණයි.)

ඉක්බිති ආදෙශසන්ධි දක්වන්නෝ. "සරාදෙසො" යනාදිය කීහු.

297. සරාදෙසො, ස්වරාදෙශයද; බ්‍යඤ්ජනොච, බ්‍යඤ්ජනාදෙශයද; නිග්ගහීතවසා, නිග්ගහීතාදෙශයද යන මොවුන්ගේ වශයෙන්; තයො

---

* 'පරො' යන එකවචන ශබ්දය කරණකොටගෙණයයි ඇතම් ආචාර්‍ය්‍යයෝ කියත්.

298. යමෙවමොත්‍යාදිසුත්තෙහි සරාදෙසො විධීයතෙ
යථාමත්‍යායං බව්හාබාධො ඉදං තෙසං නිදස්සනං.

299. සබ්බාච්චාදිසුත්තෙහි බ්‍යඤ්ජනාදෙසො විධීයතෙ
යථා ඉච්චෙවතං කුසලං එකමිදාහං නිදස්සනං.

300. අංසරෙ වග්ගඑහෙඤ්ඤං සයෙ මදා සරෙහි පි
සුත්තෙහි නිග්ගහීතාදෙසො කාතබ්බො විඤ්ඤුනා සදා.

301. පුබ්බාදෙසො පරාදෙසො ආදෙසො ද්විවිධො පුන,
යමෙ වමො සබ්බාච්චං ඉවණ්ණොත්‍යාදි පුබ්බකො.

302. එවාදිස්ස රි පුබ්බො ච රස්සො'ති අපරො මතො
යථරිව තථරිව ඉදං තස්ස නිදස්සනං.

---

ආදෙසා, ආදෙශතුමණීක්; හොන්ති, වෙති; තෙසං අපි, ඒ ආදෙශයුණි ටම; උදාහරණං දීපයෙ, (පිළිවෙළින්) උදාහරණ දක්වන්නේය.

298. යමෙවමොත්‍යාදිසුත්තෙහි, 'යමෙදන්තස්සාදෙසො' 'වමො දුදන්තානං' යනමේ සූත්‍රයන්ගෙන්; සරාදෙසො, ස්වරයට ආදෙශය; විධීයතෙ, කියනු ලැබේ; යථා, ඒ මෙසේයි; මත්‍යායං බව්හාබාධො, (මෙ අයං, බහු ආබාධො) මත්‍යායං බව්හාබාධො යන; ඉදං, මේ; තෙසං, ඔවුන්ට; නිදස්සනං, නිදර්ශනයි.

299. සබ්බාච්චාදි සුත්තෙහි, සබ්බොචන්ති දොධස්සච යනමේ සූත්‍රයන්ගෙන්; බ්‍යඤ්ජනාදෙසො, බ්‍යඤ්ජනයට ආදෙශය; විධීයතෙ, කියනු ලැබේ; යථා, ඒ මෙසේයි; ඉච්චෙවතං කුසලං, (ඉති එතං කුසලං) ඉච්චෙවතං කුසලං යනුද; එකමිදාහං, (එකං ඉධ අහං) එකමිදාහං යනුද; නිදස්සනං, (යථාක්‍රමයෙන්) නිදර්ශනයි.

300. අංසරෙවග්ගඑහෙඤ්ඤංසයෙ මදාසරෙහිපි–අං, අං බ්‍යඤ්ජනෙ නිග්ගහීතංය; සරෙ, සරෙ වාය; වග්ග, වග්ග න්තං වා වග්ගෙය; එහෙඤ්ඤං, එහෙඤ්ඤංය; සයෙ, සයෙවාය; මදා සරෙහි පි සුත්තෙහි, මදා සරෙ යනමේ සූත්‍රයන්ගෙන්; නිග්ගහීතාදෙසො, නිග්ගහීතයට ආදෙශය; විඤ්ඤුනා, ප්‍රාඥයා විසින්; සදා, සැමකල්හි; කාතබ්බො, කටයුතුයි.

යලිත් ආදෙශය දෙපරිද්දෙකින් දක්වත්.

301. පුබ්බාදෙසො, පූර්වාදෙශය; පරාදෙසො, පරාදෙශයයි; පුන, නැවත, ආදෙසො, ආදෙශයතෙම; ද්විවිධො, ද්විවිධයි; යමෙ, යමෙදන්තස්සාදෙසො යන සූත්‍රයද; වමො, වමොදුදන්තානං යන සූත්‍රයද; සබ්බාච්චං, සබ්බොචන්ති යන සූත්‍රයද; ඉවණ්ණො ඉති ආදි, ඉවණ්ණො යනාදි සූත්‍රයද නොහොත් ඉවණ්ණො යකාරංවා යන සූත්‍රයද; පුබ්බකො, පූර්වාදෙශ (සූත්‍ර) යි.

302. එවාදිස්ස රි පුබ්බො ච රස්සො ඉති, එවාදිස්ස රි පුබ්බො ච රස්සො යන සූත්‍රයෙන්; අපරො, අපරාදෙශය; මතො, දන්නාලද්දේය; යථරිව,

303. පුබ්බවිකාරො අපරො විකාරො දුවිධො මතො
'ක්වචා'ච්චාදි සුත්තෙන විකාරො අපරො මතො.

304. තථෙව ලුත්තසද්දෙන් හොති පුබ්බවිකාරකො
මහොදකං මුනෙලයො යථාසඞ්ඛ්‍යං නිදස්සනං.

305. සරා පකතිකාචෙව බ්‍යඤ්ජනපකතීති ච
දුවෙ පකතිකා වුත්තා කච්චායනෙන සුධීමතා.

306. "සරෙ ක්වචී" ති වුත්තෙන සරා පකතිකා මතා
"සරා" දිනා තු සුත්තෙන බ්‍යඤ්ජනපකතී මතා.

307. අයං සො පකතිසන්ධි මෙ සුත්තෙන පටිබාහති
"සරා සරෙ ලොපං" මිදං "වා පරො අසරූප" කා.

---

තථරිව, (යථා එව තථා එව) යථරිව තථරිව යන; ඉදං, මේ; තස්ස, ඒ අපරා දෙශයට; නිදස්සනං, නිදර්ශනයි.

'මෙ විකාරා' යි කියනලදහෙයින් ඒ සම්බන්ධ ප්‍රභෙද දක්වන්නෝ 'පුබ්බ විකාරො' යනාදිය කීහු.

303. පුබ්බවිකාරො, පූර්වස්වරයාගේ විකාරය; අපරො, අපරස්වරයාගේ විකාරයයි; විකාරො, විකාරයතෙම; දුවිධො, දෙයාකාරයයි; මතො, දන්නා ලද්දේය; ක්වචි ඉති ආදි සුත්තෙන, ක්වචි යනාදි සූත්‍රයෙන්; අපරො විකාරො, අපර විකාරයතෙම; මතො, දන්නාලද්දේය.

304. තථා එව, ඒ 'ක්වචාසවණ්ණං ලුත්තෙ' යන සූත්‍රයෙහිම; ලුත්ත සද්දෙන, ලුත්ත ශබ්ද (ග්‍රහණ) යෙන්; පුබ්බවිකාරකො, පූර්විකාරයතෙම; හොති, වේ; මහොදකං මුනෙලයො, (මහා උදකං මුනි ආලයො) මහො දකං මුනෙලයො යනු; යථාසඞ්ඛ්‍යං, (අපර විකාර පූර්විකාරදෙකට) පිළි වෙළින්; නිදස්සනං, නිදර්ශනයි.

දැන් ප්‍රකෘතිමය දක්වත්.

305. සරාපකතිකාච එව, ස්වරප්‍රකෘතිසන්ධිද; බ්‍යඤ්ජනපකති ඉතිච, ව්‍යඤ්ජන යාපරකලවන ප්‍රකෘතිසන්ධියයි කියා; වෙ පකතිකා, ප්‍රකෘතීනු දෙදේනෙක්; සුධීමතා, සුධීමත්වූ; කච්චායනෙන, කාත්‍යායනාචාර්‍ය්‍යයන් විසින්; වුත්තා, කියනලදහ.

306. සරෙ ක්වචි ඉති, 'සරෙ ක්වචි' යන; සුත්තෙන, සූත්‍රයෙන්; සරා, ස්වරයෝ; පකතිකා, ප්‍රකෘතිමත් වෙත්යයි; මතා, දන්නාලදහ; සරාදිනා තු සුත්තෙන, 'සරා පකති බ්‍යඤ්ජනෙ' යන සූත්‍රයෙන්; බ්‍යඤ්ජනෙ, ව්‍යඤ්ජනයා පරකල්හි; පකතී, ස්වරප්‍රකෘතීහු; මතා, දන්නාලදහ.

307. අයං සො පකතිසන්ධි, ඒ මේ ප්‍රකෘතිසන්ධිතෙම; සරා සරෙ ලොපං, 'සරා සරෙ ලොපං' ය; වා පරො අසරූපකා, 'වා පරො අසරූපා' ය යන; ඉදං, මේ; මෙ සුත්තෙ, සූත්‍රවය; පටිබාහති, වළකයි.

308. පුබ්බදිසො අපරො ච දිසොතු ද්විධෙරිතො
"පුබ්බො වා" ති තු සුත්තෙන පුබ්බදිසොළුදීරිතො.

309. "දිසං වා" ති සුත්තෙන පරදිසොළුදීරිතො
උදාහරණමෙතෙසං පාකටං සන්ධිගන්ථකෙ.

310. සනිද්දෙසො චානිද්දෙසො රස්සො තු ද්විධො භවෙ
"එවා" දි "පා" දිසුත්තෙහි සනිද්දෙසො විධීයතෙ.

311. "භොවාදිනාම සො හොති යථාභාවිගුණෙන සො"
පගෙව වුත්තස්ස එවං සනිද්දෙසොති වුච්චති

312. 'ලහුමත්තා තයො රස්සා' සුත්තෙන අනිද්දෙසකො
රස්සො විධීයතෙ රස්සභෙදං ජානෙය්‍ය පණ්ඩිතො.

ඉති සද්දසාරත්ථජාලිනියා සන්ධිකණ්ඩො තතියො.

———:o:———

---

මාතෘකාවෙහි "වෙ දිසා" යි කීහෙයින් දැන් එහි විස්තර කියත්.

308. දිසොතු, දිශීයවනාහි; පුබ්බදිසො, පූර්වදිශීයද; අපරො ච, අපර දිශී යදයි කියා; ද්විධො, දෙයාකාරයයි; ඊරිතො, කියනලදී; පුබ්බෙවාච ඉති සුත්තෙන තු, 'පුබ්බො ච' යන සූත්‍රයෙන්; පුබ්බදිසො, පූර්වදිශීය; උදීරිතො, කියනලදී.

309. දිසං ච ඉති සුත්තෙන තු, 'දිසං ච' යන සූත්‍රයෙන්වනාහි; පරදිසො, පරදිශීය; උදීරිතො, කියනලදී; එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; සන්ධිගන්ථකෙ, සන්ධි ප්‍රකරණයෙහි; පාකටං, ප්‍රකටයි.

ඉක්බිති හ්‍රස්වවය දක්වත්.

310. රස්සොතු, හ්‍රස්වයවනාහි; සනිද්දෙසො ච, නිර්දෙශ සහිතයද; අනිද්දෙසො ච, නිර්දෙශ රහිතය දැයි කියා; ද්විධො, දෙයාකාරවේ; එවාදිපාදි සුත්තෙහි, "එවාදිස්ස රි පුබ්බො ච රස්සො" 'පාදස්ස වාසෙනො රස්සො' යන මේ සූත්‍රයන්ගෙන්; සනිද්දෙසො, නිර්දෙශ සහිත හ්‍රස්වය; විධීයතෙ, කරණුලැබේ.

311. භොවාදි නාම සො හොති, (භොවාදි නාම සො හොති) භොවාදි නාම සො හොති යනුද; යථාභාවිගුණෙන සො, (යථාභාවිගුණෙන සො) යථාභාවිගුණෙන සො යනුද; පගෙව වුත්තස්ස, (පා එව වුත්ති අස්ස) පගෙව වුත්තස්ස යනුද; සනිද්දෙසොති, නිර්දෙශ සහිත හ්‍රස්වයයි (හෙවත්) උදාහරණ සහිත හ්‍රස්වයයි; එවං, මෙසේ; වුච්චති, කියනුලැබේ.

312. ලහුමත්තා තයො රස්සා සුත්තෙන, 'ලහුමත්තා තයො රස්සා' යන සූත්‍රයෙන්; අනිද්දෙසකො, නිර්දෙශ රහිතවූ; රස්සා, හ්‍රස්වය; විධීයතෙ, කියනුලැබේ; පණ්ඩිතො, පණ්ඩිතතෙමේ; රස්සභෙදං, හ්‍රස්වභෙදය; ජානෙය්‍ය, (මෙසේ) දන්නේය.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනී නම් ප්‍රකරණයෙහි; සන්ධිකණ්ඩො, සන්ධිකාණ්ඩනම්වූ; තතියො, තුන්වෙනිකාණ්ඩය; ඉති, මෙතෙකින් සමාප්තයි.

**313.** සුත්තවිධී ච සඞ්ඛ්‍යා ච සබ්බනාමඤ්ච නාමිකං
උපපත්තීති ඡධා නාමං පණ්ඩිතෙහි විජානියං.

**314.** සුත්තෙන ඡබ්බිධං නාමං විධිනා තු චතුබ්බිධං
ද්විධා ද්විධා තිධා තිධා සඞ්ඛ්‍යාදීනං වසෙන ච.

**315.** උපසග්ගා පවාදෙ ච සඤ්ඤා ච කාරකම්පි ච.
පරිභාසාධිකාරො ච නාමං ඡබ්බිධමීරිතං.

**316.** උපසග්ගො ගච්ඡමානො යථා අස්ස බලු ගතො
අභිනිප්පජ්ජතෙ කිච්චං අපවාදෙ න බාධති.

---

මෙතෙකින් සන්ධිසාරය දක්වා ඉක්බිති නාමසාරය දක්වන්නෝ 'සුත්ත විධී ච, යනාදිය ආරම්භකළෝ.

**313.** සුත්තවිධී ච, සූත්‍රනාමය හා විධිනාමය ද; සඞ්ඛ්‍යා ච, සඞ්ඛ්‍යා නාමය ද; සබ්බනාමඤ්ච, *සර්වනාමය ද; නාමිකං, නාම නාමය ද; උපපත්ති ඉති, උපපත්තිනාමයදැයි කියා; නාමං, නාමය, ඡධා, සපරිදියයි; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විජානියං, දතයුතු.

**314.** සුත්තෙන, සූත්‍රනාමවශයෙන්; නාමං, නාමය; ඡබ්බිධං, සවැදෑරුම්; විධිනා තු, විධිවශයෙන් වූකලී; චතුබ්බිධං, නාමය සිව්වැදෑරුම්; සඞ්ඛ්‍යාදීනං, සඞ්ඛ්‍යානාමාදීන්ගේ; වසෙනච, වශයෙන්ද මෙසේදතයුතු; ද්විධා,(සඞ්ඛ්‍යා නාමය) දෙවැදෑරුම්; ද්විධා, (සර්වනාමය) දෙවැදෑරුම්; තිධා, (නාමනාමය) තුන්වැදෑරුම්; තිධා, (උපපත්තිනාමය) තුන්වැදෑරුම්.

ඊට අනතුරුව ෂට්විධ ස්වරූප දක්වත්.

**315.** උපසග්ගා, උපසර්ගය ද; අපවාදෙ ච, අපවාදය ද; සඤ්ඤාච, සංඥාව ද; කාරකං අපි ච, කාරකය ද; පරිභාස, පරිභාෂාව ද; අධිකාරො ච, අධිකාරයදැයි කියා; නාමං, නාමය; ඡබ්බිධං, ෂට්විධයයි; ඊරිතං, කියන ලදී.

ඉක්බිති ඔවුන්ගේ ලක්ෂණ කියත්.

**316.** ගතො, යන්නාවූ; අස්සො බලූ, අශ්වතෙම වනාහී; යථා, යම්සේ; කිච්චං, (තමාගේ) කටයුත්ත; අභිනිප්පජ්ජතෙ, නිපදවාද; (එසේම) උපසග්ගො, උපසර්ගයතෙම; ගච්ඡමානො එව, සූත්‍රයට පැමිණෙන්නේම (තමාගේ කෘත්‍යය නිපදවයි) අපවාදෙ, අපවාදයතෙම; න බාධති, ප්‍රතිෂෙධ නොකෙරෙයි.

317. යං කිඤ්චි සාධනං වුත්තං හිංසති හිය්‍යයිපි ච
විවාදං පවිදංසෙති අපවාදං විධීයතෙ.

318. සඤ්ඤාසුත්තම්පි ගනත්වාන එකමෙව න ගච්ඡති
සඤ්ඤිතබ්බං ගහෙත්වාන කාරකං අනුගච්ඡති.

319. යං කරොති ච තං කිච්චං සාධනං නාතිවත්තති
තෙන කාරකභාවෙන කාරකන්ති පවුච්චති.

320. යං කිඤ්චි වචනං සුත්වා තං පුනදෙව භාසති
පුනප්පුනං කථාභාසා පරිභාසා විධීයතෙ.

321. භාසති ජොතතීචෙව යථාදීපො පභාසිතො
පවිධංසෙති තං භණ්ඩං ගෙහෙසු ච පතිට්ඨිතං.

322. අධිකිච්චං අධිට්ඨානං අධිසෙට්ඨම්පි ගච්ඡති
ජෙට්ඨසෙට්ඨකභාවෙන අධිකාරො විධීයතෙ.

---

317. යං කිඤ්චි සාධනං, යම් කිසි ප්‍රයොගයෙක්; හිංසති, නසාද; හීයති, පිරිහේද: අපිච, යලිදු; විවාදං, විරුඬ වාදය; පවිදංසෙති, ප්‍රකාශකෙරේ යයි; වුත්තං, කියනලද්දේද; (එහෙයින්) අපවාදං, අපවාද (නම් යොග) යයි; විධීයතෙ, කියනුලැබේ.

318. සඤ්ඤාසුත්තං අපි, සංඥාසූත්‍රයට ද; ගනත්වාන, පැමිණ; එකං එව, හුදකලාවම; න ගච්ඡති, නොපවතී ද; සඤ්ඤිතබ්බං, සංඥාකටයුත්ත (හෙවත්) ලක්ෂ්‍යකටයුත්ත; ගහෙත්වාන, ගෙණ; කාරකං, කාරකසූත්‍රයට; අනුගච්ඡති, අනුවයේද.

319. යං ච, යමකුත්; කරොති, කෙරේද; තං කිච්චං, ඒ කෘත්‍යය; නාතිවත්තති, නො ඉක්මවා ද; තෙන කාරකභාවෙන, ඒ කාරකභාවයෙන්; කාරකං ඉති, කාරකයයි; පවුච්චති, කියනුලැබේ.

320. යං කිඤ්චි වචනං, කිසියම් වචනයක්; සුත්වා, අසා; පුන එව, නැවතත්, තං, එය; භාසති, කියාද; පුනප්පුනං, නැවත නැවත; කථා, කියනලද; භාසා, භාෂාතොමෝ; පරිභාසා, පරිභාෂායයි; විධීයතෙ, කියනුලැබේ.

321. පභාසිතො, ප්‍රකෂීයෙන් දිලෙන; පදීපො, ප්‍රදීපයතෙම; ගෙහෙසු, ගෘහයෙහි; පතිට්ඨිතං, පිහිටියාවූ; තං භණ්ඩං ච, ඒ භාණ්ඩද; පවිධංසෙයි, ප්‍රකාශකෙරේ ද; භාසති, කියාද; ජොතතිචෙව, බබුලුවාද මේ යොගයද එසේයි.

322 (එසේම) අධිකිච්චං, අධිකෘත්‍යයට ද; අධිට්ඨානං, අධිකස්ථානයට ද; අධිසෙට්ඨං අපි, අධිකශ්‍රෙෂ්ඨස්ථානයට ද, ගච්ඡති, ගේනුයි; ජෙඨසෙඨකභා

323. උපසග්ගා ති "සාගමො සෙ" ත්‍යාදි සුත්තමීරිතං
අපවාදෙ තිව "තතො සස්ස ස්සායා" දිකං මතං.

324. තත්‍ථ සඤ්ඤා ද්විධා හොති මූලාමූලවසෙන ච
ගසඤ්ඤා මූලසඤ්ඤා ච ඛලපාඝො අමූලකා.

325. අත්ථස්ස දිත්තකාලෙ තු ජීවසෙන නාමතො
තෙනෙව විපරියසඤ්ඤා, හොති සඤ්ඤා අමූලකා.

326. සඤ්ඤාකාරකසුත්තන්ති "ලිඞ්ගඤ්ච නිපච්චතෙ" ඉදං
එකසුත්තං ද්විකිච්චං ච හොතීති සමුදීරිතං.

327. තිවිධං කාරකසුත්තං විධි විභත්ති කාරකං
'ලිඞ්ගත්ථෙ පඨමා' සුත්තං විධිකාරක නාමකං.

---

වෙත, ජ්‍යෙෂ්ඨශ්‍රෙෂ්ඨභාවය කරණකොටගෙණ (හෙවත්) සියලුම සූත්‍ර යත්ට වඩාඋතුම්වනබැවින්; අධිකාරො, අධිකාරයයි; විධීයතෙ, කියනුලැබේ.

ඉක්බිති තත්සාධක සූත්‍ර කියත්.

323. උපසග්ගා ඉති, උපසර්ගනම්; සාගමො සෙ ඉති ආදි සුත්තං. 'සාගමො සෙ, යනාදි සූත්‍රයයි, ඊරිතං, කියනලදී; අපවාදෙ ඉතිව, අපවාදනම්; තතො සස්ස ස්සාය ආදිකං, තතො සස්ස ස්සාය යනාදිසූත්‍රයයි; මතං, දන්නාලදී.

324. තත්‍ථ, ඒ සූත්‍රයන් අතුරෙන්; සඤ්ඤා, සංඥාතොමෝ; මූලාමූලව සෙන ච, මූලසංඥය අමූලසංඥය යනමොවුන්ගේ වශයෙන් ද; ද්විධා හොති, දෙපරිද්දෙකින් වේ; ගසඤ්ඤා, ගසංඥාතොමෝ; මූලසඤ්ඤා එව, මූලසංඥාමවේ; ඛලපාඝො, ඛසංඥ ලසංඥ පසංඥ ඝසංඥයෝ; අමූලකා, අමූලක සංඥයෝයි.

දූත් අමූලකසංඥයට කාරණා දක්වත්.

325. අත්ථස්ස දිතනකාලෙ තු, අර්ථය තමා දුත්කාලයෙහි වනාහි නො හොත් ඉසිනො භික්ඛුනො යනාදීන් උච්චාරණාවස්ථාවෙහි වනාහි; ජීවසෙන්, ෂෂ්ඨීවිභක්ත්‍යන්තවශයෙන්; නාමතො, නැමෙනහෙයින්; තෙන එව, ඒ නැමීම කරණකොටගෙණම; විපරියසඤ්ඤා, විපරීත සංඥාතොමෝ; අමූලකා සඤ්ඤා, අමූලක සංඥාතම් වේ.

326. ලිඞ්ගඤ්ච නිපච්චතෙ ඉදං, 'ලිඞ්ගඤ්ච නිපච්චතෙ' යන මේ සූත්‍රය, සඤ්ඤාකාරක සුත්තං ඉති, සංඥාකාරක සූත්‍රයයි (දක්කයුතු) එක සුත්තං; එකම සූත්‍රය; ද්විකිච්චං ච හොති ඉති, කටයුතුදෙකක් ඇත්තේවේයයි; සමුදීරිතං, කියනලදී.

දූත් කාරකසූත්‍රභෙද කියත්.

327. විධිවිභත්තිකාරකං, විධිකාරකසූත්‍රය විභත්තිකාරකසූත්‍රය කාරක සූත්‍රයයි; කාරක සුත්තං, කාරකසූත්‍රය; තිවිධං, ත්‍රිවිධ වේ; ලිඞ්ගත්ථෙ පඨමා සුත්තං, 'ලිඞ්ගත්ථෙ පඨමා' යනසූත්‍රය; විධිකාරකනාමකං, විධිකාරක යන නම් ඇත්තේය.

328. 'සියො'ත්‍යාදීනි සුත්තානි විභත්‍යධිකාරකං මතං
ඨපෙත්වා චෙව සුත්තානි සෙසා කාරකමීරිතං.

329. පරිභාසා දුවෙ වුත්තා පරිභාසූපරිච්චි
අඤ්ඤො අනන්තරසඤ්ඤාතො පරිභාසාති මීරිතා.

330. 'තදනුපරොධෙනා'දි උපරිභාසීති වුච්චති
පරිපුනප්පුනං භාසා උපරිභාසා පවුච්චති.

331. අධිකිච්චාභිසම්බුජ්ඣ මාරබ්භමුපදිස්සති
උපනීයති චාපෙක්ඛා අධිකාරා ඉමෙ මතා.

332. නදීසොතො මණ්ඩූකො ච ගජසීහවිලොකනා
තිලතණ්ඩුල සංසට්ඨ සෙනපාදෙධිකාරතො.

---

328. සියො ඉති ආදීනි, 'සියො' යනාදී සූත්‍ර; විභත්‍යධිකාරකං, විභක්ති කාරකයයි; මතං, දන්නාලදී; ච එව සුත්තානි' විධිකාරක විභක්තිකාරක සූත්‍රදෙකම; ඨපෙත්වා, හැර; සෙසා, සෙස්සෝ; කාරකං ඊරිතං, කාරක සූත්‍රයයි කියනලදී.

පරිභාෂාභෙද දක්වනුපිණිස 'පරිභාසා' යනාදිය ආරබ්ධයි.

329. පරිභාසා, පරිභාෂා සූත්‍රයෝ; පරිභාසා උපරිච්චි, පරිභාෂාසූත්‍රය උපරිභාෂාසූත්‍රයයි කියා; වෙ, දෙකක්; වුත්තා, කියනලද්දූහ; අඤ්ඤො අනන්තර සඤ්ඤාතො, 'අඤ්ඤො අනන්තරසඤ්ඤාතො' යනසූත්‍රය; පරිභාසා ඉති, පරිභාෂායයි; ඊරිතා, කියනලදී.

330. තදනුපරොධෙනාදි, 'තදනුපරොධෙන, යනාදි සූත්‍ර; උපරිභාසා ඉති, උපරිභාෂායයි; වුච්චති, කියනුලැබේ; උපරි, මත්තෙහි; පුනප්පුනං, නැවත නැවත; භාෂා, කීම; උපරිභාසා, උපරිභාෂායයි: පවුච්චති, කියනුලැබේ,

දැන් අධිකාරය දක්වත්.

331. අධිකිච්ච, සමක්අධිකකොට; අභිසම්බුජ්ඣ, මනාව අවබොධකොට; ආරබ්භ, ආරම්භකොට; උපදිස්සති, උපදෙශකරණු ලැබේද; අපෙක්ඛා, අපෙක්‍ෂමානව; උපනීයති, සමීපයට පමුණුවාද; ඉමෙ, මොහු; අධිකාරා, අධිකාරයෝයයි; මතා, දන්නාලදහ.

332. නදීසොතො, නදීශ්‍රොතසදෘශාධිකාරයද; මණ්ඩූකො ච, මණ්ඩූක ගතිසදෘශාධිකාරයද; ගජසීහවිලොකනා, ගජවිලොකනසදිසාධිකාරයහා සීහවිලොකන සදෘශාධිකාරයද; තිලතණ්ඩුලසංසට්ඨා, තිලතණ්ඩුල සංසඨ සදිසාධිකාරයද; සෙනපාදෙධිකාරතො, ගිජිලිහිණිපාද සදෘශාධිකාරයද යනමොවුන්ගේ වශයෙන් (අධිකාරය ෂඩ්විධයි)—තදනන්තරව 'කරොති' යනාදීන් ෂඩ්විධාධිකාරයෙහිලක්‍ෂණ දක්වූහ.

333. කරොති සකකිච්චානි පරකිච්චානි භාසති
සුත්තස්ස සඞ්ගහං කත්වා රාජා විය පකාසති.

334. පුබ්බවිධාපරවිධී අන්තරඞ්ගබහිපි ච
විධිභෙදං චතුධාති පකාසෙන්ති කවිස්සරා.

335. සුනංගිසු ච සුත්තෙන පුබ්බවිධී විධීයතෙ
පරවිධී යථා 'සුහිස්වකාරො ඒ'ති භාසතෙ.

336. පුරිසෙසූ'ති පයොගෙ සම්පත්තෙ විධිද්වයකෙ
පුබ්බතො අපරවිධි බලවා පරිභාසතො.

337. 'ලහුමත්තා තයො රස්සා, පුබ්බවිධීති වුච්චති
'දුමහිගරු' පරවිධි වත්වා පත්වාති ආදිකෙ.

---

333. රාජා, රජතෙම; පකාසති, (ස්වකීයවූද අන්‍යයන් පිළිබඳවූද කෘත්‍ය යන්) ප්‍රකාශකෙරෙයි; විය, එමෙන්; (මේ අධිකාරයද) සුත්තස්ස සඞ්ගහං කත්වා, සූත්‍ර තමා සඞ්ග්‍රහ කොට; සකකිච්චානි, ස්වකීයකෘත්‍යයන්ද; කරොති, කෙරෙයි; පරකිච්චානි, අන්‍යයන් පිළිබඳ කෘත්‍යයන්ද; භාසති, කියයි.

උක්තප්‍රකාර ෂට්විධාධිකාරය දක්වා ඉක්බිති විධිප්‍රභෙද දක්වනු.

334. පුබ්බවිධි, පූර්වවිධියද; අපරවිධි, අපරවිධියද; අන්තරඞ්ගබහිපි ච, අන්තරඞ්ගවිධිය බහිරඞ්ගවිධියදැයි කියා: චතුධා, සිව්පරිද්දෙකින්; විධි භෙදං, විධිභෙදය; කවිස්සරා, කවීශ්වරයෝ; පකාසෙන්ති; ප්‍රකාශකෙරෙත්– ඉක්බිති යථාක්‍රමයෙන් උදාහරණ දක්වනු.

335. 'සුනංගිසුව, සුත්තෙන, 'සුනංගිසුව' යන සූත්‍රයෙන්; පුබ්බවිධි, පූර්වවිධිය; විධීයතෙ, කියනුලැබේ; පරවිධි, අපරවිධිය; යථා, මෙසේයි; සුහිස්වකාරො ඒ ඉති, 'සුහිස්වකාරො ඒ, යනසූත්‍රයෙන්; භාසතෙ, කියයි.

336. පුරිසෙසු ඉති පයොගෙ, පුරිසෙසු යන ප්‍රයොගයෙහි; විධිද්වයකෙ සම්පත්තෙ, විධිද්වයක් පැමිණි සිටිකල්හි; පරිභාසතො, පරිභාෂාහෙයින්; පුබ්බතො, පූර්වවිධියට වඩා; අපරවිධි, අපරවිධිය; බලවා, බලවත් වන්නේය; (සුනංගිසු ච, 'සුහිස්වකාරො ඒ' යනසූත්‍රවයෙන් කාර්‍ය්‍යය එකවිට පැමිණිකල්හි 'සුහිස්වකාරො ඒ' යනසූත්‍ර පරිභාෂා හෙයින් පූර්වවිධියට වඩා අපරවිධිය බලවත්ව 'සුහිස්වකාරො ඒ' යන සූත්‍රයෙන් කියනලද කාර්‍ය්‍යය වේ යනු භාවයි.)

ලහුමත්තා යනාදීන් මෙයින් අන්‍යවිධි දෙකක් දක්වනු.

337. ලහුමත්තා තයො රස්සා, 'ලහුමත්තා තයො රස්සා, යනසූත්‍රය; පුබ්බ විධි ඉති, පූර්වවිධියයි; වුච්චති, කියනුලැබේ; දුමහිගරු, 'දුමහිගරු, යන

338. 'යස්මා' ත්‍යාදි සුත්තන්තං පුබ්බවිධීති වුච්චති
යං යෙන යො පරවිධි ඉති ඤෙය්‍යො පණ්ඩිතො.

339. ඛීරං දුහති ගොපාලො ඉච්චාදෙ'පායයොගතො
අපාදනෙපි සම්පත්තො බලවා හොති කම්මකං.

340. අඞ්ගංනාම සරීරඞ්ගං තම්හි ජාතනන්තරඞ්ගකං
සරීරෙ බහි ජාතන්තු බාහිරඞ්ගන්ති වුච්චති.

341. ධාතු වා පාටිපදිකං වා මතම්පනිධ විඤ්ඤුනා
අඞ්ගන්ති තම්හි ජාතංච අනන්තරඞ්ගන්ති වුච්චති.

---

සූත්‍රය; පරවිධි, අපරවිධියයි (කියනුලැබේ.) වත්වා පත්වා ඉති ආදිකෙ, වත්වා පත්වා යනාදි ප්‍රයොගයෙහි (අපරවිධිය දතයුතු.) තදනන්තරව අන්‍ය වූද විධිවයක් දක්වූහු.

338. යස්මා ඉති ආදිසුත්තන්තං, යස්මා යනමේ ආදිසූත්‍රය; (යස්මාදපෙති භයමාදත්තෙවා තදපාදානං, යනසූත්‍රය) පුබ්බවිධි ඉති, පූර්වවිධියයි; වුච්චති, කියනුලැබේ. යං, 'යං කරොති තං කම්මං' යන සූත්‍රයද; යෙන, 'යෙන වා කයිරතෙ තං කරණං' යනසූත්‍රයද; යො, 'යොධාරො තමොකාසං' යනසූත්‍රයද; පරවිධි ඉති, අපරවිධියයි; පණ්ඩිතො, පණ්ඩිතතෙම; ඤෙය්‍යො, දත්තේය.

339. ඛීරං දුහති ගොපාලො ඉති ආදෙ, 'ඛීරං දුහති ගොපාලො' යනාදි ප්‍රයොගයෙහි; අපාය යොගතො, අපාය යොගය හෙතු කොටගෙණ (හෙවත්) පහවීම්හුගේ යොගයෙන්; අපාදනෙ සම්පත්ත අපි, අපාදනය පැමිණිකල්හි ද; බලවා හොති, (අපරවිධිය) බලවත් වේ; (එහෙයින්) කම්මකං, කර්මයවේ.

ඉක්බිති 'අඞ්ගං, යනාදීන් අන්‍යවිධිදෙකක් දක්වූහ.

340. අඞ්ගංනාම, අඞ්ගයනම්; සරීරඞ්ගං, ශරීරාවයවයි; තම්හි, එහිතුල; ජාතං, උපන්නේ; අනන්තරඞ්ගං, අනන්තරඞ්ගයයි (කියනුලැබේ.) බහිසරීරෙ, පිටත ශරීරයෙහි නොහොත් ශරීරයෙන් පිටත; ජාතනාතු, උපන්නේම; බාහිරඞ්ගං ඉති, බාහිරඞ්ගයයි; වුච්චති, කියනු ලැබේ.

341. ඉධ පන, මේ අධිකාරයෙහි වනාහි; ධාතුවා, ධාතුව හෝ; පාටිපාදිකං වා, ප්‍රාතිපාදිකය හෝ; අඞ්ගං ඉති, අඞ්ගයයි; විඤ්ඤුනා නුවනැත්තහු විසින්; මතං, දන්නාලදී; තම්හි, ඒ ධාතු හෝ ප්‍රාතිපදික සඞ්ඛ්‍යාත අඞ්ගානන්තරයෙහි; ජාතංඑව, උපන්නේම; අනන්තරඞ්ගං; ඉති, අනන්තරඞ්ගයයි; වුච්චති, කියනුලැබේ.

342. අඞ්ගානං බහිතො ජාතං බාහිරඞ්ගන්ති වුච්චති
යථා 'වෙවොසු ලො වාති' 'අන්තානෙන්තා හිස්මිමාදි ච'

343. 'අකතරස්ස ලතො ස්වා'දි'තතො ස්මිං'යථාක්කමං
ඉතො පරන්ති අඤ්ඤන්ති ඤාතබ්බානි විජානතා.

344. බාහිරඞ්ගන්තරඞ්ගානං අන්තරඞ්ගං බලී ඉති
එවං සමුද්දිට්ඨං හොති වෙදිතබ්බං විභාවිනා.

345. අධිකාරංච පඨමං සඤ්ඤාසුත්තං තතො'පරං
විධිකාරකසුත්තඤ්ච ඨපෙතබ්බං සුවිඤ්ඤුනා.

346. 'ජිනවචන යුත්තං හි' අධිකාරො'ති කිත්තිතං
'ලිඞ්ගඤ්ච නිපච්චතෙ' සඤ්ඤා 'තතො' ච්චාදි විධී මතං.

---

342. අඞ්ගානං, ශරීරයන්ගේ; බහිතො, පිටත; ජාතං, උපන්නේ; බාහිරඞ්ගං ඉති, බහිරඞ්ගයයි; වුච්චති, කියනුලැබේ; යථා, ඒ (අන්තරඞ්ග බහිරඞ්ගවිධිදෙකට උදාහරණ) මෙසේයි: වෙවොසු ලො ච ඉති, වෙවොසු ලො ච යන සූත්‍රයද; අන්තානෙන්තා හිස්මි මාදිච, අන්තානෙන්තා හිස්මිමනත්තං, යන සූත්‍රයද.

343. අකතරස්සා ලතො ස්වාදි, අකතරස්සා ලතො ස්වාලපනස්ස වෙවො යන සූත්‍රයද; තතො ස්මිං, තතො ස්මිං යනසූත්‍රයද; ඉතො පරන්ති අඤ්ඤන්ති, මෙයින් අන්‍යවූ සෙසු සූත්‍රද; යථාක්කමං, පිළිවෙළින්; විඤ්ඤුනා, නුවනැත්තහු විසින්; ඤාතබ්බානි, දතයුත්තාහ.

344. බාහිරඞ්ගන්තරඞ්ගානං, බහිරඞ්ගවිධි අන්තරඞ්ගවිධිමය අතුරෙන්; අන්තරඞ්ගං බලි ඉති, අන්තරඞ්ගවිධිය බලවත්යයි; එවං, මෙසේ; සමුද්දිට්ඨං හොති, කියනලද්දේ වේ; විභාවිනා, පණ්ඩිතයාවිසින්; වෙදිතබ්බං, දතයුතු.

345. පඨමං, පළමුවැනිවූ; අධිකාරංච, අධිකාරසූත්‍රයද; තතො, එයින්; අපරං, අන්‍යවූ; සඤ්ඤාසුත්තං, සංඥාසූත්‍රද; විධිකාරකසුත්තඤ්ච, විධිකාරක සූත්‍රමයද; සුවිඤ්ඤුනා, මනාප්‍රඥා ඇත්තහු විසින්; ඨපෙතබ්බං, (පිළිවෙළින්) තැබියයුතු.

346. ජිනවචනයුත්තං හි, ජිනවචනයුත්තං හි යන සූත්‍රය; අධිකාරෙ ඉති, අධිකාරසූත්‍රයයි; කිත්තිතං, කියනලද්දේය; ලිඞ්ගඤ්ච නිපච්චතෙ, ලිඞ්ගඤ්ච නිපච්චතෙ, යන සූත්‍රය; සඤ්ඤා, සංඥාසූත්‍රයි: තතො ඉති ආදි, තතො යන මේ ආදිය; (තතො ච විභත්තියො යන සූත්‍රය) විධි, විධිසූත්‍රයයි; මතං, දන්නාලදී.

347. 'ලිඞ්ගත්ථෙ පඨමා' සුත්තං කාරකන්ති උදීරිතං
එවමෙව ඉතො සෙසං ජානිතබ්බං සුවිඤ්ඤුනා.

348. තිලිඞ්ගා එකලිඞ්ගා ච ද්විධා සඞ්ඛ්‍යා පකාසිතා
සඞ්ඛ්‍යා එකාදයො අට්ඨාරසන්තා තු තිලිඞ්ගිකා.

349. වීසාදයො නවුතන්තා ඉත්ථිලිඞ්ගා ච භාසිතා
යාව සතාදසඞ්ඛෙය්‍යං ඨපෙත්වා'ව තිකොටියො
සබ්බං නපුංසකං ඤෙය්‍යං කොටිත්තයන්තු ඉත්ථියං.

350. නයොසඞ්ඛ්‍යානවිත්ථාරො සද්දසාරෙ පකාසිතො
සබ්බනාමං ද්විධා වුත්තං අනබ්‍යයබ්‍යයභෙදතො.

---

347. ලිඞ්ගත්ථෙ පඨමා, ලිඞ්ගත්ථෙ පඨමා, යන සූත්‍රය; කාරකං සුත්තං ඉති, කාරකසූත්‍රයයි; උදීරිතං, කියනලදී; එවං එව, මෙපරිද්දෙන්ම; ඉතො, මෙයින්; සෙසං, අවශෙෂය; සුවිඤ්ඤුනා, සුන්දරප්‍රඥාවත්හු විසින්; ජානිතබ්බං, දතයුතු.

සඞ්ඛ්‍යාභෙද දක්වනු පිණිස 'තිලිඞ්ගා' යනාදිය කීහ.

348. තිලිඞ්ගා, තුන්ලිඟු ඇත්තීයයිද; එකලිඞ්ගා ච, එක්ලිඟු ඇත්තී යයිද; සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාවාචීශබ්දයෝ; ද්විධා, දෙපරිද්දෙකින්; පකාසිතා, ප්‍රකාශකරණලද්දහ; එකාදයො, එකශබ්දය ආදිකොටඇති; අට්ඨාරසන්තා, අට්ඨාරස ශබ්දය අවසන්කොටඇති; සඞ්ඛ්‍යාතු, සඞ්ඛ්‍යාශබ්දයෝ වනාහි; තිලිඞ්ගිකා, තුන්ලිඟු ඇත්තෝයයි (දන්නාලදහ.)

349. වීසාදයො, වීසතිශබ්දය ආදිකොටඇති; නවුතිඅන්තා, නවුතිශබ්දය අවසන්කොට ඇතිශබ්දයෝ; ඉත්ථිලිඞ්ගා එව, ස්ත්‍රීලිඟුඇත්තෝමයයි; භාසිතා, කියනලද්දහුය; යාව සත ආදි අසංඛෙය්‍යං, සතශබ්දය පටන්අසංඛෙය්‍යශබ්දය අන්තකොට ඇතිශබ්ද; තිකොටියො ඨපෙත්වා එව, කොටිශබ්ද තුන හෙවත්කොටි පකොටි කොටිප්පකොටි ශබ්දතුනහැරම; සබ්බං, සියල්ල; නපුංසකං, නපුංසකලිඟු ඇත්තේයයි; ඤෙය්‍යං, දතයුතු; කොටිත්තයන්තු, කොටිශබ්දතුන වනාහි; ඉත්ථියං, ස්ත්‍රීලිඟුයෙහිවේයයි දන්නාලදී.

350. සඞ්ඛ්‍යානං විත්ථාරොනයො, සියලු සඞ්ඛ්‍යාශබ්දයන්ගේ විස්තරක්‍රමය; සද්දසාරෙ, ශබ්දසාරප්‍රකීර්ණක කාණ්ඩයෙහි; පකාසිතො, ප්‍රකාශකරණලදී; අනබ්‍යයබ්‍යයභෙදතො, අනව්‍යයසර්වනාමය අව්‍යයසර්වනාමය යනමොවුන්ගේ භෙදයෙන්; සබ්බනාමං, සර්වනාමය; ද්විධා, දෙපරිද්දෙකින්; වුත්තං, කියනලදී; (මේ ගයෙහි 'නයොසඞ්ඛ්‍යානං' යනාදීන් සර්වනාමභෙද දක්වූහ.)

351. අබ්‍යයතද්ධිතං සබ්බං අබ්‍යයන්ති පවුච්චති
උදාහරණමෙතෙසං කච්චායනෙ සුපාකටං.

352. අනබ්‍යයං සබ්බනාමං සබ්බායාසාදයො මතා
සබ්බනාමාන විත්ථාරො' සද්දසාරෙ පකාසිතො.

353. රුළ්හානවරුළ්හවසෙනාපි නාමං ද්විවිධමීරිතං
ථීපුමනපුංසකානඤ්ච වසෙන තිවිධං මතං.

354. නාමනාමාදිභෙදෙන පඤ්චධා සමුදීරිතං
උදාහරණමෙතෙසං නාමකප්පෙ සුපාකටං.

355. ව්‍යුප්පත්ත්‍යව්‍යුප්පත්තීනං වසෙනුප්පත්ති ච ද්විධා
ව්‍යුප්පත්ති තත්ථ ධාතූහි පච්චයෙහි ච සිජ්ඣති.

---

351. සබ්බං අබ්‍යයතද්ධිතං, සියලු අව්‍යයතද්ධිතය; අබ්‍යයං ඉති, අව්‍යය සංඥා නාමයයි; පවුච්චති, කියනු ලැබේ; එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; කච්චායනෙ, කාත්‍යායන ප්‍රකරණයෙහි, සුපාකටං, සුප්‍රකට වන්නේයි.

352. සබ්බායාසාදයො, සබ්බා ශබ්ද යා ශබ්ද සා ශබ්දාදීහු; අනබ්‍යයං, සබ්බනාමං, අනව්‍යය සර්වනාමයයි; මතා, දන්නාලදහු; සබ්බනාමානං විත්ථාරොඅපි, සර්වනාමයන්ගේ විස්තරයද; සද්දසාරෙ, ශබ්දසාරකාණ්ඩයෙහි; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය.

විස්තරවශයෙන් නාමප්‍රභෙද දක්වන්නෝ 'රුළ්හි' යනාදි කීහු.

353. රුළ්හි අනවරුළ්හවසෙන, රූඪිනාමය අනවරූඪිනාමය යනමොවුන්ගේ වශයෙන්; නාමං, නාමය; ද්විවිධං, දෙයාකාරයයි; ඊරිතං, කියනලදී; අපි, නැවත; ථීපුමනපුංසකානංවසෙනච, ස්ත්‍රීලිඞ්ග පුංලිඞ්ග නපුංසකලිඞ්ගයන්ගේ වශයෙන්ද; තිවිධං, තුන් ආකාරයයි; මතං, දන්නාලදී.

354. නාමනාමාදිභෙදෙන, නාමනාමාදිවූ භෙදයෙන්; පඤ්චධා, නාමය පස්පරිද්දෙකින්; සමුදීරිතං, කියනලදී; එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; නාමකප්පෙ, නාමප්‍රකරණයෙහි; සුපාකටං, සුප්‍රකටයි; (මෙහි ආදිශබ්දයෙන් සර්වනාම සමාසනාම තද්ධිතනාම කිතකනාම ගතයුතු.)

ඉක්බිති 'ව්‍යුප්පත්ති' යනාදින් උප්පත්තිභෙද දක්වූහ.

355. ව්‍යුප්පත්ති අව්‍යුප්පත්තීනං, ව්‍යුත්පත්‍යුත්පත්තිය අව්‍යුත්පත්‍යුත්පත්තිය යන මොවුන්ගේ; වසෙන, වශයෙන්; උප්පත්තිච, උත්පත්තියද; ද්විධා, දෙපරිද්දෙකින් (වන්නීය); තත්ථ, ඔවුන් අතුරෙන්; ව්‍යුප්පත්ති, ව්‍යුත්පත්‍යුත්පත්තිතොමෝ; ධාතූහි, ධාතූන්ගෙන්ද; පච්චයෙහි ච, ප්‍රත්‍යයන්ගෙන්ද; සිජ්ඣති, සිද්ධවේ; (පුරිසො යනාදිය උදාහරණයි.)

356. අවිසුත්ථී තු වාධාතු පච්චයොපි නදිස්සති
එවං ඡබ්බිධනාමං තං වෙදිතබ්බං සුබුද්ධිනා.

ඉති සද්දසාරත්ථජාලිනියා නාමකප්පො චතුත්ථො කණ්ඩො.

---

357. කාරකං ඡබ්බිධං සඤ්ඤාවසෙනපිතිවීසති
භෙදෙන වුච්චතෙ කෙචි වදන්ති ච ඡවීසති.

358. කත්තා පඤ්චවිධො තත්ථ කම්මං සත්තවිධං මතං
කරණං දුවිධං වුත්තං සම්පදානං තිධා මතං.

359. අපාදානං ද්විධා වුත්තං තථාධාරො චතුබ්බිධො
කරොති කිරියං සබ්බං තස්මා කාරකමීරිතං.

---

356. අවිසු ත්ථි තු, අවිසුත්ථූත්පත්තිය වනාහි; අධාතු, ධාතුරහිතයි; පච්චයො අපි, ප්‍රත්‍යයෙක්ද; නදිස්සති, නොපෙණේ; එවං, මෙසේ; තං ඡබ්බිධනාමං, ඒ ෂඩ්වැදෑරුම්නාමය; සුබුද්ධිනා, සුඥරඥාණීහු විසින්; වෙදිතබ්බං, දතයුතු.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලින්‍යෙහි; නාමකප්පො, නාමකල්පනම්වූ; චතුත්ථො කණ්ඩො, සතරවෙනි කාණ්ඩය; ඉති, මෙතෙකින්; සමාප්තයි.

---

මෙසේ නාමසාරය දක්වා ඉක්බිති කාරකසාරය දක්වන්නෝ 'කාරකං' යනාදිය කීහු.

357. සඤ්ඤාවසෙන, සංඥාවශයෙන්, කාරකං, කාරකය; ඡබ්බිධං, ෂඩ්විධයි; අපි, නැවත; භෙදෙන, ඔවුනොවුන්ගේ භෙදවශයෙන්; තිවීසති, තුන්විස්සකැයි; වුච්චතෙ, කියනුලැබේ; කෙචි, ඇතම් ආචාර්‍ය්‍ය කෙණෙක්; ඡවීසති, සවිස්සකැයි; වදන්ති, කියත්; ( කෙචීති රූපසිද්ධි ආචරියං සන්ධායාහ, යනු ටීකායි.)

එහි භෙද දක්වීම පිණිස 'පඤ්චවිධො' යනාදිය ආරබ්ධයි.

358. තත්ථ, ඔවුන් අතුරෙන්; කත්තා, කර්තෘකාරකය; පඤ්චවිධො, පස්වැදෑරුම්වේ; කම්මං, කර්මකාරකය; සත්තවිධං, සත්වැදෑරුම්යයි; මතං, දන්නාලදී; කරණං, කරණකාරකය; දුවිධං, දෙවැදෑරුම්යයි; වුත්තං, කියනලදී; සම්පදානං, සම්ප්‍රදානකාරකය; තිධා, තුන්පරිද්දෙකින්; මතං, දන්නාලදී.

359. අපාදානං, අපාදානකාරකය; ද්විධා, දෙපරිද්දෙකින්; වුත්තං, කියනලදී; තථා, එසේම; ආධාරො, ආධාරය; චතුබ්බිධො, චතුර්විධයි; සබ්බං කිරියං (ගමනපචනාදි) සකලක්‍රියාව; කරොති, කෙරේද (නිපදවාද); තස්මා, එහෙයින්; කාරකං, කාරකයයි; ඊරිතං, කියනලදී.

360. සයං හෙතු කම්මකත්තා අභිහිතානභිහිතා
පුඤ්ඤං කරොති පුරිසො කාරෙති අපරෙ ජනෙ.

361. සයංව භිජ්ජතෙ කොට්ඨං දානං දදාති දායකො·
සූදෙන පච්චතෙ භත්තං ඉමෙ තෙසං නිදස්සනා.

362. කරීයතෙති කම්මං තං කම්මං සත්තවිධං මතං
ඉච්ඡිතානිච්ඡිතං කම්මං නෙවිච්ඡිතමනිච්ඡිතං.

363. කත්තුකම්මමකථිතං වුත්තකම්මං අනුත්තකං
භුඤ්ජති ඔදනං පොසො මද්දති කණ්ටකං ජනො.

364 ගච්ඡං ගාමං තරුමූලං උපසංකමතී ජනො
අජං සො නයතී ගාමං කම්මං කාරෙයි දූරකං.

---

ඔවුන්ගේ ප්‍රභෙද දක්වන්නෙනෝ 'සයං' යනාදිය කීවෝ

360. (කර්තෘකාරකයතෙම) සයං, ස්වයංකර්තෘය; හෙතු, හෙතුකර්තෘය; කම්මකත්තා, කර්මකර්තෘය; අභිහිතඅනභිහිතා, අභිහිතකර්තෘය අනභිහිත කර්තෘයයි (පස්වැදෑරුම්) පුරිසො, පුරුෂතෙම, පුඤ්ඤං කරොති, පින් කෙරෙයි; (ස්වයං කර්තෘයි) (පුරිසො, පුරුෂතෙම) අපරෙ ජනෙ, අන්‍යජනයන් ලවා; (පුඤ්ඤං) කාරෙති, (පින්) කරවයි, (මේ හෙතුකර්තෘයි)

361. කොට්ඨං, කොටුව; සයං එව, තෙමේම; භිජ්ජතෙ, බිඳෙයි; (මේ කර්මකර්තෘයි) දායකො, දායකතෙම; දානං දදාති, දන්දෙයි; (මේ අභිහිත කර්තෘයි) සූදෙන, අරක්කැමියා විසින්: භත්තං, බත; පච්චතෙ, පිසනුලැබේ· (අනභිහිතකර්තෘයි) තෙසං, ඒ පඤ්චවිධකර්තෘන්ට; ඉමෙ නිදස්සනා, මේ නිදර්ශනයෝයි.

වචනාර්ථ සහිත කර්මප්‍රභෙද දක්වනු පිණිස 'කරීයතෙති' යනාදිය ආරබ්ධයි.

362. කරීයතෙ ඉති, (කර්තෘහුගේ ක්‍රියාව හා සම්බන්ධ) කරනුලැබේ නුයි; කම්මං, කර්ම නම් වේ; තං කම්මං, ඒකර්මය, සත්තවිධං, සප්තවිධයයි; මතං, දත්නාලදී. ඉච්ඡිතානිච්ඡිතං, ඊප්සිතකර්මයද අනීප්සිතකර්මයද; නෙවිච්ඡිතානිච්ඡිතං, නෙවෙප්සිතානීප්සිත කර්මයද,

363. අකථිතං, අකථිතකර්මයද; කත්තුකම්මං, කර්තෘකර්මයද; වුත්තකම්මං, උක්තකර්මයද; අනුත්තකං, අනුක්තකර්මය දැයි කියායි; පොසො, පුරුෂතෙම, ඔදනං, බත; භුඤ්ජති, බුදියි; (මේ ඊප්සිත කර්මයි) ජනො, ජනතෙම, කණ්ටකං, කටුව; මද්දති, මඩියි; (මේ අනීප්සිතකර්මයි.)

364. ජනො, ජනතෙම; ගාමං, ගමට; ගච්ඡං, යන්නේ; තරුමූලං, වෘක්ෂ මූලයට; උපසංකමති, පැමිණෙයි, (මේ නෙවඊප්සිතානීප්සිත කර්මයි) සො, හෙතෙම; අජං, එළුවා; ගාමං, ගමට; නයති, පමුණුවයි; (මේ අකථිතකර්මයි)

365. භාසිතො භගවතා ධම්මො කම්මං කරොති සො ජනො
යථාසඞ්ඛ්‍යං භවෙ තෙසං උදාහරණ සත්තකං.

366. අජ්ඣත්තං බාහිරඤ්චෙව කරණං දුවිධං මතං
කරොති මනසා පුඤ්ඤං සත්ථෙන පසවො හතො.

367. කම්මාභිප්පෙතකක්‍රියාභිප්පෙතකාරකන්තරා
සම්පදානං තිධා වුත්තං රුක්ඛනාරායනාජිනො.

368. කායසම්පත්තිපුබ්බකං චිත්තසම්පත්තිකම්පිච
අපාදානං ද්විධා වුත්තං ගාමා පාපාති ආදිකං.

---

(සො හෙතෙම,) පුරිසං, පුරුෂයා ලවා, කම්මං කාරෙති, කර්ම කරවයි; (මේ කර්තෘකර්මයි)

365. භගවතා, භගවත්හු විසින්; ධම්මො, ධර්මයතෙම; භාසිතො, වදාරණලද්දේය; (මේ උක්තකර්මයි) සො ජනො, ඒජනතෙම; කම්මං කරොති කර්ම කෙරේ; (මේ අනුක්තකර්මයි) තෙසං, ඒ සප්තවිධ කර්මයන්ට; සත්තකං, මේ සප්තකය; යථාසඞ්ඛ්‍යං, පටිපාටීන්; උදාහරණං භවෙ; උදාහරණ වන්නේය.

කරණප්‍රභෙද දක්වන්නෝ 'අජ්ඣත්තං, යනාදිය කීහු.

366. අජ්ඣත්තං, ආධ්‍යාත්මිකකරණයද; බාහිරඤ්චෙව, බාහිරකරණයදැයි කියා; කරණං, කරණකාරකය; දුවිධං, දෙවැදෑරුම්යයි; මතං, දන්නා ලදී; මනසා, සිතින්; පුඤ්ඤං කරොති, පින්කෙරෙයි; (මේ ආධ්‍යාත්මිකකරණයයි) සත්ථෙන, ශස්ත්‍රයෙන්; පසවො, සිව්පාවෝ; හතො, නසනලද්දහුය; (මේ බාහිරකරණයයි.)

සම්ප්‍රදානභෙද දැක්වීම පිණිස 'කම්මාභිප්පෙතක' යනාදිය ආරබ්ධයි.

367. කම්මාභිප්පෙතකක්‍රියාභිප්පෙතකාරකන්තරා–කම්මාභිප්පෙතක, කර්මාභිප්‍රෙත සම්ප්‍රදානය; ක්‍රියාභිප්පෙත, ක්‍රියාභිප්‍රෙත සම්ප්‍රදානය; කාරකන්තරා, කාරකාන්තරාභිප්‍රෙතසම්ප්‍රදානය යනමොත්ගේ වශයෙන්; සම්පදානං, සම්ප්‍රදාන කාරකය; තිධා, තුන්පරිද්දෙකින්; වුත්තං, කියනලදී; රුක්ඛනාරායනාජිනො–රුක්ඛ, රුක්ඛස්ස ජලං දදාති යනුද; නාරායනා, නාරායනස්ස බලිං දදාති යනුද; ජිනො, ජිනස්ස ජලංදදාති යනුද; (මෙකී භෙදත්‍රයට උදාහරණයි)

ඉක්බිති අපාදානභෙද දැක්වූහ.

368. කායසම්පත්තිපුබ්බකං, කායසම්පත්තිපූර්වකඅපාදානකාරකයද; චිත්තසම්පත්තිකං අපි ච, චිත්තසම්පත්තිපූර්වකඅපාදානකාරකයදැයි කියා; අපාදානං, අපාදානකාරකය; ද්විධා, දෙපරිද්දෙකින්; වුත්තං, කියනලදී; ගාමා, ගාමා

369. බ්‍යාපිකොපසිලෙසො ච වෙසයො සාමීපො'පි ච
ජලෙ ඛීරං පරියඞ්කෙ සෙති භූමිසු මානුසා.

370. ගඞ්ගායං තිට්ඨති ඉමෙ එවං තෙසං නිදස්සනා
ඡබ්බිධං කාරකං එවං දට්ඨබ්බං වරවුද්ධිනා.

371. කිංසද්දො කාරකො නාම අථවාපෙත්ථ කාරකො
අපෙත්ථව කාරකො නාම වුච්චතෙ නතු වාචකො.

372. තබ්බාචකත්තා සද්දොපි අභිධාරෙන කාරකො
කිං සත්තිකාරකං නාම දබ්බං වා අථකාරකං

---

(අපෙපක්ෂිමුනයො); පාපා ඉති ආදිකං, පාපා (පිගුවජ්ජෙත පොසො) යනමේ ආදිය; (පිළිවෙළින් උදාහරණයි.)

'බ්‍යාපිකො' යනාදීන් ආධාරකාරකභෙද දක්වනු.

369. බ්‍යාපිකො, බ්‍යාපිකාධාරයද; ඔපසිලෙසො, ඖපසිලෙසිකාධාරයද; වෙසයො, විසයාධාරයද; සාමීපො අපිච, සාමීපිකාධාරයද්‍යයි කියා; (ආධාර කාරකය චතුර්විධ වේ); ජලෙ, ජලයෙහි; ඛීරං, කිරියි; (මේ බ්‍යාපිකාධාරයි) පරියඞ්කෙ, පර්‍ය්‍යඞ්කයෙහි; සෙති, සයනය කෙරෙයි; (මේ ඖපසිලෙසා ධාරයි)–භූමිසු, භූමියෙහි; මානුසා, මනුෂ්‍යයෝ; (වසන්ති, වෙසෙති; මේ විසයාධාරයි.)

370. ගඞ්ගායං, ගඟෙහි; තිට්ඨති, සිටී, (මේ සමීපාධාරයි) තෙසං, ඔවුන්ට; ඉමෙ නිදස්සනා, මේ නිදර්ශනයෝ; එවං, මෙපරිද්දෙන්; (දතයුත්තාහ) වරවුද්ධිනා, උත්තමබුද්ධිමත්හු විසින්; ඡබ්බිධං කාරකං, ෂඩ්විධ කාරකය; එවං දට්ඨබ්බං, මෙසේ දතයුතු.

මෙසේ සංක්ෂෙපයෙන් කාරකභෙද දක්වා දැන් කාරකවිචාරණය පිණිස 'කිංසද්දො' යනාදිය ආරබ්ධයි.

371. කිං, කිමෙක්ද; සද්දො, ශබ්දයතෙම; කාරකො නාම, කාරකනම්ද; අථවා, නොහොත්; අපෙත්ථ, අර්ථය; කාරකො ඉති, කාරකනම්දැයි; අපෙත්ථ එව, අර්ථයම, කාරකො, කාරකනම්වේ; වාචකො, ශබ්දය; නතු, කාරක නොවේ.

372. තබ්බාචකත්තා, ඒ අර්ථවාචක බැවින්; සද්දො අපි, ශබ්දයද; අභිධාරෙන, අභිමුඛයෙන්; කාරකො, කාරකනම්වේ; කිං, කිම; සත්ති, ශබ්ද ශක්තිතොමෝ; කාරකං නාම, කාරකනම්ද; අථවා, නොහොත්; දබ්බං, ද්‍රව්‍යය; කාරකං නාම, කාරකනම්දැයි.

373. මුඛ්‍යතො කාරකං සත්ති ක්‍රියානිබ්බත්තිභාවතො
තදාධාරම්පි දබ්බං තං තංයොගා කාරකං මතං.

374. සබ්බෙසු සහජාසත්ති යාවදබ්බං අවට්ඨිති
ක්‍රියා කාලෙ'භිව්‍යත්ති ආසයා නියගතා ඉව.

375. සඛිසංයොගිනො පාසා දෙවානං වරුණා යථා
ව්‍යජ්‍යන්ති ජිගීසූනං දබ්බෙසු සත්තියො තථා.

376. මුඛ්‍යාමුඛ්‍යවසෙනෙව කාරකං ද්විධං මතං
කත්තුකාරකමක්ඛාතං මුඛ්‍යන්ති වරබුද්ධිනා
කම්මාදිකං පඤ්චවිධං අමුඛ්‍යන්ති පවුච්චති.

377. අමුඛ්‍යං යදි චෙ හොති කථං කාරකමීරිතං
ක්‍රියානිප්ඵාදනභාවෙන කාරකන්ති උදීරිතං.
කම්මාදිකෙ අසන්තෙපි ක්‍රියාපිච න සිජ්ඣති.

---

373. මුඛ්‍යතො, ප්‍රධානවශයෙන්; සත්ති, ශක්තිතොමෝ; ක්‍රියානිබ්බත්තිභාවතො, ක්‍රියානිෂ්පත්තියට හෙතුවන බැවින්; කාරකං, කාරකනම් වේ; තදාධාරං, ඒ ශක්තියට ආධාරවූ; තංයොගා, ඒ ශක්තිහුගේ යෙදීමෙන්; තං දබ්බං, ඒ ද්‍රව්‍යය; කාරකං මතං, කාරකයයි දන්නාලදී.

374. සබ්බෙසු, සියලුතන්හි; සහජා සත්ති, එක්ව උපන් ශක්තිතොම; යාවදබ්බං, ද්‍රව්‍යය ඇතිතෙක්; අවට්ඨිති, ව්‍යාප්තව සිටින්නීය; ආසයා, ද්‍රව්‍යයෙන්; නියගතා ඉව, නිෂ්ක්‍රාන්තවූවාක්මෙන්; ක්‍රියාකාලෙතු එව, ක්‍රියාවගේ උත්පත්තිකාලයෙහිම; අභිව්‍යත්ති, ප්‍රකට වෙයි.

එය උපමාවෙන් සාධනය කරන්නහු 'සඛිසංයොගිනො' යනාදිය ආරබ්ධයි.

375. යථා, යම්සේ; දෙවානං, දෙවියන්ගේ; සඛිසංයොගිනො, සඛීය සඛීය සංයොගය ඇති; වරුණා, වරුණනම්වූ; පාසා, පාසයෝ; ජිගීසූනං, ජයගනුකැමති දෙවියන්ට; ව්‍යජ්‍යන්ති, ප්‍රකටවෙත්ද, දබ්බෙසු, ද්‍රව්‍යයන් කෙරෙහි; සත්තියො, ශක්තීහුද; තථා, එසේම ප්‍රකටවෙති.

අත්පරිද්දෙකින්ද කාරකභෙද දක්වනු පිණිස 'මුඛ්‍ය' යනාදිය ආරබ්ධයි.

376. වරබුද්ධිනා, උත්තමබුද්ධිමත්හු විසින්; මුඛ්‍යාමුඛ්‍යවසෙන එව, ප්‍රධාන අප්‍රධානවශයෙන්ම; කාරකං, කාරකය; ද්විධං, ද්විවිධයයි; මතං, දන්නාලදී; කත්තුකාරකං, කත්තෘකාරකය; මුඛ්‍යං ඉති, (ප්‍රධානත්වයෙන් ක්‍රියානිෂ්පාදනය කරණහෙයින්) මුඛ්‍යයයි; අක්ඛාතං, කියනලදී.

කම්මාදිකං, කර්මාදිකොටඇති; පඤ්චවිධං, පඤ්චවිධකාරකය; අමුඛ්‍යං ඉති, (අප්‍රධානත්වයෙන් ක්‍රියානිෂ්පාදනය කරණහෙයින්) අමුඛ්‍යයයි; පවුච්චති, කියනුලැබේ.

378. සත්තිනානත්තසංයොගා එකං දබ්බං පභිජ්ජතෙ
කත්තාදිභෙදතො භෙදං ජනොව සිප්පභෙදතො.

379. සකත්තෙනෙව කිරියං යො සාධෙති සකාරකො
සකත්තාති පවුච්චෙය්‍ය කරොතීති පධානතො

380. සකත්තනත්තකතා හොන්ති කත්තරියෙව කාරකෙ
කම්මාදෙසුපි සකත්තත්තං හොති කම්මාදිවාචකෙ.

381. තස්මා කම්මාදිකත්තුත්තං හොති වදෙය්‍ය චෙ තතො
න තං වචන වත්තබ්බං කාරකං වත්තුකාමතො.

---

377. යදි චෙ, ඉදින්; අමුඛ්‍යං හොති, අප්‍රධානවන්නේ නම්; කථං, කෙසේ; කාරකං ඊරිතං, කාරකයයි කියනලද්දේද; ක්‍රියානිමිත්ත භාවෙන, ක්‍රියා නිෂ්පත්තියට නිමිත්තවනබැවින්; කාරකං ඉති, කාරකයයි; උදීරිතං, කියන ලද්දී; හි, ඒ එසේමය; කම්මාදිකෙ අසන්තෙ, කර්මාදිකාරකයන් අවිද්‍යමාන කල්හි; ක්‍රියා අපිච, ක්‍රියාවද; න සිජ්ඣති, සිඩ නොවේ (නිෂ්පන්නනොවේ යනු භාවයි.)

ක්‍රියානිෂ්පාදනයට යොග්‍ය එක්දෙයෙක් කෙසේ නානාකරණභාවයට පැමිණේදැයි දක්වීම සඳහා මේ සමීප ගය කීහු.

378. සත්ති, ක්‍රියානිෂ්පාදනශක්ති යෙහි; නානත්තසංයොගා, නානාත්ව සංයොගයෙන්; එකං දබ්බං, එක්ක්‍රියානිෂ්පාදනයට යොග්‍යද්‍රව්‍යයෙක්; පභිජ්ජතෙ, භෙදයට පැමිණේ; ජනො, ජනතෙමේ; සිප්පභෙදතො ඉව, ශිල්පයන්ගේ නානාකරණයෙන් භෙදයට පැමිණෙන්නාක්මෙන්; කත්තාදි භෙදතො, කර්ත්‍රාදිකාරකයන්ගේ භෙදයෙන්; භෙදං, භෙදයට පැමිණේ.

කර්තෘකාරකලක්ෂණ දක්වනු පිණිස 'සකත්තෙනෙව' යනාදිය ආරබ්ධයි.

379. සකත්තෙනෙව, ස්ව ප්‍රධාන හෙයින්; කිරියං, යම්ක්‍රියාවක්; යො කාරකො, යම්කාරකයෙක් තෙම; සාධෙති, සිඩ කෙරේද; සො, හෙතෙම; පධානතො, ප්‍රධානවශයෙන්; කරොති, (ක්‍රියාව) කෙරේ; ඉති, එහෙයින්; සො, හෙතෙම; කත්තා ඉති, කර්තෘයයි; පවුච්චෙය්‍ය, කියන්නේය.

සියලුම කාරකයෝ තමතමන්ට ප්‍රධාන නොවෙත්දැයි චොදනාකරන්නෝ සක, යනාදිය කීහු.

380. කත්තරි කාරකෙ එව, කර්තෘකාරකයෙහිම; සකත්තනත්තකතා, ස්ව ප්‍රධානභාවය; හොති, වේ; කම්මාදෙසු අපි, කර්මාදි පඤ්චකාරකයෙහිද; කම්මාදිවාචකෙ, කර්මාදි වාචකයා ඇතිකල්හි; සකත්තත්තං, ස්වප්‍රාධාන්‍යය; හොති, වේ.

381. තස්මා, එහෙයින්; කම්මාදිකත්තුත්තං, කර්මාදීන්ගේ කර්තෘත්වය; හොති, වේයයි; වදෙය්‍ය, කියන්නේනම්; තංවචනං, ඒ කීම; න වත්තබ්බං,

382. අනුත්තෙ කත්තරි ඡට්ඨී තතියා හොති කාමතො
වුත්තෙ තු පඨමාවෙත්ථ අත්ථමත්තමපෙක්ඛිය.

383. සම්පජ්ජතෙ කිරියාය තං කම්මන්ති වුච්චති
නිබ්බත්තිවිකතිප්පත්තිභෙදතො තිවිධං මතං.

384. අනුත්තෙ දුතියා හොති වුත්තෙ තු පඨමා මතා
ණ්වුතුයුපච්චයයොගෙ ඡට්ඨීපි හොති කම්මනි.

385. යදික්‍රියාභිසම්බන්ධා කම්මමිතීහිච්ඡතෙ.
සබ්බමෙව භවෙ කම්මං කාරකං භාවයොගතො.

---

නොහිඳපුලුවී; වෙ, ඉදින්; වත්තුකාමතො, වක්තෘහුගේ ඉච්ඡාවශයෙන්; කාරකං, කාරකයවේද; තථා, එහෙයින්.

382. කත්තරි අනුත්තෙ, කර්තෘකාරකය අනුක්තකල්හි; කාමතො, (වක්තෘහුගේ) කැමැත්තපරිද්දෙන්; ඡට්ඨී, අනුක්තකර්තෘයෙහි ෂෂ්ඨී විභක්ත්‍යය හෝ; තතියා, තෘතීය විභක්තිය හෝ; හොති, වේ; වුත්තෙ තු, කර්තෘ උක්තකල්හි වනාහි; අත්ථමත්තං (කර්මාදිකාරකයන්ගෙන් අවශෙෂවූ ස්වාර්ථ ද්‍රව්‍යලිඞ්ග සඞ්ඛ්‍යායයි කියනලද ලිඞ්ගාර්ථමාත්‍රය; අපෙක්ඛිය, අපෙක්ෂාකොට—එත්ථ පඨමා එව, මෙහි ප්‍රථමාවම වේ; (ෂෂ්ඨ්‍යාදීහු නොවෙත්යනුභාවයි.)

කර්මලක්ෂණ දක්වනුවන් විසින් 'සම්පජ්ජතෙ' යනාදිය ආරබ්ධයි.

383. කිරියාය, (කර්තෘ සම්බන්ධ) ක්‍රියාවෙන්; (යස්මා, යම්හෙයකින්) සම්පජ්ජතෙ, සපයනුලැබේද; තස්මා, එහෙයින්; තං කම්මං ඉති, කර්මයයි; වුච්චති, කියනුලැබේ; නිබ්බත්තිවිකතිප්පත්තිභෙදතො,— නිබ්බත්ති, නිර්වෘත්ති කර්මය; විකති, විකෘතිකර්මය; පත්ති, ප්‍රාප්තිකර්මය යන භෙදයෙන්; තිවිධං, (කර්මය) ත්‍රිවිධයයි; මතං, දත්නාලදී.

384. අනුත්තෙ, (සමාසාදි සිව්පදයන් විසින්) අනුක්තකල්හි; දුතියා හොති, ද්විතීයාවිභක්ති වේ; වුත්තෙ තු, (සමාසාදීන් විසින්) උක්තකල්හිම; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; මතා, දත්නාලදී; ණ්වුතුයුපච්චයයොගෙ, ණ්වුප්‍රත්‍යය තුප්‍රත්‍යය යුප්‍රත්‍යය යනමොවුන්ගේ යොගයෙහි; කම්මනි, කර්මයෙහි; ඡට්ඨී අපි, ෂෂ්ඨීවිභක්තියද; හොති, වේ.

කර්මලක්ෂණයට චෝද්‍යාකරන්නෝ 'යදි' යනාදිය කීහු.

385. යදි, ඉදින්; ක්‍රියාභිසම්බන්ධා, ක්‍රියාව හා විශිෂ්ටවූසම්බන්ධයාගවතගෙසින්; කම්මං ඉති, කර්මයයි; ඉහ, මෙහි; ඉච්ඡතෙ, අභිමතවේද; (එහෙයින්) භාවයොගතො, ක්‍රියා යොගයෙන්; සබ්බං කාරකං එව, සියලු කාරකයම; කම්මං භවෙ, කර්මනම් වන්නේය.

386. තථාපි සබ්බං තං කම්මං කාරකං වත්තුකාමතො
අයමෙව නයො සෙසකාරකෙසුපි ලබ්භතෙ.

387. කත්තුක්‍රියාභිසම්බන්ධෙ කාරකෙසු පධානතො
කරණන්ති පවුච්චතෙ කාරකඤ්ඤූහි නාමතො.

388. අනුත්තෙ තතියා හොති වුත්තෙ තු පඨමා සියා
අක්ඛ්‍යාතිකාදිභෙදෙ තං පුබ්බෙයෙව පකාසිතං.

389. සම්මාපදීයතෙ යස්ස සම්පදානං තදුච්චතෙ
අනුමන්තානිරාකත්තුචාජ්ඣෙසනවසා තිධා.

390. අනුත්තෙ තු චතුත්ථීව වුත්තෙ තු පඨමා සියා
උදාහරණමෙතෙසං රුක්ඛයාචකභික්ඛවො.

---

386. තථා අපි, එසේදවුවත්; තං සබ්බං කාරකං, ඒ සියලු කාරකය; වත්තුකාමතො, වක්තෘහුගේ විවක්ෂාවශයෙන්; කම්මං, කර්මනම් වන්නේය; අයං නයො එව, මේ (විවක්ෂා) නයම; සෙසකාරකෙසු අපි, සෙසු කාරකයන්හිද ලා; ලබ්භතෙ, ලැබෙනුවේයි.

387. කත්තුක්‍රියාභිසම්බන්ධෙ, කර්තෘහාය ක්‍රියාව යනමොවුන් හා මොනවට බඳවූ; කාරකෙසු, කාරකයන් අතුරෙන්; පධානතො, ප්‍රධානභෙයින්; කාරකඤ්ඤූහි, කාරකඥයන් විසින්; නාමතො, නාමවශයෙන්; තං, ඒ කාරකය; කරණං ඉති, කරණකාරකයයි; වුච්චතෙ, කියනුලැබේ.

388. අනුත්තෙ, (සමාදීන් විසින්) අනුක්තකල්හි; තතියා හොති, තෘතීයා විභක්ති වේ; වුත්තෙ තු, උක්තකල්හිම; පඨමා සියා, ප්‍රථමා විභක්ති වන්නීය; අක්ඛ්‍යාතිකාදිභෙදෙ, ආඛ්‍යාතකිතකාදි භෙදයනිමිත්තකොටගෙණ; තං, ඒ කාරකය; පුබ්බෙයෙව, පළමුකොටම; පකාසිතං, ප්‍රකාශකරණලදී.

ලක්ෂණසහිත සම්ප්‍රදානභෙද දක්වනු පිණිස 'සම්මා' යනාදිය ආරබ්ධයි.

389. යස්ස, යමෙකුට; සම්මා, මනාකොට; පදීයතෙ, ප්‍රදානය කරණු ලැබේද; තං, එය; සම්පදානං, සම්ප්‍රදානයයි; උච්චතෙ, කියනුලැබේ; අනුමන්තු, අනුමන්තෘය; අනිරාකත්තු, අනිරාකර්තෘය; අජ්ඣෙසනං ච, ඉති අධ්‍යෙෂනය දැයි කියා; තං, ඒ සම්ප්‍රදානකාරකය; තිධා, තුන්පරිද්දෙකින් (දක්නාලදී).

390. අනුත්තෙ තු, සම්ප්‍රදානයවනාහි අනුක්තකල්හි; චතුත්ථීව, චතුර්ථී විභක්තියද; වුත්තෙ තු, උක්තකල්හිව; පඨමා, ප්‍රථමා විභක්තිද; සියා, වන්නීය; රුක්ඛයාචකභික්ඛවො, රුක්ඛයාචකභික්ඛුවො යනු; එතෙසං, මොවුන්ට; උදාහරණං, වෘක්ෂත්‍රමණයන් උදාහරණයයි; (රුක්ඛස්ස ජලං දදාති, යාචකස්ස වත්ථං දදාති, භික්ඛුස්ස පිණ්ඩං දදාතීති යෙදියයුතු.)

391. යතො'වධීයතෙ කිඤ්චි අපාදානං තදුච්චතෙ
අනුත්තෙ පඤ්චමී හොති වුත්තෙ තු පඨමාසියා.

392. ආධාරො කත්තුකම්මානං ක්‍රියාය යත්ථ කාරකො
සත්තිං ධාරෙති විඤ්ඤෙය්‍යො චතුධා බ්‍යාපිකාදිතො.

393. අනුත්තෙ සත්තමී හොති වුත්තෙ තු පඨමා සියා
එවම්පි කාරකභෙදෙ දට්ඨබ්බා සාරබුද්ධිනා.

394. සමාසො තද්ධිතො චාපි ආඛ්‍යාතො කිතකොපිච
වාචකො'පි චතුබ්බිධො දට්ඨබ්බො සාරබුද්ධිනා.

395. සමාසොවාචකො හොති පඨමාදීනං යථාරහං
තද්ධිතො භූයසො හොති කරණාවධිවජ්ජිතො.

---

'යතො, යනාදීන් සලක්‍ෂණ අපාදානභෙද කීහ.

391. යතො, යම්අවධියකින්; කිඤ්චි, යම් කිසිපදාර්ථයෙක්; අවධීයතෙ, වෙන් කරනුලැබේද; තං, ඒ කාරකය; අපාදානං, අපාදාන කාරක යයි; උච්චතෙ, කියනුලැබේ, අනුත්තෙ, අපාදානය අනුක්තකල්හි; පඤ්චමී හොති, පඤ්චමීවිභක්ති වේ; වුත්තෙ තු, උක්තකල්හි වනාහි; පඨමා හොති, ප්‍රථමා විභක්ති වේ.

ආධාරලක්‍ෂණ දක්වන්නෝ 'ආධාරො, යනාදිය ආරම්භකළෝ.

392. යත්ථ, යම්වාක්‍යයෙක්හි; ක්‍රියාය, ක්‍රියාවට නිශ්‍රයවූ; කත්තුකම්මානං, කර්තෘකර්මදෙදෙනාගේ; සත්තිං, ශක්තිය; ධාරෙති, යමෙක් දරාද; කාරකො, ඒ කාරකයතෙම; ආධාරො, ආධාර නම්වේ; (ඒ ආධාරයතෙම;) බ්‍යාපිකාදිතො, බ්‍යාපිකාදිවශයෙන්; චතුධා, සතරපරිද්දෙකින්; විඤ්ඤෙය්‍යො, දතයුත්තේය.

393. අනුත්තෙ, ඒආධාරය අනුක්තකල්හි; සත්තමී හොති, සප්තමී විභක්ති වේ; වුත්තෙ තු, උක්තකල්හි වනාහි; පඨමා සියා, ප්‍රථමා විභක්ති වන්නේය; සාරබුද්ධිනා, සාරබුද්ධිඇත්තහු විසින්; එවං අපි, මෙසේද; කාරකභෙදෙ, කාරක විශෙෂයතෙම; දට්ඨබ්බා, දක්කයුතු.

තදනන්තරව වාචකප්‍රභෙද දක්වූහ.

394. සමාසො, සමාසයද; තද්ධිතො අපිච, තද්ධිතයද; ආඛ්‍යාතො, ආඛ්‍යාතයද; කිතකො අපි ච, කිතකය දැයිකියා; වාචකො, වාචකතෙම; චතුබ්බිධො ඉති, චතුර්විධයයි; සාරබුද්ධිනා, සාරවූප්‍රඥා ඇත්තහු විසින්; දට්ඨබ්බො දක්ක යුතු.

395. පඨමාදීනං, ප්‍රථමාදි (සප්තවිභක්ති) න්ට; යථාරහං, සුදුසුපරිද්දෙන්; සමාසො, සමාසයතෙම; වාචකො හොති, වාචකවේ; තද්ධිතො තද්ධිතයතෙම;

396. ආඛ්‍යාතං කත්තුකම්මානං කරණාදීනං න වාචකො.
කිතකො සාමිවජ්ජානං ජානමෙවච වාචකො.

397. වුත්තො තු පඨමාවෙකො අවුත්තොතු යථාරහං
දුතියාදයො භවන්තීති දට්ඨබ්බා සාරබුද්ධිනා.

398. වාචකො අප්පධානොව වාච්චො පධානකො භවෙ
තබ්බිසෙසනභූතත්තා එවං ජානෙය්‍ය පණ්ඩිතො.

ඉති සද්දසාරත්ථජාලිනියා කාරකකණ්ඩො පචමො.

399. පඨමංව පදච්ඡෙදං කත්වාන තදනන්තරං
පච්ඡා සමාසො කත්තබ්බො අත්ථං ජානෙය්‍ය පණ්ඩිතො.

---

භූයසො, බොහෝ සෙයින්, කරණවසී වජ්ජිතො හොති, කරණවශී වර්ජිතවූයේවේ.

396. ආඛ්‍යාතං, ආඛ්‍යාතයතෙම; කත්තුකම්මානං, කර්තෘකර්මයන්, වාචකො, වාචකවේ; කරණාදීනං, කරණාදීන්; න, වාචකනොවේ; කිතකො, කිතකයතෙම; සාමිවජ්ජානං, සාමිවර්ජිතකොට ඇති; ජනානං එවච, ෂවි විභක්ත්‍යන්ම; වාචකො, වාචකවේ.

397. වුත්තො තු, උක්තකල්හි: වනාහි එකො පඨමා එව, හුදෙක් ප්‍රථමා විභක්තිම වේ, අවුත්තො තු, අනුක්තකල්හි වනාහි; යථාරහං, (ඒ ඒ අර්ථයන්ට) සුදුසු පරිද්දෙන්; දුතියාදයො, ද්විතීයාදීහු; භවන්ති ඉති, වෙත්යයි; සාරබුද්ධිනා, සාරමතීහු විසින්; දට්ඨබ්බා, දත්යුක්තාහ.

වාච්‍යවාචකයන් අතුරෙන් කවරෙක් ප්‍රධානදැයි විනිශ්චය කරන්නෝ 'වාචකො' යනාදිය කීහු.

398. වාචකො, වාචකතෙම; අප්පධානො එව, අප්‍රධානම (වන්නේය) වාච්චො, වාච්‍යයතෙම; පධානකො භවෙ, ප්‍රධානවන්නේය; තබ්බිසෙසනභූතත්තා, ඒ වාච්‍යයාට විශෙෂණවනබැවිනි; පණ්ඩිතො, පණ්ඩිතයතෙම; එවං, මෙසේ; ජානෙය්‍ය, (වාච්‍යවාචක දෙදෙනාගේ ප්‍රධාන අප්‍රධානබව) දන්නේය.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනියෙහි; පචමො, පස්වැනිවූ; කාරකකණ්ඩො, කාරකකාණ්ඩය; ඉති, මෙතෙකින් සමාප්තයි.

---

මෙතෙකින් කාරකසාරය දක්වා ඉක්බිති සමාසසාරය දක්වන්නෝ 'පඨමංව' යනාදිය ආරම්භකළෝ.

399. පඨමං එව, පළමුකොටම; පදච්ඡෙදං කත්වාන, පදච්ඡෙද කොට; තදනන්තරං, ඊට අනතුරුව; සමාසො, සමාසවිග්‍රහය තෙම; කත්තබ්බො, කටයුතුයි; පච්ඡා, ඊට පසු; පණ්ඩිතො, පණ්ඩිතයතෙම; අත්ථං ජානෙය්‍ය, අර්ථ දන්නේය.

400. ඡධා සමාසා සංඛෙපා විත්ථාරා සත්තවීසති
ලුත්තා චෙව අලුත්තා ච සමාසා දුවිධා මතා.

401. තත්ථ තප්පුරිසො සත්ත ඡබ්බිධො කම්මධාරයො
ඡබ්බිධා ච බහුබ්බීහි දිගුරෙව ද්විධා මතො.

402. ද්වන්දො චතුබ්බිධො ඤෙය්‍යො ‘බ්‍යයීභාවො ද්විධා මතො
තෙසං පන සමාසානං පධානත්තං චතුබ්බිධං.

403. ගුණාතිවත්තනතා නිච්චං තප්පුරිසසමානතො
තප්පුරිසොති භාසන්ති පණ්ඩිතා සුවිචක්ඛණා.

404. උත්තරස්ස පදස්ස’ත්ථො ලිඞ්ගඤ්චෙත්ථ පධානකං
භෙදො තු දුතියාදීහි විභත්තීහි විඤ්ඤෙය්‍යො.

---

400. සංඛෙපා, සංක්ෂෙපවශයෙන්; සමාසා, සමාසයෝ; ඡධා, සපරිද්දෙකින් වෙත්; විත්ථාරා, විස්තරවශයෙන්; සත්තවීසති, සප්තවිංශතියකි; (නැවත) ලුත්තා ච, ලුප්තසමාසයද; අලුත්තා චෙව, අලුප්තසමාසයද යි කියා; සමාසා, සමාසයෝ; දුවිධා, ද්විප්‍රකාරයකින්; මතා, දන්නාලදහ.

‘තත්ථ’ යනාදින් සංඥාසහිත ප්‍රභෙද දක්වූවෝ.

401. තත්ථ, ඔවුන් අතුරෙන්; තප්පුරිසො, තත්පුරුෂසමාසයතෙම; සත්ත, සප්තවිධයි; කම්මධාරයො, කර්මධාරයතෙම; ඡබ්බිධො, ෂට්විධයි; බහුබ්බීහිච, බහුව්‍රීහි සමාසය ද; ඡබ්බිධා, ෂට්විධයි; දිගු එව, දිගුසමාසය; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නාලද්දේය.

402. ද්වන්දො ච, ද්වන්ද්ව සමාසයද; චතුබ්බිධො, චතුර්විධයයි; ඤෙය්‍යො, දතයුතු; අබ්‍යයීභාවො, අව්‍යයීභාව සමාසයතෙම; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නාලද්දේය; තෙසං සමාසානං පන, ඒ සමාසයන්ගේ වනාහි; පධානත්තං, ප්‍රධානබව; චතුබ්බිධං, සිව්ආකාරවේ.

403. ගුණාතිවත්තනතා, ගුණියාගේ ඉක්මවීම හෙතු කොටගෙණ; නිච්චං, නිත්‍යයෙන්; තප්පුරිසසමානතො, තත්පුරුෂශබ්ද සාදෘශ්‍යයෙන්; තප්පුරිසො ඉති, තත්පුරුෂයයි; සුවිචක්ඛණා, අතිශයින් විචක්ෂණවූ; පණ්ඩිතා, පණ්ඩිතයෝ; භාසන්ති, කියත්.

404. උත්තරස්ස පදස්ස, උත්තරපදයාගේ; අත්ථො, අර්ථයද; ලිඞ්ගඤ්ච, ලිඞ්ගයද; එත්ථ, මේ තත්පුරුෂසමාසයෙහි; පධානකං, ප්‍රධානවේ; භෙදො තු, (ඒතත්පුරුෂ සමාසයාගේ) භෙදය වනාහි; දුතියාදීහි විභත්තීහි, ද්විතීයාදි විභක්තීන් කරණකොටගෙණ; විඤ්ඤෙය්‍යො, දන්නාලැබේ.

405. උදාහරණමෙවෙතෙසං කච්චායනෙ සුපාකටං
නාමද්වයං කම්මමිව ධාරෙති කම්මධාරයො.

406. යථාහි කම්මං ධාරෙති කිරියං ච පයොජනං
තථායං සමාසො'පි ධාරෙතීති පවුච්චති.

407. විසෙසනපුබ්බො ච විසෙසනුත්තරො'පි ච
විසෙසනොභයපදො උපමානුත්තරො'පි ච,
සම්භාවනොවධාරො'ති ඡබ්බිධො කම්මධාරයො.

408. නීලුප්පලං කොණ්ඩථෙරො සෙතලොහිතකම්පි ච
සබ්බපණ්ඩර ගුණබුද්ධි ගුණධනාදි නිදස්සනං.
විසෙසනසමාසොයං විසෙස්සනියතම්භවෙ.

---

405. එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; කච්චායනෙ, කාත්‍යායනයෙහි; සුපාකටං, අතිශයින් ප්‍රකටයි; කම්මං ඉව, කර්ම්ය මෙන්; නාමද්වයං, නාමදෙකක්; ධාරෙයි, දරානුයි; කම්මධාරයො, කර්මධාරයනම්වේ.

406. යථා, යේ මෙසේයි; හි, යම්හෙයකින්; කම්මං, කර්ම්යතෙම; කිරියං ච, ක්‍රියාවද; පයොජනං ච, එහි ප්‍රයොජනය හෙවත් ද්‍රව්‍යයෙදීමද; ධාරෙති, දරාද; තථා අපි, එපරිද්දෙන්ම; අයං සමාසො අපි, මේ සමාසයතෙමේද; ධාරෙති ඉති, (නාමයක්) දරායයි; පවුච්චති, කියනුලැබේ.

'විසෙසනො' යනාදීන් එහි භෙද දක්වත්.

407. විසෙසනපුබ්බොච, විශෙෂණපූර්වපදකර්මධාරයද; විසෙසනුත්තරො අපිච, විශෙෂණ උත්තරපද කර්මධාරයද; විසෙසනොභයපදො, විශෙෂණොභයපදකර්මධාරයද; උපමානුත්තරො අපිච, උපමානොත්තරපදකර්මධාරයද; සම්භාවනොවධාරොති,—සම්භාවනො, සම්භාවනපූර්වපද කර්මධාරයද; අවධාරො ඉති, අවධාරණපූර්වපදකර්මධාරයදැයි කියා; කම්මධාරයො, කර්මධාරයතෙම; ඡබ්බිධො, ෂඩ්විධයි.

408. නීලුප්පලං, (නීලඤ්ච තං උප්පලං චෙති) නීලුප්පලං යනුද; කොණ්ඩථෙරො, (කොණ්ඩො ච සො ථෙරො චාති) කොණ්ඩථෙරො යනුද; සෙතලොහිතකං අපි ච (සෙතං ච තං ලොහිතකඤ්ච) සෙතලොහිතකං යනුද; සබ්බපණ්ඩරං, (සබ්බම්ව පණ්ඩරං) සබ්බපණ්ඩරං යනුද; ගුණබුද්ධි, (ගුණො ඉති බුද්ධි) ගුණබුද්ධියනුද; ගුණධනං ඉති, (ගුණො එව ධනං) ගුණධනං යනුද; නිදස්සනං, (පටිපාටීන්) නිදර්ශනයි; අයං, මේ සමාසයතෙම; විසෙසනසමාසො, විශෙෂණසමාසනම් වේ; විසෙස්සං, විශෙෂ්‍යය; අනියතං භවෙ, අනියතවන්නේය.

409. බහවො වීහයො යස්ස බහුබ්බීහි නිද්දිසෙ
සදිසත්තා සමාසො'පි බහුබ්බීහීති මබ්‍රවුං.

410. දුතියා තතියා චාපි චතුත්ථී පඤ්චමී තථා
ඡට්ඨී ච සත්තමීචෙති බාහිරත්ථො ඡධා මතො.

411. උදාහරණමෙතෙසං කච්චායනෙ සුපාකටං
තග්ගුණාතග්ගුණාචෙති පුන ද්විධා පකාසිතො.

412. යත්ථ විසෙසනත්තෙන අඤ්ඤපදස්ස ගය්හතෙ
තග්ගුණොති සො ඤෙය්‍යො ලම්බකණ්ණාදිකො යථා.

413. යත්ථ පන න ගය්හති අතග්ගුණොති සො මතො
උදාහරණමෙතස්ස දිට්ඨගඞ්ගාදිකං මතං.

---

409. බහවො, බොහෝවූ; වීහයො, වී; යස්ස, යමෙකුගේද (හෙතෙම). බහුබ්බීහි ඉති, බහුබ්‍රීහිනම්යයි; නිද්දිසෙ, කියයි; සදිසත්තා (බහුබ්‍රීහි ශබ්දය හා අර්ථයෙන්) සමානබැවින්; සමාසො අපි, ඒ සමාසයද; බහුබ්බීහි ඉති, බහුබ්‍රීහිනමැයි; අබ්‍රවුං, කීහු;—'දුතියා' යනාදින් බහුබ්‍රීහි විශෙෂ දක්වුහ.

410. දුතියා, විතීයාබහුබ්‍රීහියද; තතියා ච අපි, තෘතීයාබහුබ්‍රීහියද; චතුත්ථි, චතුර්ථි බහුබ්‍රීහියද; තථා, එසේම; පඤ්චමී, පඤ්චමී බහුබ්‍රීහියද; ඡට්ඨී ච, ෂෂ්ඨී බහුබ්‍රීහියද; සත්තමීච ඉති, සප්තමී බහුබ්‍රීහියදැයි කියා; බාහිරත්ථො, බාහ්‍යවූ අර්ථඇති බහුබ්‍රීහිසමාසයතෙම; ඡධා, ෂට්පරිච්ඡෙදකින්; මතො, දන්නාලද්දේය.

411. එතෙසං, මොවුන්ට; උදාහරණං, නිදර්ශනය; කච්චායනෙ, කාත්‍යායන යෙහි; සුපාකටං, අතිශයින් ප්‍රකටයි: තග්ගුණාතග්ගුණාචෙති, තද්ගුණ සංවිඥානබහුබ්‍රීහියද අතද්ගුණසංවිඥානබහුබ්‍රීහියදැයි යයිහ; පුන, නැවත; ද්විධා, දෙපරිච්ඡෙදකින්; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය; (තස්ස අඤ්ඤපදස්ස ගුණො තග්ගුණො, තෙන සහ සංවිඤ්ඤාණොති තග්ගුණසංවිඤ්ඤාණො—න තග්ගුණසංවිඤ්ඤාණො අතග්ගුණසංවිඤ්ඤාණො.)

412. යත්ථ, යම් බහුබ්‍රීහි සමාසයෙක්හි; අඤ්ඤපදස්ස අන්‍යො, අන්‍ය පදාර්ථයතෙම; විසෙසනත්තෙන, විශෙෂණයා හා එක්කොට; ගය්හතෙ, ගණු ලැබේද; සො, ඒබහුබ්‍රීහි සමාසයතෙම; තග්ගුණො ඉති, තද්ගුණ සංවිඥාන යයි; ඤෙය්‍යො, දතයුත්තේය; යථා, ඒ මෙසේයි; ලම්බකණ්ණාදිකො, (ලම්බා කණ්ණා යස්ස සො) ලම්බකණ්ණො යනාදියයි.

413. යත්ථ පන, යම් බහුබ්‍රීහිසමාසයෙක්හි වනාහි; න ගය්හති, (විශෙෂණයා හා එක්කොට අන්‍යපදාර්ථය ගණු නොලැබේද; සො, ඒ සමාස

414. එකභාවිනෙකභාවිවසා දිගු ද්විධා මතො
එකො සමාහතො තත්ථ අනෙකොසමාහතො.

415. යථා තං තිමල'න්ත්‍යාදි පඤ්චින්ද්‍රියානිත්‍යාදයො
ඉච්චෙවං ලක්ඛණවසං නිස්සාය දිගුනාමකො.

416. සඞ්ඛ්‍යාපුබ්බනපුංසකභාවෙනාපි දිගු මතං
වෙභාවෙ වා දිගුනාම සදිසත්තා අයං යථා.

417. වෙ වෙ නාම සදිසත්ථා චන්ද'ති සමුදීරිතො
වෙ වෙ පදනි වෙකත්ථ සමොධානා'ති වා පන.

---

යනෙතම; අතබ්බගුණෙණ ඉති, අතද්ගුණසංවිඤ්ඤානයයි; මතො, දන්නාලද්දේය; දීඝනඛාදිකා, (දීඝපුබ්බා ගබ්භා අනෙනාති) දීඝගබ්භා යනාදිය; එතස්ස, මීට; උදාහරණං, උදාහරණයයි; මතං, දන්නාලදී.

දිගුප්‍රභෙද දක්වනු පිණිස 'එකභාවි' යනාදිය ආරබ්ධයි.

414. එකභාවිනෙකභාවිවසා, එකභාවිය අනෙකභාවිය යන මොවුන්ගේ වශයෙන්; දිගු, දිගුසමාසය තෙම; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නා ලද්දේය; තත්ථ, ඔවුන් අතුරෙන්; එකො, එකභාවිදිගුසමාසය තෙම; සමාහතො, සමාහාර නම් වේ; අනෙකො තු, අනෙකභාවිදිගුසමාසය වනාහි; අසමාහතො, අසමාහාර නම් වේ.

415. යථා තං, හේ මෙසේයි; තිමලං ඉති, (තීනි මලානි සමාහටානි) තිමලං යන; ආදි, මේ ආදිය (සමාහාර දිගු සමාසයට නිදර්ශන) යි; පඤ්චින්ද්‍රියානි ඉති, (පඤ්ච ඉන්ද්‍රියානි) පඤ්චින්ද්‍රියානි යන; ආදයො, මේ ආදිහු (අසමාහාර දිගු සමාස) යි; ඉති එවං, මෙපරිද්දෙන්; ලක්ඛණවසං, උදාහරණමය; නිස්සාය, ඇසුරු කොට; දිගුනාමකො, 'දිගුසමාස' යයි නම් ඇත්තේ වේ.

416. සඞ්ඛ්‍යාපුබ්බනපුංසකභාවෙන අපි, සඞ්ඛ්‍යාවාචීශබ්දයක් පූර්ව කොට ඇතිබවය නපුංසකත්වය යන මොවුන්ගේ වශයෙන්ද; දිගු, දිගුසමාසය; මතං, දන්නාලද; වෙභාවෙ වා, ගවයින් දෙදෙනෙක් හෝ; දිගුනාම, දිගු නම් වේ; සදිසත්තා, තත්සදෘශභාවයෙන්; අයං, මේ සමාසයද; යථා, එසේම දිගු නම් වේ.

ඉක්බිති චන්වලක්ෂණ දක්වන්නේ 'වෙ වෙ' යනාදිය කීහු.

417. සදිසත්ථා, (අඤ්ඤමඤ්ඤසම්බන්ධාපීඅති බැවින්) සමානාර්ථ ඇති; නාම, නාමයෝ; වෙ වෙ, දෙදෙනෙක් දෙදෙනෙක්; චන්ද ඉති, චන්වයයි; සංදීරිතො, (පූර්වාචාර්යයන් විසින්) කපිතයි; වා පන, නොහොත්; පද

418. සමාහාරෙ සමුච්චයො තථා අන්වාචයො'පිච
ඉතරීතරයොගො ච ද්වන්දො නාම චතුබ්බිධො.

419. සමාසො පන ද්වීසෙව හොන්තීති පරිදීපයෙ
කෙචි සමාසො සබ්බෙසු හොති වදන්ති කාමතො.

420. සඞ්ඛපණවං රාමජ්ජුනා සමාහාරසමුච්චයා
සමණබ්‍රාහ්මණා අන්වා දෙවදත්තයඤ්ඤදත්තා.

421. නිච්චකලහං හොති ඉතරීතරයොගතා
ඉති තෙ කෙචි වදන්ති තෙහි වුත්තං විචාරිතං.

---

නි ච, පදයෝද; වෙ වෙ, දෙදෙනෙක් දෙදෙනෙක්; එකතෝ, එකතැන හෝ එකට; සමොධානා ඉති, රැස්වනහෙයින්ද ද්වන්ද්වයයි කියනලද.

'සමාහරෙ' යනාදින් ද්වන්ද්ව භෙද දක්වූහ.

418. ද්වන්ද නාම, ද්වන්ද්වය නම්; සමාහාරෙ, සමාහාරද්වන්ද්වය ද; සමුච්චයො, සමුච්චයද්වන්ද්වයද; තථා, එසේම; අන්වාචයො අපිච, අන්වාචය ද්වන්ද්වයද; ඉතරීතරයොගො ච, ඉතරේතරයොගද්වන්ද්වයදැයි කියා; චතුබ්බිධො, සිව්වැදෑරුම් වේ.

419. සමාසො පන, මේ ද්වන්ද්වසමාසය වනාහි; ද්වීසු එව, (සමාහාර ඉතරීතරයොග) දෙක්හි ම; හොන්ති ඉති, වේයයි; පරිදීපයෙ, කියන්නේය; සමාසො, මේ සමාසයතෙම; සබ්බෙසු, (සමාහාරාදි) සියල්ලෙහි; හොති, වේයයි; කෙචි, ඇතම් ආචාය්‍යීකෙනෙක්; කාමතො, ඉච්ඡාවශයෙන්; වදන්ති, කියත්.

කිසි ආචාය්‍යීකෙනෙකුගේ මතප්‍රකාර නිදශීන කරන්නෝ 'සංඛපණවං යනාදිය කීහ.

420. සඞ්ඛපණවං, (සඞ්ඛො ච පණවො ච) සඞ්ඛපණවං යනු ද; රාමජ්ජුනා (රාමො ච අජ්ජුනො ච) රාමජ්ජුනා යනු ද; සමාහාරසමුච්චයා, සමාහාර ද්වන්ද්ව සමුච්චයද්වන්ද්ව සමාසයි; සමණබ්‍රාහ්මණා, (සමණො ච බ්‍රාහ්මණො ච) සමණබ්‍රාහ්මණා යනු ද, දෙවදත්තයඤ්ඤදත්තා, (දෙවදත්තො ච යඤ්ඤදත්තො ච) දෙවදත්ත යඤ්ඤදත්තා යනුද; අන්වා, අන්වාචයද්වන්ද්වසමාසයි.

421. නිච්චකලහං, (නිච්චං ච කලහං ච) නිච්චකලහං යනුද; ඉතරීතර යොගතා, ඉතරීතරයොගද්වන්ද්වබව; හොති, වේ; තෙ කෙචි, ඒ කිසි ආචාය්‍යීකෙනෙක්; ඉති, මෙසේ; වදන්ති, කියත්; තෙහි, ඔවුන් විසින්; වුත්තං, කියනලද්ද; විචාරිතං, විචාරණීය කටයුතු.

දැන් අභ්‍යසීභාවප්‍රභෙද දක්වන්නෝ 'නාම' යනාදිය ආරම්භ කළෝ.

422. නාමපුබ්බපදෙ චෙව තථා අබ්‍යයපුබ්බකො
අබ්‍යයීභාවො ද්විධා හොති බ්‍යයං න යන්ති අබ්‍යයා.

423. ගවම්පතීත්‍යාදිපඨමං දුතියං උපනගරං
සබ්බවිභත්තිලිඞ්ගෙසු වචනෙසු ච නාඤ්ඤථා.

424. පුබ්බුත්තරප්පධානා ච උභයඤ්ඤප්පධානකා
අබ්‍යයීභාවසමාසො දිගු ච පුබ්බඋත්තමො.

425. උත්තරපධානො සමාසො තප්පුරිසොති වුච්චති
උභයපධානො ද්විධො වණ්ණෙ ච කම්මධාරයො.

426. අඤ්ඤපදත්ථප්පධානො බහුබ්බීහි මුදීරිතො
විභත්තියා අලොපත්තා අලුත්තොති පවුච්චති.

---

422. නාමපුබ්බපදෙ ච එව, නාමපූර්වපදඅව්‍යයීභාවසමාසයද; තථා, එසේම; අබ්‍යයපුබ්බකො, අව්‍යයපූර්වකඅව්‍යයීභාවසමාසයද්දැයි කියා; අබ්‍යයීභාවො, අව්‍යයීභාවයතෙම; ද්විධා, දෙපරිද්දෙකින්; හොති, වේ; බ්‍යයං, විනාශයට; න යන්ති, නොපමුණුවත්නුයි; අබ්‍යයා, අව්‍යය නම් වෙත්.

423. ගවම්පති ඉති, (ගවස්ස පති) ගවම්පති යනු; ආදි, මේ ආදිය; පඨමං, පළමුවන (නාමපූර්වපදයට උදාහරණ) යි; උපනගරං, (නගරස්ස සමීපෙ වත්තතීති) උපනගරං යනු; දුතියං, දෙවැන්නට (උදාහරණ) යි; සබ්බවිභත්තිලිඞ්ගෙසු, සියලුවිභක්ති හා ලිඞ්ගයන්හි ද; වචනෙසු ච, වචනයන්හි ද; අඤ්ඤථා, අන් පරිද්දෙකින්; න, නො වේ; (වෙනස් නො වේ යනු භාවයි). ‘පධානං චතුධා සියං’ යි කිහෙයින් ඒ දක්වනු සඳහා මෙහි ‘පුබ්බ, යනාදීන් ආරබ්ධයි.

424, පුබ්බුත්තරප්පධානා ච, පූර්වපදප්‍රධාන උත්තරපදප්‍රධානයෝ ද; උභයඤ්ඤප්පධානකා, උභයපදප්‍රධාන අන්‍යපදප්‍රධානයෝද්දැයි කියා සමාසයෝ සිව්පරද්දෙකින් වෙත්; අබ්‍යයීභාවසමාසො, අව්‍යයීභාවසමාසය පුබ්බඋත්තමො, පූර්වපදෙත්තම වේ; (පූර්වපදප්‍රධානය යන අර්ථයි.) දිගු ච, දිගුසමාසය ද; (එසේම පූර්වපදප්‍රධාන වේ.)

425. උත්තරපධානො, උත්තරපදාර්ථප්‍රධානවූයේ; තප්පුරිසො සමාසො ඉති, තත්පුරුෂ සමාසයයි; වුච්චති, කියනු ලැබේ; වණ්ණෙ ච, වර්ණසමාසයද; කම්මධාරයො, කර්මධාරයද්දැයි කියා; උභයපධානො, උභයපදාර්ථප්‍රධාන සමාසයතෙම; ද්විධො, දෙවැද්දෑරුම්.

426. අඤ්ඤපදත්ථප්පධානො, අන්‍යපදාර්ථප්‍රධානවූයේ; බහුබ්බීහි, බහුව්‍රීහි යයි; උදීරිතො, කියනලද්දේය. විභත්තියා, විභක්තිනුගේ; අලොපත්තා, ලොප්නැතිබැවින්; අලුත්තො ඉති, අලුප්තසමාසයයි; පවුච්චති, කියනු ලැබේ.

427. තං යථා උරසිලොමො ඉතරො ච සුපාකටො
නිච්චමෙව සමාසත්තා නිච්චසඤ්ඤො පවුච්චති.

428. කුම්භකාරො නිච්චං හොති කුම්භං කාරො'ති නො සියා
රාජපුත්තාදිකො ඤෙය්‍යො අනිච්චො'ති විභාවිනා.

429. ලුත්තාලුත්තත්ථවසා පුන ද්විධා විධීයතෙ
ලුත්තෙත්ථ පඤ්චධා වුත්තො ඉතරො එකධා මතො.

430. සම්බන්ධත්ථො සංගතත්ථො සංරක්ඛිතත්ථසංසට්ඨත්ථා
පුථුකත්ථානමෙකත්ථභාවො'ති පඤ්චධා මතො.

431. සපුත්තො දුක්ඛසිතො ච රාජපුරිසො සහොදනො
සෙතපටො ඉමෙ තෙසං යථාසඞ්ඛ්‍යං නිදස්සනා.

---

427. තංයථා, හේමෙසේයි; උරසිලොමො, (උරසි ලොමානි යස්ස බ්‍රාහ්මණස්ස සොයං) උරසිලොමො යනුයි; ඉතරො, අන්‍ය (ලුප්ත සමාසය) තෙම; සුපාකටො, සපකටයි; නිච්චං එව, නිත්‍යයෙන්ම; සමාසත්තා, සමාසවනහෙයින්; නිච්චසඤ්ඤො, නිත්‍යසංඥාඇතිසමාසයයි; පවුච්චති, කියනුලැබේ.

428. කුම්භකාරො, කුම්භකාරො යන්න; නිච්චං හොති, නිත්‍යයෙන් වේ; කුම්භං කාරො ඉති, කුම්භං කාරො කියා; නො සියා, (කිසිකලෙක) නොවන්නේය; රාජපුත්තාදිකො, රාජපුත්තො යන ආදිය; අනිච්චො ඉති, අනිත්‍ය සමාසයයි; විභාවිනා, ප්‍රාඥයා විසින්; ඤෙය්‍යො, දතයුතු.

(රඤ්ඤො පුත්තො, කියා කිසිතැනෙක අසමාසවද සිටී යනු භාවයි.)

නැවතද සමාසභෙදයක් දක්වනු පිණිස 'ලුත්තත්ථා' යනාදිය අරබ්ධයි.

429 පුන, නැවත; ලුත්තාලුත්තත්ථවසා, ලුප්තාර්ථසමාස අලුප්තාර්ථ සමාසයන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින්; විධීයතෙ, කියනුලැබේ; ලුත්තෙත්ථ, ලුප්තාර්ථසමාසයතෙම; පඤ්චධා, පඤ්චප්‍රකාරයෙකින්; වුත්තො, කියනලද්දේය; ඉතරො, අන්‍යවූ අලුප්තාර්ථසමාසයතෙම; එකධා, එකප්‍රකාරයෙකින්; මතො, අභිප්‍රෙතයි.

430. සම්බන්ධත්ථො, සම්බන්ධාර්ථය; සංගතත්ථො, සංගතාර්ථය; සංරක්ඛිතත්ථසංසට්ඨත්ථා, සංරක්ෂිතාර්ථ සංසෘෂ්ටාර්ථයෝය; පුථුකත්ථානමෙකත්ථභාවො ඉති, පුථුකත්ථානමෙකත්ථභාවයයි; පඤ්චධා, පස්පරිද්දෙකින්; මතො, (ලුප්තාර්ථ සමාසය) දත්තාලද්දේය.

431. සපුත්තො, (සහපුත්තෙන පිතා වත්තතීති) සපුත්තොය; දුක්ඛසිතො, (දුක්ඛෙන සංසීදතීති) දුක්ඛසිතොය; රාජපුරිසො, (රඤ්ඤො

432. අවඤ්ඤමුල්ලොකිකානිච්චාදි ඉතරෙ මතො
එවමෙව ඉමෙ සෙසො අලුත්තන්තො විලක්ඛණෙ.

433. එකාදසසු ඨානෙසු සමාසසඤ්ඤා; විවජ්ජිතා
නිද්ධාරණෙ පූරණෙ ච ගුණවචනෙ සුහිතත්ථෙ.

434. සතත්ථෙ අබ්‍යයත්ථෙ ච තබ්බපච්චයෙපි ච
අසමානාධිකරණෙ තප්පච්චයන්තකෙපි ච.
කම්මනි කත්තරිචෙව ඉමෙ ඤෙය්‍යා පණ්ඩිතො.

435. නාරීනං රූපවා හොති පුරිසානං පවරො ජනො
කාකස්ස හි කණ්හා පක්ඛා එලානං සුඛිතො ඉසි,
භික්ඛාය සතප්පිතො සො බ්‍රාහ්මණස්ස කත්වා(තබ්බා)දි.

---

පුරිසො) රාජපුරිසොය; සප්පාදතො,* (සප්පිනා සංසට්ඨො ඔදනො) සප්පොදනොය; සෙතපතෙනා, (සෙතො ච සො පතෙනා චාති) සෙත පතෙනාය; ඉමෙ, යන මොහු; තෙසං, ඒ සමාසයන්ට; සරූපසඛ්‍යං, පිළිවෙළින්; නිදස්සනා, නිදර්ශනයෝයි.

432 අවඤ්ඤමුල්ලොකිකාති ඉති ආදි, (න වඤ්ඤං ඔලොකෙ භාතීති) අවඤ්ඤ මුල්ලොකිකාති යන මේ ආදිය; ඉතරෙ, අන්‍යවූ අලුක්තාර්ථසමාසයයි; මතො, දන්නාලදී; එවං එව, මෙපරිද්දෙන් ම; ඉමෙ, මෙයින්; සෙසො, ශෙෂවූ; අලුත්තන්තො, අලුක්තාර්ථසමාසයතෙම; විලක්ඛණෙ, විශෙෂයෙන් ලක්‍ෂ්‍ය කටයුත්තේය.

මීට අනතුරුව අසමාසවිධි දක්වන්නෝ 'එකාදසසු' යනාදිය කීවෝ.

433–434. නිද්ධාරණෙ, (භෂ්ඨී) නිර්ධාරණාර්ථයෙහිද; පූරණෙ, (සඛ්‍යා) පූරණතද්ධිතයෙහි ද; ගුණවචනෙ, ගුණකථනයෙහි ද; සුහිතත්ථෙ, සුහිත ශබ්දප්‍රයොගාර්ථයෙහි ද; සතත්ථෙ, සතශබ්දයාගේ අර්ථයෙහි ද; අබ්‍ය යත්ථෙ ච, අව්‍යයාර්ථයෙහි ද; තබ්බපච්චයෙ අපි ච, තබ්බප්‍රත්‍යයාගේ යොග යෙහි ද; අසමානාධිකරණෙ, අසමානාධිකරණාර්ථයෙහිද; තප්පච්චයන්තකෙ අපි ච, තප්‍රත්‍යයාගේ අන්තයෙහිද; කම්මනි, කර්මාර්ථයෙහිද; කත්තරි ච එව, කර්තෘඅර්ථයෙහිද; (යන) එකාදසසු ඨානෙසු, එකාදශස්ථානයෙහි; සමාස සඤ්ඤා, සමාසසංඥාතොමෝ; විවජ්ජිතා, විශෙෂයෙන් හරිණලද්දීය; ඉමෙ, මේ සමාස වර්ජිතස්ථානයන්; පණ්ඩිතො, පණ්ඩිතතෙම; ඤෙය්‍යා, මෙසේ දත්තේය.

'නාරීනං' යනාදින් යට කී එකාදශාකාරයන්ට නිදර්ශනකළහ.

435. නාරීනං, ස්ත්‍රීන් අතුරෙන්; රූපවා හොති, රූඇත්තී (දර්ශිනී) වේ; (මෙනිර්ධාරණාර්ථයෙහි සමාසනූවූතැනි) පුරිසානං, පුරුෂයන්ගේ; පව

436. බ්‍රාහ්මණස්ස කත්තබ්බන්ති ජිනස්ස මහන්තො යසො
ගරුළෙන හතො නාගො වත්ථානං ධොවනං අහො.

437. බ්‍රාහ්මණස්ස කතො යසො ජිනස්ස ගත්තො සුජාතො
යථාක්කමං ඉදං තෙසං උදාහරණ දීපනං.

ඉති සද්දසාරත්ථජාලිනියා සමාසකණ්ඩො ජට්ඨො.

—— ◌0◌ ——

438. තෙසං හිතං අපච්චාදිගණ්ණිතං ඉති තද්ධිතං
තථා තිවිධලිඞ්ගානං හිතං වා,තිපි තද්ධිතං

439. තෙසං සිස්සාන හිතං වා තද්ධිතං තෙනමීරිතා
තං හිතං'තිපි වත්තබ්බෙ හකාරස්ස ධකාරතා.

---

මො, පස්වැනිවූ; ජනො, ජනතෙමේයි; (මේපුරණාර්ථයි) කාකස්ස හි, කාකයාගේ වනාහි; කණ්හා පක්ඛා, කාලවර්ණපක්ෂයෝයි; (මේගුණ වචනාර්ථයි) ඉසි, ඍෂිතෙම; එලානං, එළුයෙන්; සුහිතො, පිණාගියේය, (මේසුහිතාර්ථයි) සො, හෙතෙම; භික්ඛාය, භික්ෂාවෙන්; සන්තප්පිතො, තප්පිතය; (මේ සන්තප්පිතාර්ථයි) බ්‍රාහ්මණස්ස, බ්‍රාහ්මණයාහට; කත්වා; සත් කාර කොට; (මේ අව්‍යයාර්ථයි) ඉති ආදි, යනමේ ආදියයි.

436. බ්‍රාහ්මණස්ස, බ්‍රාහ්මණයාගේ; කත්තබ්බං, කටයුත්ත; ඉති, මෙසේයි; (මේ තබ්බප්‍රත්‍යයාර්ථයි) ජිනස්ස, සර්වඥයන්වහන්සේගේ; මහන්තො, මහත්වූ; යසො, කීර්තියයි; (මේ අසමානාධිකරණාර්ථයි) ගරුළෙන, ගරුඩා විසින්; හතො, නසනලද; නාගො, නාගයායි; (මේ තෘතීයාර්ථයි) (අරජ කෙන, රදකුවුවනුවිසින්) වත්ථානං, වස්ත්‍රයන්; ධොවනං, ධොවනය කිරීම; අහො, ආශ්චර්‍ය්‍යයි; (මේ කර්මාර්ථයි.)

437. බ්‍රාහ්මණස්ස, බමුණාට; කතො, කළාවූ; යසො, සත්කාරයයි; ජිනස්ස, සර්වඥයන් වහන්සේගේ; ගත්තො, ශරීරය; සුජාතො, මොනවට හටගත්තේය; (මේ කර්තෲර්ථයි) තෙසං, ඒ එකාදශාකාරයන්ට; යථාක්කමං, පටිපාටීන්; ඉදං, මේ; උදාහරණ දීපනං, උදාහරණදක්වීමයි.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනී නම් ප්‍රකරණයෙහි; ජට්ඨො, සවනවූ; සමාසකණ්ඩො, සමස්කඩ; ඉති, මෙසේයි.

—— ◌0◌ ——

මෙසේ සමාසසාරය දක්වා ඉක්බිති තද්ධිතසාරය දක්වන්නෝ
'තෙසං' යනාදිය ආරම්භ කළහ.

438. තෙසං අපච්චාදිගණ්ණිතං, ඒ අපත්‍යාදිඅර්ථසමූහයන්ට; හිතං ඉති, හිත වූයේනුයි; තද්ධිතං, තද්ධිතනම්; තථා, එසේම; තිවිධලිඞ්ගානං, ත්‍රිවිධලිඞ්ග යන්ට; හිතං වා ඉති අපි, හිතවූයේ හෝ නුයිද; තද්ධිතං, තද්ධිතනම්.

439. තෙසං සිස්සානං, ඒ (ශ්‍රවණාදියෙහි නියුක්ත) ශිෂ්‍යයන්ට; හිතං වා, හිතවූයේ හෝ; තද්ධිතං, තද්ධිතනම්; තෙන, එහෙයින්; තං හිතං ඉති අපි,

440. දකාරාගමං කත්වා වා වදන්ති ච සුබුද්ධිනො
මහාදෙසසුත්තෙන නිරුත්තිලක්ඛණෙන වා

441. සාමඤ්ඤබ්‍යයභාවානං වසෙන තිවිධං මතං
තත්ථ සාමඤ්ඤතද්ධිතං තිවිධං ඊරිතං පුන.

442. අපච්චානෙකසඞ්ඛ්‍යානං වසෙන තස්ස ලක්ඛණං
අපච්චං තත්ථ තිවිධං හීනමජ්ඣිමඋත්තමා.

443. වාසිට්ඨො ගොතමො චෙව කච්චායනො අග්ගිවෙස්සනො
මොග්ගල්ලානො ච නාදෙය්‍යො උත්තමො'ති පවුච්චති.

---

තං හිතං කියා; වත්තබ්බ, කියයුතුතන්හි; හකාරස්ස, හකාරයාගේ; ධකාරතා, ධකාරතාතොමෝ; ඊරිතා, කියනලදී.

440. මහාදෙසසුත්තෙන, මහාදෙශසූත්‍රයෙන් හෝ; නිරුත්තිලක්ඛණෙන වා, නිරුක්තිලක්‍ෂණයෙන් හෝ; දකාරාගමං කත්වා වා; දකාරාගම කොට හෝ; සුබුද්ධිනො, යහපත් ප්‍රඥාන්විතයෝ; වදන්ති, තද්ධිතශබ්දයාගේ සිද්ධිය කියත්.

'සාමඤ්ඤ' යනාදීන් සඞ්ක්‍ෂෙපවශයෙන් එහි ප්‍රභෙද කීහ.

441. සාමඤ්ඤඅබ්‍යයභාවානං, සාමාන්‍යතද්ධිතය අව්‍යයතද්ධිතය භාවතද්ධිතය යනමොවුන්ගේ; වසෙන, වශයෙන්; තිවිධං, (තද්ධිත) ත්‍රිවිධයයි; මතං, දන්නාලදී; පුන, නැවත; තත්ථ, ඔවුන් අතුරෙන්; සාමඤ්ඤතද්ධිතං, සාමාන්‍යතද්ධිතය; තිවිධං, ත්‍රිවිධයයි; ඊරිතං, කියනලදී.

442. අපච්චානෙකසඞ්ඛ්‍යානං, අපච්චතද්ධිතය අනෙකාර්ථතද්ධිතය සඞ්ඛ්‍යාතද්ධිතය යනමොවුන්ගේ; වසෙන, වශයෙන්; තස්ස, ඒ සාමාන්‍යතද්ධිතයාගේ; ලක්ඛණං, ලක්‍ෂණ (දතයුතු); තත්ථ, ඔවුන් අතුරෙන්; අපච්චං, අපච්චතද්ධිතය; හීනමජ්ඣිමඋත්තමා, හීන මධ්‍යම උත්තමවශයෙන්; තිවිධං, ත්‍රිවිධ යි.

443. වාසිට්ඨො, (වසිට්ඨස්ස අපච්චං පුමෙනො) වාසිට්ඨො යනුද; ගොතමො ච එව, (ගොතමස්ස අපච්චං පුමෙනො) ගොතමො යනු ද; කච්චායනො, (කච්චස්ස අපච්චං පුමෙනො) කච්චායනො යනුද; අග්ගිවෙස්සනො, (අග්ගිවෙස්සස්ස අපච්චං පුමෙනො) අග්ගිවෙස්සනො යනු ද; මොග්ගල්ලානො ච, (මොග්ගලියා අපච්චං පුමෙනො) මොග්ගල්ලානො යනුද; නාදෙය්‍යො, (නදියා අපච්චං පුමෙනො) නාදෙය්‍යො යනු ද; උත්තමො ඉති, උත්තමතද්ධිත යයි; පවුච්චති, කියනුලැබේ.

444. වාසුදෙවො ච වච්ඡො ච නාරායණො ච මජ්ඣිමො *
කණ්හාදිපච්චයොත්තං හි ඝිනො නාමා’ති වුච්චතෙ.

445. ණො ණායනො ච ණානො ච ණෙය්‍යො ණෙරො ණවොපි ච
ණි ච ණිකො ච අට්ඨෙතෙ අපච්චෙ හොන්ති පච්චයා.

446. තරත්‍යාදිතද්ධිතෙසු චතුරො පච්චයා මතා
මෙ පච්චයා ණිකො එකො විසු සුත්තෙසු වත්තරෙ.

447. විකප්පාදිගහණෙන වුත්තා ණිකණියා දුවෙ
රාගාදිතද්ධිතෙ එකො පච්චයො සණිකාරකො.

448. ඉමඉයා,ච සුත්තන්ත ඉමියාදිගහණෙනච
කියොපි ච වසෙද්දන ජන්‍යාදිං හොන්ති පච්චයා.

---

444. වාසුදෙවො ච, (විසුදෙවස්ස අපච්චං පුත්තො) වාසුදෙවො යනු ද; වච්ඡො ච, (වච්ඡස්ස අපච්චං පුත්තො) වච්ඡො යනු ද; නාරායණො ච, (නරායනස්ස අපච්චං පුත්තො) නාරායණො යනුද; මජ්ඣිමො, මධ්‍යම තද්ධිතයයි; අපිච, සලිදු; කණ්හාදිගොත්තං හි, (කණ්හස්ස අපච්චං පුත්තො) කණ්හා යනාදිගොත්‍රය වනාහි; ඝිනො නාම ඉති, ඝින තද්ධිත නමැයි; වුච්චතෙ, කියනුලැබේ.

445. ණො, ණ ප්‍රත්‍යය ද; ණායනො ච, ණායන ප්‍රත්‍යය ද; ණානො ච, ණාන ප්‍රත්‍යය ද; ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය ද; ණෙරො, ණෙර ප්‍රත්‍යය ද; ණවො අපි ච, ණව ප්‍රත්‍යය ද; ණිච, ණි ප්‍රත්‍යය ද; ණිකො ච, ණික ප්‍රත්‍යය ද; (යන) එතෙ පච්චයා අට්ඨ, මේ ප්‍රත්‍යයයෝ අටදෙන, අපච්චෙ, අපච්ච තද්ධිතයෙහි; හොන්ති, වෙත්.

446. තරති ආදි, තරති (යනාදී) ආදිවූ; තද්ධිතෙසු, තද්ධිතයන්හි; චතුරො පච්චයා, ප්‍රත්‍යයයෝ සතරදෙනෙක්; මතා, දන්නාලදහ; එකො ණිකො, එකම ණික ප්‍රත්‍යය තෙම; මෙ පච්චයා, ප්‍රත්‍යයෝ දෙදෙනෙකැයි; ද්වීසු සුත්තෙසු, සූත්‍රවයෙහි; වත්තරෙ, පවත්ත්.

447. විකප්පාදිගහණෙන, (යෙන වා සංසට්ඨං, යනාදි සූත්‍රයෙහි) විකල්ප වාචීවාශබ්දග්‍රහණයෙන් ද, (තමධීතෙ, යනාදිසූත්‍රයෙහි) ආදිශබ්දග්‍රහණයෙන්; ණිකණියාදුවෙ, ණිකණිය යන ප්‍රත්‍යයයෝ දෙදෙන; වුත්තා, කියනලද්දාහ.—රාගාදිතද්ධිතෙ, රාගාදිතද්ධිතයෙහි; සණිකාරකො, ණිකාර සහිතවූ; එකො පච්චයො, එක්ප්‍රත්‍යයෙක් වේ.

448. සුත්තන්ත, (ජන්‍යාදීනමිමියාච යන) සූත්‍රයෙන්; ඉමඉයා එව, ඉම ඉය ප්‍රත්‍යයයෝ දෙදෙනම වෙත්; ආදිගහණෙන, ආදිශබ්දග්‍රහණයෙන්;

---

* වාසුදෙවොත්‍යාදී ච න්‍යාගරා මජ්ඣිමො නාම—පදීපිකායි.

449. කණ්ණතා පච්චයා චෙව සමූහතද්ධිතෙ තයො,
පච්චයා හොන්ති එකා තා ලිඞ්ගත්තයෙ න වත්තති. *

450. ඊයො ච පච්චයො එකො වත්තතෙ ඨානතද්ධිතෙ
සද්දසත්ථෙ ඉලඉයා තෙචිධ න විවාරිතා.

451. උපමාතද්ධිතෙ එකො ආයිතත්තං ච ජායති
සද්දසත්ථෙ ඉව වියා තෙච මෙ ධ න දිස්සරෙ.

452. නිස්සිතෙ තද්ධිතෙ එකො ලොචෙ විධ පකාසිතො
සද්දසත්ථෙතු ලොතනමිති පච්චයා සමුදීරිතා.

---

ඉමියිකා, සෙසුඅරුතෙහි ඉමඉයඉකප්‍රත්‍යයයෝ වෙත්; චසද්දෙන, ච ශබ්දයෙන්; අපිච, යලිදු; කියො, කියප්‍රත්‍යයද වේ; ජාත්‍යාදිං, ජාත්‍යාදි තද්ධිතයෙහි; පච්චයාජ, (මෙසේ) ප්‍රත්‍යයයෝ සදෙනෙක්; හොන්ති, වෙත්.

449. සමූහතද්ධිතෙ, සමූහතද්ධිතයෙහි; කණ්ණතා, කණ් ණ තා යන; තයො පච්චයාච එව, ප්‍රත්‍යයයෝ තුන්දෙනෙක්ම වෙත්; එකා තා, එක ම තා ප්‍රත්‍යය; ලිඞ්ගත්තයෙ, ලිඞ්ගත්‍රයෙහි, න වත්තති, නො පවත්නීය (ස්ත්‍රීලිඞ්ගයෙහිපමණයි;) පච්චයා; (අන්‍ය) ප්‍රත්‍යයෝ; හොන්ති, (ලිඞ්ගත්‍රයෙහි) වෙත්.

450. එකො ඊයො පච්චයො එව, එක ඊයප්‍රත්‍යය ම; ඨානතද්ධිතෙ, ඨාන තද්ධිතයෙහි; වත්තතෙ, පවතියි; සද්දසත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි නොහොත් අන්‍ය ව්‍යාකරණග්‍රන්ථයන්හි; ඉලඉයා, (තදස්සට්ඨානමීයොච, යන සූත්‍රයෙහි ච ශබ්දග්‍රහණයෙන්) ඉලඉයප්‍රත්‍යයයෝ (වෙත්යයි කියනලද්දාහ.) තෙ, ඒ (ඉලඉය) ප්‍රත්‍යයයෝ; ඉධ, මේ ප්‍රකරණයෙහි; න විවාරිතා, (ප්‍රයොග අදර්ශනයෙන්) විචාරණය නොකරණ ලද්දාහුය.

451. උපමාතද්ධිතෙ, උපමානතද්ධිතයෙහි; එකො ආයිතත්තං එව, හුදකලා ආයිතත්තප්‍රත්‍යය ම; ජායති, උපදියි; සද්දසත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි; ඉව වියා, ඉවවිය (යන ප්‍රත්‍යයයෝ ද ප්‍රකාශිතයහ); තෙච මෙ; ඒ ප්‍රත්‍යයෝ දෙදෙනාද; ඉධ, මේ (කාත්‍යායන) ප්‍රකරණයෙහි; න දිස්සරෙ, නො දක්නා ලැබෙත්.

452. නිස්සිතෙතද්ධිතෙ, නිඃශ්‍රිතතද්ධිතයෙහි; එකො ලොච එව, එකම ලප්‍රත්‍යයෙක්; ඉධ, මේ (කාත්‍යායන) ප්‍රකරණයෙහි; පකාසිතො, ප්‍රකාශ කරණලද්දේය; සද්දසත්ථෙතු, ශබ්දශාස්ත්‍රයෙහිවූකලි නොහොත් ප්‍රකරණයන්හි; ලොතනං ඉති, (ලො ච තනො ච) ලො තනා කියා; පච්චයා, ප්‍රත්‍යයයෝ (දෙදෙනෙක්); උදීරිතා, කියන ලද්දාහ.

---

* "යෙසු චෙ ඨිසු ලිඞ්ගෙසු යාථුඤ්ඤං පවත්තති" ඉච්චෙවමෙත්ථ පාඨො යුත්තං යුජ්ජති.

453. බහුලෙ තද්ධිතෙ එකො ආලුඑව ච ජයති
සත්ථෙ තු ආලුකොචාපි සොචාපිධ නදිස්සති.

454. තාරතම්ස්සිකියිට්ඨා පඤ්චසෙට්ඨක තද්ධිතෙ
තදස්සත්ථිතද්ධිතෙති වීසවීසිකාරවන්තුච
මන්තුචෙව සණිකාරො පච්චයා නව දීපිතා.

455. සත්ථෙ ඉවවියා චෙව තෙ ඊධ නපි දිස්සරෙ
පකතිතද්ධිතෙ එකො මයො එවච ජයති.

456. පූරණෙ පච්චයා පඤ්ච ඊමථඨා තියොපිච
තමඅප්පච්චයා සත්ථෙ තෙවාපිධ න දිස්සරෙ.

457. සඞ්ඛ්‍යායතද්ධිතෙ එකො පච්චයො කො'ව නිස්සිතො
විභාගෙ තද්ධිතෙ ධා සො පච්චයා සමුදීරිතා.

---

453. බහුලෙ තද්ධිතෙ, බහුලතද්ධිතයෙහි; එකො ආලු එවච, එකම ආලු ප්‍රත්‍යයෙක්; ජයති, වෙයි; සත්ථෙ තු, ශබ්දශාස්ත්‍රයෙහි වනාහි; ආලුකො ච අපි, ආලුකප්‍රත්‍යයෙක්ද (දක්නාලැබේ); සොචාපි, හෙද; ඉධ, මෙහි, න දිස්සති, නොදක්නාලැබේ.

454. සෙට්ඨකෙ තද්ධිතෙ, ශ්‍රෙෂ්ඨතද්ධිතයෙහි; තරතම්ස්සිකියිට්ඨා, තර තම ඉස්සික ඉය ඉට්ඨ යන ප්‍රත්‍යයෝ; පඤ්ච, පස්දෙන; (වෙත්) තදස්සත්ථිඉති තද්ධිතෙ, අස්ත්‍යර්ථතද්ධිතයෙහි; වී, වීප්‍රත්‍යයද; සො, සොප්‍රත්‍යයද; ඊ, ඊප්‍රත්‍යයද; ස, සප්‍රත්‍යයද; ඉක, ඉකප්‍රත්‍යයද; ර, රප්‍රත්‍යයද; වන්තු ච, වන්තුප්‍රත්‍යයද; මන්තුච එව, මන්තුප්‍රත්‍යයද; සණිකාරො, ණකාරසහිත (ණ) ප්‍රත්‍යයද යන; නවපච්චයා, ප්‍රත්‍යයෝ නවදෙන; දීපිතා, දක්වනලද්දාහ,

455. සත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි; ඉවවියා ච එව, ඉවප්‍රත්‍යය වියප්‍රත්‍යය යන දෙකක් ද; (ප්‍රකාශකරණලද්දාහුය) තෙ ච අපි, ඒ ප්‍රත්‍යයයෝද; ඉධ, මේ (කාත්‍යායන) ප්‍රකරණයෙහි; න දිස්සරෙ, නොදක්නාලැබෙත්; පකති තද්ධිතෙ, ප්‍රකෘති තද්ධිතයෙහි; එකොමයො එවච, එකමමය ප්‍රත්‍යය; ජායති, උපදියි.

456. පූරණෙ, පූරණාර්ථයෙහි; ඊමථඨා, ඊප්‍රත්‍යය මප්‍රත්‍යය ථප්‍රත්‍යය ඨප්‍රත්‍යය යන මොහුද; තියො අපි ච, තියප්‍රත්‍යයද වෙත්; තම අප්පච්චයා, තම ප්‍රත්‍යය අප්‍රත්‍යය දෙදෙන; සත්ථෙ, ශබ්ද ශාස්ත්‍රයෙහි (දක්නාලැබෙත්) තෙවාපි, ඔහු ද; ඉධ, මෙහි; න දිස්සරෙ, නොදක්නා ලැබෙත්.

457. සඞ්ඛ්‍යායතද්ධිතෙ, සඞ්ඛ්‍යාතද්ධිතයෙහි; එකො, හුදකලා; කො පච්චයො එව, කප්‍රත්‍යයම; නිස්සිතො, ඇසුරුකරණලද්දේය; විභාගෙ, විභාග තද්ධිතයෙහි; ධා සො පච්චයා, ධා සො යන ප්‍රත්‍යයෝ; සමුදීරිතා, කියන ලද්දාහ.

458. පච්චයා'සිධ පණ්ණරස ථෙරෙනෙව පකාසිතා
ද්වාදස පච්චයා වජ්ජා නිරුත්තියං පකාසිතා.

459. අබ්‍යයෙ තද්ධිතෙකූනතිංසා'චප්පකාසිතා
තෙසු ධා'ථත්තා'විධංථා පකාරත්ථෙසු ජායරෙ.

460. පඤ්චම්‍යත්ථෙසු තො එකො සත්තම්‍යත්ථෙසු සෙසකො
උදාහරණමෙතෙසං නාමකප්පෙ සුපාකටං.

461. සදිසං තීසු ලිඞ්ගෙසු සබ්බාසුච විභත්තිසු
වචනෙසු ච සබ්බෙසු යං නබ්‍යෙති තදබ්‍යයං.

462. ත්වප්පච්චයා ච භාවෙ තු ණ්‍යත්තතාණකකණාපි ච
තුසද්දෙන ත්තනඤ්චෙව ථෙරෙන ඉධ භාසිතා

---

458. ඉධ; මේ සාමාන්‍යතද්ධිතයෙහි; පණ්ණරස පච්චයා, ප්‍රත්‍යයයෝ පසළොසක්; ථෙරෙන එව, (කාත්‍යායන) ස්ථවිරයන් විසින්ම; පකාසිතා, ප්‍රකාශකරණලද්දුහ; වජ්ජා, (කාත්‍යායනයෙන්) වර්ජිත වූ; ද්වාදස පච්චයා, ප්‍රත්‍යයයෝ දෙළසෙක්; නිරුත්තියං, නිරුක්තියෙහි; පකාසිතා, ඒ ඒ ආචාර්‍ය්‍යයන් විසින්) ප්‍රකාශිතයහ.

459. අබ්‍යයෙතද්ධිතෙ, අව්‍යයතද්ධිතයෙහි; එකූනතිංසා ච; එකුන්තිසක් ප්‍රත්‍යයෝ; පකාසිතා, ප්‍රකාශිතයහ; තෙසු, ඔවුන් අතුරෙන්; ධා, ධාප්‍රත්‍යයද; ථත්තා, ථත්තාප්‍රත්‍යයද; විධං, විධංප්‍රත්‍යයද; ථා, ථාප්‍රත්‍යයද; පකාරත්ථෙසු, ප්‍රකාරාර්ථයෙහි; ජායරෙ, වෙත්.

460. පඤ්චම්‍යත්ථෙසු, පඤ්චම්‍යර්ථයෙහි; එකොතො, හුදකලා තොප්‍රත්‍යය වේ; සෙසකා, ශෙෂයෝ; සත්තම්‍යත්ථෙසු, සප්තම්‍යර්ථයෙහි (වෙත්); එතෙසං, මොවුන්ට; උදාහරණං, උදාහරණ; නාමකප්පෙ, නාමකල්පයෙහි; සුපාටකං, සුප්‍රකටයි.

461. තීසු ලිඞ්ගෙසු, තුන්ලිඞ්ගයෙහිද; සබ්බාසු විභත්තිසුච, සියලු විභක්තීන්හිද; සබ්බෙසු වචනෙසුච, සියලුවචනයන්හිද; යං, යම් තද්ධිතයෙක්; න බ්‍යෙති, වෙනසට නොයේද; තං, එය; අබ්‍යයං අව්‍යයනම් වේ.

462. භාවෙ තු, භාවතද්ධිතයෙහි වනාහි; ණ්‍යත්තතාණකකණා අපිච, ණ්‍ය, ත්ත, තා, ණ, කණ් යනමේ ප්‍රත්‍යයෝද; තුසද්දෙන, (ණ්‍යත්තතා භාවෙ තු යනසූත්‍රයෙහි) තු ශබ්දයෙන්; ත්තනං ච එව, ත්තනප්‍රත්‍යයද; ථෙරෙන, (කාත්‍යායන) ස්ථවිරයන් විසින්; ඉධ, මේ කාත්‍යායනයෙහි; පකාසිතා, ප්‍රකාශකරණලද්දුහ.

463. ආනත්තං ත්වං ණිකණිකාණිණාපි භාවතද්ධිතෙ
ජප්පච්චයා තුසද්දෙන සද්දසත්ථෙ පකාසිතා.

464. ණ්‍යත්තතාතං නපුංසකං හොති නිච්චම්පි තා පන
හොතිත්ථිලිඞ්ගාවිතරං දුවිධන්ති පවුච්චති.
ඉති සද්දසාරත්ථජාලිනියා තද්ධිතකණ්ඩො සත්තමො.

——◡0◡——

465. ආචික්ඛති ක්‍රියං යස්මා ආඛ්‍යාතන්ති තතො මතං
පහාය අත්තනො කම්මං පරං කත්තාරමාදිය
පරස්සපද විඤ්ඤෙය්‍යං විඤ්ඤූනා වරබුද්ධිනා.

466. කත්තාරමපජහිත්වාන අත්තනො කම්ම නිද්දිසෙ
අත්තනොපදවිඤ්ඤෙය්‍යං පණ්ඩිතෙන සුබුද්ධිනා.

---

463. ආනත්තං ත්වං ණිකණිකයණිණාඅපි,–ආනත්තං ත්වං ණිකණිකයණිණ යන; ජප්පච්චයා අපි, ප්‍රත්‍යයෝ සදෙනද; තුසද්දෙන, (යටකී) තුශබ්ද යෙන්; භාවතද්ධිතෙ, භාවතද්ධිතයෙහි වෙත්යයි; සද්දසත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි; පකාසිතා, ප්‍රකාශකරණලද්දහ.

464. ණ්‍යත්තතාතං, ණ්‍යය ත්තය තාතය යනමේ ප්‍රත්‍යය ත්‍රිකය; නිච්චං අපි, නිත්‍යයෙන්ම; නපුංසකං හොති, නපුංසකලිඞ්ගිකවේ; තා පන, තාප්‍රත්‍යය වූකලී; ඉත්ථිලිඞ්ගා හොති, ස්ත්‍රීලිඞ්ගිකමවේ; ඉතරං, අසිරිත් ණ්‍යප්‍රත්‍යයාදිය, දුවිධංඉති, ස්ත්‍රීනපුංසක ලිඞ්ගවය ඇතැයි; පවුච්චති, කියනුලැබේ.

ඉති; මෙසේ; සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනියෙහි; තද්ධිත කණ්ඩො, තද්ධිතකාණ්ඩයතෙම; සත්තමො, සත්වැනියි.

——◡0◡——

මෙසේ තද්ධිතසාරය දක්වා ඉක්බිති ආඛ්‍යාතසාරය දක්වනු සඳහා 'ආචික්ඛති' යනාදිය ආරබ්ධයි.

465. යස්මා, යම්හෙයකින්; ක්‍රියං, ක්‍රියාව; ආචික්ඛති, කියාද; තතො, එහෙයින්; ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාතයයි; මතං, දන්නාලද්දේය; (මෙසේ වචනාර්ථය දක්වා ඉක්බිති පරස්මෛපදාදීන්ගේ ලක්ෂණ දක්වන්නෝ 'පහාය' යනාදී කීහු) අත්තනො කම්මං, ස්වකීයකර්මය; පහාය, හැර; පරං කත්තාරං, අන්‍යකර්තෘවක්; ආදිය, ගෙණ; (යම්පදයෙක් කියාද ඒපදය) පරස්සපදං, පරස්මෛපදයයි; විඤ්ඤුනා, නුවනැත්තාවූ; වරබුද්ධිනා, උත්තමඥණීනුවිසින්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

466. (යම්පදයෙක්) කත්තාරං, කර්තෘනු; පජහිත්වාන. හැර, අත්තනො කම්මං, ස්වකීයකර්මය; නිද්දිසෙ, දක්වන්නේද; (ඒපදය) අත්තනොපදං, ආත්මනෙපදයයි; සුබුද්ධිනා, උත්තමබුද්ධිඇත්තාවූ; පණ්ඩිතෙන, පණ්ඩිතයාවිසින්; විඤ්ඤෙය්‍යං, දතයුතු.

467. පරස්ස කත්තරි ඤෙය්‍යං සකම්මිකාය ධාතුයා,
අත්තනො තීසු විඤ්ඤෙය්‍යං භාවෙ කම්මනි කත්තරි.

468. පච්චුප්පන්නෙ වත්තමානා භවිස්සන්ති අනාගතෙ,
පඤ්චමී සත්තමී තීසු අතීතෙ හොන්ති සෙසකා.

469. උපසග්ගවසා ධාතු අකම්මාපි සකම්මකා,
සකම්මාපි අකම්මාච ඤෙය්‍යා කත්තරි කම්මනි.

470. ජිනො ලොකංභිභවති සම්පත්තිං අනුභාවති,
උග්ගච්ඡතීව සුරියො ආගච්ඡති නිදස්සනං.

---

පරස්මෛපද ආත්මනෙපදයන්ගේ විශෙෂවාචකත්වය දක්වනුසඳහා 'පරස්ස, යනාදිය ආරම්භ කොළෝ.

467. සකම්මිකාය ධාතුයා, සකර්මකධාතුනු කෙරෙන්; පරස්ස (පදං), පරස්මෛපදය; කත්තරි, කර්තෘකාරකයෙහි; ඤෙය්‍යං, දතයුතු; භාවෙ, භාවකාරකයෙහිද; කම්මනි, කර්මකාරකයෙහිද; කත්තරි, කර්තෘකාරකයෙහිද; (යන) තීසු, තුන්කාරකයෙහි; අත්තනො (පදං), ආත්මනෙපදය; විඤ්ඤෙය්‍යං; දතයුතු.

'පච්චුප්පන්නෙ' යනාදීන් කාලවශයෙන් ත්‍රිවිධ භෙදය දක්වූහ.

468. පච්චුප්පන්නෙ, ප්‍රත්‍යුත්පන්නකාලයෙහි; වත්තමානා, වර්තමාන විභක්තිය වේ; අනාගතෙ, අනාගතකාලයෙහි; භවිස්සන්ති, භවිස්සන්ති විභක්තිය වේ; පඤ්චමී සත්තමී, පඤ්චමීසප්තමීවිභක්තිවෙ; තීසු, තුන්කාලයෙහි වේ; සෙසකා, සෙසුවිභක්තිහු; අතීතෙ හොන්ති, අතීතකාලයෙහි වෙත්.

469. උපසග්ගවසා, උපසර්ගයන්ගේ වශයෙන්; අකම්මා ධාතු අපි, අකර්මක ධාතුහුද; සකම්මකා, සකර්මක වෙත්; සකම්මා අපි, සකර්මකධාතුහුද; අකම්මා ච, අකර්මකද වෙත්; කත්තරි, කර්තෘකාරකයෙහිද; කම්මනි, කර්මකාරකයෙහිද ලා; ඤෙය්‍යා, දතයුත්තාහ.

'ජිනො' යනාදීන් ඔවුන්ට උදාහරණ කළෝ.

470. ජිනො, සර්වඥතෙම; ලොකං, ලොකයා; අභිභවති, මැඩපවත්වයි; (ජිනො, සර්වඥතෙම) සම්පත්තිං අනුභවති, සම්පත් අනුභවකෙරෙයි; සුරියො, සූර්‍ය්‍යතෙම; උග්ගච්ඡති, ඉහලනගියි; (සුරියො, සූර්‍ය්‍යතෙම) ආගච්ඡති, අභිමුඛව එයි; (යනු) නිදස්සනං, නිදර්ශනයි.

471. නාමෙන සහ සංයුත්තා පඨමො පුරිසො මතො,
මජ්ඣිමො තුම්හසද්දෙන අම්හසද්දෙන උත්තමො.

472. භාවෙතුවත්තනොපදෙ පඨමො පුරිසො මතො,
තමෙකවචනඤ්චෙව අකම්මකාය ධාතුයා.

473. අභිහිතෙ කත්තරි සෙසතො පඨමා සාධනසඤ්ඤුතා,
දුතියාවාථවා ඡට්ඨී කම්මනි එකදා සියා.

474. අභිහිතෙ කම්මනි සෙසතො පඨමා සාධනසඤ්ඤුතා
තතියාවාථවා ඡට්ඨී කත්තරි සබ්බදා සියා.

475. භාවාභිධායකෙ සන්තෙ සකම්මාය තු ධාතුයා,
තතියාවාථවා ඡට්ඨී කත්තරි සබ්බදා සියා.

---

‘නාමෙන’ යනාදීන් පුරුෂලක්ෂණ කීහ.

471. නාමෙන සහ, නාමය හා සමග; සංයුත්තා, යෙදුනේ; පඨමො පුරිසො, ප්‍රථමපුරුෂයයිද; තුම්හසද්දෙන, තුම්හශබ්දයා හා (යෙදුනේ); මජ්ඣිමො, මධ්‍යම පුරුෂයයිද; අම්හසද්දෙන, අම්හශබ්දය හා (යෙදුනේ) උත්තමො, උත්තමපුරුෂයයිද; මතො, දත්නාලද්දේය.

භාවකාරයෙහි ආත්මනෙපදලක්ෂණදක්වනුසඳහා ‘භාවෙ’ යනාදිය ආරබ්ධයි.

472. භාවෙ තු, භාවකාරකයෙහි වනාහි; අකම්මකාය ධාතුයා, අකර්මකධාතුවු කෙරෙන්; අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි; පඨමො පුරිසො, ප්‍රථම පුරුෂය; මතො, දත්නාලද්දේය; තඤ්ච, හෙද; එකවචනං එව, එකවචනම වේ.

473. කත්තරි අභිහිතෙ, කර්තෘ (සමාසාදීන් විසින්) උක්තකල්හි; සාධනඤ්ඤුතා, සාධනදත්නවු විසින්; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; සෙසතො, දතයුත්තේය; (එකල්හි) කම්මනි, කර්මයෙහි; දුතියාඑව, ද්විතීයා විභක්තිම වේ; අථවා, නොහොත්; ඡට්ඨී, ෂෂ්ඨීවිභක්තිතොමෝ එකදා, සමහර කලෙක; සියා, වන්නීය.

474. අභිහිතෙ, (සමාසාදීන් විසින්) උක්තකල්හි; කම්මනි, කර්මකාරකයෙහි; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; සාධනඤ්ඤුතා, සාධනදත්නවු විසින්; සෙසතො, දතයුත්තේය; කත්තරි, කර්තෘයෙහි; තතියා එව, තෘතීයා විභක්තිම වේ; අථවා, නොහොත්; ඡට්ඨී, ෂෂ්ඨීවිභක්තිය; සබ්බදා, සෑමකල්හි; සියා, මෙසේවන්නේය.

475. භාවාභිධායකෙසන්තෙ, භාවවාචකය ඇතිකල්හි; සකම්මාය තු, ධාතුයා; සකර්මකධාතුවු කෙරෙන්; කත්තරි, කර්තෘයෙහි; තතියා වි-

476. කත්තාභිධායකෙ සන්තෙ අකම්මාය තු ධාතුයා,
කත්තරියෙව විඤ්ඤෙය්‍යා පඨමා විඤ්ඤුනා සදා.

477. භාවාභිධායකෙ සන්තෙ අකම්මාය තු ධාතුයා,
තතියාවාථවා ඡට්ඨී කත්තරි සබ්බදා සියා.

478. පඤ්චමී සත්තමී සඤ්ඤා රූළ්හිසඤ්ඤා'ති ඤායති,
අපච්චොති වදන්තෙකෙ තෙහි වුත්තං විචාරියං.

479. පුරිසාදිකා සඤ්ඤා හි අපච්චොතිපි යුජ්ජති
සිස්සානං හදයං යස්මා පූරෙති තෙන පුරිසො.

480. උපසග්ගඛ්‍යසොචෙව උපසග්ගානුකූලකො
උපසග්ගා දුවිධාති විඤ්ඤෙය්‍යා සාරබුද්ධිනා.

---

තෘතීයාවිභක්තිය හෝ; අථවා, නොහොත්; ඡට්ඨී, ෂෂ්ඨී විභක්තිය හෝ; සබ්බදා, සැමකල්හි; සියා, වන්නීය. (දේවදත්තෙන පච්චතෙ, දේවදත්තස්ස පච්චතෙ, යනු තදුදාහරණයි.)

476. කත්තාභිධායකෙසන්තෙ, කර්තෘවාචකය ඇතිකල; අකම්මාය තු ධාතුයා, අකර්මක ධාතුනුකෙරෙන්; කත්තරියෙව, කර්තෘකාරකයෙහිම; පඨමා, ප්‍රථමා විභක්තිතොමෝ; විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; සදා, සැමකල්හි; විඤ්ඤෙය්‍යා, දතයුත්තීය;–(සුඛො අහොසි ආනන්දො, යනාදිය නිදර්ශනයි.)

477. භාවාභිධායකෙසන්තෙ, භාවවාචකයඇතිකල; අකම්මාය තු ධාතුයා; අකර්මකධාතුනු කෙරෙන්; කත්තරි, කර්තෘයෙහි; තතියාවා, තෘතීයා විභක්තිය හෝ; අථවා, නොහොත්; ඡට්ඨී, ෂෂ්ඨී විභක්තිය; සබ්බදා, සැමකල්හි; සියා, වන්නීය. (දේවදත්තෙන භූයතෙ, දේවදත්තස්ස භූයතෙ යනාදිය නිදර්ශනයි)

478. පඤ්චමී සත්තමී සඤ්ඤා, පඤ්චමී සප්තමී විභක්ති සංඥාවෝ; රූළ්හිසඤ්ඤා ඉති, රූඪිසංඥාවෝයයි; ඤායති, හැඟේ; (ප්‍රථමාද්විතීයාදි සංඥාඅදර්ශිත යෙති) එකෙ, ඇතැම් ආචාරීනු; අපච්චො ඉති, අපච්චීසංඥායයි; වදන්ති, කියත්; තෙහි, ඔවුන් විසින්; වුත්තං, කියනලද්ද; විචාරිතං, විචාරණය කටයුතු

479. පුරිසාදිකා, පුරුෂාදිවූ; සඤ්ඤා හි, සංඥාවතාහි; අපච්චො ඉතිපි, අපච්චීයයිද; යුජ්ජති, යෙදේ; යස්මා, යම්හෙයකින්; සිස්සානං, ශිෂ්‍යයන්ගේ; හදයං, සිත; පූරෙති, පුරවාද; තෙන, එහෙයින්; පුරිසො, පුරුෂ නම් වේ.

480. උපසග්ගඛ්‍යසො ච ඉව, අඛ්‍යසය වැනි උපසර්ගයයිද; උපසග්ගානුකූලකො, උපසර්ගානුකූලකයයිද කියා; උපසග්ගා, උපසර්ගයෝ; දුවිධා ඉති, ද්විවිධවෙත්යයි; සාරබුද්ධිනා, සාරවූප්‍රඥා ඇත්තහු විසින්; විඤ්ඤෙය්‍යා; දතයුත් තාය.

481. යදා යුත්තූපසග්ගෙහි ධාතවො අඤ්ඤමත්ථතො
ජහන්තීති උපස්සග්ගඞ්කුසො නාමාති වුච්චති

482. යදා තෙ න ජහන්තෙව තදානුකූලමුච්චති
තථානුභූයතෙ සුඛං සුරියුග්ගච්ඡතී කමා.

483. උපසග්ගඞ්කුසවසා නීයන්තෙ ධාතුකුඤ්ජරො
ගඞ්ගාසලිලමාදීය සමුද්දම්බු යථාම්බුසො.

484. තෙකාලිකං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං,
අතිලිඞ්ගං ද්විවචනං ආඛ්‍යාතන්ති විධීයතෙ.

485. අකම්මා ධාතවො හොන්ති කාරිතෙ තු සකම්මකා,
සකම්මකා ද්විකම්මා ච ද්විකම්මා ච තිකම්මකා.

---

'යදා' යනාදින් උපසර්ගයන්ගේ ලක්ෂණ කීහ.

481. යදා, යම්කලෙක; උපසග්ගෙහි යුත්තා ධාතවො, උපසර්ගයුක්තධාතූහු; අත්ථතො අඤ්ඤං, තමන්ගේ අර්ථය; ජහන්ති ඉති, හරිත්ද; (ඒ) උපසග්ගඞ්කුසො නාම ඉති, උපසග්ගඞ්කුසනමැයි; වුච්චති, කියනුලැබේ.

482. යදා, යම්කලෙක්හි; තෙ, ඒ ධාතූහු; න ජහන්ති, (තමන්ගේ අර්ථය) පහනොකෙරෙත්ද; තදා, එකල්හි; අනුකූලං ඉති, (උපසර්ග) අනුකූලයයි; වුච්චති, කියනුලැබේ; (තථා, යනාදින් බවුන්ට පටිපාටීන් උදාහරණ දක්වූහ) තථා, තාවිසින්: සුඛං, සැපය; අනුභූයතෙ, අනුභව කරණුලැබෙයි; සුරියො, සූර්‍ය්‍යතෙමේ; කමා, ක්‍රමයෙන්; උග්ගච්ඡති, නගියි.

'උපසග්ගඞ්කුසවසා' යනාදීන් ස්වකීයලබ්ධිය සමාපනකළෝ.

483. උපසග්ගඞ්කුසවසා, උපසර්ගසඞ්ඛ්‍යාතඅඞ්කුසබලයෙන්; ධාතුකුඤ්ජරො, ධාතුසඞ්ඛ්‍යාතහස්තීහු; නීයන්තෙ, පමුණුවනුලැබෙයි; ගඞ්ගාසලිලං, ගඞ්ගාජලයට; ආදිය, පැමිණ; සමුද්දම්බු, සමුද්‍රජලය; යථා, යම්සේ; අම්බුසො, මිහිරිජලය වේද එමෙනි.

ආඛ්‍යාතලක්ෂණ දක්වන්නෝ 'තෙකාලිකං' යනාදිය කීහු.

484. (යමක්තෙම) තෙකාලිකං, කාලත්‍රය ඇත්තේද; තිපුරිසං, පුරුෂත්‍රය ඇත්තේද; ක්‍රියාවාචී, ක්‍රියාවාචකද; තිකාරකං, කාරකත්‍රයඇත්තේද; අතිලිඞ්ගං, ලිඞ්ගත්‍රය නැත්තේද; ද්විවචනං, වචනද්වයෙන්යුක්තද; (ඒ) ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාතයයි; විධීයතෙ, කියනුලැබේ.

485. අකම්මා ධාතවො, අකර්මකධාතූහු; කාරිතෙ තු, කාරිතප්‍රත්‍යය කළ කල්හිවනාහි; සකම්මකා හොන්ති, කර්මසහිතයෝ වෙත්; සකම්මකාච, කර්මසහිත ධාතූහුද; ද්විකම්මා, ද්විකර්මකයෝවෙත්; ද්විකම්මකාච, ද්විකර්මකධාතූහුද; තිකම්මකා, ත්‍රිකර්මකයෝ වෙත්.

486. තස්මා කත්තරි කම්මේ ච කාරිතෙ රූපසම්භවො
න භාවෙ සුද්ධකත්තා ච කාරිතෙ කම්මමීරිතං.

487. ධාතුසද්දො ක්‍රියාවාචී සාධනං වාචී පච්චයො
අත්ථස්ස වාචකං ලිඞ්ගං විභත්ති අත්ථජොතකා.

ඉති සද්දසාරත්ථජාලිනියා ආඛ්‍යාතකණ්ඩො අට්ඨමො.

——*——

488. සකම්මකා, අකම්මකා ධාතූ දුවිධමීරිතා
සකම්මකාකම්මකාති තිධා කෙචි වදන්ති ච.

---

486. තස්මා, එහෙයින්; කත්තරි, කර්තෘකාරකයෙහි ද; කම්මෙ ච, කර්ම කාරකයෙහි ද; කාරිතෙ, කාරිතප්‍රත්‍යයෙහි; රූපසම්භවො, රූප ලැබෙන්නේය; භාවෙ, භාවකාරකයෙහි; න, (කාරිතරූප) නො ලැබේ; සුද්ධකත්තා ච, ශුද්ධකර්තෘ තෙමේද; කාරිතෙ, කාරිතප්‍රත්‍යය ඇති කල්හි; කම්මං, කර්මයයි; ඊරිතං, කියනලදී.

ධාත්වාදීන්ගේ විශෙෂවාචකබව දක්වනු සඳහා 'ධාතුසද්දො' යනාදිය කීහු.

487. ධාතුසද්දො, ධාතුශබ්දයතෙම; ක්‍රියාවාචී, ක්‍රියාව කියනසුලු වේ; පච්චයො, ප්‍රත්‍යයතෙම; සාධනංවාචී, සාධනය කියනසුලුය; ලිඞ්ගං, ලිඞ්ගය; අත්ථස්ස, අර්ථය; වාචකං, කියන්නේය; විභත්ති, විභක්තිතොමෝ; අත්ථජොතකා, අර්ථය බබුලුවන්නීය.

සද්දසාරත්ථජාලිනියා, ශබ්දසාරාර්ථජාලිනීනම් ප්‍රකරණයෙහි; අට්ඨමො, අටවැනිවූ; ආඛ්‍යාතකණ්ඩො, ආඛ්‍යාතකාණ්ඩයතෙම; ඉති, මෙතෙකින් සමාප්තයි.

——*——

මෙතෙකින් ආඛ්‍යාතසාරය දක්වා දැන් කිතකසාරය දක්වන්නෝ 'සකම්මකා' යනාදි කීහු.

488. සකම්මකා, කර්මසහිතධාතූය; අකම්මකා, කර්මරහිතධාතූයයි; ධාතූ, ධාතූතොමෝ; දුවිධං, දෙපරිද්දෙකින්; ඊරිතා, කියනලදී; සකම්මකාකම්මකාච ඉති, (සකර්මකධාතූද අකර්මකධාතූද) සකර්මකාකර්මකධාතූදයි කියා; තිධා, තුන්පරිද්දෙකින්; කෙචි, කිසි ආචාර්යකෙනෙක්; (චූලනිරුත්ති ආචාර්යයෝ;) වදන්ති, කියත්.

489. දතං දිසෙනා ලොකෙ ජායතෙ නගරා නියගතො ජනො
නගරං ආගතො රාජා ඉච්චෙවං යථාසඞ්ඛ්‍යං නිදස්සනා. *

490. පච්චයා දුවිධා හොන්ති කිතකිච්චානභෙදතො
කෙචි කිතකිච්චාති තිධා වදන්ති කාමතො.

491. පච්චයා කත්තරි හොන්ති තෙ කිතප්පච්චයා මතා
භාවකම්මෙසු යෙ හොන්ති තෙ කිච්චප්පච්චයා මතා.

---

'දතං' යනාදීන් කෙචිවාදීන්ගේ මතයෙන් උදාහරණ දක්වූහ.

489. දතං දිසෙනා, දත් දුත්තේය; (මේ සකර්මකයි) ලොකෙ, ලොක යෙහි; ජායතෙ, උපන්නේය; (මේ අකර්මකයි) ජනො, ජනතෙම; නගරා, නුවරින්; නියගතො, නික්මුනේය; (මෙහි ගමුධාතු ද අකර්මකයි) රාජා, රජතෙම. නගරං, නුවරට; ආගතො, ආයේය; (මෙහි ගමුධාතු සකර්මකයි එහෙයින් සකර්මකාකර්මකයයි කියත් “ තං අයුත්තං විය දිස්සති එත්ථ හි ගමුධාතු උපසග්ගවසෙන ච වත්තිච්ඡාවසෙන ච කදාචි සකම්මකා කදාචි අකම්මකා’ යනු ටීකායි) ඉති එවං, මෙසේ මෙපරිද්දෙන්; යථාසඞ්ඛ්‍යං, පිළිවෙළින්; නිදස්සනා; උදාහරණයෝයි.

මෙසේ ධාතුප්‍රභෙද දක්වා දැන් ප්‍රත්‍යයභෙද දක්වන්නෝ 'පච්චයා' යනාදී කීහු.

490. කිතකිච්චානං, කිත්ප්‍රත්‍යයකිච්චප්‍රත්‍යයයන්ගේ; භෙදතො, භෙදයෙන්; පච්චයා, ප්‍රත්‍යයයෝ; දුවිධා හොන්ති, දෙවැදෑරුම්වෙත්; (මෙසේ ආත්මවාදය දක්වා ඉක්බිති පරවාදය දැක්වීම පිණිස 'කෙචි' යනාදිය ආරබධයි) කෙචි, කිසි ආචාර්‍යකෙනෙක්; කිතකිච්චා ඉති, (කිත්ප්‍රත්‍යයද කිච්චප්‍රත්‍යයද) කිතකිච්ච ප්‍රත්‍යයෝද්දයි කියා; තිධා, ත්‍රිවිධයයි; කාමතො, කැමති පරිද්දෙන්; වදන්ති, කියත්.

491. පච්චයා, (යම්) ප්‍රත්‍යයකෙනෙක්; කත්තරි, කර්තෘකාරකයෙහි; හොන්ති, වෙත්ද; තෙ, ඔහු; කිතප්පච්චයා, කිත්ප්‍රත්‍යයෝයයි; මතා, දන්නා ලදහ; යෙ, යම් ප්‍රත්‍යයකෙනෙක්; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; හොන්ති, වෙත්ද; තෙ, ඔහු; කිච්චපච්චයා, කිච්චප්‍රත්‍යයෝයයි; මතා, දන්නා ලදහ. (සිස්සානං සාධනෙ කඩ්ඩං වඩ්ඪන්ති කිරති විකඛමහති අපනෙතීති ඛිනො, පච්චයං හි දිස්වා සාධනෙ නිරාසඞ්කා හොන්තීති’ යනු ටීකායි.)

---

* “ දතං දිසෙනා ලොකජාතො
නගරා නියගතො ජනො,
නගරං ආගතො රාජා
යථාසඞ්ඛ්‍යං නිදස්සනා. ”

492. භාවකම්මේසු කත්තරි හොන්ති තෙ කිතකිච්චකා
ඉච්චෙවං කෙචි වදන්ති තෙහි වුත්තං විචාරියං.

493. තබ්බානීයණ්‍යරිච්චරිරියාපිච පච්චයා
ඨපයිත්වා ඉමෙ පඤ්ච සෙසා තු කිතකා මතා.

494. කෙචි වාදෙ ණී ණු ණුක ත තවන්තු තාවී ඉත
අනතතවෙතූනත්වාන තුංත්වා තෙරස කිතකා.

495. තබ්බානීයණ්‍යරිච්චරිරියාපිච පච්චයා
ඉමෙව කිච්චසඤ්ඤාව හොන්තීති පරිදීපයෙ.

496. ණ යු ක්වි රම්ම අ ණ්වු තු ආවී රූ ඉ ත මාන මා
මන කාරා ඉමෙ පණ්ණරසාති කිතකිච්චකා.

---

492. භාවකම්මේසු, භාවකර්මයෙහිද; කත්තරි, කර්තෘකාරකයෙහිද; හොන්ති, (යම් ප්‍රත්‍යය කෙනෙක්) වෙත්ද; තෙ, ඔහු; කිතකිච්චකා, කිත කිච්චප්‍රත්‍යයෝයයි (දත්තාලදහ.) ඉච්චෙවං, මෙපරිද්දෙන්; කෙචි, සමහර ආචාර්‍ය්‍යකෙනෙක්; වදන්ති, කියත්; තෙහි, ඔවුන් විසින්; වුත්තං, කියනලද්ද; විචාරියං, විචාරණය කටයුතු.

ස්වකීයවාද පරවාදවශයෙන් ඒ ප්‍රත්‍යයන් ස්වරූපවශයෙන් දක්වන්නෝ 'තබ්බා' යනාදී කීහු.

493, තබ්බානීයණ්‍යරිච්චරිරියාපිච–තබ්බ, තබ්බය; අනීය, අනීයය; ණ්‍ය, ණ්‍යය; රිච්ච, රිච්චය; රිරියා අපිච, රිරියාය (යන) ඉමෙ පඤ්ච පච්චයා, මේ ප්‍රත්‍යය පස; ඨපයිත්වා, හැර; සෙසාතු, සෙසු ප්‍රත්‍යයයෝ වනාහි; කිතකා, කිතකප්‍රත්‍යයෝයයි; මතා, දත්තාලදහ; (මේ ආගමවාදයෙහියි.)

494. කෙචිවාදෙ, කෙචි වදන්ති යන වාදයෙහි; ණී, ණීය; ණු, ණුය; ණුක, ණුකය; ත, තය; තවන්තු, තවන්තුය; තාවී, තාවීය; ඉත, ඉතය; අනත, අනතය; තවෙ, තවෙය; තූන, තූනය; ත්වාන, ත්වානය; තුං, තුංය; ත්වා, ත්වාය (යන); තෙරස, මේ තෙළෙස; කිතකා, කිතකප්‍රත්‍යයෝයි.

495. තබ්බානීයණ්‍යරි රිරියා අපිච—තබ්බ, තබ්බප්‍රත්‍යයද; අනීය, අනීය ප්‍රත්‍යයද; ණ්‍ය, ණ්‍යප්‍රත්‍යයද; රිච්ච, රිච්චප්‍රත්‍යයද; රිරියා, රිරියා ප්‍රත්‍යයද; (යන); ඉමෙ එව පච්චයා මේ ප්‍රත්‍යයයෝ; කිච්චසඤ්ඤා එව, කෘත්‍යසංඥා ඇත්තෝම; හොන්ති ඉති, වෙත්යයි; පරිදීපයෙ, දක්වන්නේය.

406. ණ යු ක්වි රම්ම අ ණ්වු තු ආවී රූ ඉ ත මාන මාන කාරා–ණ, ණප්‍රත්‍යයද; යු, යුප්‍රත්‍යයද; ක්වි, ක්විප්‍රත්‍යයද; රම්ම, රම්මප්‍රත්‍යයද; අ, අප්‍රත්‍යයද; ණ්වු,

497. මානෙතා කත්තරි කම්මෙ ච වත්තමානෙව වත්තති
අනෙන්තා තු කත්තරියෙව නෙතා භාවෙ නො ච කම්මනි.

498. තවෙ තුං තූන ත්වා ත්වාන භාවෙ කම්මනි කත්තරි
භාවෙයෙව තු අඤ්ඤත්ථ හොන්තීති පරිදීපයෙ.

499. කත්තුසාධන කම්මඤ්ච කරණං සම්පදානකං
අපාදනාධිකරණං භාවසාධනසත්තමං.

500. සං වාක්‍ය වාචකං කත්තු පසිද්ධි තමෙව ච
කත්තුසාධන විඤ්ඤෙය්‍යං සාධනඤ්ඤූහි තං පදං
කම්මසාධනකෙපෙසො නයො ඤෙය්‍යො විභාවිනා.

---

ණ්වුප්‍රත්‍යයද; තු, තුප්‍රත්‍යයද; ආවී, ආවීප්‍රත්‍යයද; රූ, රූප්‍රත්‍යයද; ඉ, ඉප්‍රත්‍යයද; න, නප්‍රත්‍යයද; මාන, මානප්‍රත්‍යයද; ම, මප්‍රත්‍යයද; මන, මනප්‍රත්‍යයද; කාර, කාරප්‍රත්‍යයද යන; ඉමෙ පණ්ණරස, මේ පසළොස; කිතකිච්චකා, කිත කිච්චප්‍රත්‍යයෝයයි; (මතා, දන්නාලදහ.)

මෙසේ වාදමය දක්වා තදනන්තරව ප්‍රත්‍යය විශෙෂ දක්වනු පිණිස 'මානෙතා' යනාදිය ආරබ්ධයි.

497. මානෙතා, මානප්‍රත්‍යයතෙම; කත්තරි, කර්තෘකාරකයෙහිද; කම්මෙ, කර්මකාරකයෙහිද; වත්තමානෙ එව, වර්තමානකාලයෙහි ම; වත්තති, පවතියි; අනෙන්තා තු, අනන්තප්‍රත්‍යය වනාහි; කත්තරි එව, කර්තෘකාරකයෙහිම (පවතියි); භාවෙ, භාවකාරකයෙහි; නො, නොපවතියි; කම්මනි ච, කර්මකාරකයෙහිද; නො, නොපවතියි.

498. තවෙ, තවෙප්‍රත්‍යයද; තුං, තුංප්‍රත්‍යයද; තූන, තූනප්‍රත්‍යයද; ත්වා, ත්වාප්‍රත්‍යයද; ත්වාන, ත්වානප්‍රත්‍යයද; භාවෙ, භාවකාරකයෙහිද; කම්මනි, කර්මකාරකයෙහිද; කත්තරි, කර්තෘකාරකයෙහි ද වෙත්; අඤ්ඤත්ථ, අන්‍යාර්ථයන්හි; භාවෙයෙව තු, භාවකාරකයෙහි ම; හොන්ති ඉති, වෙත්යයි; පරිදීපයෙ, දක්වන්නේය.

සාධනභෙද දක්වනු සඳහා 'කත්තුසාධනං' යනාදිය කීනු.

499. කත්තුසාධනං, කර්තෘසාධනයද; කම්මංච, කර්මසාධනයද; කරණං, කරණයද; සම්පදානකං, සම්ප්‍රදානයද; අපාදනාධිකරණං, අපාදන අධිකරණදෙකද; සත්තමං, සත්වනුවූ; භාවසාධනං, භාවසාධනයද යන මේස.

501. වාක්‍යෙ යන්තු අවුත්තම්පි පච්චයෙ පාකටෙ සති
වුත්තන්ති ඉධ විඤ්ඤෙය්‍යො කරණාදිස්වයං නයො.

502. භාවසාධනවිඤ්ඤෙය්‍යං පුබ්බාපරාසු භාවකං
නකත්තාදීති වදන්ති තෙන තං භාවසාධනං.

503. භාවො නාම හි ධාත්වත්ථො ධාත්වත්ථො නාමකො ක්‍රියා
තස්මා ච භාවසාධනං ක්‍රියාවෙවෙත්ථ වාචකං.

---

ඔවුන්ගේ ලක්ෂණ දක්වන්නෝ 'යං' යනාදිය කීවෝ.

500. යං, යම්පදයෙක්; වාක්‍යෙ, (විග්‍රහ) වාක්‍යය කරණකල්හි; කත්තුං, කර්තෘහු; වාචකං, කියන්නේ වේද; පසිද්ධෙපි, ප්‍රසිද්ධියට පැමිණිකල්හිද (නොහොත්)විග්‍රහය නිපන්කල්හිද; තං එව ච, ඒ කර්තෘහුම වාචකවන්නේ ද; සාධනඤ්ඤූහි, සාධනඥයන් විසින්; තං පදං, ඒ පදය; කත්තුසාධනං, කර්තෘසාධනයයි; විඤ්ඤෙය්‍යං, දතයුතු; කම්මසාධනකෙ අපි, කර්මසාධනයෙහිද; එසො නයො, මේ ක්‍රමය; විභාවිනා, පඬිහු විසින්; විඤ්ඤෙය්‍යො, දතයුතු. (වාක්‍යයෙහි කර්තෘවාචකකපදය නිෂ්පත්තියට පැමිණිකල්හිදු කර්තෘවාචකවූයේ කර්තෘසාධනනම්, කර්මසාධනයෙහිදු මෙම නයයි.)

501. වාක්‍යෙ, වාක්‍යයෙහි; යං තු, යම්පදයෙක් වනාහි; අවුත්තං අපි, අනුක්තවූවද; පච්චයෙ පාකටෙ සති, ක්‍යාදි ප්‍රත්‍යය ප්‍රකටකල්හි; වුත්තං ඉති, උක්තයයි; අයං නයො, මේ ක්‍රමය; ඉධ, මෙහි; කරණාදිසු, කරණාදිසාධනයන්හිදු; විඤ්ඤෙය්‍යො, දතයුතු.

502. භාවසාධනං, භාවසාධනය; විඤ්ඤෙය්‍යං, මෙසේ දතයුතු; පුබ්බාපරාසු, පූර්වාපරාවස්ථාවන්හි (නොහොත් වාක්‍යකරණකාලයෙහිද වාක්‍යනිෂ්පත්තියට පැමිණිකාලයෙහිද); භාවකං,(යම්පදයෙක්) භාව (ක්‍රියාම) වාචකවන්නේද; කත්තාදීති, කර්ත්‍රාදි (ෂට්කාරකය) න්; න වදන්ති, නො කියා ද; තෙන; ඒ කාරණයෙන්; තං, ඒ; භාවසාධනං, භාවසාධනනම්.

මෙසේ ස්වරූප දක්වා ඔවුන් අතුරෙන් භාවස්වරූපය තමා අප්‍රකටබැවින් ඒ දක්වනු සඳහා 'භාවො' යනාදි කීහු.

503. ධාත්වත්ථොහි, ධාත්වර්ථය වනාහි; භාවො නාම, භාව නම් වේ; ධාත්වත්ථො නාමකො, ධාත්වර්ථනම්වූයේ; ක්‍රියා, ක්‍රියාවයි; තස්මා ච, එහෙයින් ද; භාවසාධනං, භාවසාධනනම්; එත්ථ, මේ සාධනාධිකාරයෙහි; ක්‍රියා එව ච, ක්‍රියාවම; වාචකං, වාචක වේ.

504. සාධ්‍යසිද්ධවසා භෙද භාවොතු දුවිධො මතො
සාධ්‍ය වත්ථා ක්‍රියා හොති සිද්ධවත්ථාතු සාධනං.

505. යුජ්ජතෙ යුජ්ජනං යොගො භාවසාධනමීරිතං
තස්මා පනෙත්ථීතිසද්දං නප්පයුජ්ජන්ති පණ්ඩිතා.

506. ක්‍රියාමත්තුපලද්ධත්තා න සංයුජ්ජන්ති පණ්ඩිතා
බ්‍යුප්පත්ති හෙතුමා * පෙක්ඛා ජසු යුජ්ජන්ති පණ්ඩිතා.

507. බ්‍යුප්පත්තියා නිමිත්තන්තු කුසලා කං වදන්ති ච
ක්‍රියා බ්‍යුප්පත්තිනිමිත්තං ජාත්‍යාදයො පවත්තියා. †

---

එහි ප්‍රභෙද දක්වන්නෝ 'සාධ්‍යසිද්ධවසා' යනාදිය කීහු.

504. භාවො තු, භාවකාරකය වනාහි; සාධ්‍යසිද්ධවසා භෙද, සාධ්‍යය සිද්ධය යනමොවුන්ගේ වශයෙන්වන භෙදයෙන්; දුවිධො, දෙවදුරුම්යයි; මතො, දන්නාලද්දේය; සාධ්‍යවත්ථා, සාධ්‍යඅවස්ථාතොමෝ (නොහොත් ධාතු අවස්ථාතොමෝ); ක්‍රියා හොති, ක්‍රියාව වන්නීය; සිද්ධවත්ථා තු, සිද්ධාවස්ථාතොමෝ (නොහොත් ප්‍රත්‍යයාවස්ථාතොමෝ) සාධනං, සාධනයයි.

'යුජ්ජතෙ' යනාදීන් භාවසාධනයෙන් විග්‍රහ දක්වූහ.

505. යුජ්ජතෙ යොගො, යුජ්ජතෙ යොගො යනුද; යුජ්ජනං යොගො, යුජ්ජනං යොගො යනුද; භාවසාධනං, භාවසාධනයයි; ඊරිතං, කියනලදී; එහි, මේ භාවකාරකයෙහි; තස්මා, කුමක්හෙයින්; ඉතිසද්දං, ඉතිශබ්දය; පණ්ඩිතා, පණ්ඩිතයෝ; නප්පයුජ්ජන්ති, නොයොදත්ද; (යනු චොදනායි.)

506. ක්‍රියාමත්තුපලද්ධත්තා, භාවක්‍රියාමාත්‍රය ම ලැබූ බැවින්; පණ්ඩිතා, පණ්ඩිතයෝ; න සංයුජ්ජන්ති, ඉතිශබ්දය නොයොදත්; (යනු පරිහාරයි) බ්‍යුප්පත්තිහෙතුං ආපෙක්ඛා, ව්‍යුත්පත්තිනිමිත්තාපෙක්ෂාවෙන්; ජසු, ඡවිකාරකයෙහි; පණ්ඩිතා, පණ්ඩිතයෝ; යුජ්ජන්ති, (ඉතිශබ්දය) යොදත්.

'බ්‍යුප්පත්තියා' යනාදීන් ස්වරූපවශයෙන් ව්‍යුත්පත්තිනිමිත්ත දක්වූහ.

507. බ්‍යුප්පත්තියා නිමිත්තං තු, ව්‍යුත්පත්තියගේ නිමිත්තවනාහි; කං ච, කිමෙකැයි; කුසලා, (ශබ්දශාස්ත්‍රයෙහි) දක්ෂයෝ; වදන්ති, කියත්ද; ක්‍රියා බ්‍යුප්පත්ති නිමිත්තං, ක්‍රියාව්‍යුත්පත්තියට නිමිත්තයි; ජාත්‍යාදයො, ජාත්‍යාදීහු; පවත්තියා, ප්‍රවෘත්තියට නිමිත්තයෝයි.

---

* "බ්‍යුප්පත්තිනිමිත්තා."

† "බ්‍යුප්පත්තිනිමිත්තන්නාම කිං ච වුච්චන්ති කුසලා,
ක්‍රියාබ්‍යුප්පත්තිනිමිත්තං ජාත්‍යාදී පවත්තිමත්තා."–පොත්කෙහු.

508. ජාති ක්‍රියා ගුණෙ දබ්බං තථා නාමන්ති පඤ්චධා
ලක්ඛණම්පනමෙතස්ස සද්දසාරෙ පකාසිතං.

509. කාරකසාධනානන්තු කො විසෙසො කිමන්තරං
සාධනන්තු විභත්‍යෙකං කාරකන්තු ජධා සිතං.

510. න කෙවලා පයුජ්ජන්ති ධාතුව නව පච්චයො
තස්මා යෙව ච භාවෙපි ධාතුයා පච්චයා සියුං.

511. කිතකාභිහිතකත්තාදී ජකාරකානි නාමතො
භාවෙන සද්ධිං සන්තීති ජනිතබ්බා විභාවිනා.

---

ප්‍රවෘත්ති නිමිත්තප්‍රභෙද දක්වන්නෝ 'ජාති' යනාදිය කීහ.

508. ජාති, ජාතිය; ක්‍රියා, ක්‍රියාය; ගුණෙ, ගුණය; දබ්බං, ද්‍රව්‍යය; තථා, එසේම; නාමං ඉති, නාමයයි; පඤ්චධා, (ශබ්දප්‍රවෘත්ති නිමිත්ත) පස්පරිද්දෙකින් (දන්නාලද); එතස්ස, මේ ජාත්‍යාදිප්‍රවෘත්තිනිමිත්තයාගේ; ලක්ඛණං පන, ලක්ෂණය වනාහි; සද්දසාරෙ, ශබ්දසාර (කාණ්ඩ) යෙහි; පකාසිතං, ප්‍රකාශකරණලදී.

කාරකයන් හා සාධනයන්ගේද සාධනයන් හා කාරකයන්ගේද, විශෙෂ හා නානාත්ව දක්වන්නෝ "කාරකසාධනානං" යනාදිය කීහ.

509. කාරකසාධනානන්තු, කාරකය සාධනය යන මොවුන්ගේ; විසෙසො, වෙනස; කො, කවරේද; අන්තරං, නානාත්වය; කිං, කිමෙක්ද; (යන මේ ප්‍රශ්නයෙහි ලා) සාධනන්තු, සාධනය වනාහි; විභත්ති, විභක්තියයි; එකං කාරකන්තු, එකම කාරකය වනාහි; ජධා, සපරිද්දෙකින්; සිතං, සිටියේයි.

ප්‍රත්‍යය සාධනය කියානම් කුමකට ධාතුතොමෝ නොදනුලබන්නීද ඉක්බිති ධාතුතොමෝ භාවවාචකවන්නීනම් කුමකට භාවසාධනයෙහි ප්‍රත්‍යය යොදනුලැබේද යන චොදනාවට පරිහාර පිණිස 'න කෙවලා' යනාදිය කීහ.

510. කෙවලා, හුදෙක්; ධාතු එව, ධාතුනුම; නපයුජ්ජන්ති, නොයොදනුලැබෙත්; පච්චයාව, (හුදෙක්) ප්‍රත්‍යයද; න, නොයොදනුනොලැබේ; තස්මා එව, එහෙයින්ම; භාවෙ අපි, භාවයෙහිද; ධාතුයා, ධාතුනුකෙරෙන්; පච්චයා, ප්‍රත්‍යයයෝ; සියුං, වන්නාහුය.

ඉක්බිති කිතකාභිහිත සාධන ප්‍රභෙද දක්වන්නෝ 'කිතකා' යනාදිය කීහ.

511. කිතකාභිහිතකත්තාදි ජකාරකානි, කිතකයෙන් උක්තවූ කර්ත්‍රාදි ෂට්කාරකයෝ; නාමතො, නාමය හෙතු කොටගෙණ; භාවෙන සද්ධිං, භාවය හා සමග; සන්තීති, වෙත්යයි; විභාවිනා, ප්‍රාඥයා විසින්; ජානිතබ්බා, දතයුත්තාහුය.

512. කරෙරු නරෙරු සත්ථු පූජං අනෙන සුභරෙරු ජිනො
කත්තබ්බස්ස කරෙරු ගන්ධෙ දානං දෙය්‍යස්ස වත්ථුනො.

513. බුද්ධො පුඤ්ඤස්ස පභවො දෙසො තු ජන්තූනං භවො
ජයො භවති බුද්ධානං ඉමෙ එතෙසං නිදස්සනා.

514. කිතකාභිහිතො භාවො සද්දසත්තිසභාවතො
දබ්බංව ගම්‍යතෙ තෙන තජ්ජ කම්මම්පි සමභවං.

---

515. පංසාභිඤ්ඤාතෙ * නගරෙ විසාලෙ ගන්ථෙසු සාරාභිමතං ගහෙත්වා,
සා භාසිතා සා නිභයා සමත්තා සබ්බෙපි සත්තා නිභයා භවන්තු.

516. වස්සෙටසු වස්සං තිභවෙසු වුය්හං රොගාදිවජ්ජං විගතො භවෙය්‍ය
ජුසාමි බුද්ධං ජියමෙත්තසංඛ්‍යං ධනව දත්වා පිටකං ධරෙය්‍යනාති.

පඤ්චසතං දසචෙව නවගාථා පකාසිතා
ගාථාඩ්ඪා ච සොළසෙන වෙදිතබ්බා සුධීමතා.

ඉති සද්දසාරත්ථජාලිනියා කිතකකණ්ඩො නවමො.

ඉති සද්දසාරත්ථජාලිනී සමත්තා.

---

ඔවුන්ට උදාහරණ දක්වන්නෝ 'කරෙරු' යනාදිය කීහු.

512. සත්ථු, ශාස්තෘන්වහන්සේගේ; පූජං කරෙරු, පූජාකරන්නාවූ; නරෙරු, මනුෂ්‍යයෝයි; අනෙන, මොහු විසින්; සුභරෙරු, මනාකොට දරියයුතු නොහොත් පිදියයුතු; ජිනො, සර්වඥයන් වහන්සේයි; කත්තබ්බස්ස, කටයුත්තහු; කරෙරු, කරන්නාවූ; ගන්ධෙ, ගන්ධයයි; දෙය්‍යස්ස, දියයුත්තාහට; වත්ථුනො, වස්තුහුගේ; දානං, දීමයි.

513. බුද්ධො, සර්වඥතෙම; පුඤ්ඤස්ස, පුණ්‍යයාගේ; පභවො, ප්‍රභවයයි; දෙසො තු, දෙශය වනාහි; ජන්තූනං, සත්වයන්පිණිස; භවො, හටගත්තේයි; බුද්ධානං, බුදුවරයන්ට; ජයො භවති, ජයවෙයි. ඉමෙ, මොහු; එතෙසං, ඔවුන්ට; නිදස්සනා, නිදර්ශනයෝයි.

මෙසේ සප්තවිධසාධනයන්ට උදාහරණ දක්වා භාවය වනාහි කෘත්‍යයෙහිම වේයයි ආඛ්‍යාතසාරකාණ්ඩයෙහි කියනලදබැවින් කිතකයෙහි කියනලද භාවයද එසේම වේදෝහෝයි යන ආශඞ්කා නිවාරණය පිණිස 'කිතකාභිහිතො' යනාදිය ආරබ්ධයි.

514. කිතකාභිහිතොභාවො, කිතකය විසින් කියනලද භාවයතෙම; සද්දසත්තිසභාවතො, ශබ්දශක්තිස්වභාවයෙන්; දබ්බං ඉව, ද්‍රව්‍යය මෙන්; ගම්‍යතෙ, හැඟේ. තෙන, එහෙයින්; තජ්ජ, එහි; කම්මං අපි, කර්මයද; සමභවං, ලැබෙන්නේය. (“විනයස්ස දමනං, බ්‍රහ්මස්ස කරණං” යනු උදාහරණයි; “ණ්වුතුප්පච්චයන්තස්මිං ජනී භවති කම්මනි භාවසාධනසං යුත්තො ජනී යෙව සද්ද භාව” යනු න්‍යායයි.)

---

* “පංසාභිඛ්‍යාතෙ” පො.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු